330 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 330 - இல. 05
Volume 330 - No. 05

2026 ඔක්තෝබර් 20 වන අඟහරුවාදා
2026 ஒக்ரோபர் 20, செவ்வாய்க்கிழமை
Tuesday, 20th October, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

කථානායකතුමාගේ සහතිකය [තීරුව 811]

ශ්‍රී ලංකා ක්‍රිකට් පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 811]

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 812]

ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම (2025-2029) යටතේ පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට සහ ඒ සඳහා නායකත්වය ලබා දීමට පත් කරනු ලබන කමිටුව: සාමාජිකයින් නම් කිරීම [තීරුව 812]

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ පුරප්පාඩු පිරවීමේ ප්‍රමාදය පිළිබඳ විවාදයක් ඉල්ලා සිටීම [තීරුව 813]

පාර්ලිමේන්තු වාර්තා සහ ලේඛන ඩිජිටල් ආකාරයෙන් ලබා ගැනීම [තීරුව 814]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 814]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 819]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 822-866]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

"කාවන්තිස්ස" ඇතාගේ ප්‍රතිකාර ක්‍රියාවලිය සහ මරණය සම්බන්ධ විමර්ශනය [තීරුව 867]

2026.10.17 දින දිවයින පුරා විදුලිය බිඳ වැටීමට හේතු [තීරුව 882]

**2026.10.17 දින දිවයින පුරා සිදු වූ විදුලිය බිඳ වැටීම:**

බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 891]

**විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් වැළැක්වීමේ පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදි [තීරුව 895]

**සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදි [තීරුව 896]

**කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව:**

කාලය දීර්ඝ කිරීම [තීරුව 897]

**කල්තැබීමේ යෝජනාව:**

රටේ වත්මන් තත්ත්වය [තීරු 899-991]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 991-1004]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

சபாநாயகரது சான்றுரை [ப: 811]

இலங்கைக் கிரிக்கெட் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 811]

பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 812]

தேசிய ஊழல் எதிர்ப்பு செயற்றிட்டத்தின்கீழ் (2025-2029) பாராளுமன்றத்துக்குப் பொறுப்பளிக்கப்பட்ட பணிகளை நடைமுறைப்படுத்துவதற்கும், கண்காணிப்பதற்கும் மற்றும் அதற்குத் தலைமைத்துவம் வழங்குவதற்கும் நியமிக்கப்பட்ட குழு: உறுப்பினர்கள் நியமனம் [ப: 812]

உயர் நீதிமன்றம் மற்றும் மேன்முறையீட்டு நீதிமன்றத்திலுள்ள வெற்றிடங்களை நிரப்புவதிலுள்ள தாமதம் தொடர்பில் விவாதமொன்றைக் கோரல் [ப: 813 ]

பாராளுமன்ற அறிக்கைகள் மற்றும் ஆவணங்களை டிஜிட்டல் வடிவில் பெற்றுக்கொள்ளல் [ப: 814]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 814]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 819]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 822-866]

**தனி அறிவித்தல் மூல வினா:**

"காவன்திஸ்ஸ" யானையின் சிகிச்சை நடவடிக்கை மற்றும் மரணம் குறித்த விசாரணை [ப: 867]

17.10.2026 அன்று நாடளாவிய ரீதியிலான மின் தடைக்கான காரணம் [ப: 882]

**2026.10.17ஆம் திகதி நாடளாவிய ரீதியில் ஏற்பட்ட மின் தடை:**

வலுசக்தி அமைச்சரினது கூற்று [ப:  891]

**வெளிநாட்டுப் பயங்கரவாதிப் போராளிகளைத் தடுத்தல் சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 895]

**ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களைத் தடுத்தல் சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 896]

**கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு:**

கால நீடிப்பு [ப: 897]

**ஒத்திவைப்புப் பிரேரணை:**

நாட்டின் தற்போதைய நிலைமை [ப: 899-991]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 991-1004]

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 811]

Sri Lanka Cricket Bill: Petitions to the Supreme Court [Col. 811]

Protection of the State from Terrorism Bill: Petitions to the Supreme Court [Col. 812]

Committee to Provide Leadership and Oversee Implementation of Actions Assigned to Parliament under National Anti-corruption Action Plan (2025-2029): Nomination of Members [Col. 812]

Request for Debate on Delay in Filling Vacancies in the Supreme Court and Court of Appeal [Col. 813]

Receipt of Parliamentary Reports and Documents in Digital Format [Col. 814]

AUDITOR-GENERAL'S REPORT [Col. 814]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 819]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 822-866]

QUESTION BY PRIVATE NOTICE:
Treatment Process and Investigation into Death of Tusker "Kavanthissa" [Col.867]
Reasons for Islandwide Power Outage on 17.10.2026 [Col. 882]

ISLANDWIDE POWER OUTAGE OCCURRED ON 17.10.2026:
Statement by Minister of Energy [Col. 891]

PREVENTION OF FOREIGN TERRORIST FIGHTERS BILL:
Read the First time [Col. 895]

PREVENTION OF ORGANISED CRIMES BILL:
Read the First time [Col. 896]

SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMEND ATIONS IN THAT REGARD:
Extension of time [Col. 897]

ADJOURNMENT MOTION:
Current Situation of the Country [Cols. 899-991]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 991-1004]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2026 ඔක්තෝබර් 20වන අඟහරුවාදා*
*2026 ஒக்ரோபர் 20, செவ்வாய்க்கிழமை*
*Tuesday, 20th October, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2026 ඔක්තෝබර් 19 දින මවිසින් "දූෂණ විරෝධී (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### ශ්‍රී ලංකා ක්‍රිකට් පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### இலங்கைக் கிரிக்கெட் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### SRI LANKA CRICKET BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ශ්‍රී ලංකා ක්‍රිකට්" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් තිහක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

## III

### ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### PROTECTION OF THE STATE FROM TERRORISM BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ඔක්තෝබර් 07 සහ 08 දිනැති නිවේදනවල සඳහන් පෙත්සම් දෙකට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් විසි තුනක පිටපත්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

## IV

### ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම (2025-2029) යටතේ පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට සහ ඒ සඳහා නායකත්වය ලබා දීමට පත් කරනු ලබන කමිටුව: සාමාජිකයින් නම් කිරීම
### தேசிய ஊழல் எதிர்ப்பு செயற்றிட்டத்தின்கீழ் (2025-2029) பாராளுமன்றத்துக்குப் பொறுப்பளிக்கப்பட்ட பணிகளை நடைமுறைப்படுத்துவதற்கும், கண்காணிப்பதற்கும் மற்றும் அதற்குத் தலைமைத்துவம் வழங்குவதற்கும் நியமிக்கப்பட்ட குழு: உறுப்பினர்கள் நியமனம்
### COMMITTEE TO PROVIDE LEADERSHIP AND OVERSEE IMPLEMENTATION OF ACTIONS ASSIGNED TO PARLIAMENT UNDER NATIONAL ANTI-CORRUPTION ACTION PLAN (2025-2029): NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to inform this House that, pursuant to the decision arrived at the Committee on Parliamentary Business at its Meeting held on 25th of September 2026, the following Members of Parliament have been nominated to serve in the 13-Member Committee chaired by the Hon. Deputy Chairperson of Committees, to provide leadership and oversee the implementation of the actions assigned to Parliament under the National Anti-Corruption Action Plan (2025-2029):

The Hon. Harshana Nanayakkara, Attorney at Law

The Hon. Sunil Watagala, Attorney at Law

The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne

The Hon. J.C. Alawathuwala

The Hon. Anuradha Jayaratne, Attorney at Law

The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam

[ගරු කථානායකතුමා]

The Hon. (Mrs.) Oshani Umanga

The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga

The Hon. Darmapriya Wijesinghe

The Hon. Dewananda Suraweera

The Hon. Chandima Hettiaratchi

The Hon. M. Nizam Kariapper, PC

## V

## ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ පුරප්පාඩු පිරවීමේ ප්‍රමාදය පිළිබඳ විවාදයක් ඉල්ලා සිටීම

## உயர் நீதிமன்றம் மற்றும் மேன்முறையீட்டு நீதிமன்றத்திலுள்ள வெற்றிடங்களை நிரப்புவதிலுள்ள தாமதம் தொடர்பில் விவாதமொன்றைக் கோரல்

REQUEST FOR DEBATE ON DELAY IN FILLING VACANCIES IN THE SUPREME COURT AND COURT OF APPEAL

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ පවතින පුරප්පාඩු සහ ඒවා පිරවීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විවාදයක් පැවැත්වීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙසට පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයන් 21 දෙනෙකුගේ අත්සනින් යුතුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 83 (1) යටතේ ඉදිරිපත් කරන බව සඳහන් කර මා වෙත යොමු කර ඇති යෝජනාව සම්බන්ධයෙන් මෙම සභාව දැනුවත් කිරීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 83(1) මඟින් ඉදිරිපත් කරනු ලබන්නේ ජනාධිපතිවරයාගේ හෝ වැඩබලන ජනාධිපතිවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ, විනිශ්චයකාරවරයන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් තැනැත්තන්ගේ පෞද්ගලික පැවැත්ම හා සම්බන්ධ යෝජනාවක් වන අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ පුරප්පාඩු සඳහා පත් කිරීම ප්‍රමාද වීම, පෞද්ගලික පැවැත්ම පිළිබඳ කාරණයක් නොවන බැවින්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඇ) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ පුරප්පාඩු සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නම් නිර්දේශ කිරීම ගරු ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි සිදු කළ හැකි බැවින් ද 2026 ඔක්තෝබර් 16 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී දැනුම් දුන් පරිදි මෙම යෝජනාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විවාදයක් පැවැත්වීමේ අවකාශයක් නොමැති බව දැනුම් දීමට කැමැත්තෙමි.

## VI

## පාර්ලිමේන්තු වාර්තා සහ ලේඛන ඩිජිටල් ආකාරයෙන් ලබා ගැනීම

## பாராளுமன்ற அறிக்கைகள் மற்றும் ஆவணங்களை டிஜிட்டல் வடிவில் பெற்றுக்கொள்ளல்

RECEIPT OF PARLIAMENTARY REPORTS AND DOCUMENTS IN DIGITAL FORMAT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අත්‍යවශ්‍ය නොවන රජයේ වියදම් අවම කිරීම සහ රජයේ ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගනිමින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන සියලුම වාර්තා සහ ලේඛන ඩිජිටල් ආකාරයෙන් ලබා ගැනීමට, එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ කැමැත්ත ලබා ගැනීම සඳහා 2026 සැප්තැම්බර් 09 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී එළඹි තීරණය ප්‍රකාරව, සමීක්ෂණයක් සිදු කරන ලදී.

ඒ අනුව, මින් ඉදිරියට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය, න්‍යාය පුස්තකය/ න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය, කාරක සභා වාර්තා, ගැසට් නිවේදන, පනත් කෙටුම්පත්, හැන්සාඩ් වාර්තා, අයවැය කථාව සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව සභාගත කිරීමට නියමිත අනෙකුත් සියලුම වාර්තා මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව මුද්‍රිත පිටපත් ලබා ගැනීමට කැමැත්ත දක්වන ලද මන්ත්‍රීවරයන්ට පමණක් මුද්‍රිත ආකාරයෙන් ලබා දීමට පියවර ගනු ලබන බව දැනුම් දීමට කැමැත්තෙමි.

තවද, ඉහත ලිපිලේඛන ඩිජිටල් ආකාරයෙන් ලබා ගැනීමට කැමැත්ත පළ කරන ලද මන්ත්‍රීවරයන්හට එම ලිපිලේඛන පාර්ලිමේන්තු වෙබ් අඩවියෙන්, මෙම්බර් පෝටලයෙන් - Member Portal එකෙන් - සහ මෑතක දී හඳුන්වා දුන් ජංගම යෙදුම - Mobile App එක - හරහා බාගත කර ගත හැකි බව ද වැඩිදුරටත් දැනුම් දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව

## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLIX කොටස;
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ L හා LI කොටස්; සහ
- 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VIII, IX, X, XI හා XII කොටස්, තෙවැනි කාණ්ඩයේ VIII, IX, X හා XI කොටස් සහ නවවැනි කාණ්ඩයේ IV, V හා VI කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VI කොටස, සිව්වැනි කාණ්ඩයේ IV හා V කොටස් සහ පස්වැනි කාණ්ඩයේ V කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Speaker, I present the Annual Report of the Ranaviru Seva Authority for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the -

- Annual Report of the Sri Lanka Insurance Corporation Limited for the year 2025;
- Annual Report of the Sri Lanka Insurance Corporation Life Limited for the year 2025; and
- Annual Report of the Sri Lanka Insurance Corporation General Limited for the year 2025.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present Supplementary Estimate No. 06 of 2026.

I move that the Supplementary Estimate be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Sir, I present the Report on the observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Department for Registration of Persons in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- Order made by the Minister of Finance, Planning and Economic Development under Section 19A of the Customs Ordinance (Chapter 235), as amended by the Customs (Amendment) Law No. 35 of 1974 and the Customs (Amendment) Act, No. 83 of 1988, relating to Customs Import Duty and published in Gazette Extraordinary No. 2502/21 of 18th August, 2026;
- Order made by the then Minister of Education under Section 27(1)(b) read with Sections 25A and 70C of the Universities Act, No. 16 of 1978 regarding the change of the name of the SLT Campus (Pvt.) Limited to Sri Lanka Technology Campus (Pvt.) Limited and published in Gazette Extraordinary No. 2384/27 of 16th May, 2024;
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science in Textile and Apparel Studies Degree awarded by Sri Lanka Institute of Textile and Apparel and published in Gazette Extraordinary No. 2446/36 of 22nd July, 2025;

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Honours Degrees awarded by Sri Lanka Institute of Information Technology (Guarantee) Limited and published in Gazette Extraordinary No. 2450/40 of 21st August, 2025;
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science Honours in Medical Science in Acupuncture Degree programme awarded by KIU Campus (Private) Limited and published in Gazette Extraordinary No. 2454/39 of 17th September, 2025;
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science Honours in Psychology Degree awarded by The American College of Higher Education (Private) Limited and published in Gazette Extraordinary No. 2455/06 of 22nd September, 2025;
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 27(1)(b) read with Sections 25A and 70C of the Universities Act, No. 16 of 1978 regarding the change of the name of the Esoft Metro Campus (Private) Limited to Esoft Uni (Private) Limited and published in Gazette Extraordinary No. 2458/13 of 13th October, 2025; and
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science Honours in Business Analytics Degree awarded by Sri Lanka Technology Campus (Pvt.) Limited and published in Gazette Extraordinary No. 2468/08 of 23rd December, 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මධ්‍යම පළාත් සභාව යටතේ පවතින පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බස්නාහිර පළාත් සභාව යටතේ පවතින පළාත් පාලන ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability on -

(i) Annual Performance Report of the Department of National Botanic Gardens for the year 2025; and

(ii) Annual Performance Report of the Ministry of Environment for the year 2025,

which were referred to the Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද, "විධිමත් තත්ත්ව පරීක්ෂණයකින් තොරව ආනයනික ගල් අඟුරු තොග භාවිතයට ගැනීම හේතුවෙන් උද්ගත වූ ගැටලු" මැයෙන්, සිදු වූ පාඩුව පිළිබඳව සොයා බැලීම සඳහා එම කාරක සභාව විසින් විදුලිබල අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටු වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු වැඩිපුර පාවිච්චි කිරීම හරහා රුපියල් මිලියන 7,099ක්, ඒ වාගේම අතිරේක නඩත්තු කටයුතු සඳහා රුපියල් මිලියන 80.4ක්, අතිරේක අළු ප්‍රවාහනය සහ ඒ අදාළ කාර්යය සඳහා රුපියල් මිලියන 13.1ක්, මෙගාවොට් 300ක් නිෂ්පාදනය නොවීම නිසා විදුලිය වැඩිපුර මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 8,572ක් වශයෙන් රුපියල් මිලියන 15,681ක් සහ මීට අදාළ තොරතුරු ඇතුළත් ඇමුණුම 5(1) අනුව නැව් 25ක් පැමිණෙන්න තිබියදී 19ක් පමණක් පැමිණීම නිසා හදිසි මිලදී ගැනීම් වශයෙන් ගල් අඟුරු නැව් 5ක් මිලදී ගෙන තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, වාර්තාව විතරක් ඉදිරිපත් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, පොඩ්ඩක් ඉන්න. ස්ථාවර නියෝග 111 අනුව මට මේක කියවන්න පුළුවන්.

ඒ අනුව එහි පාඩුව රුපියල් මිලියන 2,284ක්. ඒ වාගේම හදිසි මිලදී ගැනීමේ 5වැනි නැව ප්‍රමාදවීම නිසා රුපියල් මිලියන 402.8ක් වශයෙන් රුපියල් මිලියන 18,368ක පාඩුවක් මේකෙන් වෙලා තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ ඩීසල් මිල ඉහළ යෑම නිසා රජය විසින් දුන් රුපියල් 100ක සහනාධාරය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලැබූ පාඩුව මේකට ගණනය කර නැහැ. ඒ පිළිබඳවත් ගණනය කරන්න කියා අපි ඔවුන්ට උපදෙස් දී තිබෙනවා. ඒ අනුව සමස්ත පාඩුව රුපියල් මිලියන 18,368.89යි කියන එක අපි මේ සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි නැවතත් කාරක සභා වාර්තා පිළිගැන්වීමේ අවස්ථාවට යොමු වෙමු.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත - එල්.ඩී.ඕ. 8/2026; සහ

(ii) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත - එල්.ඩී.ඕ. 11/2026

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)
ගරු කථානායකතුමනි, දඹදෙනිය, කුලියාපිටිය පාර, අංක 74 යන ලිපිනයෙහි පදිංචි එච්.ආර්.කේ. විමලරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
ගරු කථානායකතුමනි, කුරුණෑගල, ගෝනගම, අංක 19 යන ලිපිනයෙහි පදිංචි අයි. ශ්‍රියානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 (ඇ) ව්‍යවස්ථාව අනුව ජනතාවගේ අධිකරණ බලය පාර්ලිමේන්තුව සතුයි. ඒ වාගේම, අධිකරණ සඳහා අවශ්‍ය කරන මූල්‍ය සම්පාදනය පිළිබඳ සම්පූර්ණ බලයත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව සතුයි. දැන් මේ අධිකරණයට විනිශ්චයකාරවරුන් පත් නොකිරීම නිසා, ශ්‍රේෂ්ඨාධිකරණයට විනිසුරුවරුන් 4දෙනෙක්, අභියාචනාධිකරණයට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ කාරණයත් කියා මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි. පොඩ්ඩක් මට අවස්ථාව දෙන්න.

ඒ විනිශ්චයකාරවරුන් පත් නොකිරීම නිසා ඇති වෙලා තිබෙන ප්‍රශ්නය පිළිබඳව විවාදයක් දෙන්න කියලා මාස දෙකක් තිස්සේ අපි ඉල්ලුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 83 (1) යටතේ ඒක අදාළ නොවේ කියලා මම පැහැදිලිවම ඔබතුමාට ප්‍රකාශ කළා.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ: විස්තර
### இலங்கையிலுள்ள சர்வதேச கிரிக்கெட் மைதானங்கள்: விபரம்
### INTERNATIONAL CRICKET STADIUMS IN SRI LANKA: DETAILS

2128/2026

**1. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාව මේ දක්වා සහභාගී වී ඇති ජාත්‍යන්තර ටෙස්ට් සහ එක්දින ක්‍රිකට් තරග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර ටෙස්ට් සහ එක්දින ක්‍රිකට් ක්‍රීඩා තරග පැවැත්විය හැකි ක්‍රීඩාංගණ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ජාත්‍යන්තර ක්‍රිකට් තරග පැවැත්විය හැකි ක්‍රීඩාංගණ පිහිටා තිබේද;

(ii) දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා කළ ක්‍රීඩකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ක්‍රීඩකයන්ගේ නම් සහ ඔවුන් නියෝජනය කළ පාසල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඩී.බී. වෙලගෙදර ක්‍රීඩාංගණය ජාත්‍යන්තර ක්‍රිකට් තරග පැවැත්විය හැකි ක්‍රීඩාංගණයක් වන්නේද;

(ii) එම ක්‍රීඩාංගණයේ පවත්වා ඇති ජාත්‍යන්තර ක්‍රිකට් තරග සංඛ්‍යාව කොපමණද;

(iii) ක්‍රීඩාංගණයේ අවසන් වරට ජාත්‍යන්තර ක්‍රිකට් තරගයක් පවත්වා ඇති දිනය කවරේද;

(iv) මෙම ක්‍රීඩාංගණයේ අයිතිය පැවති ආයතනය කවරේද;

(v) මේ වනවිට වෙනත් ආයතනයකට එම ක්‍රීඩාංගණය පවරා තිබේද;

(vi) එසේ නම්, එලෙස අයිතිය පවරා ඇති පදනම කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை தற்போது வரை பங்கேற்றுள்ள சர்வதேச டெஸ்ட் மற்றும் ஒருநாள் கிரிக்கெட் போட்டிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) தற்போது இலங்கையிலுள்ள சர்வதேச டெஸ்ட் மற்றும் ஒருநாள் கிரிக்கெட் போட்டிகளை நடாத்துவதற்கு பொருத்தமான மைதானங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) குருநாகல் மாவட்டத்தில், சர்வதேச கிரிக்கெட் போட்டிகளை நடாத்துவதற்குப் பொருத்தமான மைதானங்கள் உள்ளனவா என்பதையும்;

(ii) மேற்படி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தி சர்வதேச கிரிக்கெட் போட்டிகளில் பங்குபற்றியுள்ள வீரர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி வீரர்களின் பெயர்களும், அவர்கள் பிரதிநிதித்துவப்படுத்திய பாடசாலைகளும் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) டீ.பி. வெலகெதர மைதானம் சர்வதேச கிரிக்கெட் போட்டிகளை நடாத்துவதற்குப் பொருத்தமானதா என்பதையும்;

(ii) மேற்படி விளையாட்டரங்கில் நடாத்தப்பட்டுள்ள சர்வதேச கிரிக்கெட் போட்டிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி விளையாட்டரங்கில் சர்வதேச கிரிக்கெட் போட்டியொன்று இறுதியாக நடாத்தப்பட்ட திகதி யாது என்பதையும்;

(iv) மேற்படி விளையாட்டரங்கு எந்த நிறுவனத்துக்குச் சொந்தமானது என்பதையும்;

(v) தற்போது மேற்படி விளையாட்டரங்கு வேறு நிறுவனமொன்றுக்கு உரிமை மாற்றம் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், இந்த உரிமை மாற்றம் எந்த அடிப்படையில் மேற்கொள்ளப்பட்டது என்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(ஈ) இன்றேல் ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House the number of -

(i) international Test and one-day cricket matches that Sri Lanka has participated in so far, separately; and

(ii) stadiums in Sri Lanka at which international Test and one-day cricket matches can be played at present?

(b) Will he also inform this House -

(i) whether there are any stadiums in the Kurunegala District at which international cricket matches can be played;

(ii) the number of cricket players who played international cricket representing the said district; and

(iii) the names of such players and the schools they represented?

(c) Will he further inform this House -

(i) whether the D.B. Welagedara Stadium is one at which international cricket matches can be played;

(ii) the number of international cricket matches that had been played at the said stadium;

(iii) the date on which an international cricket match was last played at the said stadium;

(iv) the name of the institution which owned the said stadium;

(v) whether the said stadium has been transferred to another institution at present; and

(vi) if so, the basis on which such ownership has been transferred?

(d) If not, why?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)

(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජාත්‍යන්තර ටෙස්ට් තරග සංඛ්‍යාව - 329

ජාත්‍යන්තර එක්දින තරග සංඛ්‍යාව - 945

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

(ii) ක්‍රීඩාංගණ සංඛ්‍යාව 7කි.

1. ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
2. පල්ලේකැලේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
3. ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
4. රංගිරි දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
5. හම්බන්තොට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය
6. සිංහල ක්‍රීඩා සමාජ (SSC) ක්‍රීඩාංගණය, කොළඹ 07
7. පී. සරවනමුත්තු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය - (පී. සරා ඕවල්) - (ටෙස්ට් තරග)

පහත අමතර ක්‍රීඩාංගණද ඇති අතර, මෑත කාලයේදී එම ක්‍රීඩාංගණයන්හි ජාත්‍යන්තර ක්‍රිකට් තරග පවත්වා නොමැත.

1. ටිරෝන් ප්‍රනාන්දු ක්‍රීඩාංගණය - මොරටුව
2. අස්ගිරිය ක්‍රීඩාංගණය - මහනුවර
3. කොළඹ ක්‍රිකට් සමාජ (CCC) ක්‍රීඩාංගණය - කොළඹ 07
4. වෙලගෙදර ක්‍රීඩාංගණය - කුරුණෑගල

(ආ) (i) ඔව්.

ජාත්‍යන්තර කාන්තා ක්‍රිකට් තරග පමණක් පවත්වා ඇති කුරුණෑගල වෙලගෙදර ක්‍රීඩාංගණය පිහිටා ඇත.

(ii) ක්‍රීඩකයින් 7යි.

(iii)

| අ/අ | නම | පාසල |
|---|---|---|
| 1. | රංජිත් මධුරසිංහ මහතා | මලියදේව විද්‍යාලය, කුරුණෑගල |
| 2. | ලංකා ද සිල්වා මහතා | ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල |
| 3. | එරික් උපශාන්ත මහතා | මලියදේව විද්‍යාලය, කුරුණෑගල |
| 4. | රංගන හේරත් මහතා | මලියදේව විද්‍යාලය, කුරුණෑගල |
| 5. | ජීවන්ත කුලතුංග මහතා | මලියදේව විද්‍යාලය, කුරුණෑගල |
| 6. | මිනෝද් භානුක මහතා | මලියදේව විද්‍යාලය, කුරුණෑගල |
| 7. | මිලාන් රත්නායක මහතා | ශ්‍රී සුමංගල විද්‍යාලය, වාරියපොළ |

(ඇ) (i) ඔව්.

ජාත්‍යන්තර කාන්තා එක්දින තරග පමණක් පවත්වා ඇත.

(ii) ජාත්‍යන්තර කාන්තා එක්දින තරග 5කි.

(iii) 2008 මැයි මස 11වන දින - ජාත්‍යන්තර කාන්තා එක්දින තරගයකි.

(iv) මෙම ක්‍රීඩාංගණයේ අයිතිය කුරුණෑගල නගර සභාව සතු වේ.

(v) ඔව්.

(vi) මෙම ක්‍රීඩාංගණයේ අයිතිය කුරුණෑගල නගර සභාව සතුව පවතින අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් මෙම ක්‍රීඩාංගණය වර්ෂ 2037 දක්වා බදු පදනම මත ලබාගෙන, එම බදු ගිවිසුම යටතේ බදු අයිතිය පමණක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත 2007 වර්ෂයේ අගෝස්තු 01වන දින සිට පැවරී ඇත.

(ඈ) පැන නොනඟී.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

කුරුණෑගල නගර සභාව සතු වෙලගෙදර ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය මම හිතන විධියට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත භාර දීලා තිබෙන්නේ රුපියල් ලක්ෂයක මාසික බදු පදනමක් මතයි. එතැන අක්කර 5කට ආසන්න භූමි ප්‍රමාණයක් තිබෙනවා. නමුත් ඒ ගිවිසුම යාවත්කාලීන වෙලා නැහැ. කුරුණෑගල නගර සභාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දීලා තිබෙන අවස්ථාවක, අක්කර 5කට වැඩි ප්‍රදේශයක් තිබෙන මේ ක්‍රීඩාංගණය සම්බන්ධයෙන් තිබෙන ගිවිසුම යම් සංශෝධනයකට ලක් කරලා, වර්තමානයට ගැළපෙන ආකාරයට සහ නගර සභාවට වටිනාකමක් ලැබෙන විධියට එම මූල්‍යමය ක්‍රියාවලිය වෙනස් කරන්න ක්‍රීඩා අමාත්‍යාංශය හැටියට කටයුතු කරනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සම්බන්ධයෙන් නගර සභාව සහ ක්‍රිකට් ආයතනය සමඟ සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ සාකච්ඡාවට අනුව එකඟතාවක් තිබෙනවා, මෙහි වෙනස්කම් කිහිපයක් සිදු කර ගන්න. නමුත් නිශ්චිතවම එකඟතාවකට ඇවිල්ලා නැහැ. අමාත්‍යාංශය නොවෙයි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයත්, නගර සභාවත් එකතු වෙලා, සාකච්ඡා කරලා තමයි ඒ තීරණය ගන්න වෙන්නේ.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ලංකාවේ පළාත් කිහිපයකට බෙදලා තමයි ක්‍රීඩකයින් වර්ගීකරණය කරලා තිබෙන්නේ. උතුරු පළාත ගත්තොත්, මිලාන් රත්නායක ක්‍රීඩකයා සහ විජයකාන්ත් වියස්කාන්ත් ක්‍රීඩකයා වර්තමානයේදී ක්‍රීඩා කරනවා. ඔවුන් දක්ෂතා දැක් වූ ක්‍රීඩකයින් දෙදෙනෙක්. මිලාන් රත්නායක කියන්නේ වාරියපොළ ශ්‍රී සුමංගල ජාතික පාසල නියෝජනය කරපු ක්‍රීඩකයෙක්. ඔහු formats තුනටම සම්බන්ධ ක්‍රීඩකයෙක්. නමුත්, විදේශ සංචාරවලදී හෝ දේශීය ක්‍රිකට් තරගවලදී විජයකාන්ත් වියස්කාන්ත් ක්‍රීඩකයාට සහ මිලාන් රත්නායක ක්‍රීඩකයාට ලැබෙන අවස්ථාව ඉතාම අඩුයි. විශේෂයෙන්ම අපි දකිනවා, මේ වනකොටත් පාකිස්තානයට ගිහින් තිබෙන ක්‍රිකට් කණ්ඩායම තුළ සිටින ක්‍රීඩකයන් ගත්තාම, ඒ සඳහා පළාත් දෙකක් තමයි කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ කියලා. ඒ, විශේෂයෙන්ම බස්නාහිර පළාත සහ දකුණු පළාත. නමුත්, උතුරු පළාතට අඩු සැලකිල්ලක් තිබෙන්නේ ඇයි? ඒ පිළිබඳව ක්‍රීඩා අමාත්‍යාංශය හරහා මොකක් හෝ මැදිහත්වීමක් සිදු වෙනවාද කියන ප්‍රශ්නය මම අහනවා.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩකයන් තෝරන්න ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වෙනම ක්‍රිකට් තේරීම් කමිටුවක් තිබෙනවා. ඒ තේරීම් කමිටුවෙන් තමයි ක්‍රීඩකයන් තෝරන්නේ. ඒ අය විවිධ පදනම් සැලකිල්ලට අරගෙන තමයි ක්‍රීඩකයන් තෝරන්නේ. එසේ තේරීමේදී, මම හිතන විධියට තේරීම් කමිටුව විසින් ජාතිකත්ව පදනම හෝ ප්‍රාදේශීය පදනම පාවිච්චි කරන්නේ නැහැ. ඔවුන් පාවිච්චි කරන්නේ ක්‍රීඩකයන්ගේ දක්ෂතාව. ගරු මන්ත්‍රීතුමා කියන ක්‍රීඩකයා ගැන සලකා බලන්න කියලා අපට තේරීම් කමිටුවට කියන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -2139/2026- (2), ගරු දිනේෂ් හේමන්ත මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ගම්මිරිස් නිෂ්පාදනය: පර්යේෂණ සහ ව්‍යාප්තිය
### மிளகு உற்பத்தி: ஆராய்ச்சியும் விஸ்தரிப்பும்
### PEPPER PRODUCTION: RESEARCH AND EXPANSION

2163/2026

**3. ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගම්මිරිස් නිෂ්පාදනයට ප්‍රධාන වශයෙන් දායක වන දිස්ත්‍රික්ක කවරේද;

(ii) මේ වනවිට මෙරට වගා කරනු ලබන ගම්මිරිස් ප්‍රභේද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ගම්මිරිස් වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පර්යේෂණ ආයතනයක් තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට ආරම්භ කර ඇති පර්යේෂණ කවරේද;

(iii) ගම්මිරිස් වගාව ව්‍යාප්ත කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மிளகு உற்பத்திக்குப் பிரதானமாகப் பங்களிப்புச் செய்யும் மாவட்டங்கள் யாவை என்பதையும்;

(ii) தற்போது உள்நாட்டில் பயிரிடப்படுகின்ற மிளகு வகைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மிளகுச் செய்கையின் உற்பத்தித்திறனை அதிகரிப்பதற்காக ஆராய்ச்சி நிறுவனமொன்று காணப்படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், தற்போது ஆரம்பிக்கப்பட்டுள்ள ஆராய்ச்சிகள் யாவை என்பதையும்;

(iii) மிளகுச் செய்கையை விஸ்தரிப்பதற்காக இன்றளவில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the districts which mainly contribute to pepper production; and

(ii) the varieties of pepper that are currently being cultivated in the country?

(b) Will he also inform this House -

(i) whether there is a research institute for the purpose of enhancing the productivity of pepper cultivation;

(ii) if so, the research that has been initiated so far; and

(iii) the measures that have been taken so far to expand pepper cultivation?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ගම්පහ, මහනුවර, මාතලේ, නුවරඑළිය, හම්බන්තොට, කුරුණෑගල, බදුල්ල, මොනරාගල, රත්නපුර සහ කෑගල්ල

(ii) දේශීය, පැනියූර් 1, දේශීය වරණයන්. ඩිංගි රාළ, කොහුකුඹුරේ රාළ, බූටැවේ රාළ විධියටත් මෙම ගම්මිරිස් ප්‍රභේද හඳුන්වනවා.

(ආ) (i) ඔව්.

(ii)
- ➢ ගම්මිරිස් ජාන දර්ශ ඇගැයීම් පිළිබඳ පර්යේෂණ
- ➢ ගම්මිරිස් රෝග හා පළිබෝධ කළමනාකරණය පිළිබඳ පර්යේෂණ
- ➢ ගම්මිරිස් භෝග සංවර්ධන පර්යේෂණ
- ➢ ශාක පෝෂණ කළමනාකරණය මඟින් ගම්මිරිස් වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම
- ➢ ශෂ්‍ය විද්‍යාත්මක අධ්‍යයනයන්
- ➢ පසු අස්වනු තාක්ෂණ හා අගය එකතු කිරීම
- ➢ කාලගුණ විපර්යාසයන් මඟින් සිදු වන බලපෑම් අවම කර ගැනීම සඳහා කරනු ලබන පර්යේෂණ

[ගරු නාමල් කරුණාරත්න මහතා]

(iii) a) ගම්මිරිස් නව වගාවක් ලෙස ආරම්භ කිරීම සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය නොමිලේ ලබා දීම හා ආයෝජන ආධාර ලබා දීම.

b) කුඩා පරිමාණ ගෙවතු වගා වැඩසටහන යටතේ නොමිලේ ගම්මිරිස් පැළ ලබා දීම.

c) ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ දැනුම, නොමිලේ පාළු පැළ හා ආයෝජන ආධාර ලබා දීම.

d) ගම්මිරිස් වගාවට කාලගුණයෙන් සිදු වන විපර්යාසවලට අනුහුරු කරවීම සඳහා සුදුසු ජලසම්පාදන ක්‍රම හඳුන්වා දීම.

e) පළිබෝධ/ සත්ව හානි වළක්වා ගැනීමේ උපාංග/ පද්ධති ලෙස විදුලි වැට/ ශබ්ද තරංග විහිදුම් යන්ත්‍ර/ දැල් වැට/ වායු තුවක්කු හෝ වෙනත් උපාංග පද්ධති සඳහා ආයෝජන ආධාර ලබා දීම.

f) ගම්මිරිස් වගාවේ රෝග හා පළිබෝධ පාලනය

g) ගම්මිරිස් නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සකස් කර ගැනීම සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හා යහපත් නිෂ්පාදන පිළිවෙත් අනුගමනය කිරීම.

h) ගම්මිරිස්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කර අගය එකතු කළ නිෂ්පාදන දිරිගැන්වීමට අවශ්‍ය පසු අස්වනු තාක්ෂණ ක්‍රියාවලිය සඳහා පසු අස්වනු තාක්ෂණ උපකරණ වෙනුවෙන් ආයෝජන ආධාර ලබා දීම.

i) ගම්මිරිස් නිෂ්පාදනයන් කාබනික නිෂ්පාදනයන් ලෙස විදේශීය වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම සඳහා වගාවන් කාබනික වගාවන් බවට පත් කිරීම හා කාබනික නිෂ්පාදන අළෙවිකරන හා සාධාරණ වෙළෙඳ ක්‍රමය පිළිබඳ සහතිකකරණය මෙන්ම කාබනික වගාවන්ට අදාළ අනෙකුත් සහතික ලබා ගැනීම සඳහා තාක්ෂණික උපදෙස් හා ආයෝජන ආධාර ලබා දීම.

j) රූපවාහිනී, ගුවන් විදුලි ඇතුළු වෙනත් සන්නිවේදන මාධ්‍ය ඔස්සේ සහ ගොවි සායන, ක්ෂේත්‍ර දින සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් ගම්මිරිස් වගාව පිළිබඳ දැනුම ලබා දීම.

k) ගම්මිරිස් නිෂ්පාදකයන්, අපනයනය සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් මෙන්ම සැපයුම්කරුවන් හා ගැනුම්කරුවන් සම්බන්ධ කර දීම.

l) අපනයන කෘෂි ගම්මාන පිහිටුවීම.

m) ගම්මිරිස් වගාව පිළිබඳ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගම්මිරිස් කියන්නේ මේ වන විට අපේ රටේ ඉතාම වැදගත් අපනයන කෘෂිකාර්මික වගාවක්. මම ජීවත් වන මොනරාගල දිස්ත්‍රික්කයේ වාර්ෂික ගම්මිරිස් නිෂ්පාදනය දැනට මෙට්‍රික් ටොන් 800ත්, 1,500ත් අතර ප්‍රමාණයක් වෙනවා.

මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ ගම්මිරිස් අස්වැන්න නෙළා ගැනීමෙන් පසුව අපනයනය කිරීමට පෙර අගය එකතු කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවාද කියලා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ඇත්තටම ඒ පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා. ගම්මිරිස් ඇතුළු අපනයන භෝග 16ක් තිබෙනවා. ඒ 16ම ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විධියට මේ වනකොට අපි විශාල වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ගම්මිරිස්වලට අදාළව ගත්තොත්, ගම්මිරිස් අමු ඇට ප්‍රමිතිකරණය, වියළි ඇට තෝරා බේරා ගැනීම, ගල් වැලි ඉවත් කිරීම, ඒ වාගේම ගම්මිරිස් කරලෙන් ඇට ඉවත් කිරීම, අස්වනු නෙළා ගැනීම යනාදි කටයුතු සඳහා - රුපියල් ලක්ෂ 20 දක්වා, නොමිලේ - අදාළ යන්ත්‍ර සූත්‍ර ගොවි ජනතාවට සහ ඊට අදාළ සංවිධානවලට ලබා දෙන වැඩ පිළිවෙළක් තිබෙනවා. ගම්මිරිස්වලට අගය එකතු කිරීමේ ක්‍රියාදාමයත් ඒ තුළ සිද්ධ වෙනවා. ගම්මිරිස් ඇට තමයි ගොඩක් වෙලාවට අපි අපනයනය කරන්නේ. එතැනින් එහාට තවත් අගය එකතු කරලා, ඊට වඩා වැඩි වටිනාකමක් සහිතව අපනයනය කරලා, ගම්මිරිස් අපනයන වෙළෙඳ පොළ අත්පත් කර ගන්න ඕනෑ කියන කාරණයත් එක්ක, ඊට අදාළ කටයුතුවලට අපි මේ වනකොට මැදිහත් වෙමින් සිටිනවා. ඒ වාගේම ගම්මිරිස් වගාව ප්‍රචලිත කිරීම සඳහා, ගොවි ජනතාවට පහසුකරණය සඳහා මේ වනකොට විශාල ආධාර ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු සිදු කරමින් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසයයි.

වාර්ෂික ගම්මිරිස් අස්වැන්න ඒකාකාර නොවන බවක් දැනට වගා කරන ප්‍රභේද පිළිබඳව සලකා බැලීමේදී නිරීක්ෂණය වෙනවා. ඒ අනුව මේ අභියෝගය ජයග්‍රහණය කරන්න පුළුවන් නව ප්‍රභේද හඳුනා ගැනීමේ අවශ්‍යතාවක් තිබෙන බවට යෝජනාවක් ගොවීන් අතර තිබෙනවා. වාර්ෂිකව අස්වැන්න ඒකාකාරව ලබා ගත හැකි නව ප්‍රභේද හඳුනා ගැනීම සඳහා පර්යේෂණ දියත් වන්නේද යන්න දැන ගන්න කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ඔව්. ඇත්තටම ඒ පිළිබඳව හොඳ පර්යේෂණ සිද්ධ වෙනවා. ගම්මිරිස් පර්යේෂණ ආයතනය විසින් විවිධ පර්යේෂණ කටයුතු මේ වනකොට සිදු කරනු ලබනවා. ඒ සමහර පර්යේෂණ කටයුතු පිළිබඳව මේ වනකොටත් සාධනීය දත්ත තොරතුරු අපට ලැබිලා තිබෙනවා. ගම්මිරිස් වගාවන්ට රෝග වැලඳුනාට පසුව ඒවා මර්දනය පිණිස ගොවීන්ට නොමිලයේ උදවු කරන, සියයට 50ක දායකත්වය යටතේ ආධාර දෙන, පාළු වන පැළවලට ආධාර දෙන, වෙනත් උපද්‍රව ආවොත් ඒවාට ආධාර දෙන, ගම්මිරිස් වගා කරන ගොවීන්ට නොමිලයේ පැළ ලබා දෙන සහ හෙක්ටෙයාර 20 දක්වා ගොවීන්ට ආධාර දෙන විශේෂ වැඩසටහන් තිබෙනවා. ඒ වෙනුවෙන් රජය සහ අමාත්‍යාංශය විශාල මුදල් ප්‍රමාණයක් වැය කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණය හරි.

උදාහරණයක් විධියට අපි අත් දකිනවා මෙන්න මේකත්. මාතලේ දිස්ත්‍රික්කයේ ගම්මිරිස් අස්වනු විශාල වශයෙන් අඩු වුණා; ගම්මිරිස් හැදෙන්නේම නැතිව ගියා. ඒ පිළිබඳව පරීක්ෂණ කරමින් තිබෙනවා. ඒ තත්ත්වයත් එක්ක, අඛණ්ඩව ගම්මිරිස් ඵලදාවක් ලබා ගැනීමට අදාළ අලුත් ප්‍රභේද පිළිබඳව මේ වන විට අවධානය යොමු වෙලා තිබෙනවා. ඊට අදාළ පර්යේෂණ මේ වනකොට ආරම්භ කරලා තිබෙනවා.

## රජයේ පාසල් ගුරු තනතුර: මූලික සුදුසුකම්
## அரச பாடசாலையில் ஆசிரியர் பதவி: அடிப்படைத் தகுதி
## POST OF TEACHER IN GOVERNMENT SCHOOL: BASIC QUALIFICATION

2192/2026

**4. ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අධ්‍යාපනවේදී උපාධියක් රජයේ පාසලක ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා මූලික සුදුසුකමක් ලෙස සලකනු ලබන්නේද;

(ii) එම උපාධි පාඨමාලාව සම්පූර්ණ කර මේ දක්වා ගුරු සේවයට බඳවාගෙන නොමැති රාජ්‍ය සහ පෞද්ගලික උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரச பாடசாலையொன்றில் ஆசிரியராக நியமனம் பெறுவதற்கான அடிப்படைத் தகைமையாகக் கல்விமாணிப் பட்டம் கருதப்படுகின்றதா என்பதையும்;

(ii) மேற்படி பட்டப்படிப்பை நிறைவு செய்தபோதும், இதுவரை ஆசிரியர் சேவைக்கு ஆட்சேர்க்கப்படாத அரச மற்றும் தனியார் பட்டதாரிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether a Bachelor of Education Degree is considered a basic qualification for obtaining an appointment as a teacher in a government school; and

(ii) separately, the number of graduates who have obtained the said degree from the State universities and private universities and have not been recruited to Teachers' Service so far?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.3.5 වගන්තිය අනුව අධ්‍යාපනවේදී උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් පමණක් පවත්වා ඉන් සමත් වන අයදුම්කරුවන් ගුරු සේවයේ 2-II ශ්‍රේණියට බඳවා ගත හැක.

(ii) රාජ්‍ය විශ්වවිද්‍යාල මෙන්ම රජයේ අනුමත උපාධි පිරිනමන ආයතන, විදේශීය විශ්වවිද්‍යාල අනුබද්ධිත පෞද්ගලික ආයතන, පාර්ලිමේන්තු පනත් මඟින් පිහිටුවා ඇති උසස් අධ්‍යාපන ආයතන යන ආයතන මඟින්ද අධ්‍යාපනවේදී උපාධි පිරිනමන අතර එම උපාධිධාරීන් සියල්ලන්ම ගුරු සේවය සඳහා අයදුම් කරනු නොලැබේ. ඒ අනුව ගුරු සේවයට බඳවාගෙන නොමැති උපාධිධාරීන් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය සතුව නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාගේ පිළිතුරෙහි සඳහන් වෙච්ච මූලික කාරණාවක් තමයි, ශ්‍රී ලංකා ගුරු සේවයේ පත්වීමක් ලබා ගැනීම සඳහා මූලික සුදුසුකමක් විධියට අධ්‍යාපනවේදී උපාධිය සලකනු ලබනවා කියන එක. අපේ රටේ රාජ්‍ය සහ පෞද්ගලික කියන අංශ දෙකෙන්ම අධ්‍යාපනවේදී උපාධිය පිරිනමනු ලබනවා. කෙසේ වෙතත්, අධ්‍යාපනවේදී උපාධිය පිරිනමනු ලබන ආයතනවල ස්වභාවය - රාජ්‍ය සහ පෞද්ගලික කියන ආයතනවල ස්වභාවය - මේ උපාධි පාඨමාලාවේ අධ්‍යයන අන්තර්ගතය සහ කාල සීමාව වාගේ කාරණා මත අධ්‍යාපනවේදී උපාධියේ ස්වභාවය සහ ගුණාත්මකභාවය පිළිබඳ යම් සාකච්ඡාවක් සමාජය තුළ මතු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ, රජය විධියට ඔබතුමන්ලා අධ්‍යාපනවේදී උපාධිය පිරිනමනු ලබන ආයතන සහ අධ්‍යාපනවේදී උපාධියේ ගුණාත්මකභාවය පිළිබඳව නියාමනය කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරනවාද සහ ඒ සඳහා ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවාද කියන එකයි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා වැදගත් ප්‍රශ්නයක් ඇහුවේ. විශේෂයෙන් මෙය - අධ්‍යාපනවේදී උපාධිය සම්බන්ධයෙන් - ටික කාලයක් තිස්සේ සාකච්ඡා වෙච්ච ගැටලුවක්. මුලින්ම කතිකාවකුත් ආවා, සමහර විශ්වවිද්‍යාලවල මෙම ඉගැන්වීම් කටයුතු මාර්ගගත ක්‍රමයට පමණක් සිද්ධ වෙනවා කියලා. එම නිසා මේ සම්බන්ධයෙන් සොයා බලන්න කමිටුවක්

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

පත් කරලා තිබුණා. ඒ කමිටුවේ නිර්දේශ ලැබිලා පසුව ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළා. ඒ කමිටුවෙන් ලබා දුන් ඉතාම පැහැදිලි වාර්තාවක් තිබෙනවා. එහි නිරීක්ෂණ කිහිපයක් තිබෙනවා. ඒවායෙන් එකක් දෙකක් මම ඔබතුමාට ඉදිරිපත් කරන්න කැමැතියි.

සමහර විශ්වවිද්‍යාලවල මාර්ගගත ක්‍රමයට ඉගැන්වෙන බව, සමහර විශ්වවිද්‍යාලවල ඇතැම් විෂයය ඒකක ගැළපෙන විෂයය ඒකක නොවන බව යනාදිය ඇතුළත් සවිස්තර වාර්තාවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කර තිබෙනවා. මම ඒවාත් ඔබතුමාට සඳහන් කරන්නම්. මේ නිර්දේශ අතිශයින්ම වැදගත්. එකක් තමයි, රටේ අනාගතයට පදනම් වන පාසල් පද්ධතියට ගුණාත්මකභාවයෙන් යුතු, සුදුසුකම් සහිත ගුරුවරයෙකු ඇතුළත් වීම අත්‍යවශ්‍ය ලෙස සලකන බැවින් ගුරු සේවා ව්‍යවස්ථාවේ පවතින අධ්‍යාපනවේදී උපාධිය හා "අධ්‍යාපනවේදී උපාධිධාරින්" යන්නෙහි නිර්වචනය කාලානුරූපව සාධනීය ලෙස වෙනස් විය යුතු බව. දෙවැනි එක, විශේෂ කාරණාවක්. "අධ්‍යාපනවේදී උපාධිධාරියා" යන්න නිර්වචනය කිරීමේදී උපාධිවල ගුණාත්මකභාවය මැන බැලිය හැකි සම්මත කරන දර්ශක හා නිර්ණායක ඇතුළත් කිරීමට නිර්දේශ තිබෙනවා. තුන්වැනි කාරණාව මේකයි. විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් මෙහි නිර්දේශ කිහිපයක් තිබෙනවා. මේවා වැදගත්. ඒවා තමයි, එම උපාධිය විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති හෝ වෙනත් පාර්ලිමේන්තු පනත් මඟින් පිහිටුවා ඇති උපාධි පිරිනමන ආයතන මඟින් ලබා දෙන උපාධියක් වීම, වසර හතරක පූර්ණ කාලීන මාර්ගගත නොවන උපාධියක් වීම, ඒ වාගේම credits සංඛ්‍යාව 120ක් වීම සහ රජයේ හෝ පළාත් පාසලක අවම වශයෙන් සති 10ක ප්‍රායෝගික ගුරු පුහුණුව, උපාධි පාඨමාලාව තුළ අවම වශයෙන් credits 6ක මොඩියුලයක්, පර්යේෂණ නිබන්ධයක්. මේ කියන කාරණා සම්පූර්ණ විය යුතුයි රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලයක මේ උපාධිය පිරිනමනවා නම්. ගුණාත්මකභාවය ලබා දීම සඳහා තමයි මේ කමිටු වාර්තාවේ එසේ සඳහන්ව තිබෙන්නේ. මේ ක්‍රමය තුළ අපට සාධනීය, ගුණාත්මකභාවයෙන් යුතු පිරිසක් අධ්‍යාපන පද්ධතියට එකතු කර ගැනීමේ හැකියාව ලැබෙනවා කියලා අපි විශ්වාස කරනවා.

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සංවර්ධනය සහ එය පවත්වාගෙන යාම සඳහා අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා සහ ඒ ආයතන සම්බන්ධව ගනු ලබන ඒ ක්‍රියාමාර්ග සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කරන ලද උපාධිධාරින් සැලකිය යුතු ප්‍රමාණයක් මේ වනවිට රජයේ පාසලක ගුරු පත්වීමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන්, ශ්‍රී ලංකා ගුරු සේවයට ඇතුළත් වීමේ අපේක්ෂාවෙන් පසු වෙනවා.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ වන විට විසිතුන්දහසකට අධික ගුරු පත්වීම් සංඛ්‍යාවක් ලබා දීම සඳහා කටයුතු කරමින් තිබෙනවා. ගුරු පත්වීම් ලබා දීමේ ක්‍රමවේදය යටතේ අධ්‍යාපනවේදී උපාධිධාරින් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා රජය පැත්තෙන් ගෙන තිබෙන ක්‍රියාමාර්ග සහ ඒ සඳහා ගනු ලබන පියවර මොනවාද කියලා දැන ගැනීමට මම කැමැතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, මුලින්ම මේ සම්බන්ධයෙන් සංඛ්‍යාව නිර්ණය කළ යුතුයි. ඒ සඳහා පළාත්වලට දැන් නිර්දේශ ලැබිලා තිබෙනවා. පළාත් මට්ටමින් දැන් ඒ සංඛ්‍යාව කැඳවමින් පවතිනවා. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඒ සංඛ්‍යාව සම්බන්ධයෙන් පළාත් මට්ටමින් තොරතුරු දැනුම් දීමක් කර තිබෙනවා. අපි මේ වන විට ඒ සඳහා අවසර ගැනීමක් කරමින් පවතිනවා.

දෙවැනි කාරණාව, මම කලින් කිව්වා වාගේ මේ සම්බන්ධයෙන් නිර්දේශ මත තිබෙනවා. ගුරු සේවා ව්‍යවස්ථාවේ නිශ්චිතවම වෙනස්වීමක් සිද්ධ වෙනවා. ඒ සම්බන්ධයෙන් ගැසට් පත්‍රය ඉදිරියේදී නිකුත් වෙයි. එතකොට කාරණා දෙකයි. තුන්වැනි කාරණාව, මේ බඳවා ගැනීම් සිද්ධ වෙන්නේ කොහොමද කියන එක. බඳවා ගැනීම් සිද්ධ වෙන්නේ ඉදිරියේදී. නොවැම්බර් මාසය වන විට උපාධිධාරින් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණත් එක්කම බඳවා ගන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, තවත් කාරණාවක් කියන්න ඕනෑ. මෙතෙක් පුරප්පාඩු 23,000ක් විතර තිබෙනවා. ඉන් එහා තමයි මේ පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම් කරන්නේ. මේක ඇතුළත නොවෙයි. ඒ නිසා මේ කාරණා හතර ඔස්සේ අපි නිශ්චිත ක්‍රියාදාමය තීරණය කරලා ඉවරයි. අපේ නිශ්චිත බඳවා ගැනීමේ හැකියාව මේ මොහොතේදී තිබෙනවා. ඒක අපි කරනවා.

## ග්‍රාම නිලධාරි සේවය: පුරප්පාඩු සහ ගැටලු
## கிராம உத்தியோகத்தர் சேவை: வெற்றிடங்களும் சிக்கல்களும்
## GRAMA NILADHARI SERVICE: VACANCIES AND ISSUES

2197/2026

**5. ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ග්‍රාම නිලධාරි සේවය සඳහා අනුමත නිලධාරි සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට සේවයේ නියුතු නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) ග්‍රාම නිලධාරි සේවා ව්‍යවස්ථාව, වැටුප් විෂමතා, බඳවාගැනීමේ පටිපාටිය, උසස්වීම් සහ අනෙකුත් දීමනා සම්බන්ධයෙන් මතුව ඇති ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிராம உத்தியோகத்தர் சேவைக்காக அங்கீகரிக்கப்பட்ட உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) தற்போது சேவையில் ஈடுபட்டுள்ள உத்தியோகத்தர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி சேவையில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) கிராம உத்தியோகத்தர் சேவைப்பிரமாணம், சம்பள முரண்பாடுகள், ஆட்சேர்ப்பு நடைமுறை, பதவி உயர்வுகள் மற்றும் ஏனைய கொடுப்பனவுகள் தொடர்பில் ஏற்பட்டுள்ள பிரச்சினைகளைத் தீர்ப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House the -

(a) approved cadre of the Grama Niladhari Service;

(ii) number of Grama Niladhari officers currently in active service;

(iii) number of existing vacancies in the Grama Niladhari Service;

(iv) measures that will be taken to fill the said vacancies; and

(v) measures that will be taken to address the issues relating to the Service Minute of the Grama Niladhari Service, salary anomalies, recruitment procedure, promotions and other allowances?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 14,022යි.

(ii) 13,299යි.

(2026.10.08 සහ 2026.10.09 දිනයන්හි ලබා දුන් මුළු පත්වීම් 1551න් පසු එම පුහුණු පත්වීම්ලාභීන් ද ඇතුළුව)

(iii) 2026.06.30 දිනට පැවති ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාව - 2274කි.

2026.10.08 දින පත්වීම් ලබා දෙනු ලැබූ පුහුණු පත්වීම්ලාභීන් සංඛ්‍යාව -1540කි.

වෙන්ගලචෙට්ටිකුලම් සහ මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අයදුම්කරුවන් දෙදෙනෙකුගේ මූලික අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් උපදෙස් ලබා ගත යුතුව තිබූ අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණයෙන් පසු 2026.10.09 දින ලබා දුන් පුහුණු පත්වීම් සංඛ්‍යාව 11කි.

ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම; 2025 -2026දී තමයි බඳවා ගත්තේ- මහින් බඳවා ගනු ලැබූ මුළු පුහුණු පත්වීම්ලාභීන් සංඛ්‍යාව 1551කි.

ඒ අනුව තවදුරටත් පවතින පුරප්පාඩු සංඛ්‍යාව 723කි.

(iv) ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ විභාගයක් පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා සකස් කරන ලද අය වැය යෝජනාවක් 2027 වර්ෂයේ අය වැය සඳහා ඉදිරිපත් කර ඇති අතර, දැනට පවතින පුරප්පාඩු 723ක පමණ ප්‍රමාණය සහ ඒ වන විට ඇති වන පුරප්පාඩු ප්‍රමාණය එමඟින් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

(v) 2025.10.15 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථාවට තවදුරටත් ඉදිරිපත් කරනු ලබන සංශෝධන හෝ යෝජනා, දැනට ස්ථාපිත කර ඇති වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ඇත. ග්‍රාම නිලධාරීන්ගේ ගමන් වියදම් දීමනාව ඉහළ නැංවීමට අමාත්‍යාංශය විසින් 2027 වර්ෂයේ අය වැය සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ග්‍රාම නිලධාරි කියන්නේ, ගමක තමාට අයත් කොට්ඨාසය තුළ ජනතාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ක්‍රියාත්මක කළ යුතු නිලධාරි මහත්මයෙක්. ග්‍රාම නිලධාරීන්ගේ ගමන් වියදම් දීමනා ලබා දීම සම්බන්ධව අමාත්‍යාංශය විසින් 2027 අය වැය සඳහා නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවාය කියලා ඔබතුමා කිව්වාට එය කොයි ආකාරයෙන් ද, කොයි ප්‍රමාණයෙන් ද කියන එක පැහැදිලි කළේ නැහැ. එම නිසා මම දැනට තිබෙන තත්ත්වය පැහැදිලි කරන්නම්.

ග්‍රාම නිලධාරිවරයෙකුට ගමන් වියදම් දීමනාව වශයෙන් දෙන්නේ රුපියල් 600යි. එතකොට අද තිබෙන තත්ත්වය හැටියට ග්‍රාම නිලධාරිවරයෙකු බයිසිකලයක ගියොත් රුපියල් 600ට පෙට්‍රල් ලීටර් 2ක් ගහන්න බැහැ නේ. ඒ, මාසයකට දෙන මුදල. එම මුදල ප්‍රමාණවත් නැති නිසා ඔවුන් දිගින් දිගටම ඒ සම්බන්ධයෙන් ඉල්ලීම් කරලා තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමනි, මේ අයගේ ගමන් වියදම් දීමනාව සඳහා මේ අය වැයටවත් පැහැදිලි යෝජනාවක් ඉදිරිපත් කරනවා ද, එය කොපමණ ප්‍රමාණයක් ද කියලා සඳහන් කරන්න පුළුවන් ද? ගමන් වියදම් දීමනාව සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන්ගේ ඉල්ලීම වන්නේ, අඩු ගණනේ රුපියල් 3,000ක්වත් දෙන්න කියන එකයි.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම දැනට ඔවුන්ට කාර්යාල දීමනාව සඳහා ගෙවන්නේ රුපියල් 2,000යි. මම හිතන විධියට, ඉතා ග්‍රාමීය ප්‍රදේශයක වුණත් රුපියල් 2,000ට කාර්යාලයක් දමා ගන්න පුළුවන් තත්ත්වයක් නැහැ. මොකද, දැන් සිටින ගොඩක් ග්‍රාම නිලධාරීන් ගමේම අය නොවෙයි. විභාග ක්‍රමයට අනුව පත් කළාම වෙනත් වෙනත් ප්‍රදේශවල අය තමයි ග්‍රාම නිලධාරීන් හැටියට පත් වෙලා තිබෙන්නේ. ඉතින්, මේ අයගේ කාර්යාල දීමනාව සඳහා ගන්නා පියවර මොකක්ද කියලාත් මම අහනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කළ මුල් කාරණය නිවැරදියි. ගමන් වියදම් දීමනාව හැටියට ලබා දෙන්නේ රුපියල් 600ක් තමයි. ග්‍රාම නිලධාරිවරුන්ගෙන් ලැබෙන තොරතුරු අනුව අවුරුදු 15කට වඩා වැඩි කාලයක් තිස්සේ රුපියල් 600 තමයි දීලා තිබෙන්නේ. පසුගිය රජයන් විසින් එම දීමනාව වැඩි කරන්න පියවර අරගෙන තිබුණේ නැහැ. ගමන් වියදම් දීමනාව සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙන බව අපි දකිනවා. හැබැයි, එම රුපියල් 600 ගෙවන්නේ තමන්ගේ වසම තුළ ගමන් යෑම සඳහායි. වසමෙන් පිට යනවා නම් තව රුපියල් 1,000ක් ගෙවනවා. එතුමා විමසීමක් කළා, ඒ සඳහා අය වැයෙන් වැඩි වන ප්‍රමාණය ගැන. අය වැයෙන් වැඩි වන ප්‍රමාණය අය වැය යෝජනාවෙන්ම තමයි ඉදිරිපත් කරන්න වෙන්නේ. එය අපට මේ වෙලාවේ කියන්න පුළුවන්කමක් නැහැ. එතුමා දාපු සීමාවෙන් ග්‍රාම නිලධාරිවරුන්ට අගතියක් වනවා ද කියලාත් මට හිතෙනවා. නමුත්, එම සීමාවට අපත් බොහොම සතුටුයි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු ඇමතිතුමනි, ඒ සීමාව මම දමපු එකක් නොවෙයි. ඒ, ග්‍රාම නිලධාරින් ඉල්ලපු ගණන. අඩුම ගණනේ රුපියල් 3,000ක්වත් ඕනෑ කියන එකයි ඔවුන්ගේ ඉල්ලීම. මොකද, රුපියල් 600ක් නේ දැන් දෙන්නේ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. සේවා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී කාර්යාල සහ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස ප්‍රතිපත්තිමය වශයෙන් ග්‍රාම නිලධාරින්ගේ ඊට අදාළ අනුරූපික වැටුප් තලය වන MN-5 වැටුප් තලයට අනුරූපව වැටුප් ඉහළ දමනවා ද? ඒ වාගේම සේවා ව්‍යවස්ථාව පිළිබඳ කාරණයේ වර්තමාන තත්ත්වය කොහොමද කියන එකත් පැහැදිලි කර ගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, අපි සේවා ව්‍යවස්ථාව 2025 ඔක්තෝබර් 15වන දින සිට ක්‍රියාත්මක කිරීම ආරම්භ කළා. සමහර ග්‍රාම නිලධාරි වෘත්තීය සමිති මේ සේවා ව්‍යවස්ථාව පිළිබඳව යම් යම් එකඟතා පළ කරලා තිබුණා. ඒ වාගේම එකඟ නොවන කාරණාත් තිබුණා. එකඟ නොවන කාරණා සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරින්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ කටයුතු සඳහා අපි එම කොමිෂන් සභාව ස්ථාපිත කර තිබෙනවා. මේ සේවා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා පවත්වලා තමයි මේ ඉදිරිපත් කිරීම කරනු ලැබුවේ. ඒ නිසා අපි හිතනවා මෙහි සාධනීය කරුණු විශාල ප්‍රමාණයක් තිබෙනවා කියලා. නමුත්, යම් අදහසක්, යෝජනාවක් තිබෙනවා නම් ඒවාත් සැලකිල්ලට අරගෙන අදාළ සංශෝධන කිරීම සඳහා අපි කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -2207/2026- (1) ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ) තනතුර: 2010-2026 කාලසීමාව තුළ බඳවා ගැනීම්
### சுகாதார சிற்றூழியர்கள் (கனிஷ்ட) பதவி: 2010-2026 வரைஆட்சேர்ப்பு
### POST OF HEALTH SERVICE AID (JUNIOR): RECRUITMENTS DURING 2010-2026

2231/2026

**7. ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ මේ වනවිට සේවය කරනු ලබන සෞඛ්‍ය කනිෂ්ඨ කාර්ය සහායකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2010 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා කාලය තුළ එම තනතුර සඳහා බඳවා ගත් සංඛ්‍යාව වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලසීමාව තුළ වැඩිම සෞඛ්‍ය කනිෂ්ඨ කාර්ය සහායකයින් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබූ වර්ෂ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2026 වර්ෂයේ සෞඛ්‍ය කනිෂ්ඨ කාර්ය සහායකයින් බඳවා ගැනීම සඳහා නිකුත් කරන ලද ගැසට් නිවේදනයට පොළොන්නරුව සහ බදුල්ල දිස්ත්‍රික්ක ඇතුළත් නොකිරීමට හේතු කවරේද;

(ii) ඒ හේතුවෙන් ඉහත සඳහන් දිස්ත්‍රික්ක දෙකට අසාධාරණයක් සිදුව ඇති බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுகாதார அமைச்சில் தற்போது சேவையாற்றி வருகின்ற சுகாதார கனிஷ்ட சிற்றூழியர்களின் எண்ணிக்கை யாது;

(ii) 2010ஆம் ஆண்டு முதல் 2026ஆம் ஆண்டு வரையான காலப்பகுதிக்குள் மேற்படி பதவிக்கு ஆட்சேர்ப்புச் செய்யப்பட்டுள்ள எண்ணிக்கை ஆண்டு வாரியாக வெவ்வேறாக யாது;

(iii) மேற்படி காலப்பகுதியில் மிக அதிகமாக சுகாதார கனிஷ்ட சிற்றூழியர்கள் ஆட்சேர்ப்புச் செய்யப் பட்டுள்ள ஆண்டுகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2026ஆம் ஆண்டு சுகாதார கனிஷ்ட சிற்றூழி யர்களை ஆட்சேர்ப்புச் செய்வதற்காக வெளியிடப்பட்ட வர்த்தமானி அறிவித்தலில் பொலன்னறுவை மற்றும் பதுளை மாவட்டங்கள் உள்ளீர்க்கப்படாமைக்கான காரணங்கள் யாவை;

(ii) அதன் காரணமாக மேற்படி இரண்டு மாவட்டங் களுக்கும் அநீதி இழைக்கப்பட்டுள்ளது என்பதை அவர் ஏற்றுக்கொள்வாரா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of personnel in the post of Health Service Aid (Junior) currently serving in the Ministry of Health;

(ii) number of persons recruited to the said post from 2010 to 2026, separately by each year; and

(iii) years in which the highest number of personnel were recruited to the post of Health Service Aid (Junior) during the said period?

(b) Will he also inform this House -

(i) the reasons for the exclusion of the Polonnaruwa and Badulla Districts from the Gazette Notification issued in 2026 calling for applications for the recruitment of Health Service Aid (Junior); and

(ii) whether he accepts that, as a result, the aforesaid two districts have been subjected to unequal treatment?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) බඳවා ගැනීම් ආරම්භයේදී පැවති දත්ත අනුව, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා ආයතනවල සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ) සේවකයන් 10,932ක් හා සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) සේවකයන් 11,583ක් අනුමතව පැවති අතර, සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ) සේවකයන් 10,845ක් හා සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) සේවකයන් 8,843ක් සේවය කර ඇත.

ඒ අතරින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තුළ 2026.08.18 දින වන විට සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ) සේවකයන් 157ක් හා සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) සේවකයන් 151ක් සේවය කරනු ලබයි.

(ii)

| වර්ෂය | ප්‍රමාණය |
|---|---|
| 2010 | බඳවාගෙන නැත. |
| 2011 | බඳවාගෙන නැත. |
| 2012 | ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක නිලධරයන් සඳහා 2012.03.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් ලබා දී ඇති අතර නිවැරදි තොරතුරු ලබාගත හැකි ලේඛන නොමැත. |
| 2013 | බඳවාගෙන නැත. |
| 2014 | ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක නිලධරයන් සඳහා 2014.10.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් ලබා දී ඇති අතර නිවැරදි තොරතුරු ලබාගත හැකි ලේඛන නොමැත. |
| 2015 | ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් 2,254ක් ලබා දී ඇත. |
| 2016 | බඳවාගෙන නැත. |
| 2017 | ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් 4,204ක් ලබා දී ඇත. |
| 2018 | ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක නිලධරයන් 558ක් සඳහා 2012.03.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් ලබා දී ඇත. |
| 2019 | ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක නිලධරයන් සඳහා 2019.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් ලබා දී ඇති අතර නිවැරදි තොරතුරු ලබාගත හැකි ලේඛන නොමැත. |
| 2020 | බඳවාගෙන නැත. |
| 2021 | ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක නිලධරයන් සඳහා 2021.06.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් ලබා දී ඇති අතර නිවැරදි තොරතුරු ලබාගත හැකි ලේඛන නොමැත. |
| 2022 | බඳවාගෙන නැත. |
| 2023<br>2024 | බහුකාර්ය නිලධරයන් සඳහා අදියර 6ක් යටතේ සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් 3,290ක් ලබා දී ඇත. |
| 2025 | බඳවාගෙන නැත. |
| 2026 | සෞඛ්‍ය කාර්ය සහායක තනතුරු 1,989ක් බඳවා ගැනීමට අනුමතව ඇති අතර 2026.10.11 දින වන විට අදියර 4ක් යටතේ 1,989ක් සඳහා පත්වීම් ලබා දී ඇත. |

(iii) මම මීට කලිනුත් කිව්වා, වැඩියෙන් බඳවා ගැනීම් කළේ කවදාද කියලා.

2025 වර්ෂයේදී අදියර දෙකක් මඟින් සෞඛ්‍ය කාර්ය සහායක (කනිෂ්ඨ) තනතුරු 1,989ක් අනුමත වූ අතර, 2026.10.11 දින වන විට 1,989ක් සඳහා පත්වීම් ප්‍රදානය කර ඇත.

මීට අමතරව 2015 වර්ෂය තුළ ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් 2,254ක් ද, 2017 වර්ෂය තුළ ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් 4,204ක් ද ලබා දී ඇත.

(ආ) (i) 2015-2018 කාලයේ ආදේශක සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් ලබා දීමේදී අතිවිශාල ප්‍රමාණයක් පොළොන්නරුව, බදුල්ල, මාතර, කළුතර, රත්නපුර වාගේ දිස්ත්‍රික්කවලින් තමයි ලබා දීලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඒ පිළිබඳව දන්නවා. මේ බොහෝදෙනෙක් සේවය කරන්නේ කොළඹ සහ ඊට තදාසන්න රෝහල්වල. මේ අයගේ ඉල්ලීම් පවතින්නේත් තමන්ගේ දිස්ත්‍රික්කවලට යන්න ඕනෑය කියන එක. වසර 10කට වැඩි කාලයක් තිස්සේ මෙම සේවකයින්හට ගම්බිම් කරා යෑමට අවස්ථාව නොලැබීම මත විවිධ සමාජයීය හා පවුල් අර්බුදවලට ඔවුන් මුහුණ දී සිටිනවා. ඒ නිසා ඔවුන්ට තමන්ගේ ගම්බිම්වලට ස්ථාන මාරු වී යෑමට අවස්ථාව ලබා දීම සඳහා මෙලෙස

පොළොන්නරුව, බදුල්ල වැනි දිස්ත්‍රික්කයන්හි රෝහල්වල පැවති පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සිදු නොකර ස්ථාන මාරු මඟින් එම පුරප්පාඩු පිරවීමට අප තීරණය කරන ලදී.

ගරු කථානායකතුමනි, මෙවර මේ 1,989දෙනා මධ්‍යම ආණ්ඩුවේ රෝහල්වලට බඳවා ගැනීමේදී අපි අනුගමනය කරපු ක්‍රමවේදය තමයි, කිසිදු දේශපාලන මැදිහත්වීමකින් තොරව එය සිදු කිරීම. අපි ඉස්සෙල්ලා බැලුවා, මේ රෝහල්වල කොතරම් පුරප්පාඩු ප්‍රමාණයක් පවතිනවාද, ඒ වාගේම ස්ථාන මාරු කොච්චර ඉල්ලා තිබෙනවාද කියන එක. ඒ ස්ථාන මාරු හැකි තරම් ලබා දීලා ඉතිරි වන පුරප්පාඩුවලට තමයි අපි මේ බඳවා ගැනීම් කළේ.

(ii) පසුගිය 2015, 2018 වැනි වර්ෂයන්හිදී පොළොන්නරුව, බදුල්ල වැනි දිස්ත්‍රික්කවලින් අසාමාන්‍ය ලෙස ආදේශක සෞඛ්‍ය කාර්ය සහායකයින් කොළඹ හා අවට රෝහල් වෙත බඳවා ගෙන තිබීම මත අද වන විට ද පොළොන්නරුව දිස්ත්‍රික්කය වෙත ස්ථාන මාරු වී යෑමට සෞඛ්‍ය කාර්ය සහායකයින් 959දෙනෙකුත්, බදුල්ල සඳහා 218දෙනෙකුත් අපේක්ෂාවෙන් සිටිනවා. පසුගිය කාලය තුළදී කොළඹ හා අවට රෝහල් වෙත මෙම දිස්ත්‍රික්කයන්හි පදිංචි පුද්ගලයින්හට පමණක් පත්වීම් ලබා දීම තුළ ලංකාවේ අනෙකුත් සියලු ම දිස්ත්‍රික්කවල ජනතාවට යම් අසාධාරණයක් වෙලා තිබුණා. අපි දැන් ඒක නිවැරදි කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, අපි මේ පත්වීම් 1,989 ලබා දීමේදී දැනට 1,000කට පමණ ස්ථාන මාරුවීම් ලබා දීලා තිබෙනවා. මේක වැදගත් දෙයක්. ඇත්තටම දුර ඉඳන් ඇවිල්ලා කොළඹ වාගේ ප්‍රදේශවල සේවය කිරීමේදී ඔවුන්ට විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වුණා. ඒ නිසා අපි ඉතාම සාධාරණ ක්‍රමවේදයක් යටතේ ඔවුන් සේවය කරපු වසර ගණන දිහා බලා අනුපිළිවෙළට ස්ථාන මාරුවීම් ලබා දෙනවා. ඒ අනුව අපි එම පුරප්පාඩු පුරවනවා. අපට මෙවර හතර වාරයක් බඳවා ගන්න සිදු වුණේ, අපි 1,989ක් බඳවා ගන්නකොට අවසාන වශයෙන් ගත්තාම, 450ක් පමණ පත්වීම ලබා නොගැනීම නිසායි. ඒ අයටත් දැන් පත්වීම් ලබා දීලා තිබෙනවා. ඊටත් අමතරව, දැන් අපි උපස්ථායක තනතුර සඳහා තවත් දහසක් පුහුණු කරගෙන යනවා. ඒ ඇති වෙච්ච පුරප්පාඩුවලට ලබන ජනවාරි හෝ පෙබරවාරි වනකොට තවත් සෞඛ්‍ය කාර්ය සහායකයින් 1,100ක් බඳවා ගැනීමට කටයුතු කරනවා, රෝහල්වල පවතින පුරප්පාඩු පිළිබඳව සලකා බලා සහ ඒ ස්ථාන මාරු කටයුතුද ක්‍රියාත්මක කරමින්.

(ඇ) පැන නොනඟී.

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

මගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අපි මහජන දිනයක් පැවැත්වුවොත්, ඒ මහජන දිනයට 100ක් ආවොත්, පොළොන්නරුව දිස්ත්‍රික්කය වාගේ දිස්ත්‍රික්කයකින් ඒ එන 40කට ආසන්න පිරිසක් එන්නේ මෙන්න මේ ප්‍රශ්නය මූලික කරගෙන. ගරු ඇමතිතුමනි, ඊයේ පැවති මහජන දිනයේදී එක සේවකයෙක් ආවා. ඔහු වසර 15කට වැඩි කාලයක් ඔහුගේ සේවා ස්ථානයේ සේවය කරපු කෙනෙක්. අවස්ථා කිහිපයකදී ඔහුගේ නම ස්ථාන මාරුවීම් ලේඛනවල තිබුණත්, අද වනතුරු ඔහුට ඒ ස්ථාන මාරුව ලැබිලා නැහැ. පසුව මම ඔහුගෙන් ප්‍රශ්න කළා, එහෙම වුණේ ඇයි කියලා. ඒ වෙලාවේදී ඔහුගේ පැත්තෙන් කියැවුණු දේ තමයි, පසුගිය කාලයේ ඒ වෘත්තීය සමිති නායකයින් විසින් සමහර විට රුපියල් ලක්ෂ දෙක, තුන වාගේ මුදල් අය කරගෙන අර ශ්‍රේණිගත කරපු, නැත්නම් සේවා කාලය අනුව ස්ථාන මාරුවීම දෙන්න ඕනෑකම තිබුණු අයට එය ලබා නොදී, ඊට පහළින් හිටපු අය ඒ ලැයිස්තුවේ ඉහළට අරගෙන ස්ථාන මාරුවීම් ලබා දීලා තිබෙනවා කියන කාරණය. මම හිතන විධියට, ඒක රාජ්‍ය ක්‍රියාකාරිත්වය ඇතුළේ, නැත්නම් මේ වාගේ පරිපාලන ක්‍රියාවලියකදී, ස්ථාන මාරුවීම් ලබා දීමකදී නොවිය යුතු සිද්ධියක්. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි, ඒ සඳහා වර්තමානයේ ගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, පොළොන්නරුවේ තිබෙන මේ ප්‍රශ්නය විසඳන්න නම්, තව වාර දෙකක්වත් බඳවා ගැනීම් කරන්න වනවා. අපි දෙවන වාරයේ 1,100ක් බඳවා ගන්නකොට තව කොටසකට පොළොන්නරුවට ස්ථාන මාරු ලබා දෙන්නම්. මම කිව්වා වාගේ 900කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා, ගරු මන්ත්‍රීතුමනි. ඒගොල්ලන් එකවර යවන්න අපට බැහැ. බඳවා ගැනීම් කරන ප්‍රමාණය අනුව යවන්නම්. මොකද, අපි බඳවා ගන්නේ මධ්‍යම ආණ්ඩුවේ රෝහල්වලට. පොළොන්නරුවේ තිබෙන්නේ, දිස්ත්‍රික් මහ රෝහල, එහෙම නැත්නම් වකුගඩු රෝග ආශ්‍රිතව ප්‍රතිකාර කරන රෝහල. ඒ රෝහල් දෙකට නේ යවන්න වෙන්නේ. පළාත් සභා රෝහලට යවන්න බැහැ නේ. ඒ නිසා ක්‍රමානුකූලව ඒ කටයුතු කරන්න ඕනෑ. ඔය ආකාරයෙන් බඳවා ගත් අයගෙන් ප්‍රශ්න ඉතිරි වෙලා තිබෙන්නේ පළමුවෙන්ම පොළොන්නරුවේ, අංක දෙකට බදුල්ලේ. ඒවාත් අපි නිරාකරණය කරගෙන යනවා. බඳවා ගන්නා ප්‍රමාණයට ස්ථාන මාරුවලට ප්‍රමුඛතාව ලබා දෙමින් යනවා. ඒ නිසා කාටවත් කිසි අසාධාරණයක් වන්නේ නැහැ. හැමදෙනාටම තව වාරයක් දෙකක් ඉවසාගෙන ඉන්න වනවා.

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

ගරු ඇමතිතුමනි, මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමාට මම යොමු කරපු ප්‍රශ්නවලට අදාළව ඔබතුමාගෙන් අවස්ථා දෙක තුනකදී කියැවුණා, ඒ බඳවා ගත් ප්‍රමාණය පිළිබඳව නිශ්චිත අදහසක් නැහැ වාගේ, ඒ වාගේම ඔවුන්ට වෙච්ච දේ මොකක්ද කියන එක පිළිබඳවත් නිශ්චිත අදහසක් නැහැ වාගේ දෙයක්. ඒ නිසා ඒ තත්ත්වය ඇති වුණේ කොහොමද, ඔවුන් මොන පදනම මත බඳවා ගත්තාද, ඊට අදාළ ලේඛන අස්ථානගත වුණේ කොහොමද කියන කාරණාවලටත් මම ඔබතුමාගෙන් පිළිතුරු දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඒ කාලයේ බඳවා ගත් අය අතරින් සමහර අය පළාත් සභාවලටත් යොමු කර තිබුණා. විවිධාකාරයේ බඳවා ගැනීම් තමයි කරලා තිබෙන්නේ. නිසි අධ්‍යාපන සුදුසුකම් අනුව නොවෙයි බඳවා ගෙන තිබෙන්නේ. ඔවුන් ස්ථිර කරන්න ගියාට පස්සේ අපට තව ප්‍රශ්න පැන නැඟිලා තිබෙනවා. කාලයක් තිස්සේ ඒ අය බඳවා ගෙන, ස්ථිර නොකර තාවකාලික පදනමින් සේවයේ යොදවාගෙනත් තිබෙනවා. අන්න ඒ ප්‍රශ්නය තමයි නිරාකරණය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඇත්තටම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය කාර්ය සහායක පත්වීම් කියන්නේ, තනිකරම දේශපාලන මැදිහත්වීම් මත කරපු පත්වීම්. වෛද්‍යවරුන්, හෙද නිලධාරින් එහෙම බඳවා ගන්න බැහැ නේ. හැබැයි, සෞඛ්‍ය කාර්ය සහායකයින් බඳවා ගැනීම් කර තිබෙන්නේම ලැයිස්තුවලට. ඒ ඒ කාලවල හිටපු ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් විසින් ලැයිස්තු අරගෙන තමයි මේ කටයුත්ත කර තිබෙන්නේ. සමහර වෙලාවට සුදුසුකම්වත් බලා නැහැ. ඉතින්, මේක තමයි නිරාකරණය කරගන්න සිදුවෙලා තිබෙන්නේ. හැබැයි, පසුගිය කාලයේ බැඳිච්ච අය දිහා බැලුවාම ඔබතුමාටත් පෙනෙනවා ඇති, ඒ අය සුදුසුකම් සම්පූර්ණ කරලා, පෞද්ගලික රෝහල්වල, එහෙම නැත්නම් විවිධාකාරයේ ස්වේච්ඡා කටයුතු කරලා ලකුණු ලබා ගෙන ආපු අය බව. ඒ අනුව දැන් අපි හොඳ තරුණ කණ්ඩායමක් බඳවාගෙන තිබෙනවා. ඒ අයත් එක්ක අපට මේ ගමන යන්න පුළුවන්. හැබැයි, මේ කටයුත්ත සියයට සියයක්ම නිවැරදි කරන්න නම්, අඩු තරමින් තව වාර දෙකක්වත් බඳවා ගැනීම් කරන්න වෙයි කියලා මම හිතනවා.

## මොනරාගල දිස්ත්‍රික්කයේ 2025.01.01 දින සිට වී වගාව: විස්තර
மொனராகலை மாவட்டத்தில் 01.01.2025 முதல் நெல் சாகுபடி: விபரம்
PADDY CULTIVATION IN MONARAGALA DISTRICT FROM 01.01.2025: DETAILS

2249/2026

**8. ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ 2025.01.01 දින සිට මේ දක්වා එක් එක් කන්නය තුළ වී වගා කර ඇති භූමි ප්‍රමාණය ගොවිජන සේවා කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම කාලය තුළ දිස්ත්‍රික්කයේ සමස්ත වී අස්වැන්න එක් එක් කන්නය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වී අස්වැන්නෙන් රජයේ වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වී ප්‍රමාණය එක් එක් කන්නය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වී ගොවීන් මුහුණ දෙන ගැටලු සඳහා විසඳුම් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்தில் 2025.01.01ஆந் திகதி முதல் தற்போது வரை ஒவ்வொரு போகத்திலும் நெற்செய்கை மேற்கொள்ளப் பட்டுள்ள காணிகளின் பரப்பளவு, கமநல சேவைப்பிரிவு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியில் மாவட்டத்தின் மொத்த நெல் விளைச்சல், ஒவ்வொரு போகத்துக்கும் அமைவாக தனித்தனியாக யாது என்பதையும்;

(iii) மேற்படி நெல் விளைச்சலில், அரசாங்கத்தின் நெல் சந்தைப்படுத்தல் சபையால் கொள்வனவு செய்யப்பட்ட நெல்லின் அளவு, ஒவ்வொரு போகத்துக்கும் அமைவாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) நெல் விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினை களுக்குத் தீர்வுகளை வழங்குவதற்காக மேற் கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the extent of land cultivated with paddy in the Monaragala District during each season from 01.01.2025 to date, categorized separately by Agrarian Service Divisions;

(ii) the total paddy harvest of the district during this period, categorized separately by season;

(iii) the quantity of paddy that has been purchased by the Paddy Marketing Board of the Government, out of the said paddy yield, categorized separately by season; and

(iv) the measures that will be taken to provide solutions to the issues faced by paddy farmers?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

(අ) (i)

| | ගොවිජන සේවා මධ්‍යස්ථානය | 2025 යල වගා වපසරිය (හෙක්ටෙයාර) | 2025/26 මහ වගා වපසරිය (හෙක්ටෙයාර) | 2026 යල වගා වපසරිය (හෙක්ටෙයාර) |
|---|---|---|---|---|
| 01 | අලුත්වැව | 1,634.91 | 1,834.16 | 1,478.39 |
| 02 | ඇතිමලේ | 2,652.91 | 5,609.98 | 1,501.10 |
| 03 | බඩල්කුඹුර | 526.5703 | 552.7533 | 368.8386 |
| 04 | බිබිලේ | 550.9148 | 1,432.2973 | 432.603 |
| 05 | බුත්තල | 2,638.65 | 3,385.43 | 2,248.92 |
| 06 | බඹරගොල්ල | 723.9401 | 1,699.0108 | 198.4956 |
| 07 | හිඟුරුකඩුව | 358.6292 | 359.2424 | 261.856 |
| 08 | කතරගම | 837.4034 | 853.457 | 848.5788 |
| 09 | කොටගම | 174.6314 | 610.2275 | 114.8349 |
| 10 | මැදගම | 700.3686 | 1,954.2166 | 264.9976 |
| 11 | මොනරාගල | 687.9635 | 1,279.8052 | 248.7836 |
| 12 | නෙල්ලියැද්ද | 97.8855 | 422.6318 | 77.817 |
| 13 | ඔක්කම්පිටිය | 848.4249 | 1,330.9407 | 607.3063 |
| 14 | සෙවනගල | 2,526.43 | 2,542.87 | 2,357.25 |
| 15 | සියඹලාණ්ඩුව | 1,404.57 | 4,605.73 | 1,172.61 |
| 16 | තෙල්වුල්ල | 2,101.29 | 2,609.37 | 1,820.36 |
| 17 | තණමල්විල | 909.8583 | 1,096.7357 | 640.6576 |
| 18 | වැල්ලවාය | 705.6925 | 851.4104 | 735.6186 |
| | **එකතුව** | **20,081.05** | **33,030.28** | **15,379.01** |

(ii) මොනරාගල දිස්ත්‍රික්කයේ වී වගාවේ සමස්ත වී නිෂ්පාදනය පහත පරිදි වේ.

| කන්නය | මුළු නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2024/25 මහ | 145,378 |
| 2025 යල | 79,415 |
| 2025/26 මහ | 173,157 |

ඒ අනුව 2024/25 මහ කන්නයට සාපේක්ෂව 2025/26 මහ කන්නයේ මොනරාගල දිස්ත්‍රික්කයේ වී මෙට්‍රික් ටොන් 27,779ක වැඩිවීමක් තිබෙනවා.

2026 යල කන්නය සඳහා මොනරාගල දිස්ත්‍රික්කයේ වී වගාවේ සමස්ත වී නිෂ්පාදනයට අදාළ දත්ත තවම ප්‍රසිද්ධ කර නැහැ.

(iii)

| වර්ෂය | කන්නය | මිලදී ගත් වී ප්‍රමාණය KG (මොනරාගල දිස්ත්‍රික්කය) |
|---|---|---|
| 2025 | 2024/25 මහ | 0 |
| | 2025 යල | 1,561.120 |
| 2026 | 2025/26 මහ | 2,157.736 |
| | 2026 යල | 1,676.200 |

(iv)

- වී සඳහා සාධාරණ මිලක් ලබා දීම සහ වී අස්වනු මිලදී ගැනීම විධිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- වී ගබඩා කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම, අස්වනු හානි අවම කිරීම සහ ගොවීන්ගේ නිෂ්පාදන සඳහා ස්ථාවර වෙළෙඳ පොළක් ඇති කිරීම තුළින් ගොවීන්ගේ ආදායම් මට්ටම හා ජීවන තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- කුඹුරු ඉඩම්වල වී සහ වෙනත් ක්ෂේත්‍ර භෝග වගා කරන ලද ගොවීන් වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා රජයේ ප්‍රතිපත්තිවලට යටත්ව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා පොහොර සහනාධාරය හෝ පොහොර ලබා ගැනීම සඳහා මූල්‍ය සහනාධාරය ලබා දීම.
- ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවීන් වෙත උපදේශන සේවා ලබා දීම හා ගොවිජන සේවා අළෙවි සැල් හරහා සහනාධාර ක්‍රමයට පහසු මිල ගණන් යටතේ කෘෂි උපකරණ, බීජ වර්ග හා කෘෂි රසායන ද්‍රව්‍ය ලබා දීම ආදී කටයුතු සිදු කරනු ලැබේ.
- වී වගාවේ නිෂ්පාදකතාව වැඩි කර ගැනීමේ අරමුණින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාය වැඩසටහන: 2025/26 මහ කන්නයේ යාය 500කින් ආරම්භ කර යාය 1,000 දක්වා වැඩි කර ඇත. මෙම යාය වැඩසටහනේදී වී වගාවේ නිෂ්පාදකතාව වැඩි වන තාක්ෂණ ක්‍රියාකාරකම් මඟින් අස්වැන්න වැඩි කරගනු ලබයි.
- මීට අමතරව හෙක්ටෙයාරයකින් මෙට්‍රික් ටොන් 10ක සාමාන්‍ය අස්වැන්නක් ලබා ගැනීමට හැකි වන පරිදි යාය 15ක් 2026/27 මහ කන්නයේ සිට ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. එමඟින් වී කිලෝවක නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු අගයකින් අඩු කර ගැනීමට බලාපොරොත්තු වේ. වී වගාවේදී මිනිස් ශ්‍රමය සඳහා වැය වන වියදම් අඩු කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතය දිරිගැන්වීමේ වැඩ පිළිවෙළෙහිදී වී වගාව සඳහා ඩ්‍රෝන තාක්ෂණය යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම ප්‍රධාන වේ. මෙහිදී ඒකක පිරිවැය තවදුරටත් අඩු කිරීමට අපේක්ෂා කෙරේ. ඉදිරි වර්ෂයේදී වී අස්වැන්න ක්‍රමානුකූලව වියළා ගැනීම සඳහා වියළන යන්ත්‍ර ලබා දීමට බලාපොරොත්තු වේ. තවද, වී වගාවේ බිම් සැකසීම යාන්ත්‍රිකරණයට පෙලඹවීම මඟින්ද වී වගාවේ නිෂ්පාදකතාව වැඩි කර ගත හැකිය.
- මීට අමතරව, වී වගාවේ නිෂ්පාදකතාව ඉහළ නංවා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වී පර්යේෂණ ආයතනය

මඟින් වැඩි අස්වනු ප්‍රභේද ආදියද හඳුන්වා දෙයි. මෙවැනි ප්‍රභේද වගා කිරීම පිළිබඳව මෙන්ම වගා භූමියේ බිම් සැකසීමේ සිටම අස්වනු නෙළීම දක්වා වූ ක්ෂේත්‍ර කටයුතු නිසි පරිදි සිදු කර ගැනීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම සහ පුහුණු වැඩසටහන් ආදිය පැවැත්වීමද සිදු වේ. වර්තමානයේ කාලගුණික විපර්යාසයන් හේතුවෙන් වගාවේ ඇති වන ගැටලු මඟ හරවා ගැනීම සඳහා භාවිත වන සුහුරු කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳව පුහුණු වැඩසටහන්වලදී විශේෂ අවධානයක් යොමු කරයි. තවද, වගා කටයුතු සඳහා අවශ්‍ය යාවත්කාලීන වූ තොරතුරු ලබා දීම තුළින්ද ගොවි ගැටලු සඳහා විසඳුම් ලබා දෙයි.

(ආ) අදාළ නොවේ.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පසුගිය කාලයේ රටේ වීවලින් ඇති තරම් සහල් නිෂ්පාදනය වෙද්දී පිට රටින් සහල් ගෙන්වීම හේතුවෙන් වී විකුණා ගැනීමට නොහැකිව, වී ගොවීන් ඉතාම අසරණ තත්ත්වයට පත් වුණා. එසේ සහල් ගෙන්වූයේ මොන අදහසින්ද, ඉදිරියට වී අලෙවි මණ්ඩලය හරහා වී මිලදී ගන්නේද කියන එක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වන්නේ.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, අපිට කිරි සම්බා වීවල හිඟයක් තිබුණා. අපේ රටේ කිරි සම්බා පරිභෝජනය කරන ප්‍රමාණය අනෙකුත් සහල්වලට සාපේක්ෂව අඩුයි. නමුත්, ඒ අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න නිෂ්පාදනයක් තිබුණේ නැහැ. අපිට නාඩු වීවල අතිරික්තයක් තිබුණා. නමුත් කිරි සම්බාවල හිඟයක් තිබුණා. ඔන්න ඔය තත්ත්වය තුළ විශේෂයෙන්ම හෝටල් කර්මාන්තය, සංචාරක කර්මාන්තය පදනම් කරගෙන අපිට සහල් යම් ප්‍රමාණයක් පිට රටින් ගෙනෙන්න සිදු වුණා. ඒ තත්ත්වය මත කිරි සම්බාවලට විකල්පයක් විධියට තමයි යම් සහල් ප්‍රමාණයක් පිට රටින් ගෙනාවේ. ඒ අනුව, පැවැති තත්ත්වය ඒකෙන් පාලනය වුණා. එහෙම නැතුව පොදුවේ අපිට සහල් ගෙනෙන්න වුවමනාවක් නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයට අදාළ කරුණු මම දැන් ඉදිරිපත් කළා. අපි මේ වනකොට වී අස්වැන්න වැඩි කරගෙන තිබෙනවා. අපි විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ ගොවි ජනතාව ඉදිරියට අරගෙන යමින් තිබෙනවා. කිරි සම්බා සම්බන්ධව ඉදිරියේදී ප්‍රශ්නයක් නැති වෙයි කියන අදහසේ තමයි දැනට අපි ඉන්නේ. මොකද, ඒකට අපි උත්තරයක් හැදුවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කය තුළ ලබා ගත් වී අස්වැන්න මම කිලෝවලින් කියන්නම්. පසුගිය මහ කන්නයට වඩා මේ මහ කන්නයේ වී කිලෝ දෙකෝටි හැත්තෑහත්ලක්ෂ හැත්තෑනවදහසකින් අස්වැන්න වැඩි කරගෙන තිබෙනවා. රටේම මේ වැඩිවීම තිබෙනවා. ඒ තත්ත්වය තුළ තමයි සහල්වලට අදාළව තිබුණු නීතිමය බාධා අපි තාවකාලිකව ඉවත් කළේ. ඒ තත්ත්වය මත අපිට ඉදිරියට කිරි සම්බා සහල් වුණත් රටින් ගෙනෙන්න වුවමනාවක් නැති වෙයි කියන විශ්වාසයේ අපි ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, වී අලෙවි මණ්ඩලයේ වී මිලදී ගැනීම සම්බන්ධවත් ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයෙන් ඇහුවා. වී අලෙවි මණ්ඩලය විසින් වී මිලදී ගැනීම ඉදිරියටත් කරගෙන යනවා.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ මතය නම් සහල් ගෙන්වූවා වැඩියි කියන එකයි. ඒ හැඟීම තමයි මට නම් දැනෙන්නේ. කොහොම වුණත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වී අලෙවි මණ්ඩලයේ වී ගබඩා ඇති කළා නම් ඉතාම වටිනවා කියන අදහසේ මම ඉන්නවා. මොකද, වී ප්‍රවාහනයේදී ගොවීන් බොහොම අපහසුතාවලට ලක් වෙනවා, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වී අලෙවි මණ්ඩලයේ ගබඩා ඇති කරලා නැති නිසා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා පසුගිය කාලයේ පොරොන්දු වූ පරිදි වී කිලෝවකට එන මාස් කන්නයේ සිටවත් රුපියල් 150ක් ගෙවනවාද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වී ගබඩා පිහිටුවන්න කලින් ඇත්තටම අපේ පළමුවැනි රාජකාරිය වෙලා තිබුණේ වසා දමා තිබුණු වී ගබඩා ප්‍රතිසංස්කරණය කර, ඒ කියන්නේ වී මිලදී ගැනීම් නතර කර තිබුණු වී ගබඩා යථාවත් කර ඒවා සක්‍රිය කර ගැනීමේ කටයුත්තයි. අපිට අත ගහන්න සිද්ධ වුණේ ඒ කටයුත්තටයි. විශේෂයෙන්ම වී අලෙවි මණ්ඩලය අපි භාර ගන්නකොට එහි සේවකයන් 159දෙනායි හිටියේ. හැබැයි, 1977දී තමුන්නාන්සේලාට ආණ්ඩුව මාරු වනකොට වී අලෙවි මණ්ඩලයේ සේවකයන් 1,820 ගණනක් හිටියා. ලොරි රථ 17ක් තිබුණා. වී මෝල් තිබුණා. අපි වී අලෙවි මණ්ඩලය බාර ගන්නකොට ඒ මොකක්වත් නැතිව තමයි බාර ගත්තේ. එකම එක ලොරියයි තිබුණේ. අන්න එහෙම ආයතනයක් තමයි අපි එදා බාර ගත්තේ. සම්පූර්ණයෙන්ම වල් වැදිච්ච, වී මිලදී ගන්නේ නැති ගබඩා තමයි අපට බාර ගන්න සිද්ධ වුණේ. අපි මේ වෙනකොට ඒවා යථාවත් කර තිබෙනවා; තවදුරටත් යථාවත් කරමින් ඉන්නවා. ඒ කටයුත්ත ඉස්සරහට යනවා.

ඔබතුමා ඊළඟ ප්‍රශ්නයෙන් ඇහුවා, වී කිලෝ එකක මිල රුපියල් 150ක් කරනවාද කියලා. මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තිබුණා නම් වී කිලෝ එකක මිල රුපියල් 150ක් කරනවාද කියලා. වී කිලෝ එකක් රුපියල් 150ක් කරලා ඔබතුමන්ලා සහල් දෙන්නේ කීයටද? මෙන්න මේ ප්‍රශ්නයටත් තමුන්නාන්සේලා උත්තර දෙන්න ඕනෑ. අපේ සටන් පාඨය වුණේ ගරු මන්ත්‍රීතුමනි, වී කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදමට සියයට 30ක් එකතු කරලා වී කිලෝ එකක මිල තීරණය කරන එකයි. අපි ඒක කරලා තිබෙනවා. ඒ නිසා වී කිලෝ එකක් රුපියල් 150ක් කරන්න ඕනෑ කියන කථාවට මම මීට කලිනුත් මේ සභාවේදී උත්තර දීලා තිබෙනවා. පොහොර සහනම් කරපු පසුගිය කාලයේ වී නිෂ්පාදනය සියයට 35කින් අඩු වුණා කියලා විපක්ෂ නායකතුමාම මේ සභාවේ ඉඳගෙන ප්‍රකාශ කළා. එතුමා කියපු කාරණාව හරි. පොහොර සහනම් කරපු ඒ කාලයේ වී නිෂ්පාදනය සියයට 35කින් අඩු වුණා නම්, ඊට පෙර වී කිලෝ 1,000ක අස්වැන්නක් ගත්ත ගොවියෙක් පොහොර සහනමෙන් පස්සේ ගත්තේ වී කිලෝ 650යි. ඒ කාලයේ පොහොර මිටියක මිල රුපියල් 40,000ට, 50,000ට ගියා. අන්න ඒ තත්ත්වය තුළ වී කිලෝ එකක නිෂ්පාදන වියදම රුපියල් 150 පැන්නා. මෙන්න මේකයි අපි කිව්වේ. එදා අපේ සටන් පාඨය වුණේ, "වී කිලෝ එකක නිෂ්පාදන වියදම අඩු කරන්න, පොහොර සහනම ඉවත් කරන්න, ගොවියාට වෙච්ච අසාධාරණයට වන්දි ගෙවන්න" කියන එකයි. ඔය සටන් පාඨයේ අපි හිටියා මිස, වී කිලෝ එකක් රුපියල් 150ක් කරන්න කියලා අපි කොතැනකදීවත් සටන් පාඨයක් ගෙනාවේ නැහැ.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් මම ඔප්පු කරලා පෙන්නුවා, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේම වී කිලෝ 27,700,000ක් පසුගිය මහ කන්නයට වඩා වැඩියෙන් මේ මහ කන්නයේ අස්වැන්න ලෙස අරගෙන තිබෙනවා කියලා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අල්ල ව්‍යාපාරයේ ගොවි නායකයා ජල කළමනාකරණ කමිටුවේදී මාධ්‍ය ඉදිරියේදී ප්‍රකාශ කළා, අපේ යායේ හෙක්ටෙයාරයකට වී කිලෝ 12,000කට වඩා වැඩි ප්‍රමාණයක් අපි අස්වනු ගත්තා කියලා. ඒ නිසා අලුත් පැකේජයත් එක්ක ගොවි ජනතාව කලින් ගත්ත අස්වැන්නට වඩා වැඩි අස්වැන්නක් දැන් ලබා ගන්නවා. අස්වැන්න වැඩිවීම ඇතුළේ වී ගොවියාගේ නිෂ්පාදන වියදම දැන් අඩු වෙලා තිබෙනවා. මේ වෙනකොට නාඩු, රතු නාඩු, සුදු නඩු ඇතුළු සියලුම වීවල නිෂ්පාදන වියදම රුපියල් 90ට පහළින් තිබෙන්නේ. මේක තමයි තත්ත්වය. එහෙම නම්, මේකට සියයට 30ක් එකතු වෙනකොට, නාඩු වී කිලෝ එකක් දැන් රුපියල් 120යි. ඒ නිසා, අපි ඉදිරිපත් කරපු කාරණයට අදාළව ගොවියාට සාධාරණත්වය ඉෂ්ට වෙලා තිබෙනවා කියන කාරණය මේ වෙලාවේදී මම මතක් කරන්න කැමැතියි.

## තඹුත්තේගම මූලික රෝහල: කාර්ය මණ්ඩල හිඟය
### தம்புத்தேகம ஆதார வைத்தியசாலை: ஆளணிப் பற்றாக்குறை
### TAMBUTTEGAMA BASE HOSPITAL: SHORTAGE OF STAFF

2294/2026

**9. ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) තඹුත්තේගම මූලික රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහලෙන් පසුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැඩිම බාහිර හා නේවාසික රෝගීන් සංඛ්‍යාවකට ප්‍රතිකාර සපයන රෝහල බවත්;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රෝගීන් විශාල පිරිසක්ද එම රෝහලෙන් ප්‍රතිකාර ලබා ගන්නා බවත්;

(iii) A ශ්‍රේණියේ මූලික රෝහලක් වන එහි අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව වෛද්‍ය, හෙද හා අනෙකුත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ හිඟයක් පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) රෝහලේ පවතින කාර්ය මණ්ඩල හිඟය පියවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාලසීමාව කවරේද;

(iii) රෝහල පළාත් සභාව යටතේ පාලනය වුවද, එහි ඇතැම් සේවා සහ සංවර්ධන කටයුතු මධ්‍යම රජය මඟින් සිදු කරනු ලබන්නේද;

(iv) එසේ නම්, මෙම රෝහල මධ්‍යම රජය යටතට පවරා ගැනීම සඳහා අවධානය යොමුවී තිබේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(vi) පළාත් සභාව මඟින් පමණක් රෝහලේ නඩත්තු, සංවර්ධන සහ සේවා අවශ්‍යතා සපුරාලීමේදී ගැටලු පවතින්නේද;

(vii) එසේ නම්, එම ගැටලු නිරාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தம்புத்தேகம ஆதார வைத்தியசாலையானது, அநுராதபுர போதனா வைத்தியசாலைக்குப் பின்னர் அநுராதபுர மாவட்டத்தில் கூடுதலான வெளிநோயாளர்கள் மற்றும் வதிவிட நோயாளர்களுக்குச் சிகிச்சை வழங்கும் வைத்தியசாலை என்பதையும்;

(ii) குருநாகல் மாவட்டத்தைச் சேர்ந்த பெருமளவான நோயாளர்களும் மேற்படி வைத்தியசாலையில் சிகிச்சை பெற்றுக்கொள்கிறார்கள் என்பதையும்;

(iii) A தரத்திலுள்ள ஆதார வைத்தியசாலையான அங்கு, அனுமதிக்கப்பட்ட ஆளணியுடன் ஒப்பிடுகையில் வைத்தியர்கள், தாதியர்கள் மற்றும் ஏனைய சுகாதார ஆளணிப் பற்றாக்குறை நிலவுகிறது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) வைத்தியசாலையில் நிலவும் ஆளணிப் பற்றாக் குறையை நிவர்த்தி செய்வதற்கு மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு எதிர் பார்க்கப்படும் காலப்பகுதி யாது என்பதையும்;

(iii) வைத்தியசாலை மாகாண சபையின்கீழ் நிருவகிக்கப்பட்டபோதிலும், அதன் சில சேவைகள் மற்றும் அபிவிருத்திப் பணிகள் மத்திய அரசினால் மேற்கொள்ளப்படுகின் றனவா என்பதையும்;

(iv) ஆமெனில், இந்த வைத்தியசாலையை மத்திய அரசாங்கத்துக்குப் பொறுப்பேற்பது தொடர்பில் கவனம் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(v) அது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) மாகாண சபை தனித்து வைத்தியசாலையின் பராமரிப்பு, அபிவிருத்தி மற்றும் சேவைத் தேவைகளைப் பூர்த்திசெய்வதில் சிக்கல்கள் நிலவுகின்றனவா என்பதையும்;

(vii) ஆமெனில், மேற்படி சிக்கல்களைத் தீர்ப்பதற் காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Is he aware that -

(i) Tambuttegama Base Hospital is the hospital that provides treatment to the highest number of outpatients and inpatients in the Anuradhapura District, second only to the Anuradhapura Teaching Hospital;

(ii) a large number of patients from the Kurunegala District also receive medical treatment from the said hospital; and

(iii) despite being a Grade-A Base Hospital, a shortage of medical, nursing, and other health staff exists relative to its approved cadre?

(b) Will he inform this House -

(i) the measures that will be taken to remedy the staff shortage existing at the hospital;

(ii) the period of time expected to fill the said vacancies;

(iii) whether certain services and development activities of the hospital are carried out by the Central Government, even though it is governed under the Provincial Council;

(iv) if so, whether attention has been focused on taking over this hospital under the Central Government;

(v) the steps that will be taken in that regard;

(vi) whether issues have been encountered in fulfilling maintenance, development, and service requirements of the hospital solely through the Provincial Council; and

(vii) if so, the measures that will be taken to resolve the said issues?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අක්කර 25ක භූමි ප්‍රමාණයකින් යුතු තඹුත්තේගම මූලික රෝහල A වර්ගයේ මූලික රෝහලකි. මෙම රෝහල අනුරාධපුර ශික්ෂණ රෝහලට පසුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින විශාලතම රෝහල වන අතර, එම රෝහල වෙත අවට නගරවලින් - ගල්නෑව, ගාලදිවුල්වැව, නොච්චියාගම, රාජාංගනය, තලාව, ඇලයාපත්තුව, නාච්චාදූව - රෝගීන් විශාල සංඛ්‍යාවක් දිනකට ප්‍රතිකාර සඳහා යොමු වෙනවා. ආසන්න වශයෙන් දිනකට රෝගීන් - OPD එකට - 600ත්, 800ත් අතර ප්‍රමාණයක් ප්‍රතිකාර ගැනීමට මෙම රෝහලට පැමිණෙනවා.

(ii) පුළුල් මාර්ග පහසුකම් සහ ළඟාවීමේ පහසුව මත කුරුණෑගල දිස්ත්‍රික්කයේ රෝගීනුත් මෙම රෝහලෙන් ප්‍රතිකාර ලබා ගන්නවා.

(iii) ඇමුණුම මඟින් පුරප්පාඩු දක්වා ඇත. ඇමුණුම පහත පරිදි වේ.

**Base Hospital -Thambuththegama -Cardre**

| | Designation | Approved Cadre (for BH- B) | 31.09.2026 | |
|---|---|---|---|---|
| | | | In Position | Vacancies |
| 1 | Medical Superintendent | 1 | 1 | 0 |
| 2 | Medical Consultants | 10 | 15 | -5 |
| 3 | Grade Medical Officers | 56 | 81 | -25 |
| 4 | Dental Surgeon | 4 | 2 | 2 |
| 5 | Register Medical Officer | 2 | 0 | 2 |
| 6 | Matron | 1 | 1 | 0 |
| 7 | Administrative Officer | 1 | 0 | 1 |
| 8 | Psychiatric Social Worker | 1 | 0 | 1 |
| 9 | Ward Sister | 9 | 13 | -4 |
| 10 | Staff Nurse | 130 | 101 | 29 |
| 11 | Pharmacist | 6 | 6 | 0 |
| 12 | MLT | 6 | 6 | 0 |
| 13 | Radiographer | 3 | 2 | 1 |
| 14 | Physiotherapist | 3 | 3 | 0 |
| 15 | Occupational Therapist | 1 | 1 | 0 |
| 16 | Ophthalmic Technician | 1 | 1 | 0 |
| 17 | Hospital Midwife | 20 | 12 | 8 |
| 18 | Speech Therapist | 1 | 1 | 0 |
| 19 | ECG Recordist | 3 | 3 | 0 |
| 20 | PHLT | 1 | 1 | 0 |
| 21 | Development Officer | 3 | 4 | -1 |
| 22 | Development Assistant | 1 | 1 | 0 |
| 23 | Public Health Field Officer | 1 | 0 | 1 |
| 24 | Management Assistant | 8 | 5 | 3 |
| 25 | Dispensers | 5 | 3 | 2 |
| 26 | Medical Record Officers | 1 | 0 | 1 |
| 27 | Diet Steward | 1 | 1 | 0 |
| 28 | House Warden | 0 | 0 | 0 |
| 29 | Ward Clerk | 2 | 0 | 2 |
| 30 | Driver | 4 | 3 | 1 |
| 31 | Attendant | 35 | 30 | 5 |
| 32 | Cook | 3 | 0 | 3 |
| 33 | Hospital Overseer | 2 | 2 | 0 |
| 34 | Lab Orderly | 2 | 2 | 0 |
| 35 | Seamstress | 1 | 0 | 1 |
| 36 | Telephone Operator | 2 | 2 | 0 |
| 37 | Suakya Karya Sahayaka (Ordinary) | 50 | 19 | 31 |
| 38 | Suakya Karya Sahayaka (Junior) | 30 | 36 | -6 |
| 39 | Watcher | 5 | 3 | 2 |
| 40 | KKS | | 0 | 0 |
| | | 416 | 361 | 55 |

ගරු කථානායකතුමනි, විශේෂඥ වෛද්‍යවරුන්ගේ අනුමත cadre එක 10යි. දැනට 15දෙනෙකු ඉන්නවා. ශ්‍රේණි වෛද්‍ය නිලධාරින් - Grade Medical Officers - අනුමත cadre එක 56යි. දැනට 81දෙනෙකු ඉන්නවා. හෙද කාර්ය මණ්ඩලයේ අනුමත cadre එක 130යි. දැනට 101දෙනෙකු තමයි ඉන්නේ. පුරප්පාඩු 29ක් පවතිනවා. Ward Sister අනුමත කාර්ය මණ්ඩලය 9යි. දැනට 13දෙනෙකු ඉන්නවා. වැඩිපුර 4දෙනෙක් ඉන්නවා. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් අනුමත කාර්ය මණ්ඩලය 20යි. දැනට 12දෙනෙකු ඉන්නවා. සෞඛ්‍ය කාර්ය සහායකයින් - කනිෂ්ඨ සහ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

සාමාන්‍ය කියන දෙක එකතු කළාම - අනුමත කාර්ය මණ්ඩලය 80යි. නමුත් දැනට ඉන්නේ 55දෙනායි. පුරප්පාඩු 25ක් පවතිනවා. සමස්තයක් හැටියට ගත්තාම, තඹුත්තේගම මූලික රෝහල සඳහා අනුමත කාර්ය මණ්ඩලය 416යි. 361දෙනෙකු දැනට සේවය කරනවා. විවිධ මට්ටම්වල පුරප්පාඩු 55ක් සහ අතිරික්තයනුත් පවතිනවා.

(ආ) (i) මෙම රෝහල සඳහා හෙද නිලධාරි හිඟය - මම කිව්වා, 29ක් තිබෙනවා කියලා - සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ හෙද නිලධාරින් 18දෙනෙකු බඳවාගෙන තිබෙනවා. තවත් නවක පත්වීම්ලාභී හෙද නිලධාරින් 2,850කට අපි නොවැම්බර් 1වැනි දා පත්වීම් ලබා දෙනවා. එතැනින් කොටසකුත් උතුරු මැද පළාතේ, පළාත් සභාව හරහා තඹුත්තේගම රෝහලට අනුයුක්ත කරනවා.

විකිරණ ශිල්පී එක් පුරප්පාඩුවක් පවතිනවා. ඒ සඳහා මාස හයේ පුහුණුව ලබන කණ්ඩායමෙන් යොමු කරන්න කටයුතු කරනවා.

සෞඛ්‍ය කාර්ය සහායක අනුමත කාර්ය මණ්ඩලය (සාමාන්‍ය/කනිෂ්ඨ) 80ක් ඉන්නවා කියලා මම කිව්වා. දැනට පුරප්පාඩු 25ක් පවතිනවා. සමස්ත වශයෙන් ගත්තාම, උතුරු මැද පළාතේ සෞඛ්‍ය කාර්ය සහායකයන් 53ක් සඳහා පුරප්පාඩු පවතිනවා.

තවමත් මේක මුදල් අමාත්‍යාංශයේ DMS එකෙන් අනුමත කර නැහැ. ඒ නිසා පළාත් සභාව විසින් DECMA කියන ආයතනයෙන් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර තිබෙනවා. දැන් ඒ බඳවා ගැනීමට යොමුවෙලා තිබෙන්නේ.

(ii) මාසයක් පමණ.

(iii) ඔව්.

පරිපාලන කටයුතු පළාත් සභාව මඟින් සිදු කරන අතර, ඇතැම් ප්‍රසම්පාදන කටයුතු මධ්‍යම රජය මඟින් සිදු කරයි.

(iv) ගරු මන්ත්‍රීතුමනි, දැනට අපි ඇත්තටම තෘතියික මට්ටමේ රෝහල් තමයි මධ්‍යම ආණ්ඩුව මඟින් පාලනය කරගෙන යන්නේ. එතැනිනුත් තව රෝහල් 6ක් තිබෙනවා, - දිස්ත්‍රික් මහ රෝහල් 6ක් - පළාත් සභාව මඟින් පාලනය වන. මේක මූලික රෝහලක්. මූලික රෝහල් සාමාන්‍යයෙන් පළාත් සභාව යටතේ තමයි පාලනය වන්නේ. ජනතාවගේ ඉල්ලීම් පවතිනවා. ප්‍රදේශයේ දේශපාලන අධිකාරියෙන් ඉල්ලීම් පවතිනවා. නමුත්, ඒ සම්බන්ධයෙන් අපි දැනට තීන්දුවක් අරගෙන නැහැ.

(v) අදාළ නොවේ.

(vi) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත වාර්ෂිකව වෙන් වන මුදල් ප්‍රතිපාදනවලින් සාමාන්‍යයෙන් සියයට 75ක් පමණ තඹුත්තේගම මූලික රෝහල සංවර්ධනය සහ නඩත්තු කිරීම් සඳහා තමයි යොදවන්නේ. ඇත්තටම ඒකත් එක් හේතුවක්, මේක මධ්‍යම ආණ්ඩුවට පවරාගන්න කියන යෝජනාවක් එන්න.

(vii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු ආකාරයට සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල විශාල හිඟයක් පවතිනවා. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිබෙන රෝහල් 84න් 83ක්ම පළාත් සභා රෝහල්. පළාත් සභාව යටතේ තිබෙන මේ රෝහල් 83ට අනුමත කාර්ය මණ්ඩලය 3,265ක් කියා සඳහන් වෙලා තිබෙනවා. නමුත්, දැනට සිටින්නේ 2,885යි. ඒ අනුව, පුරප්පාඩු 525ක් තිබෙනවා. ඒ වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිබෙන පළාත් සභා රෝහල්වලට අනුමත වෛද්‍යවරු සංඛ්‍යාව 413ක් වෙනවා. හැබැයි, දැනට සිටින්නේ 321යි. පුරප්පාඩු 92ක් තිබෙනවා. අනුමත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් සංඛ්‍යාව 480යි. දැනට සිටින සංඛ්‍යාව 372යි. එහි පුරප්පාඩු 108ක් තිබෙනවා. ඒ වාගේ, පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතිනවා. අපි දැක්කා, මේ පුරප්පාඩු නිසා පසුගිය මාසයේ නෑගම රෝහල වැහෙන්න ගියා, වෛද්‍යවරයෙක් නැතිව. ඒ වාගේම, රාජාංගනය යාය 11 රෝහලත් වෛද්‍යවරයෙක් නැතිව වැහෙන්න ගියා. ඒ ගැන උද්ඝෝෂණත් කළා. ඒ වාගේ, පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතිනවා. ඒ වාගේම, වෛද්‍ය උපකරණවල හිඟයකුත් පවතිනවා.

වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් ගත්තොත්, ප්‍රාථමික මට්ටමේ වෛද්‍ය උපකරණවලත් හිඟයක් තිබෙනවා. අපි දැක්කා, ECG machine ඇතුළු උපකරණවල හිඟය ගැන ඔබතුමාට - අමාත්‍යාංශයට - දන්වා එවා තිබෙනවා. බබාලාගේ බර කිරීමට ගන්නා scalesවල පවා හිඟතාවක් තිබෙනවා. මේ වෛද්‍ය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සහ වෛද්‍ය උපකරණ හිඟය නැති කිරීමට නිශ්චිත ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙනවාද, ඒ වාගේම මේ පුරප්පාඩු පුරවලා අවසාන කරන නියමිත දිනයක් තිබෙනවාද, ඒ පවතින පුරප්පාඩු හේතුවෙන් ජනතාවට අපහසුතාවක් ඇති නොවන ආකාරයට සෞඛ්‍ය පහසුකම් සැපයීම සම්බන්ධව වැඩ පිළිවෙළක් තිබෙනවාද කියා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා වෛද්‍ය පුරප්පාඩු සම්බන්ධයෙන් කියපු ඉලක්කම් වැරදියි. මොකද, 2017දී තමයි අවසාන වශයෙන් අපේ cadre revision එකක් කරලා තිබෙන්නේ. ඊට පස්සේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විටින් විට අපිට සමහර රෝහල්වලට විශේෂ අනුමැතියක් ලබා දීලා තිබෙනවා. ඒ ලබා දී තිබියදී අපට පශ්චාත් සීමාවාසික, නැත්නම් preliminary grade එකේ වෛද්‍ය පත්වීම් 1,400කට cadre එක හොයා ගත්තේ බොහොම අමාරුවෙන් කියන එකත් මම කියන්න ඕනෑ. දැන් අපට ඒ අය බඳවා ගැනීමට පුළුවන්කමක් තිබෙනවා. සමහර වෙලාවට සිදු වන්නේ මේකයි. එක්කෝ, වෛද්‍යවරු විභාගයක් ලියලා, එහෙම නැත්නම්, සේවයෙන් ඉවත් වීමෙන් ක්ෂණිකව ඇති වන පුරප්පාඩු තිබෙනවා. නෑගම්පහ ප්‍රාදේශීය රෝහලේ ආවේ එහෙම ප්‍රශ්නයක්. එතැන වෛද්‍යවරියක් හිටියා. එතුමිය යම් කිසි හේතුවක් මත එතැනින් ගියාට පස්සේ දවසක් දෙකක් ඇතුළත වෙනත් කෙනෙකු පත් කරගන්න බැරි වුණා. නමුත්, අපේ හිටපු අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙනත් වෛද්‍යවරයෙකු දාලා ඒ කටයුතු කරගෙන ගියා.

ගරු කථානායකතුමනි, පළාත් සභාවල cadre එක අනුමත කර ගන්න අපි යොමු කර තිබෙනවා. ගිය වසරේ ඉඳලා අපි ප්‍රාථමික සත්කාර ඒකකයේ ඉඳලා ජාතික රෝහල් දක්වා හැම

රෝහලකම අලුතින් ඇති වෙච්ච ඒකකවලට, ඒ වාගේම අපි අලුතින් ආරම්භ කරන ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන ඇතුළු සියල්ලටම අවශ්‍ය කරන cadre එක සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් දැන් සකස් කර අවසානයි. දැන් මාසයක් පමණ වනවා, අපි ඒක මුදල් අමාත්‍යාංශයට භාර දීලා. මුදල් අමාත්‍යාංශය අපට කිව්වා, දෙසැම්බර් මාසයේ පළමුවෙනි සතිය වනකොට අපට ඒ cadre එක අනුමත කරලා දෙන්නත් පුළුවන් කියලා. ඒ අනුව තමයි පළාත් සභාවල බඳවා ගැනීම් කරන්න වෙන්නේ. ඇත්තටම වෙලා තිබෙන්නේ, අපි බඳවා ගන්නා විශාල ප්‍රමාණයක් මධ්‍යම ආණ්ඩුවේ රෝහලට අනුයුක්තව සිදු වෙලා තිබෙන්නේ, පළාත් සභාවල සමහර වෙලාවට පවතින පුරප්පාඩු නැති නිසා.

මම කිව්වා වාගේ, උතුරු මැද පළාතේ සෞඛ්‍ය කාර්ය සහායකයන් 53දෙනෙකු පුරප්පාඩුයි, 2017 අනුව. ඒක upgrade කළාට පස්සේ තමයි වැඩිපුර ප්‍රමාණයක් බඳවා ගන්න සිද්ධ වෙන්නේ. ඒ අනුව අපි කටයුතු කරනවා. සමහර තැන්වල, පරිපූරක වෛද්‍ය වෘත්තිකයන්ට අදාළව MLT, physiotherapist, pharmacist වාගේ තනතුරුවල පුරප්පාඩු පවතිනවා. නමුත්, අපි දැන් උපාධිධාරීන්ගෙන් තමයි ඒ අය බඳවා ගන්නේ. කලින් ඩිප්ලෝමාධාරීන්ගෙන් බඳවා ගත්තේ. උපාධිධාරීන්ගෙන් බඳවා ගන්නා නිසා අවුරුදු 7කින් විතර ඒ අය බඳවාගෙන තිබුණේ නැහැ. දැන් අපි ඒ අය බඳවාගෙන මාස 6ක පුහුණුවක් ලබා දෙමින් පවතිනවා. ඒ පරිපූරක වෛද්‍ය වෘත්තිකයන් බොහෝදෙනෙකුගේ පුහුණුව අවසන් වෙනවා, ලබන වසරේ පෙබරවාරි මැද වනකොට. එතකොට අපට පුළුවන්, radiographers ඇතුළු කණ්ඩායම ලබා දෙන්න. ඒ අනුව තමයි අපි කටයුතු කරන්නේ.

සෞඛ්‍ය කාර්ය සහායකයන් සම්බන්ධයෙන් මම දිගින් දිගටම මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කළා. දැනට අපි "ඩෙක්මා" එකෙන් බඳවා ගන්නේ තාවකාලිකවයි. ඉදිරියේදී ස්ථිරව බඳවා ගන්න පුළුවන්කම ලැබේවි. ඒ ආකාරයට අපි ළඟදී උතුරු පළාත් සභාවේ 350කට පමණ ඒ පළාත් සභාව යටතේ පාලනය වන රෝහල්වලටම පත්වීම් ලබා දුන්නා. ඒ අනුව මේ cadre එක සම්පූර්ණ කරන්න පුළුවන්කම ලැබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. එතැනදී අපි තඹුත්තේගම මූලික රෝහලටත් බඳවා ගන්න කටයුතු කරනවා. මොකද, එය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශික්ෂණ රෝහල හැරුණාම තිබෙන මූලික රෝහලක්; අපි upgrade කරන්න බලාපොරොත්තු වන රෝහලක්. ඒ වෙනුවෙන් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

ගරු ඇමතිතුමනි, මා වෛද්‍ය පුරප්පාඩු සම්බන්ධයෙන් කියපු කථාව නිවැරදි නැහැ කියලා ඔබතුමා කියපු කාරණය ගැන මම මුලින්ම කියන්න ඕනෑ. පළාත් සෞඛ්‍ය ලේකම්තුමා දීපු, සෞඛ්‍ය අමාත්‍යාංශයටත් යවපු ලේඛනයෙන් ඒ උපුටා ගැනීම කරලා තමයි වෛද්‍ය පුරප්පාඩු සංඛ්‍යාව මේ ගණනයි කියලා මා කිව්වේ.

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ආරෝග්‍යශාලා 1,000ක් හදනවා කියලා ජනාධිපතිතුමා යම්කිසි ප්‍රකාශයක් කළා. ආරෝග්‍යශාලා 1,000ක් අලුතින් ඉදි කරන එකද කළ යුත්තේ, එහෙම නැතිනම් ග්‍රාමීය රෝහල්වල පවතින වෛද්‍ය උපකරණ සහ වෛද්‍යවරුන්ගේ හිඟය සපුරලා ඒ ග්‍රාමීය රෝහල්වලින් ජනතාවට වෛද්‍ය පහසුකම් ලබා ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම නොවෙයිද සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට ඔබතුමන්ලා මුලින්ම ගන්න ඕනෑ ක්‍රියාමාර්ගය? අලුතින් ආරෝග්‍යශාලා 1,000ක් හදනවාට වඩා දැනට තිබෙන ඒවායේ වෛද්‍යවරුන්ගේ හිඟය සහ ඒවාට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම නොවෙයිද කළ යුත්තේ?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ආරෝග්‍යශාලා 1,000ක් නොවෙයි හදන්නේ. ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන - Health and Wellness Centres - තමයි හදන්නේ. ඒක අපේ ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතියේ කොටසක්. අපි 1978 Alma-Ata ප්‍රකාශනයෙන් තමයි ප්‍රාථමික සෞඛ්‍ය සේවාව ශක්තිමත් කිරීමට එකඟතාව පළ කළේ. ලෝකයක් හැටියටත් අපි එකඟ වෙලා තිබෙනවා, ප්‍රාථමික සෞඛ්‍ය සේවාව ශක්තිමත් කරන්න ඕනෑ කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව අපේ ප්‍රාථමික සෞඛ්‍ය සේවාව ශක්තිමත් කිරීමේදී අවධානය යොමු කළ යුතු අංශ කීපයක් තිබෙනවා. අපේ රටේ ප්‍රාදේශීය රෝහල් ප්‍රමාණයක් තිබෙනවා. ඊට අමතරව, ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක - PMCUs - ප්‍රමාණයක් තිබෙනවා.

ජනගහනය වැඩි වීම නිසා, භූගෝලීය ප්‍රශ්න නිසා අන්න ඒ ප්‍රාදේශීය රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකවලින් ආවරණය නොවන ප්‍රදේශවල තමයි මේ කියන ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන පිහිටුවන්නේ. දැනට සාමාන්‍යයෙන් අපි හඳුනාගත් ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන 1,000ක් පමණ පවතිනවා. ඒවායේ අඩුපාඩුව සම්පූර්ණ කරන්න තවත් ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන, එහෙම නැත්නම් ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන 1,000ක් පමණ වුවමනායි. මේවා ග්‍රාමීය ප්‍රදේශවල තමයි විශේෂයෙන්ම පිහිටුවන්නේ. ඊට අමතරව මේවා නාගරික ප්‍රදේශවල තිබෙන මහල් නිවාස ආශ්‍රිතවත් පිහිටුවීමේ කටයුතු අපි ආරම්භ කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, අපේ බලාපොරොත්තුව වී තිබෙන්නේ, ජනගහනය දසදහසකට එක් මධ්‍යස්ථානයක් බැගින් ලබා දීලා දසදහසක් වූ එම ජනතාවගේ සෞඛ්‍ය වගකීම සම්පූර්ණයෙන්ම ඒ අදාළ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට භාර දීමයි. ඒ අනුව, අපි දැන් ආරම්භ කර තිබෙන pilot project එක යටතේ මේ වනකොට මධ්‍යස්ථාන 39ක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එම මධ්‍යස්ථානවල සේවය කරන මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනිය - Public Health Nursing Officer - ගෙයින් ගෙට ගොස් ඒ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කරනවා. ඇත්ඔය වැනි ප්‍රදේශවලත්, මහනුවර පොල්ගොල්ලවත්ත ඇතුළු ප්‍රදේශවලත් මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනියන් ගෙයින් ගෙට යන ආකාරය ඔබතුමාත් දැකලා ඇති. ඒ අය අපේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් වාගේ ගෙයින් ගෙට යනවා. ගෙයින් ගෙට ගිහිල්ලා ඒ ජනතාවගේ blood pressure පරීක්ෂා කිරීම, සීනි මට්ටම පරීක්ෂා කිරීම ආදි දේවල් කරලා ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් යොමු කරනවා, ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන වෙත සහ එතැනින් එහාට ද්විතීයික හා තෘතීයික සෞඛ්‍ය මධ්‍යස්ථානවලට.

මේ වැඩ පිළිවෙළ මඟින් තමයි, දැන් අප මුහුණ දෙන බෝ නොවන රෝග පිළිබඳ අභියෝගයට නිසි උත්තරයක් ලබා දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. මේක අප සොයාගත් සංකල්පයක් නොවෙයි. ලෝක සෞඛ්‍ය සංවිධානයත් පිළිගත් වැඩ පිළිවෙළක්. ලෝක සෞඛ්‍ය සංවිධානයේ කණ්ඩායමක් ලංකාවට ඇවිල්ලා, මෙම ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සහ අපේ ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය පිළිබඳව සමාලෝචනයක් කරලා, ඒ සම්බන්ධයෙන් හොඳ විමර්ශන වාර්තාවකුත් අප වෙත ලබා දී තිබෙනවා. ඒ ඔක්කෝම දේවල් උදව් කරගෙන තමයි අප මේ කටයුත්ත කරන්නේ. ඒ නිසා මෙම වැඩ පිළිවෙළ සංකල්පයක්, මූලධර්මයක් සහ ප්‍රතිපත්තියක් හැටියට පිළිගත් එකක්. මීට පෙර පැවැති රජයන්ද මේ සඳහා උත්සාහ කළා. අපි එම උත්සාහයන් තවදුරටත් සාර්ථක කරමින්, වර්ධනය කරමින් ඉදිරියට අරගෙන යනවා. එම නිසා මේ වැඩ පිළිවෙළට විරුද්ධ වෙන්න එපා. මේවා ආරෝග්‍යශාලා නොවෙයි. ඔබේ ගමේ, ඔබ නියෝජනය කරන ප්‍රදේශවල සිටින ජනතාවට පහසුවෙන් ළඟා විය හැකි, සාමාන්‍යයෙන් කිලෝමීටර් දෙකක පමණ දුරකින් හෝ උපරිම වශයෙන් කිලෝමීටර් දෙකහමාරක දුරකින් සිටින ජනතාවගේ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

සෞඛ්‍ය රැක බලා ගන්නා සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් සහිත මධ්‍යස්ථානයක් තමයි මේ යටතේ ලබා දෙන්නේ. ලබන වසර වන විට මෙම කටයුතු බොහෝදුරට අවසන් වෙනවා. මේ සියලු මධ්‍යස්ථාන අලුතින්ම ඉදි කරනවා නොවෙයි. අලුතින් ඉදි කරන ප්‍රමාණයකුත් තිබෙනවා. ඒ වාගේම, දැනට පවතින රජයේ ගොඩනැඟිලි සහ සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් මාතෘ හා ළදරු සායන නවීකරණය කරලා, expand කරලා, අදාළ පහසුකම් ලබා දීමේ කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය PHNOsලාත් දැන් පුහුණු කරගෙන යනවා. ඒ වාගේම, අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගනිමින් සිටිනවා. එමෙන්ම, අලුතින් බඳවා ගන්නා වෛද්‍යවරුන්ගෙන් කොටසක්ද මෙම මධ්‍යස්ථානවලට අනුයුක්ත කරනවා. ඒ විධියට තමයි මේ කටයුතු සිදු වන්නේ.

## කිරි ගොවීන් සහ කුකුළු පාලනයේ නිරත ගොවීන්: නුවරඑළිය දිස්ත්‍රික්කය
### பால் மற்றும் கோழிப்பண்ணையாளர்கள் : நுவரெலியா மாவட்டம்
### DAIRY AND POULTRY FARMERS : NUWARA ELIYA DISTRICT

2328/2026

**10. ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත කිරි නිෂ්පාදනයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයට හිමි වන ස්ථානය කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ කිරි ගොවීන්ගේ සහ කුකුළු පාලනයේ නිරත ගොවීන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ පශු වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු පවතින බවත්;

(ii) එම කාර්යාල සඳහා වාහන අවශ්‍යතා පවතින බවත්;

(iii) "දිට්වා" සුළි කුණාටුවෙන් විනාශයට පත් වූ පුඬළුඔය පශු වෛද්‍ය කාර්යාලය මේ දක්වා වසා දමා ඇති බවත්;

එතුමා දන්නේද?

(ඇ) ඉහත (ආ) (i), (ii) සහ (iii) සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் ஒட்டுமொத்த பால் உற்பத்தியில் நுவரெலியா மாவட்டம் வகிக்கும் இடம் யாது என்பதையும்;

(ii) மேற்படி மாவட்டத்திலுள்ள பால் உற்பத்தியாளர்களினதும், கோழி வளர்ப்பாளர்களினதும் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) நுவரெலியா மாவட்டத்தில் கால்நடை வைத்தியர்களின் வெற்றிடங்கள் நிலவுகின்றன என்பதையும்;

(ii) அந்த அலுவலகத்தில் வாகனங்களின் தேவை நிலவுகின்றது என்பதையும்;

(iii) தித்வா புயலால் சேதமுற்ற பூண்டுலோயா கால்நடை அலுவலகம் தற்போது வரை மூடப்பட்ட நிலையில் உள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(இ) மேற்படி (ஆ) (i),(ii) மற்றும் (iii) தொடர்பாக தற்போதுவரை மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) rank held by the Nuwara Eliya District in terms of total milk production of Sri Lanka; and

(ii) number of dairy farmers and poultry farmers in the said district, separately?

(b) Is he aware that -

(i) there are vacancies for veterinary surgeons in the Nuwara Eliya District;

(ii) there are vehicle requirements for the said offices; and

(iii) the Pundaluoya Veterinary Office, which was destroyed by Cyclone "Ditwah", remains closed to date?

(c) Will he also inform this House the steps taken to date regarding (b) (i), (ii) and (iii) above?

(d) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත කිරි නිෂ්පාදනයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයට හිමි වන්නේ පළමුවන ස්ථානයයි.

(ii) නුවරඑළිය දිස්ත්‍රික්කයේ කිරි ගව පාලනයේ නියුතු ගොවීන් සංඛ්‍යාව 12,152කි.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කුකුළු පාලනයේ නිරත ගොවීන් සංඛ්‍යාව 3,900කි.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ඇ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ පශු වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු පැවතීම සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති පියවර පහත පරිදි වේ.

මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර පශු වෛද්‍ය කාර්යාල 12ක් සහ පශු රෝහල් 1ක් ක්‍රියාත්මක වේ. ඒ අනුව, නුවරඑළිය දිස්ත්‍රික්කයට අදාළව 2026.10.01 දිනට සේවයේ නිරත පශු වෛද්‍ය නිලධාරින් සංඛ්‍යාව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ.

| තනතුර | අත්‍යවශ්‍ය නිලධාරි සංඛ්‍යාව | දැනට සිටින නිලධාරි සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| පශු වෛද්‍ය නිලධාරි | 30 | 09 | 21 |

මෙම පුරප්පාඩු සඳහා නවක පශු වෛද්‍ය නිලධාරින් බඳවා ගැනීමට අදාළ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

පශු වෛද්‍ය කාර්යාල සඳහා වාහන අවශ්‍යතා සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති පියවර පහත පරිදි වේ.

මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයක් සහ පශු වෛද්‍ය කාර්යාල 12ක් පවතී. මේවායෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය සහ පශු වෛද්‍ය කාර්යාල 1ක් සඳහා දැනට වාහන නොමැත. අනෙකුත් පශු වෛද්‍ය කාර්යාල 11 සඳහා වාහන 11ක් තිබේ. එම වාහන අතුරින් වාහන 2ක් ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර, තවත් වාහනයකට අලුත්වැඩියා කටයුතු සඳහා අමතර කොටස් සොයා ගැනීමට අපහසු වී පවතී. ඒ අනුව දැනට වාහන නොමැති කාර්යාල දෙක සඳහා අලුතින් වාහන 2ක් ලබා දීමට අවශ්‍යතාවක් පවතී. තවද, ඉතා අබලන් තත්ත්වයේ පවතින සහ අලුත්වැඩියා කටයුතු සඳහා අමතර කොටස් සොයා ගැනීමට අපහසු වී ඇති වාහන තුන සඳහා ද අලුතින් වාහන 3ක් ලබා දීමේ අවශ්‍යතාවක් පවතී.

රාජ්‍ය ආයතනවල භාවිතය සඳහා ඉදිරි කාලයේදී වාහන ආනයනය කිරීමට ඇති හැකියාව පිළිබඳව සලකා බලමින් පවතී.

"දිට්වා" සුළි කුණාටුවෙන් පූඩළුඔය පශු වෛද්‍ය කාර්යාලයට හානි සිද්ධ වුණා. එම කාර්යාලය දැන් වෙනත් තැනකට අරගෙන ගිහින් තිබෙනවා.

ඒ අනුව පූඩළුඔය පශු වෛද්‍ය කාර්යාලය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ස්ථිර විසඳුමක් ලබා ගන්නා තෙක් තාවකාලිකව කොත්මලේ පශු වෛද්‍ය කාර්යාලයීය ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යෑමට කටයුතු කර තිබෙනවා.

පූඩළුඔය පශු වෛද්‍ය කොට්ඨාසය සඳහා ස්ථිර කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීමට පූඩළුඔය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට යාබද හිස් ඉඩමින් කොටසක් මැනුම් කර, මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමටත්, අනතුරුව නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීමටත් අවශ්‍ය කටයුතු මේ වනකොට සිදු කරමින් පවතිනවා.

(ඈ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දැන් පිළිගත්තා නුවරඑළිය දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය නිලධාරින් අඩු බව. ඒ වාගේම එහි පශු වෛද්‍ය කාර්යාලවලට වාහන අඩුවකුත් තිබෙනවා. නුවරඑළිය කියන්නේ වැඩිම කිරි නිෂ්පාදනයක් කරන දිස්ත්‍රික්කයක්. එම නිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා වාහන නැති පශු වෛද්‍ය කාර්යාලවලටත් වාහන දෙන්න. එහෙම නැත්නම් ඒ සතුන්ගේ මරණ සංඛ්‍යාව වැඩි වෙනවා.

ඊළඟ කාරණය මේකයි. ඒ කිරි ගොවි පොළවල් ඔක්කොම තිබෙන්නේ වතු ඇතුළේ. වතු ඇතුළට යනකොට හොඳ වාහනයක් දෙන්න ඕනෑ. අබලන් වාහනයක් අරගෙන ගිහින් මඟ නැවතුණාම, ගොවියන්ටම තමයි සල්ලි දීලා වාහන අරගෙන යන්න වෙන්නේ. ඒකෙනුත් ඒ මිනිස්සු දුක් විඳිනවා. ඒ නිසා එම කාර්යාලවලට හොඳ වාහන ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. එසේ කරාවි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒක මධ්‍යම පළාත් සභාවටයි අයිති. මධ්‍යම පළාත් සභාවත් එක්ක කථා කරලා ඒ කටයුත්ත පුළුවන් ඉක්මනට කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමා මතු කළ කාරණය හරි. ඒ පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු වෙලා තිබෙනවා. 2030 වනකොට අපට කිරි ක්ෂේත්‍රයෙන් යන්න ඉලක්කයක් තිබෙනවා. ඒ ඉලක්කයට යෑම සඳහා අපි මේ වනකොට වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළේම එක කොටසක් තමයි ඔන්න ඔය කියන අඩුපාඩුකම් සම්පූර්ණ කරන එක. පශු වෛද්‍යවරුන් පිරිසක් අපි මීට මාස කිහිපයකට කලින් බඳවා ගත්තා. ඇත්තටම පශු වෛද්‍යවරුන්ගේ ලොකු හිඟයක් තිබෙනවා. පේරාදෙණියේ පශු වෛද්‍ය පීඨය පළල් කර හෝ වෙනත් පීඨයක් ඇති කර හෝ එම අංශයෙන් විශ්වවිද්‍යාලවලින් එළියට එන ප්‍රමාණය තවත් වැඩි කර ගන්න ඕනෑ කියන යෝජනාවත් සිදු කර ඒ ගැන අපි විශේෂයෙන්ම ගරු අගමැතිතුමියත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා.

ඊළඟට ඔබතුමා කියපු වාහන ප්‍රශ්නය ගත්තොත්, ඉතාම අබලන් තත්ත්වයේ වාහන ගොඩක් තිබෙනවා. රජය මේ වන විටත් ප්‍රතිපත්තියක ඉන්නවා, පුරප්පාඩු තිබෙන රජයේ සේවාවන් සම්පූර්ණ කරන්න, සේවයේ ස්ථිර කරපු නැති අය ස්ථිර කරන්න. කලින් ඒවා කළේ නැහැ. කලින් ඒවා කළා නම් මෙහෙම ප්‍රශ්නයක් එන්නේ නැහැ. අපි දැන් ඒ කටයුත්තට අත ගහලා තිබෙනවා. රජයේ ආයතනවලට අත්‍යවශ්‍ය වාහන පහසුකම් ලබා දීම සඳහාත් රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ අනුව අපට ඉදිරි සැලසුම් ඇතුළේ මේ කියන ගැටලු නිරාකරණය කර ගන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණය මම පිළිගන්නවා. අප මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර තිබෙන බව මම මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපේ වතුවල වෙන වෙනම පට්ටි හදන්න බැහැ. මොකද, වතුවල දැන් ගෙවල් හදන්නත් ඉඩ දෙන්නේ නැහැ. පට්ටි හදන්න කොහොමත් ඉඩ දෙන්නේ නැහැ. එම නිසා වතුවල common පට්ටි හදලා ගවයන් ඇති කරන්න කටයුතු කරනවා නම් හොඳයි. මම ඉස්සර පළාත් සභාවේ මේ අමාත්‍යාංශය කරන කොට ඒක කරලා තිබෙනවා. ඊට පස්සේ ඒක නැවතුණා. මම මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ වාගේ common පට්ටි හදලා, ඒ common පට්ටිවල සත්තු 15ක් හරි 20ක් හරි වශයෙන් ඒගොල්ලන්ට බෙදා දෙන විධියට කටයුතු කරන්න පුළුවන්. ඒක කරනවා නම් හොඳයි කියන එකයි මගේ අදහස. ඔබතුමා ඒක ඉදිරියට ක්‍රියාත්මක කරනවාද කියා කියන්න පුළුවන්ද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ඔව්. රටේම පශු වෛද්‍ය කොට්ඨාස කාර්යාල 337ක් තිබෙනවා. මේ වනකොට අපි මධ්‍යස්ථාන 300ක් තෝරාගෙන Dairy Hubs හදලා තිබෙනවා; සංවිධාන හදලා තිබෙනවා. ඒ සංවිධාන හරහා ගොවි ජනතාවට ආධාර ලබා දෙන වැඩසටහන් කිහිපයක් අපි හඳුන්වා දී තිබෙනවා. ඒ අනුව ගොවි ජනතාවට සහනාධාර විශාල ප්‍රමාණයක් ලැබෙනවා. දැනට මේ Dairy Hub ව්‍යාපෘතිය යටතේ රටෙන්ම ගොවීන් 5,000ක් තෝරාගෙන තිබෙනවා.

ඒ වාගේම තමයි, "දිට්වා" සුළි කුණාටුවෙන් කැඩිච්ච ගව නිවාස, එළු නිවාස සියල්ලම නොමිලේ හදා දීම සඳහා මේ වනකොට වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ අනුව, Dairy Hub ව්‍යාපෘතිය යටතේ ඔබතුමා කියපු කාරණය සම්බන්ධව ගොවි ජනතාව සමඟත් සාකච්ඡා කරලා ගැළපෙන විධියට ඒ කටයුතුවලට මැදිහත් වෙන්න අපට පුළුවන්. තිබෙන ප්‍රායෝගික තත්ත්වයත් එක්ක, බිමත් එක්ක, පරිසරයත් එක්ක කරුණු සියල්ල සැලකිල්ලට අරගෙන විද්‍යාත්මක ක්‍රමවේදයකට යෝජනා සම්මත කරගෙන අපට ඒවා ක්‍රියාත්මක කරන්න පුළුවන්. මෙකයි කියලා අපට දැන්මම මේකට ආකෘතියක් කියන්න අමාරුයි. ඒ ඒ බිමට ගැළපෙන විධියට ඒ සඳහා යෝජනා ඉදිරිපත් වනකොට, ඒ තත්ත්වයන් සැලකිල්ලට අරගෙන අපට ඒ පිළිබඳව අවධානය යොමු කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## සුනඛයින්ට ජලභීතිකා මර්දන එන්නත් ලබා දීම සහ වන්ධ්‍යාකරණය: 2025/2026 සඳහා මුදල් වෙන් කිරීම

## நீர்வெறுப்பு நோய்த் தடுப்பூசி மற்றும் நாய்களுக்கான கருத்தடை: 2025/2026ஆம் ஆண்டுக்கான நிதி ஒதுக்கீடு

RABIES VACCINATION AND STERILIZATION OF DOGS: ALLOCATION OF FUNDS FOR 2025/ 2026

2139/2026

**2. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු දිනේෂ් හේමන්ත මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு தினேஷ் ஹேமந்த சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Dinesh Hemantha)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2025 වර්ෂයේදී සුනඛයන් සපා කෑම හේතුවෙන් ජලභීතිකා රෝගය වැළදී මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වර්ෂයේදී ජලභීතිකා රෝගීන් සඳහා ප්‍රතිකාර සහ එන්නත්කරණ කටයුතු වෙනුවෙන් වැය කර ඇති මුදල කොපමණද;

(iii) සුනඛයින් වන්ධ්‍යාකරණය කිරීම සඳහා එම වර්ෂයේදී වෙන් කළ මුළු මුදල කොපමණද;

(iv) එම මුදල් භාවිත කොට වන්ධ්‍යාකරණයට ලක් කළ වීදි සුනඛයින් සංඛ්‍යාව කොපමණද;

(v) සුනඛයින් වන්ධ්‍යාකරණ වැඩසටහන සඳහා 2026 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශයට වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(vi) එම මුදල් භාවිත කර 2026 වර්ෂයේ මේ වන විට වන්ධ්‍යාකරණයට ලක් කළ වීදි සුනඛයින් සංඛ්‍යාව කොපමණද;

(vii) අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සුනඛයින් වන්ධ්‍යාකරණය කිරීමේ වැඩසටහනේ ස්වභාවය පිළිබඳව කෙටි විස්තරයක් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025ஆம் ஆண்டில் நாய்க்கடி காரணமாக நீர்வெறுப்பு நோயால் பீடிக்கப்பட்டு உயிரிழந்தவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி ஆண்டில் நீர்வெறுப்பு நோயாளர்களுக்கு சிகிச்சையளித்தல் மற்றும் தடுப்பூசியேற்றல் நடவடிக்கைகளுக்காகச் செலவிடப்பட்டுள்ள நிதித் தொகை யாது என்பதையும்;

(iii) மேற்படி ஆண்டில் நாய்களை மலடாக்குவதற்காக ஒதுக்கப்பட்ட மொத்த நிதி யாது என்பதையும்;

(iv) அந்நிதியைப் பயன்படுத்தி மலட்டுத்தன்மைக்கு உட்படுத்தப்பட்ட தெரு நாய்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) நாய்களை மலடாக்குவதற்கான வேலைத்திட்டத்திற்காக 2026ஆம் ஆண்டில் அமைச்சுக்கு ஒதுக்கப்பட்டுள்ள மொத்த நிதி யாது என்பதையும்;

(vi) அந்நிதியைப் பயன்படுத்தி 2026ஆம் ஆண்டில் இதுவரை மலட்டுத்தன்மைக்கு உட்படுத்தப்பட்ட தெருநாய்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vii) அமைச்சின்மூலம் நடைமுறைப்படுத்தப்படும் நாய்களை மலடாக்குவதற்கான வேலைத்திட்டத்தின் தன்மை குறித்து சிறு விளக்கத்தை தர முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of persons who died of rabies as a result of dog bites in 2025;

(ii) expenditure incurred on the treatment and vaccination provided to rabies patients during the said year;

(iii) total amount allocated for sterilization of dogs during the said year;

(iv) number of stray dogs sterilized using the said allocation;

(v) total amount allocated to the Ministry in 2026 for the dog sterilization programme;

(vi) number of stray dogs sterilized to date in 2026 using the said allocation; and

(vii) nature of the dog sterilization programme implemented by the Ministry, in brief?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 14

(ii) රුපියල් 655,824,000.00කි.

(iii) 2025 වර්ෂයේ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා සඳහා වෙන් වූ මුළු මුදල රුපියල් මිලියන 220ක් වන අතර, සුනඛ වන්ධ්‍යාකරණය ලෙස විශේෂිත වූ මුදලක් වෙන් කර නැත.

(iv) සුනඛ වන්ධ්‍යාකරණය සිදු කිරීමේදී වීදි සුනඛයින්, නිවාසවල ඇති කරන සුනඛයින් ලෙස වර්ගීකරණයක් සිදු නොකරන බැවින් වන්ධ්‍යාකරණය කළ වීදි සුනඛයින් සංඛ්‍යාව වාර්තා වී නොමැත.

(v) 2026 වර්ෂය සඳහා මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජලභීතිකා මර්දන වැඩසටහන (සුනඛයන් එන්නත්කරණය, වන්ධ්‍යාකරණය, දැනුවත් කිරීමේ වැඩසටහන්ද ඇතුළුව සමස්ත වැඩසටහන) සඳහා වෙන් වූ මුදල රුපියල් මිලියන 51කි.

(vi) එක් එක් දිස්ත්‍රික්කයන්හි වන්ධ්‍යාකරණ කටයුතු අවසන් වූ පසු ලැබෙන වවුචර් සමඟ ඒ ඒ දිස්ත්‍රික්කයන්හි වන්ධ්‍යාකරණය කරනු ලබන සුනඛයන් සංඛ්‍යාව සඳහන් කර එවනු ලබන අතර, 2026.08.30 වන විට දිස්ත්‍රික්ක 4ක සුනඛයන් 5,951ක් වන්ධ්‍යාකරණයට ලක් කර ඇති අතර ඉතිරි දිස්ත්‍රික්කයන්හි වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතී.

(vii) මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා මඟින් අදාළ දිස්ත්‍රික්කයේ අවශ්‍යතාව පිළිබඳව විමසා බලමින් සංඛ්‍යාත්මක විස්තර ලබා ගන්නා අතර, අදාළ දිස්ත්‍රික් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලින් ලබා ගන්නා එම දත්ත මත පදනම්ව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලබයි. පසුව ඉදිරිපත් වන ආයතන, පුද්ගලයින් හෝ ලංසු සලකා බලමින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව වන්ධ්‍යාකරණ සැත්කම් සඳහා සුදුසුම ආයතනය හෝ පුද්ගලයා තෝරා ගනු ලැබේ. එම ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව අනුමත ආයතන/පුද්ගලයන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කිරීමෙන් අනතුරුව, අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ වන්ධ්‍යාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. වැඩසටහන නිමා වූ පසු සිදු කරන ලද කාර්යයන් අදාළ ප්‍රමිතීන්ට අනුකූල බවට අධීක්ෂණ නිලධාරීන් විසින් සහතික කරනු ලබන අතර, ඉන් පසුව අනුමත ක්‍රමවේදයන්ට යටත්ව අදාළ සේවාව වෙනුවෙන් ගෙවීම් සිදු කරනු ලබයි.

(ආ) පැන නොනගී.

## ශ්‍රී ලංකා කජු සංස්ථාව සතු ඉඩම්: 2015 වසරේ සිට කජු වගාව
## இலங்கை மரமுந்திரிகைக் கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான காணி: 2015இலிருந்து மரமுந்திரிகைச் செய்கை
LAND BELONGING TO SRI LANKA CASHEW CORPORATION: CASHEW CULTIVATION SINCE 2015

2207/2026

**6. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chithral Fernando)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික කජු නිෂ්පාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ ශ්‍රී ලංකා කජු සංස්ථාව සතු ඉඩම් ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් කාලය තුළ සංස්ථාව සතු ඉඩම්වල කජු වගා කර ඇති ඉඩම් ප්‍රමාණය සහ කජු වගා නොකළ ඉඩම් ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සංස්ථාව සතු ඉඩම්වල වුවද විධිමත් පරිදි කජු වගා කිරීමට සංස්ථාව අසමත් වීමට බලපා ඇති සාධක කවරේද;

(v) එම තත්ත්වය මඟ හරවා කජු සංස්ථාව සතු ඉඩම්වල විධිමත් පරිදි කජු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இதுவரையான காலப்பகுதியில் இலங்கையின் வருடாந்த மரமுந்திரிகை உற்பத்தி வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியில் இலங்கை மரமுந்திரிகை கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான காணிகளின் அளவு ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி (i)இல் குறிப்பிடப்பட்ட காலப்பகுதியில், கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான காணிகளில் மரமுந்திரிகை பயிரிடப்பட்ட காணிகளின் அளவும், மரமுந்திரிகை பயிரிடப்படாத காணிகளின் அளவும், ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான காணிகளில்கூட, மரமுந்திரிகையை முறைப்படி பயிரிடுவதற்கு கூட்டுத்தாபனம் தவறியமைக்குக் காரணமாக அமைந்த காரணிகள் யாவை என்பதையும்;

(v) மேற்படி நிலைமையைத் தவிர்த்து, மரமுந்திரிகை கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான காணிகளில் மரமுந்திரிகைச் செய்கையை முறைப்படி ஊக்குவிப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he state the -

(i) annual cashew production in Sri Lanka from the year 2015 to date, separately;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) extent of land owned by the Sri Lanka Cashew Corporation during the said period, separately for each year;

(iii) extent of land cultivated with cashew and the extent uncultivated, out of the land owned by the Corporation during the period referred to in (i) above, separately for each year;

(iv) factors that have contributed to the failure of the Corporation to cultivate cashew in a systematic manner even in the lands owned by the Corporation; and

(v) measures that will be taken by the Ministry to overcome this situation and to promote cashew cultivation systematically on the land belonging to the Cashew Corporation?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | ලෙලි කජු නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2015 | 14,043 |
| 2016 | 14,732 |
| 2017 | 16,068 |
| 2018 | 35,618 |
| 2019 | 27,895 |
| 2020 | 26,784 |
| 2021 | 8,225 |
| 2022 | 14,730 |
| 2023 | 13,014 |
| 2024 | 14,007 |
| 2025 | 13,390 |

(ii)

| වර්ෂය | ශ්‍රී ලංකා කජු සංස්ථාව සතු ඉඩම් ප්‍රමාණය (අක්කර) |
|---|---|
| 2015 | 10,210 |
| 2016 | 10,210 |
| 2017 | 10,210 |
| 2018 | 10,210 |
| 2019 | 10,846 |
| 2020 | 10,846 |
| 2021 | 11,346 |
| 2022 | 11,346 |
| 2023 | 11,346 |
| 2024 | 11,176 |
| 2025 | 11,126 |
| 2026 | 11,126 |

(iii)

| වර්ෂය | සංස්ථාව සතු මුළු අක්කර ප්‍රමාණය | කජු වගා කළ අක්කර ප්‍රමාණය | කජු වගා නොකළ අක්කර ප්‍රමාණය |
|---|---|---|---|
| 2015 | 10,210 | 3,224 | 6,986 |
| 2016 | 10,210 | 3,324 | 6,886 |
| 2017 | 10,210 | 3,040 | 7,170 |
| 2018 | 10,210 | 3,095 | 7,115 |
| 2019 | 10,846 | 3,205 | 7,641 |
| 2020 | 10,846 | 3,390 | 7,456 |
| 2021 | 11,346 | 3,580 | 7,766 |
| 2022 | 11,346 | 3,823 | 7,523 |
| 2023 | 11,346 | 3,823 | 7,523 |
| 2024 | 11,176 | 4,079 | 7,097 |
| 2025 | 11,126 | 4,069 | 7,057 |
| 2026 | 11,126 | 4,094 | 7,032 |

මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇමුණුම** මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) 1. ශ්‍රී ලංකා කජු සංස්ථාව සතු ඉඩම්වල කජු වගා කිරීමට අවශ්‍ය වන ස්වයං මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

2. විවිධ හේතූන් මත කජු වගාව ව්‍යාප්තව පවතින ප්‍රදේශවලින් කම්කරු ශ්‍රමය ලබා ගැනීමට පවතින අපහසුව.

(v) ඔව්.

රජයට අයත් වාණිජමය නොවන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ ශ්‍රී ලංකා කජු සංස්ථාවද ඉදිරියේදී ප්‍රතිව්‍යුහගත වන අතර සංස්ථාව සතු ඉඩම් රජයට අයත් වැවිලි සමාගම් වෙත පැවරීම සඳහා එම ආයතන වෙතින් යෝජනා කැඳවා ඇත. තවද, සමස්ත අක්කර 6,498ක් වන කොණ්ඩච්චි වතුයායේ පවතින ඌන උපයෝජිත ඉඩම් හෙක්ටෙයාර 1,541ක් (අක්කර 3,806) ප්‍රශස්ත උපයෝජනය යටතේ කජු වගාව සඳහා සුදුසු ආයෝජකයින් වෙත ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### "කාවන්තිස්ස" ඇතාගේ ප්‍රතිකාර ක්‍රියාවලිය සහ මරණය සම්බන්ධ විමර්ශනය
### "காவன்திஸ்ஸ" யானையின் சிகிச்சை நடவடிக்கை மற்றும் மரணம் குறித்த விசாரணை
### TREATMENT PROCESS AND INVESTIGATION INTO DEATH OF TUSKER "KAWANTHISSA"

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මම ඉතාම සංවේදී ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නේ. ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ දළ ඇතුන් අතර සුවිශේෂී ස්ථානයක් හිමි "කාවන්තිස්ස" ඇතා වෙඩි වැදීමෙන් සිදු වූ තුවාලවලට ප්‍රතිකාර ලබමින් සිටියදී 2026 ඔක්තෝබර් 16වන දින මිය යෑමත් සමඟ, එම ඇතාගේ ජීවිතය බේරා ගැනීමට ගත් පියවර, ප්‍රතිකාරවල ප්‍රමාණවත්භාවය, නිලධාරින්ගේ වගකීම් සහ විමර්ශන සම්බන්ධයෙන් බරපතළ විවේචන රැසක් ඉදිරිපත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මම මීට අමතරව කියන්න කැමැතියි, අපේ රටේ ඇත් පරපුර වඳ වීගෙන යන පරපුරක් බවට පත් වෙලා තිබෙන බව. අපේ රටේ පිරිමි අලි ගහනයෙන් සියයට 6ත්, 10ත් අතර ප්‍රමාණයක් පමණයි දළ ඇතුන් හැටියට සලකන්නේ. ඒ අහිමි වුණු සතුන්ගේ නම් කිහිපයක් මම සඳහන් කරන්නම්. වලස්කෙම ඇතා, යාලෙ රාජා, මහ පූට්ටුවා, පොඩි පූට්ටුවා, කණ්ඩුල, දළ පූට්ටුවා, ස්ටාර්, කුබ්ලයි ඛාන්, ගෙන්ගිස් ඛාන්, තිලක්, කොබ්බෑකඩුව ඇතා වාගේම කලාවැව, කහල්ල පල්ලේකැලේ වනය ආශ්‍රිතව සිටි ධාතුසේන, වළගම්බා, මහ තනි දළයා, රේවත ආදී වශයෙන් ඇතුන් විශාල ප්‍රමාණයක් අපට අහිමි වෙලා තිබෙනවා. මෑත කාලයේ භාතිය, තේක්ක රාජා වාගේම දින කිහිපයකට පෙර කාවන්තිස්ස කියන ඇතාත් අපට අහිමි වුණා. මේක ඉතාම සංවේදී ප්‍රශ්නයක් වාගේම අපේ රටේ ඇත් සම්පතට මේ වන විට එල්ල වී තිබෙන බලවත් ප්‍රහාරයක්. ඇත්තවශයෙන්ම ඇතුන් ඝාතනය කරන සංස්කෘතියක් දීර්ඝ කාලයක් පුරාවටම ක්‍රියාත්මක වනවා. මේ ඇත් ඝාතන රැල්ල නතර කරන්නට අපි හැමෝම කටයුතු කරන්නට ඕනෑ.

මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ රටේ පොදු ප්‍රශ්නයක් හැටියටයි. මේකට පක්ෂ දේශපාලනයක්, ජාති, ආගම්, කුලමල, වෙනත් තරාතිරම් භේද මොනවත් නැහැ. මා බලාපොරොත්තු වනවා, පහත ප්‍රශ්න සඳහා ඉතාම විධිමත් පිළිතුරු.

1. කාවන්තිස්ස ඇතාට වෙඩි වැදී ඇති බවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ පරිසර අමාත්‍යාංශයට ප්‍රථම වරට දැනුම් දුන් දිනය, ප්‍රතිකාර ආරම්භ කළ දිනයන් සහ ඒ සඳහා වගකීම දැරූ නිලධාරින්, පශු වෛද්‍යවරුන් පිළිබඳ විස්තර මොනවාද?

   රටේ සුවිශාල බහුතරයක් පිළිගන්නවා, කාවන්තිස්ස කියන්නේ සුවිශේෂී ඇතෙක් බව. ඒ පිළිගැනීම රජයටත් තිබෙනවාද? එසේ තිබෙනවා නම්, වෙඩි වැදී තුවාල වී සිටින අවස්ථාවේදී කාවන්තිස්ස ඇතාට විශේෂ සැලකිල්ලක් දක්වන්නට කටයුතු නොකළේ ඇයි කියන එක මම අහන්න කැමැතියි.

2. මෑත කාලයේ ආන්දෝලනයට ලක් වූ භාතිය ඇතුගේ මියයෑමත් සමඟ අනතුරට ලක්වන හස්තීන් වෙනුවෙන් ප්‍රතිකාර ලබා දෙන ක්‍රමවේදයේ වෙනසක් සිදුකරනු ලැබුවේ නම්, එම පැරණි ක්‍රමවේදයේ හා නව ක්‍රමවේදයේ වෙනස කුමක්ද?

   භාතිය ඇතා වාගේම තේක්ක රාජා ඇතුළු තවත් ඇතුන් ගණනාවකුත්, විශේෂයෙන්ම ගල්ගමුව ප්‍රදේශයේ හිටපු දළ පූට්ටුවෙකුත් අපට අහිමි වුණා. දිගින් දිගටම මේ ඇත් පරපුර අහිමිවීමත් සමඟ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු පරිසර අමාත්‍යාංශයත්, ඒ අදාළ ආයතනත් මෙය සුවිශේෂී තත්ත්වයක් හැටියට සලකා මේ සම්බන්ධව ගත් සුවිශේෂී පියවර කුමක්ද කියන එක මම අහන්න කැමැතියි. ඒ වාගේම තේක්ක රාජා, භාතිය වැනි ඇතුන් අපට අහිමිවීම තුළින් පාඩම් ඉගෙන ගත්තාද, නැද්ද කියන ප්‍රශ්නයත් අපට අහන්න තිබෙනවා. පාඩම් ඉගෙන ගත්තා නම් අපි රටක් හැටියට වාගේම රජයක් හැටියට මේ අවස්ථාවේදී විශේෂයෙන්ම අනුගමනය කරපු සුවිශේෂී වැඩ පිළිවෙළ කුමක්ද?

3. කාවන්තිස්ස ඇතාට ප්‍රතිකාර ආරම්භ කළ දිනයේ සිට සිදු කළ වෛද්‍ය පරීක්ෂණ, ලබා දුන් ඖෂධ, ඒවායේ මාත්‍රා, රුධිර පරීක්ෂණ සහ වෙනත් පරීක්ෂණ, ප්‍රතිකාරවල වෙනස්කම්, මුල් වෛද්‍ය වාර්තා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

   ඇත්තවශයෙන්ම මේ තොරතුරු සියල්ලක්ම මේ සභාවට ඉදිරිපත් කිරීම අතිශයින්ම වැදගත්. අපට අවශ්‍යයි, සත්‍යය අවබෝධ කරගන්න; යථාර්ථය අවබෝධ කරගන්න. ඒ වාගේම සිදු වුණු සියලු ක්‍රියාදාම පිළිබඳව විනිවිදභාවයෙන් යුක්ත වූ කරුණු මත, දත්ත මත පදනම්ව අපට යම්කිසි නිගමනවලට එන්න අවශ්‍යයි. ඒ නිසා ඒ තොරතුරු රටටම හෙළිදරව් කරන්නට ඕනෑ.

4. මේ ඇතුන් ඝාතනය කරන ඝාතන සංස්කෘතිය තුළ කාවන්තිස්ස ඇතාගේ තත්ත්වය බරපතළ වූ අවස්ථාවලදී ගනු ලැබූ වෛද්‍ය තීරණ, ප්‍රතිකාර පිළිබඳ වාර්තා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

   ඒ වාර්තාත් අත්‍යවශ්‍යයි. මේ සම්බන්ධව අපිත් දැනගන්න ඕනෑ, රටත් දැනගන්න ඕනෑ, ජනතාවත් දැනගන්න ඕනෑ.

5. කාවන්තිස්ස ඇතාගේ ජීවිතය බේරා ගැනීම සඳහා අතිරේක විශේෂඥ පශු වෛද්‍ය සහාය, යුද හමුදා සහාය හෝ විශේෂිත ගලවා ගැනීමේ උපකරණ අවශ්‍ය බව තීරණය කළේ නම්, ඒවා ඉල්ලා සිටියේ කවර ආයතනවලින්ද?

   ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරපු දින කවරේද කියන එකත් මම මේ අවස්ථාවේදී අහන්න කැමැතියි.

   අපේ රටේ වනජීවී ක්ෂේත්‍රය ආශ්‍රිතව බරපතළ ලෙස පශු වෛද්‍යවරුන්ගේ හිඟතාවක් තිබෙනවා. පශු වෛද්‍යවරුන් 33ක් ඉන්න ඕනෑ තැන 17දෙනායි ඉන්නේ. එම නිසා අලුතෙන් ඒ අය බඳවා ගැනීමට ගන්නා පියවර මොනවාද?

   මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමැතියි, පානම ප්‍රදේශයේ කණ්ඩුල කියන දළ පූට්ටුවා වෙඩි තැබීමක් නිසා බිම වැටී සිටින මොහොතක - මීට දශක කිහිපයකට පෙර - ඇඹිලිපිටියේ යුද හමුදාවේ ඉංජිනේරු අංශය හරහා අලි උස්සන harness එක ඒ පානම ප්‍රදේශයට යවන්න අපට පුළුවන් වුණු බව. ඒ වාගේම කාවන්තිස්ස ඇතා ඇද වැටිලා හිටපු මොහොතේ - කුඹුරක වැටිලා හිටියේ - එවැනි උත්සාහයක්, එවැනි පියවරක් ගත්තාද කියලාත් මම දැනගන්න කැමැතියි.

6. ඇතාගේ ප්‍රතිකාර සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ, රසායනාගාර පහසුකම්, ඖෂධ හෝ මානව සම්පත්වල හිඟයක් පැවතියේද? එවැනි හිඟයක් තිබුණා නම් එය ප්‍රතිකාර කිරීම කෙරෙහි බලපෑවේ කෙසේද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

7. කාවන්තිස්ස ඇතා ප්‍රතිකාර ලබමින් සිටි කාලය තුළ වගකිවයුතු නිලධාරීන් සිද්ධිය සම්බන්ධයෙන් සෘජු අධීක්ෂණයක් හෝ ස්ථානීය නිරීක්ෂණයක් සිදු කළේද? එම නිරීක්ෂණ, උපදෙස් සහ ගත් පියවර මොනවාද?

මම මාධ්‍ය හරහා දැක්කා, යම් අවස්ථාවකදී ඇමතිතුමා ඒ ස්ථානයට ගිහිල්ලා සිටිනවා. මම දැනගන්න කැමැතියි, එතැනට වනජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්තුමා ගියාද, ඒ වාගේම අදාළ අනෙකුත් ඉහළ නිලධාරින් ගියාද, නැද්ද කියන එක. ඒ වාගේම ඇමතිතුමාත් ඒ ස්ථානයට ගිහිල්ලා නිරීක්ෂණය කරලා ඒ සම්බන්ධව ගත් පියවර මොකක්ද කියන එකත් මම මේ අවස්ථාවේ අහන්න කැමැතියි.

8. කාවන්තිස්ස ඇතාගේ මරණය ඝාතනයක් බව රජය පිළිගන්නේද? කාවන්තිස්සට වෙඩි තැබීම සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනයේ වර්තමාන ප්‍රගතිය කුමක්ද? ඒ ඇතාට මීට පෙරද තර්ජන, පහරදීම් හෝ තුවාල සිදුවීම් වාර්තා වී තිබේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ආරක්ෂක පියවර මොනවාද?

ඇත්තවශයෙන්ම මීට පෙරත් ඒ ආකාරයෙන් තර්ජන තිබුණා. විවිධ වෙඩි ප්‍රහාර එල්ල වෙලා තිබුණා, තුවාල සිදු වෙලා තිබුණා. ඒවා සිදු වුණාට පස්සේ පරිසරවේදීන් විශාල පිරිසක් මේ කරුණු කාරණා ඉදිරිපත් කළා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත්, ඇමතිතුමාටත් මේ කාවන්තිස්ස ඇතා පිළිබඳව විශේෂිත වූ ආරක්ෂක පියවර ගන්න කියලා. මීට මාස කිහිපයකට පෙරදීයි ඒ අවදානම්කාරී තත්ත්වය අමාත්‍යාංශයට වාර්තා කළේ. මම දැනගන්න කැමැතියි, එසේ නම් ඒ සම්බන්ධව ගත් පියවර මොකක්ද කියන එක.

ගරු කථානායකතුමනි, මට මේ ගැනත් දැනගන්න ලැබුණා. මම විශේෂයෙන් ස්තුතිවන්ත වනවා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වනසත්ව අඩවි ආරක්ෂක චතුර ගුණරත්න මහතාටත්, ASP රොහාන් ඕලුගල මහතා ප්‍රමුඛ කණ්ඩායමටත්. මොකද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කණ්ඩායම සහ රොහාන් ඕලුගල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන වැටලීම් අංශය විසින් යම්කිසි සක්‍රිය ක්‍රියාදාමයක් මඟින් කාවන්තිස්ස ඇතාට වෙඩි තැබීම සම්බන්ධව යම් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමක් සිදු කර තිබෙනවා. ඇත්තටම නීතිමය තත්ත්වයක් තිබෙන නිසා මම ඒ ගැන විග්‍රහ කරන්න යන්නේ නැහැ.

ඇමතිතුමාට මතක ඇති, මම ගිය සතියේ පාර්ලිමේන්තුවේදී කිව්වා, කාවන්තිස්ස ඇතාට වෙඩි තැබූ අය අල්ලා ගන්න ගිය චතුර ගුණරත්න කියන නිලධාරියාගේ රස්සාව අහිමි කරන්න මේ දෙපාර්තමේන්තුව කටයුතු කරන බව. ඒ, මේ ඇතා මරපු මිනිස්සු අල්ලපු නිලධාරියා. මම ගිය සතියේ කිව්වේ, ඒ මනුස්සයාගේ රස්සාව අහිමි කරන්න යනවා, ඔහුගේ රාජකාරිය පිළිබඳව Facebook එකේ දැම්මා කියලායි. එහෙම කරන්න එපා. මම ඔබතුමාට මේ අවස්ථාවේදී යෝජනාවක් කරනවා, චතුර ගුණරත්න මැතිතුමාගේත්, අවශ්‍ය නම් රොහාන් ඕලුගල මැතිතුමාගෙත් සහාය අරගෙන, ඒ දෙපළගේ නායකත්වයෙන් මේ රටේ ඇතුන් ආරක්ෂා කරන විධිමත් වැඩසටහනක්, විධිමත් කාර්ය සාධක බලකායක් ක්‍රියාත්මක කරලා අපේ රටේ ඉන්න මේ ඇත් සම්පත ආරක්ෂා කර ගන්න කියලා. ඇතුන් විශේෂිත වූ සත්ව කොට්ඨාසයක් හැටියට හඳුන්වන්න පුළුවන්. අපි ඒකට කියනවා, special species කියලා. ඇත්තවශයෙන්ම ඒ iconic species රැක ගන්නට කටයුතු කරන්නට ඕනෑ. චතුර ගුණරත්නව ගෙදර යවන්නේ නැතුව, ඔහුගේ රස්සාව අහිමි කරන්නේ නැතුව, ඒ වාගේ දක්ෂ නිලධාරියෙක් උපයෝගී කරගෙන, ඕලුගල මහත්මයාගේත් ආධාර උපකාර අරගෙන මේ රටේම ඇත් සම්පත ආරක්ෂා කරන වැඩ පිළිවෙළකට කරුණාකරලා යොමු වෙන්න. ඔබතුමන්ලා ඒ වාගේ දෙයක් කරන්නට කටයුතු කරනවාද කියලා මම අහන්න කැමැතියි.

9. ඇතාගේ මරණයට නිශ්චිත හේතුව තහවුරු කිරීම සඳහා පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කළේ නම් එහි නිගමන ඇතුළත් වාර්තා, නිරීක්ෂණ සභාගත කරන්නේද? ඇතාගේ දේහය පිළිබඳ අවසාන කටයුතු සිදු කිරීමට අධිකරණ නියෝගයක් ලබාගෙන තිබෙනවාය කියා අපට ආරංචි වනවා. එසේ නම් එම නියෝගයත් සභාගත කරන්නේද? දේහය සම්බන්ධයෙන් ගනු ලැබූ අවසන් ක්‍රියාමාර්ග මොනවාද?

ගරු ඇමතිතුමනි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් මහාචාර්යවරුන් ප්‍රමුඛ කණ්ඩායමක් ඇවිල්ලා එම මරණ පරීක්ෂණ කටයුතු සිදු කළා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය ක්ෂේත්‍රය මම මොහොතකටවත් අවතක්සේරු කරන්නේ නැහැ. මම කියන්නේ නැහැ, ඒ අයගේ වටිනාකම අඩුයි කියලා. ඒ, ඇත්තවශයෙන්ම වටිනාකමින් ඉහළ, බොහොම ප්‍රශස්ත කණ්ඩායමක්. නමුත්, මම යෝජනා කරනවා, විදේශීය විශේෂඥ කණ්ඩායමකුත් ගෙනැල්ලා එම පරීක්ෂණ කටයුතු කිරීම සුදුසුයි කියලා. මොකද, මට ආරංචි විධියට ඇතාගේ දේහය වළ දාලා තිබෙන්නේ. එම පරීක්ෂණ කටයුතු කිරීම ඉතාම වැදගත් කාරණයක් කියන එක මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ඒ වාගේම එවැනි ඛේදවාචකයක් නැවතත් වරක් සිදු නොවන්නට අපි අනිවාර්යයෙන්ම රටක් හැටියට පියවර ගත යුතුයි කියන එක මම ඔබතුමාට කියන්නට කැමැතියි.

10. ඇතාගේ ප්‍රතිකාර ක්‍රියාවලිය සම්බන්ධයෙන් ස්වාධීන විශේෂඥ විමර්ශනයක් සිදු කිරීමට රජය පියවර ගන්නේද? එහි කාල රාමුව කුමක්ද?

ගරු ඇමතිතුමනි, මම මාධ්‍ය හරහා දැක්කා, ඒ සිදුවීම සම්බන්ධයෙන් සොයා බලන්න කමිටුවක් පත් කරලා තිබෙන බව. එම කමිටුව පත් කරන්නේ අධ්‍යක්ෂ ජනරාල්තුමා නේ, ඔබතුමාත් එක්ක. මම යෝජනාවක් කරනවා, පරිසර සහ සිවිල් සංවිධානවලටත් එහි යම්කිසි නියෝජනත්වයක් ලබා දෙන්න කියලා. එතකොට පරීක්ෂණයේ විනිවිදභාවය පිළිබඳව ලොකු වටිනාකමක් ලැබෙනවා. පරීක්ෂණයට ලොකු ගුණාත්මකභාවයක් ලැබෙනවා. එම නිසා පරිසර සංවිධාන, සිවිල් සංවිධානවල කොටසකට හෝ මෙම පරීක්ෂණය විවෘත කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. ඒ වාගේම නැවතත් වරක් මම ඔබතුමාට කියන්නට කැමැතියි, විදේශීය විශේෂඥයන්ගෙනුත් සමන්විත මරණ පරීක්ෂණයත් එක්ක කරන ඒ පරීක්ෂණ ටික කිරීම ඉතා වැදගත් කියන කාරණය.

11. මෙම ඛේදජනක සිදුවීමත් සමඟ මෙවැනි සුවිශේෂී සත්වයන් - iconic species - ආරක්ෂා කිරීමට නවීන රෝග විනිශ්චය උපකරණ, ජංගම රසායනාගාර පහසුකම්, හදිසි ප්‍රතිකාර ඒකකවල කඩිනම් අවශ්‍යතාවක් පවතින බව රජය පිළිගන්නේද?

ගරු ඇමතිතුමනි, ජංගම රසායනාගාර පහසුකම්, හදිසි ප්‍රතිකාර ඒකකයක් සහ Rapid Deployment Force එකක් අවශ්‍යයි, යමක් සිදු වුණාම ඉක්මනින්ම එතැනට යන්න. ඒ සඳහා විදේශ ආධාරත් ලබා ගන්න. අපිත් උදවු කරන්නම්. මොකද, එම සිදුවීම වෙලා පැය කිහිපයක් ඇතුළත මමත් එතැන හිටියා. අඩුපාඩු නම් ගණනාවක් තිබෙනවා. අපි කරන්නට ඕනෑ එම අඩුපාඩු හඳුනාගෙන ඒවාට ප්‍රතිකර්ම යෙදීමයි, ඒවාට විසඳුම් ලබා දීමයි.

ඒ වාගේම එම සත්වයන්ගේ ජාන සංචිත - gene pools - ආරක්ෂා කිරීමට නිශ්චිත වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නට රජය කටයුතු කරනවාද කියන කාරණයත් මම මේ අවස්ථාවේදී අහන්න කැමැතියි.

12. ජෛව විවිධත්වය අතිශය ඉහළ මෙන්ම වන සතුන් හේතුවෙන් සංචාරක ආකර්ෂණයක් හිමි වී ඇති මෙරට වන සතුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමට සත්ව රෝහලක් ස්ථාපනය කිරීමේ දැඩි අවශ්‍යතාවක් තිබෙනවා. ඒ සඳහා රජයේ අවධානය යොමු වෙලා තිබෙනවාද?

රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා නම් එය ක්‍රියාවට නංවන්නට වැඩ පිළිවෙළක් යොදන්න. එම ව්‍යාපෘතියටත් අපේ පූර්ණ සහයෝගයත්, ශක්තියත් අපි ලබා දෙන්නම්. සත්ව රෝහලක් ස්ථාපනය කිරීමට කටයුතු කරන්න.

ගරු කථානායකතුමනි, මට තව පොඩි වේලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, දැන් අවසන් කරන්න. ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න පටන් ගත්තේ පෙර වරු 11.07ට. දැන් වෙලාව පෙර වරු 11.23යි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අවසාන කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න විනාඩි 16ක් ගත්තා. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී අපි කථා වුණා, ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න විනාඩි 5ක් ගනිමු, උත්තරය දෙන්න විනාඩි 5ක් ගනිමු කියලා. ෂාණක්කියන් මන්ත්‍රීතුමාත් ඇවිල්ලා මගෙන් ඉල්ලනවා, ඔබතුමාට කාලය ලබා දෙන විධියටම එතුමාටත් කාලය ලබා දෙන්න කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් දෙන්න, මේ කාරණයත් කියා අවසන් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා වහාම අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් දෙන්න. මම නම් කාවන්තිස්ස ඇතා පිළිබඳව කථා කිරීම සඳහා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. අනේ ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ අවසාන ප්‍රශ්නය මේකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසාන ප්‍රශ්නය ඉවරයි. ඔබතුමාගේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය අහලා ඉවරයි, ගරු විපක්ෂ නායකතුමනි. ප්‍රශ්න ටික අහලා ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අවසාන කාරණාව කියන්න මට අවස්ථාවක් දෙන්න.

ගරු ඇමතිතුමනි, අප්‍රිකාවේ ඔය super tuskersලා ආරක්ෂා කරන්නට, ඒ කියන්නේ Ahmed, Satao, Tim, Tolstoy, Craig, Paolo, One Ton, Esau, Vronsky වැනි සුවිශේෂී ඇතුන් ආරක්ෂා කරන්නට වෙනමම හමුදා බලකායක් ඉන්නවා. ජෝමෝ කෙනියාටා ජනාධිපතිවරයා කෙන්යාවේදී මේ වාගේ වැඩසටහනක් අහමඩ් ඇතා ඇතුළු අනෙකුත් ඇතුන් වෙනුවෙන් ආරම්භ කළා සේ අපේ රටේත් එවන් වැඩසටහනක් ආරම්භ කරන්න කියන යෝජනාව මම මේ අවස්ථාවේදී ඔබතුමාට ඉදිරිපත් කරනවා.

අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා විනාඩි 18ක් පාවිච්චි කරලා තිබෙනවා, ස්ථාවර නියෝග 27 (2 ) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සඳහා. මම ඒ ගැන කනගාටු වෙනවා.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි අමාත්‍යතුමා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපේ රටේ ජාතික සම්පතක් හැටියට අපි සලකපු කාවන්තිස්ස හස්තියා පසුගිය 16වැනි දා අප අතරින් වියෝ වුණා. ඒක රජයක් හැටියට අපටත්, මේ රටේ ජනතාවටත්, පරිසරවේදීන්ටත් - අප කාටත් - ඉතාම සංවේගජනක අවස්ථාවක්. කාවන්තිස්ස හස්තියා ආරක්ෂා කර ගැනීම සඳහා මේ රජය පත් වෙච්ච දවසේ ඉඳලාම අපි විශේෂ අවධානයකින් යුතුව කටයුතු කළා. අපි හස්තියා ගැන නිතර සොයා බැලුවා. ඒ සම්බන්ධයෙන් වනජීවී නිලධාරීන් දැනුවත් කරලා, ඔවුන් මේ ඇතා සම්බන්ධයෙන් විමසිලිමත්ව පසු වීමට අවශ්‍ය කරන ඒ අවධාරණය කිරීම්, මඟ පෙන්වීම් අපි කරමින් තිබෙන අවස්ථාවේදී තමයි ඇතා මෙලෙස හදිසියේ රෝගාතුර වෙලා ප්‍රතිකාර කරමින් සිටියදී අප අතරින් වියෝ වුණේ. ඒක අප කාටත් සංවේගජනක සිද්ධියක්.

විශේෂයෙන්ම මේ සිද්ධිය සම්බන්ධයෙන් ගත්තොත්, අපි මේ ඇතා රෝගාතුර වෙච්ච අවස්ථාවේ සිටම ඒ සම්බන්ධයෙන් ඉතා විශේෂ මැදිහත්වීමක් කළා. ඒ වාගේම වනජීවී නිලධාරීන්, පශු වෛද්‍යවරු, ගම්වැසියන් සහ ආරක්ෂක අංශ කියන මේ සියලු දෙනා ඒ සම්බන්ධයෙන් විශේෂ මැදිහත්වීමක් කළා. පරිසර

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

අමාත්‍යාංශය හැටියට අපි වෙන කිසිදු හස්තියෙකුට මැදිහත් නොවුණු තරම් මැදිහත්වීමක් මේ කාවන්තිස්ස හස්තියා වෙනුවෙන් පසුගිය දිනවල කළා. නමුත් ඒ සියල්ල තිබියදී තමයි ඇතා අප අතරින් වියෝ වුණේ.

ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අහපු ඒ ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරු මම දැන් සඳහන් කරන්නම්. විශේෂයෙන්ම හස්තියාගේ මේ රෝගී තත්ත්වය ගත්තාම, විශේෂයෙන්ම තුවාලයක් සිදු වෙලා තිබෙන තත්ත්වයක් තමයි අපට වාර්තා වුණේ, 2026 සැප්තැම්බර් මාසයේ 23වැනි දා. දකුණු පාදයේ තමයි මේ තුවාලය තිබෙන බවට වාර්තා වුණේ. ඉන්පස්සේ අපි 24වැනි දා - ඊට පහුවෙනි දා ඉඳලා - ප්‍රතිකාර ආරම්භ කළා. 25වැනි දා අපට පුළුවන්කම ලැබුණා, මේ හස්තියා නිර්වින්දනය කරලා ඒ තුවාලයෙන් අවශ්‍ය කරන සාම්පල අරගෙන, ඒ සාම්පල පරීක්ෂාවට ලක් කිරීමට. ඒ වාගේම අනෙකුත් ලේ සාම්පල ඇතුළු ඒ සියල්ල අරගෙන අපි පරීක්ෂාවට ලක් කළා. ඊට පස්සේ ඒ ප්‍රතිඵල අනුව අපි අවශ්‍ය කරන ඖෂධ ඇතාට ලබා දුන්නා.

විශේෂයෙන්ම ඒ සිදුවීම සිදු වෙලා දෙවන දවසේ ඉඳලාම පශු වෛද්‍ය කණ්ඩායම්, ඒ ප්‍රදේශය භාර පශු වෛද්‍යවරු සහ ඊට අමතර පශු වෛද්‍ය කණ්ඩායම් මේ ඇතාගේ රෝගී තත්ත්වය සම්බන්ධයෙන් online හරහා, විශේෂයෙන්ම Zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡා පවත්වමින් දිනපතා මේ තත්ත්වය සලකා බලමින්, ඒ වාර්තාවල ප්‍රතිඵල සලකා බලමින් තීන්දු තීරණ ගනිමින් මේ තත්ත්වයට මැදිහත් වුණා. පළමුවෙනි රෝගී තත්ත්වය ඖෂධ ලබා දීමෙන් පසුව හොඳ කරගන්න අපට පුළුවන් වුණා. රෝගී තත්ත්වය වාර්තා වුණේ 23වැනි දා. අපි 24වැනි දා ප්‍රතිකාර කරන්න පටන් ගත්තා. 25වැනි දා එම හස්තියා නිර්වින්දනය කරලා අවශ්‍ය කරන සැරව සාම්පල් සහ ලේ සාම්පල් අරගෙන ඒවායේ වාර්තා ද ලබා ගත්තා. 30වැනි දා මම ඒ ප්‍රදේශයට ගියා. ගිහිල්ලා ඒ හස්තියාට ප්‍රතිකාර කරපු, එතැන හිටපු ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරු හමුවෙලා, ප්‍රතිකාර කිරීමේ සහය කණ්ඩායම් මුණ ගැහිලා, වනජීවී නිලධාරින් මුණ ගැහිලා, ඒ අවස්ථාවට සම්බන්ධ වෙලා හිටපු සිවිල් ආරක්ෂකයින් මුණ ගැහිලා මේ පිළිබඳව සාකච්ඡා කළා. ඒ වෙනකොට වෛද්‍ය වාර්තා ඇවිල්ලා තිබුණා. ඒවාත් මම නිරීක්ෂණය කළා. ඒ වාගේම ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද කියන එකත් අපි සාකච්ඡා කළා.

ගරු කථානායකතුමනි, සැප්තැම්බර් 30වැනි දා වෙනකොට කාවන්තිස්ස හස්තියාගේ තත්ත්වය සුව අතට හැරිලා තිබුණා. ඉදිරි පාදයේ තිබිච්ච තුවාලය සුව වෙලා ඇතා පාද හතරටම බර තියලා ගමන් කරන තත්ත්වයක් තිබුණා. ඒ නිසා පළමු අවස්ථාවේ තුවාලයට කරපු ප්‍රතිකාරයෙන් රෝගය සුව වුණා කියලා අපි විශ්වාස කරනවා. ඊට පසුව කාවන්තිස්ස හස්තියා ඒ ප්‍රදේශයේ සැරිසරලා තිබෙනවා. ඔබතුමන්ලා සමාජ මාධ්‍ය හරහා දකින්න ඇති, එම හස්තියා බල්ලෙක් පසුපසත් එළවාගෙන යන දර්ශනයක්. ඒ කියන්නේ, ඒ වෙනකොට තුවාලය සුව වෙලා සාමාන්‍ය තත්ත්වයට ඇවිල්ලා තිබුණා.

ඉන්පසුව අපට ඒ හස්තියා නැවත වතාවක් නිරීක්ෂණය කරන්න ලැබුණේ, ගල්ගමුව ප්‍රදේශයෙන් බැහැරට ගිහිල්ලා අනුරාධපුර ප්‍රදේශයේ සිටියදී. එම හස්තියාගේ දෙවැනි රෝගී තත්ත්වයක් අපි නිරීක්ෂණය කළා, ඔක්තෝබර් 06වැනි දා. ඒ අවස්ථාවේ හස්තියාට පාචන - diarrhoea - තත්ත්වයක් ඇති වෙලා තිබුණා. සැප්තැම්බර් 30වැනි දායින් දවස් 6කට පසුව තමයි දෙවැනි රෝගී තත්ත්වය වාර්තා වුණේ. දෙවැනි රෝගී තත්ත්වය වාර්තා වුණාට පසුව අපි ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය කරමින් අවශ්‍ය කරන ප්‍රතිකාරවලට මැදිහත් වුණා. විශේෂයෙන්ම අපි උත්සාහ කළා, එම හස්තියාගේ මලපහවල සාම්පල් හොයාගන්න. නමුත්, ඒ දවස්වල තිබිච්ච වර්ෂා තත්ත්වය නිසාත්, එම හස්තියාට වැලඳී තිබුණේ පාචන තත්ත්වයක් නිසාත් ඒ සාම්පල් හොයා ගැනීමට නොහැකි වුණා. ඒ පාචන තත්ත්වය නිසා එක පැත්තකින් ඇතා දුර්වල වෙන බවත්, ආහාර නොගන්නා බවත් අපිට නිරීක්ෂණය වුණා. ඒ කාලය තුළ අපි - පරිසර අමාත්‍යාංශය හැටියට මමත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමා සහ වනජීවී සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමිය, ප්‍රතිකාර කිරීම සඳහා පත්කරන ලද වෛද්‍යවරු ඇතුළු සියලුදෙනා - Zoom සාකච්ඡා මඟින් එකතුවෙලා එදිනෙදාට තිබෙන තත්ත්වයන් සලකා බලමින් අවශ්‍ය කරන මැදිහත්වීම් සිදු කළා.

මේ තත්ත්වය සම්බන්ධයෙන් අපි ඔක්තෝබර් 14වැනි දා ආරක්ෂක ලේකම්තුමා සමඟ සාකච්ඡා කරලා එම ඇතා දුර්වල වෙමින් පවතින නිසා හදිසි අවස්ථාවකදී මැදිහත්වීම සඳහා 25දෙනෙකුගෙන් යුත් ආරක්ෂක හමුදා බලකායක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. එතුමා ඒ වෙලාවේම ඒක අනුමත කළා. ඒ වාගේම රාත්‍රී කාලයේදී ඒ හස්තියා ගමන් කරන මාර්ග නිරීක්ෂණය කිරීම සඳහා thermal drone cameras අපි ඉල්ලා සිටියා. ඒවාත් ලබා දුන්නා. ඒවාත් සම්පාදනය කරගනිමින් තමයි අපි මේ කටයුත්තට මැදිහත් වුණේ.

ඉන්පසුව ඔක්තෝබර් 14වැනි දා එම ඇතා කලා ඔයේ බැහැලා ඉන්න අවස්ථාවේදී අපට නිරීක්ෂණය වුණා. ඒ අනුව වෛද්‍ය කණ්ඩායම් ගිහිල්ලා ප්‍රතිකාර කළා. ඔක්තෝබර් 15වැනි දා කලන්කුට්ටි ඇළ කියන ප්‍රදේශයේ සිටින බව නිරීක්ෂණය වුණා. ඒ අනුව මමත්, වෛද්‍ය කණ්ඩායමුත් එම ස්ථානයට ගිහිල්ලා එම හස්තියාව නිරීක්ෂණය කරලා අපට කරන්න පුළුවන් මොකක්ද කියන එක ගැන සාකච්ඡා කළා. දෙවැනි රෝගී තත්ත්වය - ආහාර නොගන්නා තත්ත්වයත්, ඒ වාගේම පාචන තත්ත්වයත් - ඇති වුණාට පසුව අපි මූලික වශයෙන් එම හස්තියාට ලබා දුන්නේ පෝෂණ පදාර්ථ සහ ආහාර රුචිය වඩවන ඖෂධ වර්ග.

නමුත් ගරු කථානායකතුමනි, ඔක්තෝබර් 16වැනි දා වෙනකොට ඇතා වැටිලා හිටියා. අපි උදේ නිරීක්ෂණය කළා ඇතා වැටිලා ඉන්නවා. එදා සවස 6.44ට පමණ තමයි ඇතා ජීවිතක්ෂයට පත් වුණේ. ඉතින් මේ ක්‍රියාවලියේදී වෛද්‍ය කණ්ඩායම් විශාල ප්‍රමාණයක් මැදිහත් වුණා. විශේෂයෙන් චන්දන ජයසිංහ, ආනන්ද ධර්මකීර්ති, අකලංක පිනිදිය, උදේශිකා මධුවන්ති, පුබුදු මධුවන්ති, ඉසුරු හේවාකෝට්ටගේ ඇතුළු වනජීවී අංශයේ පශු වෛද්‍යවරු මේ සඳහා මැදිහත් වුණා.

ඒ වාගේම අපි online Zoom සාකච්ඡාවලට පේරාදෙණිය පශු වෛද්‍ය පීඨය, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනවල ඉන්න පශු වෛද්‍යවරුත් සම්බන්ධ කරගත්තා. අපි ඇතාට ප්‍රතිකාර කිරීමේදී මේ ක්ෂේත්‍රයේ පළපුරුදු වෛද්‍යවරුන් වන Dr. Neville De Silva, Dr. Niranjala de Silva, Dr. Tharaka Prasad, Prof. Ashoka Dangolla, National Zoological Gardensහි Dr. R. C. Rajapaksa, Dr. Buddhika Bandara වැනි අය සමඟ Zoom සාකච්ඡා පවත්වමින්, අවශ්‍ය කරන clinical data වාර්තා කරමින්, clinical features වාර්තා කරමින් කටයුතු කළා. ඒ නිසා අපි වෙනත් කිසිදු හස්තියෙකුට මැදිහත් නොවුණු තරමේ මැදිහත්වීමක් තමයි ජාතික වස්තුවක් හැටියට සලකපු කාවන්තිස්ස හස්තියාගේ ජීවිතය බේරා ගැනීම සඳහා කළේ. මීට අමතරව අපි 15වැනි දා සහ 16වැනි දා කියන දෙදින තුළ මේ සඳහා ඉන්දියාවේ සහ තායිලන්තයේ පශු වෛද්‍යවරුන්ගෙන් අවශ්‍ය කරන උපදෙස් ලබා ගත්තා. ඒ වාගේම ඔවුන් මේ රටට ගෙන්වීම සඳහා අවශ්‍ය කරන සාකච්ඡා අපි ආරම්භ කරලා තිබුණා. ඇතාගේ මේ රෝගී තත්ත්වය වාර්තා වුණාට පස්සේ අපි

ලේ සාම්පල අරගෙන ඒවා යවලා online හරහා විදේශීය වෛද්‍යවරුන්ගේ උපදෙස් අරගෙන ප්‍රතිකාර කිරීමට කටයුතු කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කළ Zoom සාකච්ඡාවල තොරතුරු සහ WhatsApp groupsවල පණිවුඩ අඩංගු ලේඛන මම **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

අපි විශේෂ මැදිහත්වීමක් සිදු කළා, කාවන්තිස්ස හස්තියා රෝගී තත්ත්වයෙන් මුදා ගන්න. ඒ නිසා අපිට පුළුවන්කම ලැබුණා, පළමුවැනි අවස්ථාවේ කකුලේ තිබුණු තුවාලය සුව කරන්න. ඉන් පසුව ගල්ගමුව ප්‍රදේශයෙන් බැහැරට, අනුරාධපුර ප්‍රදේශයට ගියාට පස්සේ තමයි දෙවැනි රෝගී තත්ත්වය අපි නිරීක්ෂණය කළේ. අන්න ඒ දෙවැනි රෝගී තත්ත්වය තමයි අපට සුව කරගන්න නොහැකි වුණේ.

ගරු කථානායකතුමනි, කාවන්තිස්ස ඇතාට ප්‍රතිකාර ආරම්භ කළ දිනයේ සිට අපි ලබාදුන්න ඖෂධ සම්බන්ධ වාර්තාවක් තිබෙනවා. ඒ වාර්තාවත්, කාවන්තිස්ස හස්තියාගේ ලේ සාම්පලවලට අදාළ වාර්තා - reports - ටිකත් මම **සභාගත*** කරනවා.

අපි නිරීක්ෂණය කළා, ඇතාගේ කකුලේ තුවාලය ඇති වෙලා තිබෙන්නේ *Staphylococcus aureus* කියන සමේ වාසය කරන විෂබීජයක් නිසා කියලා. ඒ විෂබීජ ආසාදනය අපි සුව කළා. දෙවැනි ආසාදනයට හේතුව තමයි අපට සොයා ගැනීමට නොහැකි වුණේ.

අපි මේ සම්බන්ධයෙන් උපකරණ ලැයිස්තුවක් සකස් කරලා ඒ ලැයිස්තුව ලබා ගැනීම සඳහා ඉල්ලීම් කළා. පළමුවැනි වතාවට සැප්තැම්බර් මාසයේ 29වැනි දා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙන් ඒ අවශ්‍ය කරන උපකරණ අපි ඉල්ලීම් කරලා තිබෙනවා. දෙවැනි වරට අපි ඉල්ලීම් කළා, thermal drone cameras සහ Quick Response Team එකක්, ආරක්ෂක අමාත්‍යාංශයෙන්. අපට ඔක්තෝබර් මාසයේ 15වැනි දා වෙනකොට ඒවා ලබා ගන්න අනුමැතිය ලබා දීලා තිබෙනවා.

ගරු විපක්ෂ නායකතුමා අසා තිබෙනවා, මේ හස්තියාගේ ප්‍රතිකාර සම්බන්ධයෙන් අවශ්‍ය වෛද්‍ය උපකරණ, රසායනාගාර පහසුකම් හෝ ඖෂධ සම්බන්ධයෙන් හිඟයක් පැවතුණාද කියලා. නමුත්, අපට එහෙම හිඟයක් තිබුණේ නැහැ. ඒ අවශ්‍ය කරන උපකරණ සහ අනෙකුත් සම්පත් අපි කලට වේලාවට සම්පාදනය කර ගත්තා.

ගරු කථානායකතුමනි, ඒ හස්තියා අසනීප වෙච්ච දවසේ ඉඳලාත්, ඊට කලිනුත් අපි ඒ හස්තියා සම්බන්ධයෙන් විමසිල්ලෙන් ඉන්න විශේෂ වනජීවී කණ්ඩායම් පත් කරලා තිබුණා. ඊට අමතරව ඒ හස්තියා අසනීප වුණාට පස්සේ විශේෂ වනජීවී කණ්ඩායම් දෙකක් අපි ඒ හස්තියා සැරිසරන ප්‍රදේශ නිරීක්ෂණය කරන්න පත් කරලා තිබුණා. ඒ හස්තියා කොයි පැත්තේද ඉන්නේ, පවතින තත්ත්වය මොකක්ද යනාදිය සම්බන්ධයෙන් ඔවුන් අපට දිනපතා වාර්තා සැපයුවා. අපි ඒ විධියට කණ්ඩායම් යොදවා තිබුණා. පශු වෛද්‍යවරුන් හැටියට ජ්‍යෙෂ්ඨ පශු වෛද්‍යවරුනුත්, මමත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරිනුත් වරින් වර ඒ ප්‍රදේශයට ගිහිල්ලා ඒ අවශ්‍ය කරන සහාය ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, ඒ හස්තියාගේ හදිසියේ ඇති වූ තුවාලය වෙඩි තැබීමක් නිසා සිදු වෙච්ච තුවාලයක් කියන එක අපි නිරීක්ෂණය කළා. අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කරන විමර්ශන කටයුතු සිදු කළා. හස්තියාගේ මරණයෙන් පසුව මම රොහාන් ඕලුගල මැතිතුමාට කථා කරලා ඒ සහාය ඉල්ලා සිටියා. අපි එහෙම කටයුතු කරලා, ඒ අවශ්‍ය කරන මැදිහත්වීම් කරලා, මේ වනකොට ගිනි අවි සහ පුද්ගලයන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ පුද්ගලයන් සම්බන්ධයෙන් අධිකරණයට වාර්තා කරලා මේ වනකොට ඔවුන් රිමාන්ඩ් බන්ධනාගාරගත කරලා තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් රහස් පොලීසියත් මැදිහත් කර ගනිමින්, මේ මොහොතේ විශේෂ විමර්ශනයක් සිදු කරමින් තිබෙනවා. මේ මොහොත වන විට විශේෂ කරුණු අනාවරණය වෙමින් තිබෙනවා. කිසියම් සංවිධානාත්මක බවක්, කිසියම් කුමන්ත්‍රණකාරී ක්‍රියාවලියක් මේ පසුපස තිබුණාද කියන එක සම්බන්ධයෙන් මේ වනකොට විමර්ශන සිදු වෙනවා.

අපි කියන්න ඕනෑ, කාවන්තිස්ස හස්තියා රෝගී වෙච්ච අවස්ථාවේ ඉඳලා ප්‍රතිකාර කිරීමේදී සහ එම හස්තියා ගැන සොයා බැලීමේදී වනජීවී නිලධාරින්, පශු වෛද්‍ය නිලධාරින්, බහු කාර්ය සේවකයින්, සිවිල් ආරක්ෂක සේවකයින්, ගම්වැසියන් ආදි සියලු දෙනාම එම හස්තියා තමන්ගේ කෙනෙකු, තමන්ගේ ඥාතියෙකු හැටියට සලකා තමයි කටයුතු කළේ කියන එක. අපි කවුරුත් එක කණ්ඩායමක් හැටියට ඒ හස්තියාගේ ජීවිතය ගලවා ගැනීම සඳහා කථා බහ කරමින්, ඉතාම සහයෝගයෙන් කටයුතු කළා. අපි එක කණ්ඩායමක් හැටියට විශාල වෙහෙස මහන්සියක් දැරුවා. අපි අගය කරන්න ඕනෑ, ඒ හැමදෙනොම දීපු සහාය. ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම ආරක්ෂක ලේකම්තුමා, ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ සියලුදෙනා අවශ්‍ය කරන සහාය අපෙන් විමසා සිටියා; ඒ අවශ්‍ය කරන සහාය ඕනෑම මොහොතක ලබා දෙන්න එතුමන්ලා සූදානම් වෙලා හිටියා. ඒ වාගේම ඒ අවස්ථාවේ පරිබාහිර පුද්ගලයන් විශාල පිරිසක් අපව සම්බන්ධ කර ගනිමින් ඒ ගැන සොයා බැලුවා. ඒ සම්බන්ධයෙනුත් අපි ඔවුන් සියලුදෙනාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ඇත්තටම කාවන්තිස්ස හස්තියාට ප්‍රතිකාර කරද්දී අපි සැලකුවේ, එම හස්තියා වනජීවී සත්වයෙකු හැටියට නොවෙයි. අපේම කෙනෙකු, අපේම පුද්ගලයෙකු, මනුෂ්‍යයෙකු හැටියට සලකමින් තමයි ඒ සියලු කණ්ඩායම් ඒ අවස්ථාවේ මැදිහත් වුණේ. එම හස්තියාගේ වියෝව අප කාටත් ඉතාම වේදනා දෙන සිද්ධියක්. අපි කවුරුත් කම්පාවට පත් වුණා, ඒ තරම් මහන්සි වෙලාත් ඒ හස්තියාගේ රෝගී තත්ත්වය සුව කර ගැනීමට නොහැකි වීම ගැන. මේ සම්බන්ධයෙන් මූලික වගකීම පරිසර අමාත්‍යවරයා හැටියට මම භාර ගන්න සූදානම්. අපි දැක්කා, පශු වෛද්‍ය නිලධාරින් ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේ කටයුතු කරන ආකාරය. ඒ කටයුතු කරද්දී ඔවුන් විවිධ විවේචනවලට මුහුණ දෙමින් තමයි කටයුතු කළේ.

නමුත් අපි තේරුම් ගන්න ඕනෑ, වනජීවී නිලධාරින් සහ පශු වෛද්‍යවරුන් වැඩ කරන්නේ සාමාන්‍ය තත්ත්වයක නොවෙයි කියන එක. ඔවුන් වනාන්තරවල අව්වට වේළෙමින්, වැස්සට තෙමෙමින් පහසුකම් අඩු තත්ත්වයන් යටතේ තමයි වැඩ කරන්නේ. අපේ පැත්තෙන් අපි ඔවුන් දිරිමත් කරමින්, අධෛර්යයට පත් වීමට ඉඩ නොදෙමින් උපරිම මැදිහත්වීමක් කළා. ඉදිරියේදීත් ඔවුන් අතර ගැටලු ඇති නොවන ආකාරයට, ඔවුන් දිරිමත් වන ආකාරයට, මේ දුෂ්කරතාවලට මුහුණ දෙමින් වැඩ කිරීමට අවශ්‍ය කරන ධෛර්යය ඔවුන්ට සපයන ආකාරයට අප මැදිහත් විය යුතුයි කියා මම යෝජනා කරනවා. මේ මොහොතේදී කිසියම් අඩුපාඩුවක්, වරදක් සිදු වුණා නම්, ඒක කවුරු අතින් සිදු වුණත් පරිසර අමාත්‍යවරයා හැටියට එම වගකීම භාර ගන්න මම සූදානම්.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

ගරු කථානායකතුමනි, අපි මේ සම්බන්ධයෙන් වන විමර්ශන කටයුතු පැති කිහිපයකින් කරනවා. ඒ අනුව දැනට අත්අඩංගුවට ගැනීම් ද කර තිබෙනවා. ඊට අමතරව, පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වෙනම ඉල්ලීමක් කළා, මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්න කියලා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කර තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, එම කමිටුව තුළ පරිසරවේදින් ඉන්නවා; පශු වෛද්‍ය විශේෂඥයින් ඉන්නවා; අපරාධ නීතිය පිළිබඳ විශේෂඥයින් ඉන්නවා. ඒ සියලු දෙනාගේ සංයුතියෙන් යුක්ත කමිටුවක් තමයි අපි පත් කරලා තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ඒ විමර්ශන සාර්ථක වෙයි කියලා.

ඊළඟට, කාවන්තිස්ස හස්තියාගේ පශ්චාත් මරණ පරීක්ෂණය සම්බන්ධයෙන් අපි අධිකරණයට වාර්තා කළා. ගල්ගමුව මහෙස්ත්‍රාත් අධිකරණයට තමයි වාර්තා කළේ. අපි අධිකරණ නියෝගයක් ලබා ගත්තා, එම හස්තියාගේ පශ්චාත් මරණ පරීක්ෂණය සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් කිරීම සඳහා පේරාදෙණිය පශු වෛද්‍ය හා සත්ව විද්‍යාපීඨයේ මහාචාර්ය කවින්ද්‍ර විජේසුන්දර මැතිතුමා සම්බන්ධ කර ගනිමින් එම පරීක්ෂණ කටයුතු සිදු කිරීමට. එම පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අපට අධිකරණයෙන් අවසරය ලැබුණා.

එම අධිකරණ තීන්දුව සහ ඊට අදාළ අනෙකුත් ලේඛන මම මේ මොහොතේ **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

එම පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතුවලට අවශ්‍ය samples ලැබීම සඳහා තව ටික කාලයක් යනවා. ඊට පසුව තමයි අපට එම වාර්තාව ලබා ගන්න වෙන්නේ.

මෙන්න මේ කියන විධියට තමයි නියෝග කරලා තිබෙන්නේ. මියගිය වන ඇතාගේ මෘත දේහය සම්බන්ධ පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය හා සත්ව විද්‍යාපීඨයේ පශුව්‍යාධවේදී - Pathology - අංශයේ මහාචාර්ය කවින්ද්‍ර විජේසුන්දර මහතා විසින් සිදු කර වාර්තාව ගරු අධිකරණයට ගොනු කරන ලෙසටත්, සිරුරු කොටස් ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙසටත් - ඒ කියන්නේ, ඇත් දළ - පැ.01 ලෙස හඳුන්වන නඩු භාණ්ඩය වන මිය ගිය ඇතාගේ මෘත දේහය පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතුවලින් පසු මිහිදන් කරන ලෙසටත්, මෙම සිදුවීමට අදාළ වැඩිදුර විමර්ශන කටයුතු සිදු කොට ගරු අධිකරණයට වාර්තා කරන ලෙසටත් නියෝග කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් දළ ඇතෙකුගේ මළ සිරුරක් සම්බන්ධයෙන් කටයුතු කරද්දී එහි ඔළුව කොටස සහ දළ කොටස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට අරගන්නවා; සිරුරේ ඉතිරි කොටස මිහිදන් කරනවා. ඉතින් අපි කාවන්තිස්ස හස්තියාගේත් දළ සහ ඔළුව කොටස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට රැගෙන ගිහිල්ලා, එම දෙපාර්තමේන්තුවේ භූමියක එය තැන්පත් කරලා, අධිකරණයට ඉදිරිපත් කරන්න නියමිතව තිබෙනවා. අපි එම කටයුත්ත අවසන් කර තිබෙනවා. භූමදානය කිරීමට කලින් අපි එම හස්තියා වෙනුවෙන් පාංශුකූලය ලබා දීලා, ඒ අවශ්‍ය කරන ගෞරවය සිදු කරලා මිහිදන් කිරීමේ කටයුත්ත අවසන් කළා.

ගරු කථානායකතුමනි, අධිකරණ නියෝගය අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසිනුත් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කරන්න තිබෙනවා. අන්න ඒ පරීක්ෂණයේ කටයුතුත් අපි ඉදිරියේදී සිදු කරනවා.

ගරු විපක්ෂ නායකතුමා අසා තිබෙනවා, මෙම බේදජනක සිදුවීමත් සමඟ මෙවැනි සුවිශේෂී සත්ත්වයන් ආරක්ෂා කිරීමට නවීන රෝග විනිශ්චය උපකරණ, ජංගම රසායනාගාර පහසුකම් සහිත නිශ්චිත වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමට රජය කටයුතු කරනවාද කියලා. ගරු කථානායකතුමනි, මේ වනකොට අපි වනජීවී ක්ෂේත්‍රයේ පශු වෛද්‍ය කටයුතු සඳහා අවශ්‍ය කරන ජංගම රෝහලක් සැදීමට අදාළ මූලික කටයුතු අවසන් කර තිබෙනවා. දැනට ඒ අවශ්‍ය කරන තත්ත්වයට වාහනය සකස් කරමින් තිබෙනවා; අවශ්‍ය කරන භාණ්ඩ මිල දී ගෙන තිබෙනවා. ඒ අනුව එම කටයුතුවලින් සියයට 90ක් පමණ අවසන් කර තිබෙනවා. ඒ සකස් කළ වාහනය ලැබුණු ගමන් අපි එම ජංගම රෝහල පටන් ගන්නවා.

ඊට අමතරව අපි අනුරාධපුර නගරයේ සිට කිලෝමීටර 4ක පමණ දුරින් පිහිටි උළුක්කුලම ප්‍රදේශයේ සත්ව රෝහලක් ඉදි කිරීම සඳහා භූමියක් වෙන් කරගෙන, ඊට අදාළ සංකල්ප පත්‍රිකාව රජයට ඉදිරිපත් කර, ඒ සඳහා අනුමැතිය ලබාගෙන තිබෙනවා. ඒ අනුව අපි විධිමත් සත්ව රෝහලක් ඉදි කිරීමේ කටයුතු මේ වනකොට ආරම්භ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව, අපේ රටේ අලි ඇතුන් ආරක්ෂා කර ගැනීම සඳහා පරිසර අමාත්‍යාංශය ලෙස අපි පසුගිය කාලය මුළුල්ලේම විශාල වැඩ කොටසක්; විශාල මැදිහත්වීමක් සිදු කළා වාගේම සිදු කරමින් ද සිටිනවා. ඒ අනුව මේ වනකොට අපට පුළුවන් වෙලා තිබෙනවා, අපේ රටේ වන අලින්ගේ මරණ සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට. සාමාන්‍යයෙන් අලි මරණ ආකාර කිහිපයකට සිදු වෙනවා. ඒ කියන්නේ, ස්වාභාවිකව අලි මරණ සිදු වෙනවා, අලි ඇතුන් වියපත් වීම නිසා. ඊට අමතරව මිනිසාගේ මැදිහත්වීම නිසා සිදු වන අලි මරණත් තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙහිදී අපට අඩු කරන්න පුළුවන් වන්නේ, මිනිසුන්ගේ මැදිහත්වීම නිසා, ඒ කියන්නේ වෙඩි තැබීම්, විදුලිය කාන්දු කිරීම, හක්කපටස් දැමීම, වස දීම වාගේ දේවල් නිසා සිදු වන වන අලි මරණයි. නමුත් ස්වාභාවිකව සිදු වන අලි මරණ අපට අඩු කරන්න බැහැ. මේ වසර කිහිපය තුළ අප විසින් ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ග නිසා අපට පුළුවන්කම ලැබී තිබෙනවා, අලින්ගේ මරණ ප්‍රමාණය අඩු කර ගන්න.

ගරු කථානායකතුමනි, 2023 වසරේ වෙඩි තැබීම් නිසා අලි මරණ 98ක් සිද්ධ වෙලා තිබෙනවා. 2024 වසරේ එම ප්‍රමාණය 84ට අඩු කර තිබෙනවා. 2025 වසරේදී එම ප්‍රමාණය 79ට අඩු කර තිබෙනවා. මේ අවුරුද්දේ අපි ඒ ප්‍රමාණය 42 දක්වා අඩු කර තිබෙනවා.

ඒ අනුව වෙඩි තැබීම් නිසා සිදුවන වනඅලි මරණ සංඛ්‍යාව මේ වන විට අපි අඩු කරගෙන තිබෙනවා. ඒ වාගේම විදුලිය කාන්දු කිරීම් නිසා 2023 වසරේදී වනඅලි මරණ 72ක්, 2024 වසරේදී 56ක්, 2025 වසරේදී 69ක් සිදු වුණා. ඒ අනුව මේ වසරේදී විදුලිය කාන්දු කිරීම් නිසා සිදුවන වනඅලි මරණ සංඛ්‍යාව 32 දක්වා අපි අඩු කරගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම හක්කපටස් නිසා 2023 වසරේදී වනඅලි මරණ 52ක්, 2024 වසරේදී 52ක් සහ 2025 වසරේදී 56ක් සිදුව තිබෙනවා. මේ වසරේදී තවම එවැනි සිදුවීම් වාර්තා වෙලා තිබෙන්නේ 33යි. ඒ අනුව හක්කපටස් නිසා සිදුවන වනඅලි මරණ සංඛ්‍යාවත් අපි අඩු කරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම දුම්රියේ ගැටීම නිසා 2023 වසරේදී වනඅලි මරණ 24ක්, 2024 වසරේදී

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

11ක් සහ 2025 වසරේදී 21ක් සිදුව තිබෙනවා. මේ වසරේදී දුම්රියේ ගැටීම් නිසා සිදුවන වනඅලි මරණ සංඛ්‍යාව 3ක් දක්වා අපි අඩු කරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ අනුව මිනිසාගේ මැදිහත්වීම නිසා සිදුවන වනඅලි මරණ සංඛ්‍යාව මේ වන විට අපි සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කරගෙන තිබෙනවා. මීට කලින් සිදු වූ සමස්ත වනඅලි මරණවලින් සියයට 50කට වැඩි ප්‍රමාණයක් සිදු වුණේ එවැනි විදුලිය කාන්දු කිරීම්, වෙඩි තැබීම්, හක්කපටස්, දුම්රියේ ගැටීම් ආදිය නිසායි. නමුත්, අපි මේ වසර තුළදී ඒක සියයට 40 දක්වා පහතට ගෙනැල්ලා තිබෙනවා. අපට මේ දේ කරගන්න පුළුවන්කම ලැබුණේ, පසුගිය කාලය මුළුල්ලේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් පරිසර අමාත්‍යාංශය ලෙස අපි මේ සඳහා විශේෂ මැදිහත්වීමක් සිදු කළ නිසායි. අපි ඒ සඳහා අවශ්‍ය භෞතික සම්පත් සම්පාදනය කළා. මේ වෙනුවෙන් අපි කැබ් රථ 100ක්, බයිසිකල් 181ක්, ට්‍රැක්ටර් 9ක් ආදී වශයෙන් පහසුකම් ලබා දුන්නා. ඒ වාගේම බඳවා ගැනීම් විශාල ප්‍රමාණයක් සිදු කළා. ඒ අනුව සිවිල් ආරක්ෂක නිලධාරින් 5,000ක්, බහුකාර්ය සේවකයින් 3,500ක්, ඒ වාගේම වනජීවී නිලධාරින් 265ක් මේ වන විට අපි බඳවා ගනිමින් ඉන්නවා.

ගරු කථානායකතුමනි, අලි ඇතුන්ගේ මරණ ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා අපි පසුගිය කාලයේ අලිමංකඩවල් 3ක් විවෘත කර තිබෙනවා. විශේෂයෙන්ම නාකොළගනේ ප්‍රදේශයේ අක්කර 1,500ක් පමණ වූ පසුගිය පාලනයන් විසින් විනාශ කරලා තිබුණු ඒ වනාන්තරය නැවත අත්පත් කර ගන්න සහ ඒ ප්‍රදේශය අභය භූමියක් බවට ප්‍රකාශයට පත් කරන්නත් අපට කැබිනට් අනුමැතිය ලැබුණා. ඒ අනුව අපි ඒ ප්‍රදේශය ඉදිරියේදී අභය භූමියක් හැටියට ප්‍රකාශයට පත් කරමින් අනුරාධපුරය සහ තබ්බෝව යා කරන අලිමංකඩ හැටියට ප්‍රකාශයට පත් කරන්නත් බලාපොරොත්තු වනවා.

ඒ වාගේම පසුගිය කාලයේ අපට පුළුවන්කම ලැබුණා, අපේ රටේ වනාන්තර 113ක් රක්ෂිත හැටියට ප්‍රකාශයට පත් කරන්න. මේ රක්ෂිත ඇතුළේත් වනඅලින්ගේ වාසස්ථාන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම අපි වනඅලි ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් පරිසර පද්ධති සුපෝෂණය සඳහා විශාල වැඩ කොටසක් පසුගිය වසර දෙක තුළ සිදු කර තිබෙනවා. මේ රජය එවැනි වැඩ කොටසක් කරමින් තමයි ඉන්නේ. ඒ අතරතුරදී අපේ රටේ ජාතික සම්පතක් වෙච්ච කාවන්තිස්ස හස්තියාට දෙවැනි අවස්ථාවේදී ඇති වෙච්ච ඒ රෝගී තත්ත්වයෙන් එම හස්තියාව සුවපත් කරගෙන බේරා ගන්නට නොහැකිවීම ගැන අපි කනගාටු වනවා. මේ සම්බන්ධයෙන් අපේ රටේ ජනතාව ශෝකයට පත්වෙලා ඉන්නේ. අපටත් ඒක දැනෙනවා. අපටත් ඒ කනගාටුව තිබෙනවා. මේ සම්බන්ධයෙන් කිසියම් කෙනෙකු අතින් අඩුපාඩුවක් වුණා නම්, ඒ සියලු වගකීම් පරිසර අමාත්‍යවරයා ලෙස මා දරන්න සූදානම්. මේ හස්තියා සුවපත් කර ගැනීම සඳහා සහාය ලබා දීපු, ඒ වෙනුවෙන් ප්‍රාර්ථනා කරපු, ඒ වෙනුවෙන් මැදිහත් වුණු, වචනයකින් හරි උදව් කරපු සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ පිළිතුරු ලබා දීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ගරු ඇමතිතුමාගෙන් බොහොම කෙටියෙන් පැහැදිලි කර ගැනීම් කිහිපයක් කරගන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ අදහසක් තිබෙනවා ද, GPS satellite tracking collars, drones with thermal infrared cameras, AI-powered camera traps, smart sensors, satellite imagery, Geographic Information Systems, ඒ වාගේම live dashboard වැනි දේවල් සම්බන්ධයෙන්? මේවා අලුත් යෝජනා. විශේෂයෙන්ම මේවා ලෝකයේ වෙනත් රටවල ක්‍රියාත්මක වන යෝජනා. ඒවා අපේ රට තුළත් ක්‍රියාත්මක කිරීම වැදගත්. ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමැතියි, දිගම දළ තිබෙන ඇතා හැටියට හඳුන්වන්නේ මහසෙන් කියන දළ පුට්ටුවා බව. දැන් ඒ ඇතාව හොයා ගන්නට නැහැ. එම නිසා ඒ සඳහා විශේෂිත වැඩ පිළිවෙළක් යොදන්න අවශ්‍යයි. ඒ වාගේම මේ කාවන්තිස්ස හස්තියාගේ අහිමිවීමත් එක්ක ඉන්දියාව දවසේ පැය 24 පුරාවටම වෙනමම guard එක දාලා තිබෙනවා, ඉන්දියාවේ සිටින ලොකුම ඇතාට. එම නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, ඒ වාගේ task force එකක් ඉක්මනින්ම අපේ රටේත් ක්‍රියාත්මක කරන්න කියලා. ඒ වාගේම මේ ඇතාගේ තුවාල දිහා බැලුවාම, වෙඩි වැදීම් පවා තිබුණා. ඒ ඇතාගේ දකුණු ගාතයටත් වෙඩි වැදී තිබුණා. වෛද්‍යවරුන් කියන විධියට බඩටත් වෙඩි වැදී තිබුණා.

ඇතාගේ creatinine level එක ඉහළ ගොස් තිබුණු බවත්, kidneysවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ගැටලු පැවති බවත් ඒ blood test එක මඟින් අනාවරණය වෙලා තිබුණා. ඒ නිසා මේ පිළිබඳව පැහැදිලි අධ්‍යයනයක් සිදු කර, අදාළ තොරතුරු වාර්තා කරන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට තව එක කාරණයක් සඳහන් කරන්නට කැමැතියි. ඔබතුමන්ලාගේම සහෝදර ඇමතිවරයෙක් පසුගිය කාලයේ වගා ආරක්ෂා කිරීම සඳහා කියලා තුවක්කු බෙදුවා. තුවක්කු බෙදලා කිව්වා, වගාවලට හානි කිරීමට පැමිණෙන සතුන්ට හොඳින් සලකන්න කියලා. මම කියන්නේ එය ඉතාම වැරදි යෝජනාවක් බවයි. අලි-මිනිස් ගැටුම හේතුවෙන් කෘෂි කර්මාන්තයට බරපතළ හානි සිදු වන බව මම පිළිගන්නවා. එහිදී මිනිස් ජීවිතවලටත් හානි සිදු වනවා, වගා හානිත් සිදු වනවා, දේපළවලටත් හානි සිදු වනවා, සතුනුත් මැරෙනවා. නමුත්, ඒකට විසඳුම තුවක්කු බෙදා දීලා අලි ඇතුන්ට වෙඩි තැබීම නොවෙයි. ඒ කාරණය ඉතාම පැහැදිලියි. ඇත්තවශයෙන්ම මේ ආණ්ඩුව බලයට පත් වූ අලුත ලාල් කාන්ත ඇමතිතුමා ඒ කාරණය ප්‍රකාශ කළා. එවැනි අදූරදර්ශී ප්‍රතිපත්ති අනුගමනය නොකර, අලි-මිනිස් ගැටුම අවම කිරීමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

කාවන්තිස්ස ඇතාගේ ඝාතනයත් මේ අලි-මිනිස් ගැටුමේ ප්‍රතිඵලයක්. ඇත්තවශයෙන්ම මේ වන විට අලි ඇතුන් ඝාතනය වීමේ රැල්ලක් තිබෙනවා. එම නිසා බෙදා දී තිබෙන තුවක්කු සම්බන්ධයෙන් පරිසර අමාත්‍යවරයා හැටියට ඔබතුමා විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතු බව මම යෝජනා කරනවා. එහෙම නැති වුණොත්, අපට තවත් අලි ඇතුන් අහිමි වීමට ඉඩ තිබෙනවා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ යෝජනා ඉතාම වැදගත් යෝජනා බව මම විශ්වාස කරනවා. ඒ

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

වාගේම කාවන්තිස්ස ඇතා සම්බන්ධයෙන් ඔබතුමා විශේෂ සංවේදීභාවයකින් කටයුතු කළ බවත් මා දන්නවා. ඔබතුමා ඒ ඇතාට සුවය ප්‍රාර්ථනා කරමින් අවසන් කාලයේ ඇතාගේ සුව දුක් සොයා බැලීමටත් සහභාගි වුණා. එම නිසා ඔබතුමා ඉදිරිපත් කළ යෝජනා සාධනීයව සලකා බලන්න අපි සූදානම්. නමුත් ගරු විපක්ෂ නායකතුමනි, අපේ රජය බලයට පත් වූ පසු අපි අවි ආයුධ බෙදා දීමක් සිදු කරලා නැහැ. ඊට පෙර පැවති පාලන කාලවලදී තමයි මේ ආකාරයෙන් අවි ආයුධ ලබා දීම් සිදු කර තිබෙන්නේ. නමුත්, ඔබතුමා කියපු කාරණය පිළිබඳව අපි සැලකිලිමත් වෙන්නම්.

ඒ වාගේම වනසතුන්ට වෙඩි තැබීමේ සිදුවීම් බොහොමයක් නීත්‍යානුකූල අවි ආයුධ භාවිතයෙන් සිදු වන ඒවා නොවෙයි. ඒවා නීති විරෝධී අවි ආයුධ සහ විවිධාකාරයෙන් සකස් කර ගත් ආයුධ භාවිතයෙන් සිදු කරන වෙඩි තැබීම්. විශේෂයෙන්ම අලි ඇතුන්ට මෙවැනි ප්‍රහාර එල්ල කිරීමේ සිදුවීම් වැඩි ප්‍රමාණයක් එවැනි ආකාරයෙන් තමයි සිදුවෙලා තිබෙන්නේ. කෙසේ වෙතත්, ඔබතුමා ඉදිරිපත් කළ කාරණය සම්බන්ධයෙනුත් සැලකිලිමත් වන්න අපි සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාවන්තිස්ස ඇත් රජුගේ වියෝව පිළිබඳව අප සියලුදෙනා තුළම කනගාටුවක් සහ දුකක් පවතිනවා. කාවන්තිස්ස ඇතා වෙනුවෙන් අප සියලුදෙනාගේ ශෝකය මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කර සිටිනවා.

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, කාවන්තිස්ස ඇතාගේ වියෝව අප සියලුදෙනාටම දුකක්. එම කාරණය සඳහා පැයක කාලයක් ගතවුණත්, කැලණිතිස්ස, නොරොච්චෝලේ සහ Upper Kotmale විදුලි බලාගාර සම්බන්ධයෙන් කොපමණ කාලයක් වෙන් වෙයිද කියලා අපි බලමු. පසුගිය දිනක විදුලිය බිඳ වැටීමත් සමඟ මිනිසුන්ගේ blood pressure එකත් වැඩි වුණා, ශරීරයේ උෂ්ණත්වයත් වැඩි වුණා, ඒ වාගේම ජනතාවගේ කෝපයත් වැඩි වුණා. ගරු කථානායකතුමා ඒ සම්බන්ධයෙන් කථා කරන්න කොපමණ කාලයක් ලබා දේවිද කියලා අපි බලමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ කාරණය සියලුදෙනාම තේරුම් ගන්න. මීට පෙරත්, ඒ කියන්නේ ගරු විපක්ෂ නායකතුමා කරුණු ඉදිරිපත් කළ අවස්ථාවේදීත් මම පැහැදිලිව සඳහන් කළා, අපි මේක විනාඩි පහකට සීමා කරගෙන කටයුතු කරමු කියලා. එක් වරක් අඩුපාඩුවක් සිදු වුණා කියලා ඒක repeat කරන්න ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා සූදානම් නොවී ඉන්නවා නම් වඩාත් හොඳයි. දැන් ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## II

## 2026.10.17 දින දිවයින පුරා විදුලිය බිඳ වැටීමට හේතු

## 17.10.2026 அன்று நாடளாவிய ரீதியிலான மின் தடைக்கான காரணம்

## REASONS FOR ISLAND WIDE POWER OUTAGE ON 17.10.2026

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, 2025.02.09වන දින රට පුරා සිදු වූ විදුලිය බිඳවැටීමෙන් අනතුරුව, 2026.10.17වන දින නැවතත් රට පුරා විදුලිය බිඳවැටීම හේතුවෙන් අත්‍යවශ්‍ය සේවා සහ ආර්ථික කටයුතු අඩාළ විය. විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමෙන් පමණක් මෙම බිඳවැටීම්වලට හේතු පැහැදිලි කිරීම, වගකීම තහවුරු කිරීම සහ මෙවැනි සිදුවීම් නැවත ඇතිවීම වැළැක්වීම සම්බන්ධයෙන් රජයේ වගකීම අවසන් නොවේ. නැවත නැවත ඇතිවන මෙවැනි බාධා මහජන ආරක්ෂාවට, අත්‍යවශ්‍ය සේවාවලට, ජනතාවගේ ජීවනෝපායයන්ට සහ ආයෝජකයන්ගේ විශ්වාසයට තර්ජනයකි.

ගරු ඇමතිතුමනි, ඒ අනුව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

1. විදුලිය බිඳවැටීමට මුල් වූ දෝෂය කුමක්ද? එය සිදු වූ ස්ථානය සහ නිශ්චිත වේලාව කුමක්ද? කොත්මලේ සිදු වූයේ කුමක්ද? ඉන් අනතුරුව ගනු ලැබූ පූර්ව ආරක්ෂක පියවර මොනවාද? එම සිදුවීම සමස්ත ජාතික විදුලි පද්ධතිය බිඳවැටීමට බලපෑවේ කෙසේද?

2. වේලාවන් සහිත විදුලි ජනන, ඉල්ලුම්, සංඛ්‍යාත, වෝල්ටීයතා සහ ආරක්ෂණ පද්ධති ක්‍රියාකාරිත්ව වාර්තා සභාගත කරන්නේද?

   දෝෂය පැතිරීම පාලනය කිරීමට ආරක්ෂණ පද්ධති - security systems - අසමත් වූයේ ඇයි?

3. කිසිදු ජනන බලාගාරයක් බිඳ වැටී නොමැති බවට වූ ජාතික පද්ධති ක්‍රියාකරුගේ - NSOගේ - ප්‍රකාශය අනුව, නොරොච්චෝලේ නතර වීම පද්ධති අස්ථාවරත්වයට හේතුවක්ද, නැතහොත් එහි ප්‍රතිඵලයක්ද? ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු පිළිබඳ චෝදනා විමර්ශනය සඳහා මෙහෙයුම් වාර්තා සහ ස්වාධීන තත්ත්ව පරීක්ෂණ ප්‍රතිඵල ප්‍රසිද්ධ කරන්නේද? ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය වී ඇති බව තහවුරු වුවහොත් ගිවිසුම් ප්‍රකාර පිළියම් ක්‍රියාත්මක කරන්නේද?

4. 2025.02.09වන දින විදුලිය බිඳ වැටීමෙන් පසු - මේ කියන්නේ, පානදුරේදී ඇති වුණු වඳුරාගේ ප්‍රශ්නය - නිකුත් කළ නිර්දේශ හා නියාමන විධාන අතරින් තවමත් ක්‍රියාත්මක කර නැති ඒවා මොනවාද? ඒ ඇයි සහ ඊට වගකිවයුත්තේ කවුරුන්ද? ස්වාධීන විමර්ශනයක කාර්ය නියම, සොයා ගැනීම් සහ නිවැරදි කිරීමේ කාල සීමාව ප්‍රසිද්ධ කරන්නේද?

5. සම්ප්‍රේෂණ උපපොළවලට සහ බලපෑමට ලක් වූ සියලු ම පාරිභෝගිකයින්ට විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කළේ කවදාද? සැපයුම යළි ලබා දුන් ඇතැම් ප්‍රදේශවල විදුලි සැපයුම නැවත විසන්ධි වූයේ ඇයි? ඒ කියන්නේ, විදුලි සැපයුම විසන්ධි වෙලා පස්වරු හයට විදුලිය ආවාට පස්සේ නැවත outage එකක් වුණා. එම අවස්ථාවේ රෝහල්, ජල පවිත්‍රාගාර, විදුලි සන්දේශ සේවා සහ airports ආරක්ෂා කිරීමට තිබුණු විධිවිධාන මොනවාද?

6. විදුලිය බිඳවැටීමට පෙර සැබෑ සූර්ය විදුලි ජනනය, සමස්ත ඉල්ලුම සහ ලබා ගත හැකි සංචිත ජනන ධාරිතාව කොපමණද? මෙගාවොට් 1,700යි කියලා වාර්තා වෙලා තිබෙනවා. නමුත් දැන් ඒක ඊට වඩා වැඩිද, අඩුද? වහල මත සවි කර ඇති සූර්ය බලශක්ති පද්ධති විසන්ධි කිරීමට ඉල්ලා සිටියේ ඇයි? සැපයුම යථා තත්ත්වයට පත් කිරීමේ පියවර සහ බිඳවැටීම තහවුරු වූ හේතු අතර වෙනස පැහැදිලි කරමින්, බලශක්ති ගබඩාකරණය, ජාලය ශක්තිමත් කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම සඳහා අරමුදල් සහිත සැලසුම් ඉදිරිපත් කරන්නේද?

   ගරු කථානායකතුමනි, power outage එකක් වුණාම පුනර්ජනනීය බලශක්ති පද්ධති ක්‍රියා විරහිත කරන්න කිව්වේ ඇයි, විශේෂයෙන්ම විදුලිබලයේ අඩුපාඩුවක් තිබුණු අවස්ථාවේදී?

7. සාධාරණ ආයෝජන ප්‍රතිලාභ, බැංකු මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාව සහ පාරිභෝගිකයින්ට දැරිය හැකි මිල තහවුරු කරන විනිවිදභාවයෙන් යුතු පුරෝකථනය කළ හැකි, වෙළෙඳ පොළ පදනම් කර ගත් පුනර්ජනනීය බලශක්තියෙන් නිපදවන විදුලිය මිලදී ගැනීමේ ගාස්තු රජය සහතික කරන්නේද? මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2026.09.10 දිනැති ජනන සීමාකිරීම් සඳහා වන්දි මුදල තීරණය කිරීමට අදාළ විදුලි ඒකක ප්‍රමාණය, ගෙවිය යුතු මුදල, ගෙවූ මුදල සහ හිඟ මුදල කොපමණද? හිඟ මුදල් ගෙවන්නේ කවදාද?

8. පාරිභෝගිකයින් ගෙවීම් පැහැර හැරීමේදී අමතර ගාස්තු හා විසන්ධි කිරීම්වලට මුහුණ දෙති. එසේ නම් සැපයුම් බාධා, හදිසි වෝල්ටීයතා ඉහළ යෑම් සහ උපකරණ හානි සඳහා සැපයුම්කරුවන්ට අදාළ වන්දි වගකීම් මොනවාද? බලාත්මක කළ හැකි ප්‍රමිති, වන්දි ඉල්ලීමේ ක්‍රියාපටිපාටි සහ ගෙවීම් අවසන් කිරීමේ කාල සීමාව ප්‍රසිද්ධ කරන්නේද?

   ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා නේ, විදුලි බිල ගෙවීම දවසක් හරි ප්‍රමාද වුණොත් විදුලිය විසන්ධි කරනවා කියලා. ඊට පස්සේ නැවත ඒ විදුලි සැපයුම ලබා ගන්න දහස් ගණනින් මුදල් ගෙවන්න ඕනෑ. හැබැයි, National System Operator යටතේ දවසකට තුන් හතර සැරයක් විදුලිය විසන්ධි වනවා. එතකොට ඒ ප්‍රශ්නයට වන්දි ගෙවන්නේ කවුද? මේවායෙන් පාරිභෝගිකයාට කිසිම සෙතක් නැහැ. නමුත්, ඒ අයට හැම රැකවරණයම තිබෙනවා.

9. 2026.10.17 සහ 2025.02.09 දිනවල සිදු වූ බිඳවැටීම් හේතුවෙන් NSO එකට හෝ එහි පූර්වගාමී ආයතනවලට - successorsලාට- සහ පාරිභෝගිකයින්ට සිදු වූ අලාභය කොපමණද? එක් එක් සිදුවීම්වලට අදාළව වෙන් වෙන්ව අලාභ ඇස්තමේන්තු සහ ඒවා ගණනය කළ ක්‍රමවේද සහාගත කරන්නේද?

10. ජාතික ජාලයට සම්බන්ධ කර තිබූ බැටරි බලශක්ති ගබඩා පද්ධති - BESS - මොනවාද? ඒවා සම්බන්ධ කළ ස්ථාන, දින සහ මෙගාවොට් පැය ධාරිතාවන් කොපමණද?

   විශ්වාසදායකව ලබා ගත හැකි ජනන ධාරිතාවේ හිඟය පියවීමට ඒවා දායක වූයේ කෙසේද? තවද, 2026 ඔක්තෝබර් 17 සහ 18 දිනවල තාප විදුලි ජනන පිරිවැය එක් එක් දිනය සඳහා වෙන් වෙන්ව කොපමණද?

11. වගකිව යුතු ආයතන, අරමුදල් සහ මැනිය හැකි ඉලක්ක හඳුනා ගත්, නිශ්චිත කාල සීමා සහිත නිවැරදි කිරීමේ වැඩසටහනක් සභාගත කර, එහි ප්‍රගතිය පාර්ලිමේන්තුවට වාර්තා කරන්නේද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා විනාඩි 7යි ගත්තේ. බොහොම ස්තුතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේ ඇත්තටම ප්‍රශ්න 23ක් තිබෙනවා. ඒ නිසා පිළිතුරු දීමට මට සාධාරණ කාලයක් ලැබෙයි කියා බලාපොරොත්තු වනවා. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා අසන සමහර ප්‍රශ්නවලට අදාළව සහ මේ සිද්ධිය සම්බන්ධයෙන් කොහොමත් අමාත්‍යාංශ නිවේදනයක් කරන්න මා බලාපොරොත්තු වනවා. මෙතුමා අසන ලද සමහර ප්‍රශ්නවලට පිළිතුරු මා එම අමාත්‍යාංශ නිවේදනය තුළ සඳහන් කරනවා. ඒ නිසා කාලය ඉතිරි කරගන්න මම ඒ ටික repeat කරන්නේ නැතිව පිළිතුර ලබා දෙනවා.

1. මෙම ප්‍රශ්නයට පිළිතුර අමාත්‍යාංශ නිවේදනය මඟින් ඉදිරියේදී ලබා දීමට මා බලාපොරොත්තු වනවා.

2. මෙම ප්‍රශ්නයේ තිබෙන්නේ, මේ සිද්ධිය වනකොට generation එක, demand එක, frequency එක ආදී තාක්ෂණික තොරතුරු සභාගත කරන්න කියන එක. සාමාන්‍යයෙන් මේ වාගේ දෙයක් වුණාම standard procedures අනුව NSO එක විසින් detailed report එකක් සකස් කරනවා. තවමත් ඒ detailed report එක සකස් කර නැහැ. මේ සතිය ඇතුළත ඒ detailed report එක ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. ඒ detailed report එකේ තමයි මේ දත්ත තිබෙන්නේ. ඒ report එක ලැබුණු වහාම ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සභාගත කරන්න මා කටයුතු කරනවා.

3. මේ ප්‍රශ්නයෙන් අහන්නේ, මේ සිදුවීම වූ වෙලාවේ නොරොච්චෝලේ බලාගාරයේ යන්ත්‍ර ක්‍රියා විරහිත වුණේ මොන හේතුව නිසා ද සහ ඒකෙන් පසු ඇති වෙච්ච අතුරු ප්‍රතිඵල පිළිබඳව. මම මේ ප්‍රශ්නයට පිළිතුරත් මගේ Statement එකෙන් ප්‍රකාශයට පත් කරන්න බලාපොරොත්තු වනවා.

4. මේ යටතේ අහන්නේ, විශේෂයෙන් 2025.02.09වැනි දා වූ සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂණ කර, ඒ නිර්දේශ ක්‍රියාත්මක කර තිබෙන්නේ කොයි විධියෙන් ද සහ ඒවායේ ප්‍රගතිය සම්බන්ධයෙන්.

   පළමු නිර්දේශය වශයෙන් තිබෙන්නේ, මේ වනකොට තිබෙන spinning reserve criterion එක consider කර system inertia ඇති කිරීම. මේ සම්බන්ධයෙන් AFRY කියන consultancy firm එක Transmission Grid Stability සහ renewable energy සම්බන්ධයෙන් study එකක් කරලා වාර්තාවක් submit කරලා තිබෙනවා. එහි recommendations මේ වනකොට ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒක ඉදිරි සැලසුම්වල තිබෙනවා.

   දෙවන නිර්දේශය, Reviewing of Under-frequency Load Shedding - UFLS - Scheme. මේ සම්බන්ධයෙන් appoint කරපු කමිටුවේ report එක ලැබී තිබෙනවා. ඒ report එක review කරලා ඒක implement කරන්න කටයුතු කරමින් ඉන්නවා.

   තුන්වන නිර්දේශය, hydro සහ thermal power plantsවල synchronous condensers සවි කිරීම. මේ සම්බන්ධයෙන් මොනවාද කරලා තිබෙන්නේ කියන ප්‍රශ්නයට පිළිතුර

[ගරු අනුර කරුණාතිලක මහතා]

වන්නේ, New Laxapana Power Station එකේ units දෙකක් දැනටමත් Synchronous Condenser Mode එකට ඇතුළත් කර තිබීමත්, ඒ වාගේම Small GTs at KPS, GT 01 and GT 02 කියන units දෙක, දැන් Synchronous Condenser Mode එකේ run වෙනවා කියන එකයි. ඒ වාගේම දැන් තවත් කණ්ඩායමක් appoint කර තිබෙනවා, GT 05 at KPS කියන එක සම්බන්ධයෙන් කටයුතු කරන්න. ඒවායේ අලුත්වැඩියා කටයුතු මේ වනකොට කරමින් පවතිනවා. ඒ වාගේම Uma-Oya generators මේ විධියටම convert කිරීම සඳහා study එකක් මේ වනකොට කරගෙන යමින් පවතිනවා.

හතරවන recommendation එකේ තිබෙන්නේ, BESS implementation එක ගැන. අපි දැනටත් දන්නා විධියට මෙගාවොට් 30ක් මේ වනකොට ඇතුළත් කරලා, මෙගාවොට් 160ක් මේ අවුරුද්දේත්, ඉදිරි අවුරුද්දේ මෙගාවොට් 540කුත් වශයෙන් සැලැස්ම තුළ ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

පස්වන නිර්දේශය වශයෙන්, immediate blackout එකක් නතර කරන්න මොනවාද කරන්නේ කියලා සඳහන් කර තිබෙනවා. විශේෂයෙන් කොළඹ අවට ප්‍රදේශයේ power supply එක සොබාදනවි බලාගාරය ආශ්‍රයෙන් energize කරන්න කටයුතු කරන එක evaluation stage එකේ තමයි මේ වනකොට තිබෙන්නේ.

හයවන නිර්දේශය වශයෙන් තිබෙන්නේ, මේ වාගේ shutdown එකක් වුණාම ලක්විජය බලාගාරයේ safety measures ගැනීම. මේ සම්බන්ධයෙන් ගෙන තිබෙන පියවර මොනවාද කිව්වොත්, EPC contractor of China Machinery Engineering Corporation මේ සම්බන්ධයෙන් කටයුතු කර තිබෙනවා. ඒ සමහර modifications මේ වනකොටත් කරලා තිබෙනවා. මේක සම්පූර්ණ කිරීම සඳහා PMU එකක් මේ වනකොට establish කර තිබෙනවා, system outage එකකදී ලක්විජය බලාගාරයේ power plant units safeguard කිරීම සඳහා, for procurement of design, supply, installation and commissioning of boiler feed water system.

ඒ වාගේම හත්වන Recommendation එකේ තිබෙන්නේ, "Manage all power sources to safeguard the system stability" කියලා. ඒ කියන්නේ, system එකේ stability එක හදන්න, සියලු ජනන ප්‍රභවවලට මොන වාගේ කටයුතුද කරලා තිබෙන්නේ කියලා. මම කලින් සඳහන් කළා වාගේ ජල විදුලි ප්‍රභවය සඳහා කටයුතු කර තිබෙනවා. ඒ වාගේම rooftop solar powerවල controllability එක සහ visibility එක ලබා ගැනීම සඳහා පළමුවැනි අදියරේ කිලෝවොට් 100ට වැඩි rooftop solar power තිබෙන තැන්වල device එකක් සවි කරලා ඒකෙන් controllability එක සහ visibility එක NSO එකට ගන්න මේ වනකොට කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම Distribution Control Centre එකේ මේ විධියට සම්පූර්ණයෙන්ම frequency control සහ disturbance management හරහා overall system stability එකක් ලබා ගන්න කටයුතු කරමින් ඉන්නවා.

ඊළඟට තිබෙන්නේ, Renewable Energy Desk එකක් establish කරන්න කියන එක. මේ සඳහා දැනටමත් project එකක් establish කරලා තිබෙනවා.

ඒ වාගේම Renewable Energy Desk එක ආරම්භ කරන්න සහ renewable energy monitor කරන්න, forecasts ඉදිරිපත් කරන්න වාගේම manage කරන්න අවශ්‍ය කටයුතු ද මේ වනකොට සකස් කර තිබෙනවා. මේකේ bid එක 2026 ජූලි මාසයේ 02වැනි දා වනකොට close කරලා, දැන් bid evaluation process එකේ තිබෙන්නේ. අපි විශ්වාස කරනවා, මේ අවුරුද්ද අවසාන වනකොට award කරලා 2028 අගෝස්තු වනකොට මේක ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා.

5. සහ 6. ප්‍රශ්න සඳහා පිළිතුරු මම සිදු කරන Ministerial Statement එකට ඇතුළත් කරන්න බලාපොරොත්තු වෙනවා.

7. මෙම ප්‍රශ්නයෙන් අහන්නේ විශේෂයෙන් PUCSL එකේ නියෝග අනුව curtail කරන renewable energyවලට, විශේෂයෙන් solar powerවලට ගෙවීම් කටයුතු කරනවාද කියන එක සම්බන්ධයෙන් සහ කොච්චර මුදලක් outstanding තිබෙනවාද කියන එක ගැන. සාමාන්‍යයෙන් රජය renewable energy සම්බන්ධයෙන් මේ වනකොට competitive bidding process එක තමයි facilitate කරන්නේ. එතකොට, අපේ priority එක තිබෙන්නේ මිලියන 70ක් වන විදුලි පාරිභෝගිකයා සම්බන්ධයෙන් කටයුතු කරන එක. ඒ අනුව curtailment එක සඳහා දැනට ගෙවීමේ situation එකක් නැහැ. අපි පුළුවන් තරම් අඩුවෙන්, පද්ධති පාලනයේ අවශ්‍යතාව වෙනුවෙන් විතරමයි මේ curtailments කරන්නේ. ඒ නිසා Power Purchase Agreement එකත් එක්ක අප මේ curtailment සඳහා ගෙවන්න කටයුතු කළොත්, සමහර වෙලාවට වෙනත් පාර්ශ්වයකට නීතිමය පැත්තෙන් මේක අභියෝගයට ලක් කරන්න පුළුවන්. ඒ අනුව අපි දැනට curtailmentsවලට ගෙවීමක් කරන්න මේ වනකොට කටයුතු කරන්නේ නැහැ. ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, BESS හරහා මේ curtailments හැකිතාක් දුරට අවම කරන්න. ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරන්න පුළුවන්කම ලැබෙයි කියලා අපි හිතනවා.

8. මෙම ප්‍රශ්නයෙන් අහන්නේ interruption, voltage surges, equipment damages වාගේ දේවල්වලට මොනවාද කරන්නේ, මොන වාගේ claimsද ගෙවන්න බලාපොරොත්තු වෙන්නේ කියලා, default charges, disconnectionsවලදී. Public Utilities Commission එක තමයි මේ සම්බන්ධයෙන් regulatory body එක හැටියට කටයුතු කරන්නේ. ඒ වාගේම ඒ අනුව electricity safety, quality and continuity for damages to equipment ආදිය සම්බන්ධයෙන් PUCSL එක කටයුතු කරනවා. PUCSL එක charges approve කළාට පස්සේ disconnection and connection charges පිළිබඳ කටයුතු කරන්නෙත් PUCSL එකේ දීලා තිබෙන නිර්ණායක අනුව.

9. "What losses did the NSO or predecessor entitle....." යනුවෙන් මෙම ප්‍රශ්නයෙන් ගරු මන්ත්‍රීතුමා අහන්නේ, NSO එකට සහ අනෙකුත් ආයතනවලට 2026.10.17 දින සහ 2025.02.09වැනි දා ඇති වෙච්ච මේ blackout එක නිසා සාමාන්‍යයෙන් තිබෙන loss එක ගැන. මේ වාගේ loss එකක් ආවාම සාමාන්‍යයෙන් NSO එක සහ අනෙක් companiesවල tariffsවලින් තමයි ඒක reflect වෙන්නේ. ඒ නිසා consumersලාට වෙන loss එක quantify කරන්න බැහැ.

10. මෙම ප්‍රශ්නයෙන් අහන්නේ, මේ වනකොට gridවලට connect වෙලා තිබෙන BESS මොනවාද, ඒ ප්‍රදේශ මොනවාද කියන එක සහ කොච්චර ප්‍රමාණයක්ද කියන එකයි. ගාල්ල ප්‍රදේශයේ තිබෙනවා, මෙගාවොට් 10ක්, මෙගාවොට් පැය 40ක්. සැප්තැම්බර් මාසයේ 10වැනි දා තමයි ඒක grid එකට connect වුණේ. අනුරාධපුරයේ තිබෙනවා, මෙගාවොට් 10ක්. ඒ කියන්නේ, මෙගාවොට් පැය 40ක්. ඔක්තෝබර් මාසයේ 01වැනි දා තමයි ඒක grid එකට connect වුණේ. වවුනියාවේ තිබෙනවා, මෙගාවොට් පැය 40ක්. ඒ කියන්නේ, මෙගාවොට් 10ක්. ඔක්තෝබර් මාසයේ 14වැනි දා තමයි ඒක grid එකට connect වුණේ.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා අහනවා, thermal generation cost එක කීයද කියලා. ලක්විජය විදුලි බලාගාරයේ units 1, 2, 3හි කිලෝවොට් පැයක thermal generation cost එක රුපියල් 24.19ක්. නැප්තා ඉන්ධන භාවිතයෙන් ධාවනය වන කැලණිතිස්ස ඒකාබද්ධ චක්‍ර විදුලි බලාගාරයේ කිලෝවොට් පැයක thermal generation cost එක රුපියල් 55.33ක්. මා ඉහත සඳහන් කළ විදුලි බලාගාර unitsවල සහ අනෙකුත් විදුලි බලාගාර unitsවල තාප විදුලි ජනන පිරිවැය දැක්වෙන වගුව ඇතුළත් සවිස්තරාත්මක පිළිතුර මා **සභාගත*** කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට කියන්න පුළුවන්ද, වැඩිම තාප විදුලි ජනන පිරිවැයක් තිබෙන්නේ කොහේද කියලා?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

වැඩිම තාප විදුලි ජනන පිරිවැය තිබෙන්නේ හම්බන්තොට ඩීසල් බලාගාරයේ. එහි කිලෝවොට් පැයක තාප විදුලි ජනන පිරිවැය රුපියල් 129.18ක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුර අවසන්ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඔව්, පිළිතුර ලබා දීලා අවසන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමනි. 10 සහ 11 ප්‍රශ්න සඳහා පිළිතුරු මම සිදු කරන්න බලාපොරොත්තු වන අමාත්‍යාංශ නිවේදනයේ ඇතුළත් කර තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, කොයි වෙලාවටද ඒක ඉදිරිපත් කරන්නේ?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මට මතක හැටියට, "Ministerial Statements" යටතේ දම්මික පටබැඳි ඇමතිතුමාගේ Statement එකක් තිබෙනවා. ඒ Statement එකෙන් පස්සේ මගේ Statement එක ඉදිරිපත් කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශ නිවේදනයේ තිබෙන්නේ මොනවාද කියලා මම දන්නේ නැහැ. නමුත් මට අනුමාන කරන්න පුළුවන්, මොනවාද ඒකේ තිබෙන්නේ කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දුන්නු පිළිතුර ප්‍රකාරව ඔක්තෝබර් 17වැනි දා පෙර වරු 11.43ට විදුලිය බිඳ වැටීමක් සිදු වුණා. මෙගාවොට් 2,870ක් ජනනය කිරීමට අවශ්‍යව තිබූ අවස්ථාවේදී නොරොච්චෝලේ විදුලි බලාගාරයේ විදුලිය මෙගාවොට් 175ක් ජනනය කරමින් තිබියදී එක වතාවටම එය මෙගාවොට් 5කට අඩු වීම තුළින් තමයි මේ තත්ත්වය ඇති වුණේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිගන්නවා, අපේ තිබෙන අණපනත් අනුව, CEB එක හෝ National System Operator අඛණ්ඩ විදුලි ජනනය කිරීමක් සඳහා බැඳී සිටින බව. එහෙම තිබියදී විදුලිය මෙගාවොට් 175 මෙගාවොට් 5ට අඩු වුණා. ඒක වුණේ ඒ machines දෙකේ boiler එකේ diaphragm එකේ ඇති වුණු ප්‍රශ්නයක් නිසා. මේ diaphragm එකේ ඇති වුණු ප්‍රශ්නය ගත්තොත්,- ඩී.වී. චානක මන්ත්‍රීතුමා, අපේ එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා මෙවැනි ප්‍රශ්න නිරන්තරයෙන් අහනවා - මෙය බාල ගල් අඟුරු නිසා ඇති වුණු ප්‍රතිවිපාකයක් ලෙස ලංකා විදුලිබල මණ්ඩලයම පාර්ලිමේන්තුවට වාර්තා කර තිබෙනවා. මේ diaphragm එකේ ඇති වුණු සිද්ධියේ අතුරු ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ ඒ heat වෙන එකේ තිබෙන ප්‍රශ්නය නිසා සිදු වූ අලාභය මම හිතන විධියට රුපියල් බිලියන 56ක් කියලා තමයි දැනට ගණනය කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, රුපියල් කෝටි 5,600ක්. මේ අලාභය හැදිලා තිබෙන්නේ මෙහෙමයි. ඇති වෙලා තිබෙන අලාභය රුපියල් බිලියන 16යි. ඊට පස්සේ රජය දරන සහනාධාරය රුපියල් බිලියන 15යි. බාල ගල් අඟුරු නිසා ඩීසල්වලින් විදුලිය ජනනය කරන්න යන වියදම රුපියල් බිලියන 25යි. ඒවා එකතු වුණාම සමස්ත අලාභය රුපියල් බිලියන 56යි කියලා ඔප්පු වෙනවා. ඒ කියන්නේ, රුපියල් කෝටි 5,600යි.

ගරු කථානායකතුමනි, 2025 පෙබරවාරි 09වැනි දා මෙවැනි ජාතික විදුලිය කප්පාදුවක් - national power outage එකක් - තිබුණු වෙලාවේ මහජන උපයෝගිතා කොමිසම නිර්දේශ කළා, inverter setting for solar panels, සාමාන්‍ය ධාරිතාව විධියට තිබුණු සියයට 50 ධාරිතාව සියයට 47.5කට තිබිය යුතුයි කියලා. ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේදී ඒක ක්‍රියාත්මක වෙලා තිබෙනවාද කියන එක හිටපු විදුලිබල සහ බලශක්ති ඇමතිවරයෙක් වශයෙන් මම ඔබතුමාගෙන් අහනවා. මම දන්නවා, ඔබතුමාත් ඕනෑකමින් මේ සම්බන්ධයෙන් කටයුතු කර තිබෙනවා කියලා. මේ අවස්ථාවේදී මේ inverter setting එක සියයට 47.5කට තිබුණාද, නැත්නම් සියයට 49.5කට ඒ ආකාරයෙන්ම තිබුණාද? NSO එකේ අඛණ්ඩ විදුලි ජනනය කිරීමේ අවශ්‍යතාව විදුලිය මෙගාවොට් 2,870ක්ව තිබියදී එදින පෙර වරු 11.43ට විදුලි කප්පාදුවක් සිදු වුණා. ඔබතුමාම කිව්වා, spinning reserve එකක් තිබෙනවා කියලා. සාමාන්‍යයෙන් සියයට 10-15 අතර spinning reserve එකක් තිබෙනවා. ඒ කියන්නේ, විදුලිය මෙගාවොට් 280-425 අතර ප්‍රමාණයක්. මේක මෙගාවොට් 175කින් අඩු වුණා නම් ඒ spinning reserve එක තුළින් කිසි ප්‍රශ්නයක් නැතුව විදුලිය ජනනය කරන්න තිබුණා. ඒ කියන්නේ විදුලිය මෙගාවොට් 280-425 අතර ප්‍රමාණයක spinning reserve එකක් තිබෙනවා නම් විදුලිය මෙගාවොට් 175කින් අඩු වුණා නම් තවම විදුලිය මෙගාවොට් 200ක් සංචිතයේ තිබෙනවා. එහෙම නම් මේක මෙගාවොට් 175කින් අඩු වීම නිසා කිසි බාධාවක් ඇති වෙන්නේ නැහැ. එහෙම වුණා නම් කොහොමද මේ තත්ත්වය ඇති වුණේ?

ගරු ඇමතිතුමනි, ඒ විතරක් නොවෙයි, අපි capacity charge එකක් ගෙවනවා. එලෙස ගෙවන්නේ West Coast Power (Pvt.)

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවී කරුණානායක මහතා]

Limited එකට වෙන්න පුළුවන්, Sobadhanavi Limited එකට වෙන්න පුළුවන්. විදුලිය පාවිච්චි කළත්, නැතත් දවසකට ඒකකයට රුපියල් 4ක capacity charge එකක් ගෙවනවා. මේ generation එකට මිනිත්තු දෙක තුනකින් නැවත විදුලිය ජනනය කිරීම පටන් ගන්න තිබුණා. ඇයි එහෙම නොවුණේ කියන ප්‍රශ්නය මම ඉතාම ඕනෑකමින් අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කාවන්තිස්ස ඇතාගේ මරණය වාගේම මේකත් මම බොහොම දුකට පත් වුණු තත්ත්වයක්. අර පාරිභෝගිකයන් ලක්ෂ 70, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් ප්‍රශ්න කිහිපයක්ම ඇහුවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් ඇමතිතුමාම කිව්වා, මේකේ අලාභය ගණනය කරන්න බැහැ, නමුත් ඒක tariff එකෙන් තමයි පෙනෙන්නේ කියලා. ඉතින් අන්තිමට ඒ විදුලි බිල ගෙවන්නේ පාරිභෝගිකයා. ඒ අපරාධය නවත්වන්න තමයි මම මේ අහන්නේ. මේ loss එක බැලුවොත්, කෙළින්ම ඩීසල්වලින් ගන්නකොට - මේක ඩීසල් මාෆියාවේ කැමැත්ත - මේ සඳහා දවසකට කෝටි 150ක් වියදම් වෙනවා. ඉතින්, මේ දවස් හතර පහටම කෝටි 7,000ක් විතර නැති වෙයි. ඉතින් ඇමතිතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කෙටියෙන් අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම හිතන විධියට, ගරු කථානායකතුමාටත් වේලාව එක්ක ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් මම පාරිභෝගිකයා වෙනුවෙන් සටන් කරන නිසා, ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් අහනවා, මේ දෙක තුළින් ගණනය කරලා, මේ අලාභය නැති කරලා, කොහොමද මේ ප්‍රශ්නයට උත්තරයක් සපයන්නේ කියලා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු මන්ත්‍රීතුමනි, spinning reserve එක ගැන කිව්වා. ඒ මොහොතේදී spinning reserve එක හැටියට වැඩ කළේ, Victoria Power Station එකේ තිබෙන එක. ඒ වාගේම කාලයක් තිස්සේ අපට තිබෙන ගැටලුවක් තමයි, ගිය සැරේත් තිබ්බ recommendation එකක් තමයි, අපේ spinning range එක, frequency range එක පිළිබඳ ගැටලුව. 48 කියන එක තිබුණේ. ඒක සමහර ඒවායේ down වෙනවා, 40, 47 දක්වා. 47 වෙනකල් අවම ප්‍රමාණයට, දරා ගන්න පුළුවන් range එකකට ගෙනෙන්න ඕනෑ කියලා නිර්දේශයක් තිබුණා. ඒ සම්බන්ධයෙන් මට මතක හැටියට, 2025 මාර්තු මාසයේ හෝ ඊට පසුව අදාළ ගැසට් නිවේදනය නිකුත් කරලා තිබෙනවා, විශේෂයෙන්ම rooftop solar inverter එක ඒ range එකට ගෙනෙන්න කියලා. Sri Lanka Sustainable Energy Authority - SLSEA- එක ඒ සම්බන්ධයෙන් දැනටමත් අදාළ ගැසට් නිවේදනය නිකුත් කරලා තිබෙනවා. ඒ වාගේම දැන් අලුතෙන් ගෙන්වන inverters සඳහා ඒක ක්‍රියාත්මක වෙනවා. නමුත් ප්‍රශ්නයක් තිබෙනවා. දැනටමත් සැලකිය යුතු solar inverters ප්‍රමාණයක්, මෙගාවොට් 2,000කට ආසන්න හෝ ඊට වැඩි ප්‍රමාණයක් සවි කරලා තිබෙනවා, මේ spinning range එකේ නැතුව. එතකොට, මේ සිදුවීමත් එක්ක අපි කල්පනා කරලා බලනවා, අදාළ companies එක්ක එකතු වෙලා, ඒ companies ගෙන්වලා, ඒ දැනට සවි කරලා තිබෙන invertersවලත් frequency range එක පහළට ගෙනෙන්න.

ඊළඟට, ruptures ගැන, diaphragms rupture වෙච්ච එක ගැන, loss එක ගැන ඉදිරිපත් කරලා තිබෙන සංඛ්‍යා දත්ත හරි කියලා මම හිතන්නේ නැහැ. මොකද, ඒ diaphragms rupture වෙච්ච එකක් තිබෙන්නේ. අපි විශ්වාස කරනවා, ලබන 22වැනි දා වෙනකොට, ඒ කියන්නේ බ්‍රහස්පතින්දා වෙනකොට ඒවා යථා තත්ත්වයට පත් කරන්න පුළුවන් වෙයි කියලා. මේ වෙලාවේ මට හරියටම කියන්න බැහැ, නියම damage එක කීයද කියලා, ruptures වෙච්ච නිසා. හැබැයි, ඔය තිබෙන බිලියන ගණනක් නම් වෙන්නේ නැහැ. ඒක එහෙම නැහැ. ඒ වාගේම ඔබතුමා දකින්න ඇති, ඊයේ තිබ්බ මාධ්‍ය සාකච්ඡාවේදී ඒ විදුලි ඉංජිනේරුවන් කිව්වා, ගල් අඟුරුවල ප්‍රමිතිය සහ මේ සිදුවීම අතර සම්බන්ධයක් නැහැ කියලා. මම හේතුව කියන්නම්. මොකද, කලින් season එකේදී තමයි ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳව ගැටලුවක් ආවේ. සැප්තැම්බර් 4වැනි දා වෙනකොට ඒ coal සියල්ලම පාහේ අවසන් කරලා තිබුණේ. සැප්තැම්බර් 4වැනි දායින් පස්සේ අපි පාවිච්චි කරන්නේ අලුත් coal. ඒ වාගේම මේ Unit I කියන එක ඒ කාලය තුළ shut down කරලා තිබුණේ, අත්‍යවශ්‍ය overhaul කටයුත්තකට, repair එකකට. සැප්තැම්බර් මාසයේ 29වැනි දා ඉඳලා තමයි ඒක ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ. ඒක ක්‍රියාත්මක කරන්න පටන් ගත්තේ, සම්පූර්ණයෙන්ම මේ season එකේ ගෙනාපු ගල් අඟුරුවලින්. ඒ නිසා කලින් තිබුණු ප්‍රමිතිය පිළිබඳ ගැටලුව, මේ ගැටලුවත් එක්ක සම්බන්ධයක් නැහැ. මොකද, සාමාන්‍යයෙන් complete overhaul එකක් කළාට පස්සේ මොනවා හරි ගැටලුවක් තිබෙනවා නම් ඒක අනිවාර්යයෙන්ම අලුත්වැඩියා කටයුත්තේදී විසඳෙන නිසා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍ය, ගරු අනුර කරුණාතිලක මහතා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපට වෙලාව මදි. Debate එකට වෙලාව නැහැ.

# 2026.10.17 දින දිවයින පුරා සිදු වූ විදුලිය බිඳ වැටීම: බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය

# 2026.10.17ஆம் திகதி நாடளாவிய ரீதியில் ஏற்பட்ட மின் தடை: வலுசக்தி அமைச்சரினது கூற்று

# ISLANDWIDE POWER OUTAGE OCCURRED ON 17.10.2026: STATEMENT BY MINISTER OF ENERGY

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, පසුගිය ඔක්තෝබර් 17වැනි සෙනසුරාදා උදේ 11.44ට පමණ මුළු දිවයිනටම බලපෑ විදුලි බිඳ වැටීමක් ගැන මට දැන ගන්න ලැබුණා. ඒ පිළිබඳව ආරංචිය ලැබුණු වහාම අපි ජාතික පද්ධති- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බාධා කරන්න එපා, ගරු මන්ත්‍රීතුමා. ගරු අමාත්‍යතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා බාධා කරන්නේ නැතුව ඉන්න. *[බාධා කිරීමක්]* දයාසිරි මන්ත්‍රීතුමනි, දයාවෙන් ඉල්ලන්නේ. පොඩ්ඩක් වාඩිවෙලා සද්ද නැතුව අහගෙන ඉඳිමු. *[බාධා කිරීමක්]*

ඒ පිළිබඳව දැන ගන්න ලැබුණු වහාම ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ සම්බන්ධ වෙලා, විශේෂයෙන්ම ජනාධිපතිතුමා මැදිහත් වෙලා, ඒ සම්බන්ධයෙන් කටයුතු කළා. පස්වරු 12.37 වෙනකොට පළමු ප්‍රතිෂ්ඨාපනය කරන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ මොහොතේ සිට සවස 5.00 දක්වා ගරු ජනාධිපතිතුමාත්, ඇමතිවරයා හැටියට මමත් මේ රටේ අධි වෝල්ටීයතා පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කරන තෙක් පද්ධති පාලන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය පෞද්ගලිකව නිරීක්ෂණය කරන්න කටයුතු කළා. මේ අවස්ථාවේදී මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ මේ සිද්ධිය සිදු වූ මොහොතේ සිට ඉතා දැඩි කැපවීමෙන් පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කරන්නට NSO එකේ ඉංජිනේරුවන් ඇතුළු අනෙකුත් අනුප්‍රාප්තික සමාගම්වල සියලුම තාක්ෂණික කාර්ය මණ්ඩලය ඉතා දැඩි කැපවීමෙන් කටයුතු කළ බව. ඒ කාර්ය මණ්ඩලයට මම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම පද්ධති පාලන මධ්‍යස්ථානයේ සියලු බලාගාර, ග්‍රිඩ් උපපොළවල සියලුදෙනාම දැඩි කැපවීමෙන් කටයුතු කළා. මට මතකයි, එක් තරුණ ඉංජිනේරු මහත්මයෙක් තමන්ගේ සමීපතමයෙකුගේ අභාවය සිදු වී ඇති මොහොතේත්, ඇත්තටම පවුලේ සමීපතමයෙකුගේ අවමඟුල සිදු වෙන මොහොතේදී එතැනට යන්නේ නැතිව තමන්ගේ සේවය ලබා දෙන්න NSO එකේ ඉඳගෙන කටයුතු කළා. මුළු රටේම විදුලිය ප්‍රතිෂ්ඨාපනය කර අවසන් කරන තෙක් ඔවුන් කළ කැපවීම මේ අවස්ථාවේදී මම විෂය භාර අමාත්‍යවරයා හැටියට අගය කරන්න කැමැතියි. ඒ වාගේම මේ සිද්ධිය නිසා විදුලි පාරිභෝගිකයන්ට සිදු වුණු අපහසුතාවලට මගේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා.

මුලින්ම කියන්න ඕනෑ මේ සිද්ධිය සම්බන්ධයෙන් කොත්මලේ බලාගාරයේ කිසිම සම්බන්ධයක් නැති බව. සිකුරාදා දවසේ ඉහළ කොත්මලේ බලාගාරයේ එක් යන්ත්‍රයක තාක්ෂණික බිඳ වැටීමක් සිදු වුණා. නමුත් එම සිදුවීම වන විට එම බලාගාරයේ අනෙක් යන්ත්‍රයෙන් විදුලි ජනනය කිරීම සිදු වුණා. ඒ අනුව කොත්මලේ බිඳ වැටීම සහ මේ blackout එක අතර කිසිදු සම්බන්ධයක් නැහැ.

අපි ඇත්තටම බලමු මොකක්ද සිද්ධ වුණේ කියලා. සෙනසුරාදා උදේ 11.43 වන විට පද්ධති පාලන මධ්‍යස්ථානයේ පාලනයට නතුව තිබූ බලාගාර සහ කුඩා ජල විදුලි බලාගාරවලින් මෙගාවොට් 1,137ක් ජනනය වෙමින් තිබුණා. ඒ වාගේම ඒ අවස්ථාවේදී ගල් අඟුරු බලාගාරයේ මෙගාවොට් 516ක ප්‍රමාණයක් සහ මෙගාවොට් 621ක් ජල විදුලි බලාගාරවලින් ලබා ගනිමින් සිටියා. ඉතා වැදගත් වන කාරණය තමයි, මේ මොහොතේදී NSO එකට, පද්ධති ක්‍රියාකරුට නතු නොවන, ඒ වාගේම visibility එක නැති පුනර්ජනනීය බලශක්තිය හරහා ලැබෙන තවත් මෙගාවොට් 1,700කට ආසන්න ප්‍රමාණයක් ජනනය වෙමින් තිබුණා කියන එක. ඒ වන විට සමහර සෝලා බලාගාර පද්ධතියෙන් ඉවත් කරලා තිබුණේ, demand එක නැති නිසා. ඒ වාගේම එදා දවස පුනර්ජනනීය බල ශක්තියේ අතිරික්තයක් තිබුණු දවසක්. 2025 පෙබරවාරි 09වෙනි දා ඇති වුණු සමස්ත පද්ධති බිඳ වැටීමෙන් අපි ඉගෙන ගත්ත පාඩමක් තමයි ඉල්ලුම අඩු, පුනර්ජනනීය බලශක්ති අතිරික්තයක් තිබෙන දවස්වල පද්ධතිය ඉතා අවදානම් තත්ත්වයක පවතින බව. ඒ වාගේම 2025 පෙබරවාරි සිද්ධියෙන් පස්සේ තවත් මෙගොවොට් 1,000ක විතර ප්‍රමාණයක් renewable energy හරහා පද්ධතියට එකතු වෙලා තිබුණා.

නැවත මම ඒ දිනයට ආවොත්, සෙනසුරාදා 11.43 වෙනකොට ගල් අඟුරු බලාගාරයේ Unit 1ට අදාළව යම් නඩත්තු කටයුත්තක් වෙමින් තිබුණා. ඒ නඩත්තුවේ ඇති වුණු තාක්ෂණික සංකූලතාවක් නිසා එම යන්ත්‍රයේ බලශක්තිය වේගයෙන් අඩු වුණා, එහි සංඛ්‍යාතය අඩු වෙන්න පටන් ගත්තා. පද්ධතියට සැපයෙන බලශක්තිය අඩුවීමෙන් පද්ධතියේ සංඛ්‍යාතය අඩු වෙනවා. සංඛ්‍යාතය අඩු වෙනවාත් එක්ක අනෙක් බලාගාරවලින් බලශක්තිය වැඩියෙන් ලබා දෙන්න උත්සාහ කළා, ඒක නිරීක්ෂණය වුණා. නමුත් පද්ධතියට අලුතෙන් එක් වුණු ශක්තියට වඩා පද්ධතියෙන් ඉවත් වුණු NSO එකේ visibility එක නැති, control එක නැති ඉවත් වුණු ජනන ධාරිතාව වැඩි වුණු නිසා, - ඒ වාගේ හේතුවක් නිසා - පද්ධතියේ සමතුලිතතාව සම්පූර්ණයෙන්ම ගිලිහී ගියා. ගල් අඟුරු බලාගාරය ආශ්‍රිත ක්‍රමවේද අනුව පද්ධතියේ ඉවත්වීම් තිබීම හැර වෙන කිසිදු බලාගාරයක අක්‍රිය වීමක් මේ මොහොතේ සිදු වී නැති බව මතක් කරන්න ඕනෑ.

නොරොච්චෝලේ බලාගාරයේ ඉවත්වීම කියන්නෙත් තාක්ෂණික හේතූන් නිසා diaphragm dislodge වෙලා tripවීමත් එක්ක diaphragm rupture වෙලා ඇති වෙන තත්ත්වයක්. Safety measure එකක් හැටියට තමයි ඒ trip වීම වෙන්නේ. ඉන් පසුව පද්ධතිය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා දහවල් 12.37 වන විට කොත්මලේ බලාගාරයේ විදුලිය බියගම දක්වා ගෙනැවිත් පාරිභෝගිකයන් කොටසකට නැවත විදුලිය සැපයීම සිද්ධ කරන්න හැකි වුණත්, මේ වෙනකොට විසන්ධි වෙලා තිබුණු පද්ධති පාලනය නැති ඇතැම් බලාගාර නැවත සම්බන්ධවීමත් එක්ක මේ පද්ධතියේ සමතුලිතතාව නැවතත් බිඳ වැටුණා. මේ වාගේ අභියෝගාත්මක තත්ත්වයක් යටතේ සියලු දෙනාගේම සහභාගිත්වයෙන් පස්වරු 4.58 වනවිට සම්ප්‍රේෂණ ජාලයේ අධි වෝල්ටීයතා පද්ධතිය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට හැකියාව ලැබුණා. ගල් අඟුරු බලාගාර පද්ධතිය අහිමි වීම සහ තාප බලාගාර පද්ධතියට එක් කර ගැනීමේ ප්‍රමාදය නිසා - මෙතුමා සඳහන් කළා වාගේ - එදින peak demand අවස්ථාවේදී සියලු පාරිභෝගිකයන්ට විදුලිය සැපයීමට හැකියාවක් තිබුණේ නැහැ. ඊට හේතුව වුණේ capacity එකේ ගැටලුවක්. නමුත් රාත්‍රී 9.56

[ගරු අනුර කරුණාතිලක මහතා]

වනවිට සියලුම පාරිභෝගිකයන්ට විදුලිය සැපයීමට හැකියාව ලැබුණා. මේ කාලය පුරාවට හැකි සෑම අවස්ථාවකදීම රෝහල්, ගුවන් තොටුපළවල් සහ ජල පිරිපහදු මධ්‍යස්ථාන ආදී ස්ථානවලට ප්‍රමුඛතාව ලබා දෙමින් විදුලිය සැපයීමට NSO එක සහ අදාළ සමාගම් කටයුතු කළා.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේදී අමාත්‍යවරයා හැටියට මටත් ප්‍රධාන ප්‍රශ්න තුනක් තිබෙනවා. පළමුවැනි කාරණය තමයි, විදුලිබල පද්ධතිය ඉහළ අවදානම් තත්ත්වයක පවතින මේ වාගේ දවසක ගල් අඟුරු බලාගාරයේ අවදානම් සහිත නඩත්තු කටයුත්තක් සිදු කිරීමට තෝරා ගත්තේ ඇයි කියන කාරණය. විශේෂයෙන්ම අපි දන්නවා, සති අන්තයේ සහ නිවාඩු දිනවල අපේ විදුලිබල පද්ධතිය අවදානම් තත්ත්වයක පවතින බව. එවැනි අවදානමක් පවතින දවසක් මේ නඩත්තු කටයුත්ත සිදු කිරීමට තෝරා ගත්තේ ඇයි කියන එක සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම විදුලි ඉල්ලුම අවම මට්ටමක පවතින, හොඳින් හිරු එළිය ලැබෙන, renewable energy වැඩි වශයෙන් පද්ධතියට එකතු වන දවසක මෙවැනි අවදානම් සහිත නඩත්තු කටයුත්තක් සිදු කිරීම පිළිබඳව මේ වනවිටත් අපි අදාළ නිලධාරින්ගෙන් ප්‍රශ්න කර තිබෙනවා. මම බලාපොරොත්තු වෙනවා, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා හරහා විමර්ශනයක් සිදු කර පිළිතුරක් ලබා ගැනීමට. එම පිළිතුර ලැබුණු වහාම පාර්ලිමේන්තුව ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමටත් අපි කැමැතියි.

දෙවැනි කාරණය තමයි, තනි යන්ත්‍රයක් තාක්ෂණික හේතුවක් මත ක්‍රියා විරහිත වූ විට සමස්ත විදුලිබල පද්ධතියම බිඳවැටීම. මෙතුමා සඳහන් කළා වාගේ, මේ තත්ත්වය අපට කොහොමටවත් පිළිගන්න බැහැ. සාමාන්‍යයෙන් එක් යන්ත්‍රයක් බිඳවැටීම අපට තේරුම් ගන්න පුළුවන්. හැබැයි, එක් යන්ත්‍රයක් බිඳවැටීම සමස්ත විදුලිබල පද්ධතියම බිඳවැටීම දක්වා වර්ධනය වන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව අපි නැවත වරක් සිතා බැලිය යුතුයි. විශේෂයෙන්ම මෙවර සිදු වූ බාධාව 2025 පෙබරවාරි 9වැනි දා සිදු වූ බාධාවට වඩා විශාල එකක් බව ඇත්ත. මොකද, 2025දී අපි experience කළේ වෝල්ටීයතාවේ drop වීමක්. හැබැයි, මෙවර සිදු වුණේ frequency drop වීමත් සමඟ සමස්ත පද්ධතියම බිඳවැටීමක්. ඒ වාගේම මේ වනවිට අපේ විදුලිබල පද්ධතිය තුළ, විශේෂයෙන්ම NSO එකට visibility සහ controllability නැති විදුලි ජනන ධාරිතාව මෙගාවොට් වශයෙන් විශාල ප්‍රමාණයක් දක්වා වර්ධනය වී තිබෙනවා. ඒ තත්ත්වයත් එක්ක මෙවර සිදු වූ බාධාව මීට පෙර සිදු වූ බාධාවට වඩා තරමක් බරපතළ එකක්. නමුත් විදුලිබල පද්ධති සම්බන්ධයෙන් පවතින සම්මතයන්ට අනුව, එවැනි තත්ත්වයක් සමස්ත පද්ධතියම බිඳවැටීමට හේතුවක් නොවිය යුතුයි කියන එක තමයි මගේ අදහස.

මම කලින් සඳහන් කළා වාගේ, විදුලි ඉල්ලුම අඩු දිනවල පද්ධතිය තුළ පවතින අවදානම සහ ඒ හේතුවෙන් ඇති විය හැකි මෙවැනි සිදුවීම් අපි හැමදාමත් අත්විඳිය යුතු නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් කඩිනමින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බලා කටයුතු කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඊළඟට තුන්වැනි කාරණය තමයි, මේ සිද්ධියේදී ගල් අඟුරු බලාගාරයේ ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව එම බලාගාරය දින කිහිපයක් පද්ධතියෙන් ඉවත් කිරීමට සිදු වීම. අපි විශ්වාස කරනවා, බ්‍රහස්පතින්දා - 22වැනි දා - වනවිට අවම වශයෙන් එක් යන්ත්‍රයක් හෝ නැවත පද්ධතියට එකතු කර ගැනීමට හැකි වේවි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, දැන් අවසන් කරන්න.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
අවසන් කරනවා.

හැබැයි, මීට අදාළ backup පද්ධතියක් මෙතෙක් ස්ථාපිත නොකළේ ඇයි කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍ය නියෝග සහ උපදෙස් මේ වනවිටත් අමාත්‍යාංශ ලේකම්වරයා හරහා ලබාදී තිබෙනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. සූර්ය බලය වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වැඩි වැඩියෙන් විදුලිබල පද්ධතියට එකතු කරමින් රටක් විධියට අපි දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් අපේ වගකීම ඉටු කර තිබෙනවා. නමුත් ඒ නිසාම, ඊට සමගාමීව අවදානමට ලක්ව ඇති විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීමටත් අපි වහාම කටයුතු කළ යුතුයි.

අපේ රටේ මේ වනවිට පවතින්නේ පුනර්ජනනීය විදුලි බලය වැඩි වශයෙන් ඇති, ලෝකයේ දියුණු රටවලට ආසන්න බලශක්ති සංයුතියක්, power generation mix එකක්. වෙනත් රටවල මෙවැනි පද්ධති පවත්වාගෙන යාම සඳහා බලශක්ති නොවන අමතර ආයෝජන විශාල ප්‍රමාණයක් සිදු කර තිබෙනවා. බැටරි පද්ධතිය කියන්නේ ඉන් එක් අංගයක් පමණයි. එහි ප්‍රතිඵලයක් විධියට අපේ රටේ පුහුණුව ලබන ඉංජිනේරුවන් ඇතුළු තාක්ෂණික ශිල්පීන් ඉතා ඉහළ වැටුප්වලට එම රටවලට ගෙන්වා ගන්නවා. ඒ වාගේම එම රටවල සාමාන්‍ය පාරිභෝගිකයන් ගෙවන විදුලි බිල අපේ රටේ විදුලි පාරිභෝගිකයන් ගෙවන විදුලි බිලට වඩා වෙනස්. රජයක් හැටියට අපි විදුලි ඒකකයක මිල සාමාන්‍යයෙන් රුපියල් 25කට වඩා අඩු මට්ටමකට ගෙන ඒමේ දැඩි අවශ්‍යතාවකින් සිටිනවා. ඒ අභියෝගය ජය ගැනීම සඳහා මේ සිදුවීම්වලින් උගත් පාඩම් සැලකිල්ලට ගනිමින් කඩිනමින් කටයුතු කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

කාලය ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Ministerial Statement by the Hon. (Dr.) Dammika Patabendi.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර අමාත්‍යාංශය විධියට අද දවසේ ප්‍රකාශයක් ලබා දෙන්න තීරණය කළේ පසුගිය දා අපෙන් වියෝ වෙච්ච - අපට අහිමි වුණු - කාවන්තිස්ස හස්තියාගේ

මරණය සම්බන්ධයෙන් මූලික පැහැදිලි කිරීමක් කරන්නයි. අද දවසේ ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරේදී ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදු කෙරුණා. එහිදී මූලික පැහැදිලි කිරීම සිදු කළා. එම නිසාත්, කාල වේලාව ගත වෙලා තිබෙන නිසාත් මම ඒ ප්‍රමාණයෙන් සෑහීමකට පත් වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Notice of Presentation of Bills and Motions at the Commencement of Public Business.

Item No. 01, Minister of Foreign Affairs, Foreign Employment and Tourism.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Minister of Foreign Affairs නැද්ද? You are taking our time. Government එක කරන්න ඕනෑ වැඩ. කෝ, සභානායකතුමාව එක්කගෙන එන්න, ඉක්මනින්. *[බාධා කිරීම්]*

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් වැළැක්වීමේ පනත් කෙටුම්පත
### வெளிநாட்டுப் பயங்கரவாதிப் போராளிகளைத் தடுத்தல் சட்டமூலம்
### PREVENTION OF FOREIGN TERRORIST FIGHTERS BILL

"විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් විසින් එල්ල කරන තර්ජන වැළැක්වීමට සහ මැඩපැවැත්වීමට අදාළව වර්ෂ 2014 සැප්තැම්බර් මස 24 වන දින සම්මත කරගන්නා ලද 2178 දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මතය බලාත්මක කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවට ගරු හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***
***2026 නොවැම්බර් 03වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர் சார்பாக மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2026 நவம்பர் 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் பொருளாதார அபிவிருத்தி மற்றும் சர்வதேச உறவுகள் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara on behalf of the Minister of Foreign Affairs, Foreign Employment and Tourism; to be read a Second time upon Tuesday, 03rd November, 2026 and to be printed and to be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Hon. Deputy Speaker, where is the Minister of Foreign Affairs? That is the problem. - *[Interruption.]* He has to take the responsibility. - *[Interruption.]*

### සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත
### ஒழுங்கமைக்கப்பட்ட குற்றச்செயல்களைத் தடுத்தல் சட்டமூலம்
### PREVENTION OF ORGANISED CRIMES BILL

"ජාතික සීමා ඉක්මවූ සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද; ඵලදායී ජාතික සහ අන්තර්ජාතික සහයෝගීතාව මගින් බරපතළ අපරාධ වැළැක්වීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා ද; සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වලින් ඉදිරිපත් වන තර්ජනවලින් සමාජය ආරක්ෂා කිරීම සඳහා ද සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***
***2026 නොවැම්බර් 03වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2026 நவம்பர் 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 03rd November, 2026 and to be printed and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

# පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව

## கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு

## SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "කොළඹ වරායේ සිට බහාලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2025 නොවැම්බර් 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාලසීමාව, 2026 දෙසැම්බර් 21 දින දක්වා දීර්ඝ කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Member?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මමත් එම බහලුම් 323 සම්බන්ධව සොයා බැලීමේ කමිටුවේ සාමාජිකයෙක්. එහි සභාපතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. පසුගිය ජූලි 22වන දායින් පසුව මාස තුනක් එම කමිටුව රැස් වුණේ නැහැ. එතුමා අපේ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රශ්න ගැන බල බලා හිටියා. ඊළඟට, අනෙක් වැඩ ටික කර කර හිටියා. මාස තුනක් මේක ඇදලා දැන් තවත් මාස තුනක් අදින්න යනවා. මම අහන්න කැමැතියි, තවත් මාස තුනක් ඇදලා මේ කන්ටේනර් 323 ප්‍රශ්නය යට ගහන්නද හදන්නේ කියලා. එම කමිටුව රැස් කරන එක එහි සභාපතිවරයා හැටියට දැන් ඔබතුමාගේ අතේ තිබෙන්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

බොරුවට කෑ ගහනවා නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ඒක කරන එක ඔබතුමාගේ අතේ තිබෙන්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, voice-cut එකක් ඕනෑ නම් වෙනම දෙන්න. බොරු කියන්න එපා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ. Voice-cuts නොවෙයි. ඔබතුමාගේ අතේ තිබෙන්නේ වැඩේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොට අවසන් කරලා තිබෙන්නේ.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

To move the Adjournment Motion, Hon. Gayantha Karunathilleka. You have 14 minutes.

## රටේ වත්මන් තත්ත්වය
## நாட்டின் தற்போதைய நிலைமை
## CURRENT SITUATION OF THE COUNTRY

[අ.භා 1.06]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රට තුළ මේ වන විට උද්ධමනය සියයට 8ක අගය දක්වා ඉහළ ගොස් ඇති පසුබිමක අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිල ඉහළ යෑම, කෘෂි හා වැවිලි ආර්ථිකයේ නිෂ්පාදන ක්‍රියාවලියේ පිරිවැයට එල්ල වී ඇති බරපතළ බලපෑම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය ඖෂධ, ශල්‍ය උපකරණ හා අනෙකුත් සේවා සැපයීමේදී සිදු වී ඇති බිඳවැටීම්, අධ්‍යාපනය තුළ සිසු දරු දැරියන්ට අත්‍යවශ්‍ය පොත් පත් සහ උපකරණවල අධික මිල, ඉන්ධන මිල ඉහළ යෑම මෙන්ම පිරවුම්හල්වල ඉන්ධන සීමාවීම, රට පුරා ගෑස් හිඟයක් පැවතීම, විදුලි බිල ඉහළ යෑම හා අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීමට අපොහොසත්වීම, ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම ඇතුළු ඉහත කරුණු මත ජනතාව දැඩි පීඩනයටත් අසහනයටත් පත්ව ඇත. මෙම ගැටලු තවත් තීව්‍ර කරමින් සංවේදී පරිසර ප්‍රශ්න, සංස්කෘතික ප්‍රශ්න එදිනෙදා ජන ජීවිතය දැඩි පීඩාවට පත් කර ඇත.
>
> එබැවින්, මෙම කාරණාවලදී රජයේ දැඩි අසංවේදී බව හේතුවෙන් ජනතාව තව තවත් පීඩාවටත්, අර්බුදයටත් ලක් වී ඇති හෙයින්, රජය වහාම මේ පිළිබඳ අවධානය යොමු කර ජනතාවට අවශ්‍ය කඩිනම් සහ ස්ථාවර විසඳුම් ලබා දිය යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි".

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක පැත්තකින් මාලිමාව ආණ්ඩුවේ තුන්වැනි අය වැය ඉදිරිපත් කරන්න ඔන්න මෙන්න කියලා තිබියදී, තවත් පැත්තකින් "අපේ ආණ්ඩුවට වසර දෙකයි-රටට සුභයි" කියමින් රට පුරා දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් පසුගිය අවුරුදු දෙකක ආණ්ඩුවේ ප්‍රගති වාර්තා බැලුවා නම් "කථාව සමත් - වැඩ අසමත්" කියලා තමයි අප කාටත් කියන්න වෙන්නේ. අවසානාවට අවුරුදු 2ක් ගියාට පස්සේත් මේ ආණ්ඩුව හිතාගෙන ඉන්නේ ඉතිරි ටිකත් කථාවෙන්ම අල්ලා ගෙන යන්න පුළුවන් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නා පරිදි අපේ රටේ මිනිස්සු විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් දිහා බලන්නේ හොඳම කථාව කරන්නේ කවුද කියලා; කථාවට දක්ෂ කවුද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ හිටපු අය ආණ්ඩු බලය ගත්තාට පසුව ජනතාව බලන්නේ විපක්ෂයේ ඉන්න කොට කථාවෙන් කියපු ඒවා ක්‍රියාවෙන් කරලා පෙන්වන්නේ කවුද කියලායි.

පසුගිය දවසක ආණ්ඩුව පැත්තෙන් කියනවා අපි දැක්කා, ලෝකයේ ආර්ථික අතින් වේගයෙන්ම සංවර්ධනය වන රටවල් 4 අතරට ශ්‍රී ලංකාව ඇවිල්ලා කියලා. නමුත්, තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්න කොට විවේචනය කරපු, බලයට ආවාට පස්සේ ඉස්පිල්ලක්, පාපිල්ලක් වෙනස් නොකර ඉස් මුදුනින් පිළිගත්තු IMF එකයි, මහ බැංකුවයි පෙන්වා දුන්නා පසුගිය අගෝස්තු මාසයේ උද්ධමනය සියයට 8යි කියලා. ඒ වාගේම ලෝක බැංකු ඇස්තමේන්තුවලට අනුව පසුගිය අවුරුද්දේ අපේ රටේ දරිද්‍රතා අනුපාතය සියයට 16.9ක් කියලා පෙන්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාර්තාවල මොනවා සඳහන් වුවත්, කොහොම පෙන්නුවත්, කොහොම කිව්වත් අපි හොඳාකාරව දකින දෙයක් තිබෙනවා. ඒක තමයි, අපේ රටේ මිනිසුන්ගේ කුස්සියට දැනෙන උද්ධමනය මේ හැම එකකටම වඩා වැඩියි කියන එක. ඒ වාර්තා හැම එකකටම වඩා කුස්සියේ උද්ධමනය මිනිසුන්ට දැනෙන ප්‍රමාණය වැඩියි. "ආණ්ඩුවට වසර දෙකයි-රටට සුභයි" කියමින් රට වටේ ගියාට කඩයකට බඩු මිල දී ගන්න ගියාම, බඩුවල ගණන් ඇහුවාම මිනිසුන්ට දැනෙනවා සුභද, අසුභද කියන එක. මේ වෙද්දි අපේ රටේ මිනිස්සු හාල් මිලට ගන්නේ ඉතිහාසයේ වැඩිම මිලට. ඊවර ජනතාවට මාළු ඉන්න තැන් පෙන්වන්න app එක තවම දෙන්න බැරි වුණා. හැබැයි, ඉතිහාසයේ වැඩිම මාළු මිල අද වනකොට වාර්තා වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද කුකුළු මස් කිලෝවක මිල රුපියල් 1,250කට, 1,300කට වැඩියි. ඒ කාලයේ මාළු මිල ගණන් ඉහළ යන විට මිනිස්සු පුරුදු වෙලා හිටියා, සැමන් ටින් එකක් හරි අරගෙන කෑම කන්න. අද සැමන් ටින් එකත් රුපියල් 600කට වැඩියි. ළදරුවන්ට කිරි පිටි දෙන්න ගියාම ඒ කිරි පිටි මිල දෙමව්පියන්ට දරා ගන්න බැහැ. පොල් ගෙඩියක් රුපියල් 180ක්, 200ක් වනවා. පාන් ගෙඩිය ගත්තත්, බනිස් ගෙඩිය ගත්තත්, "ටී" එකක සහ "ප්ලේන් ටී" එකක ගණන් බැලුවත් ඉතිහාසයේ කවරදාකවත් මේ තරම් මිලක් ගෙවන්න වුණේ නැහැ. අද දරුවෙකුට මාළු කෑල්ලක් එක්ක, කරවල කෑල්ලක් එක්ක බත් පිඟානක් දෙන එක දෙමව්පියන්ට බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. රටට කොච්චර සුබයි කිව්වත් මිනිසුන්ට විශේෂයෙන්ම ජීවන වියදම හමුවේ කිසිම සුබභාවයක් නැති බව තමයි පෙනෙන්න තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, නැවෙන් ගොඩබාන ගණනට දෙනවාය කියපු පෙට්‍රල් ලීටරය, ඩීසල් ලීටරය ඉතිහාසයේ වැඩිම මිල ගෙවලා තමයි අද වනකොට මිනිස්සු මිලට ගන්නේ. මේ වෙද්දි තෙල් මිලේ පමණක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තෙල් බෙදා හැරීමේත් සමහර තැන්වල අවුල් තිබෙන බව අපට පෙනෙන්න තිබෙනවා. සමහර පෙට්‍රල් ෂෙඩ්වලට ගියාම බොහෝ වෙලාවට පෙට්‍රල්, ඩීසල් ගන්න බැරි වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියයට 33කින් විදුලි බිල අඩු කරන්න කතිරය ගහපු මිනිස්සු ඉතිහාසයේ වැඩිම විදුලි බිලක් ගෙවන ගමන් දූෂිත බාල ගල් අඟුරු වංචාවේ ප්‍රතිඵල භුක්ති විඳින්න කුප්පි ලාම්පු සූදානම් කරන්න දැන් පටන්ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන තරම් රටට සුබයි කියලා පම්පෝරි ගැහුවත් සාමාන්‍ය මිනිස්සු මොන තරම් අමාරුවෙන්ද ජීවත් වෙන්නේ කියන එක පෙන්වන හොඳම උදාහරණයක් තමයි, මහ බැංකු තොරතුරුවලට අනුව මේ අවුරුද්දේ පළමු මාස 6 තුළ විතරක් මිනිස්සු තමන් සතු කනකර ඇතුළු රත්‍රන් බඩු රුපියල් බිලියන 211.9ක ප්‍රමාණයක් උකස් තබා තිබීම. ඒ අනුව බලද්දී මේ වනකොට බැංකුවල පවතින මුළු රන් ණය උකස් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන එකයි දශම ගණනකට වැඩි වෙලා තිබෙනවාය කියලා වාර්තා වනවා. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවාට අමතරව ගම්වල අවිධිමත් විධියට පොලියට දෙන තැන්වල උකස් තියලා මිනිසුන්ට අහිමි වුණු රත්‍රන් බඩු ප්‍රමාණය කොපමණද කියලා අපට හිතා ගන්නත් අමාරුයි.

ඒ වාගේම මම කියන්න කැමැතියි, පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගැන සිහින මවපු මිනිස්සු අද වනවිට ඉන්නේ මොන තරම් පීඩනයකින්ද කියන එක ගැන. එක පැත්තකින් මිනිසුන්ට ඔරොත්තු නොදෙන ආර්ථික පීඩනයක් තිබෙනවා. ඒ වාගේමයි මානසික ආතතිය. ඒවායේ ප්‍රතිඵල ලෙස ඇති වන විවිධ රෝගාබාධවලට අද වනකොට මිනිස්සු ලක් වනවා. ප්‍රතිකාර ගන්න රෝහලකට ගියාම රෝහල්වල පවතින බෙහෙත් හිඟය, වෛද්‍ය උපකරණ හිඟය බොහොම බරපතළ තත්ත්වයකට අද වනවිට පත් වෙලා තිබෙනවා. මේ රජය බලයට ආපු මුල් කාලයේ සෞඛ්‍ය ඇමතිවරයා කිව්වා අපට මතකයි, තිස්තුන්කෝටියක් දෙවියෝ දුන්නාට වැඩිය මුදලක් වාර්ෂිකව රජය සෞඛ්‍යයට වෙන් කරනවාය කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gayantha Karunathilleka, you have two more minutes left.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Thank you, Hon. Deputy Speaker.

එදා එහෙම කිව්වාට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඒ රජයේම ප්‍රධානියා කියනවා, ආණ්ඩුවේ ඉස්පිරිතාලවලට යන්න ඉස්සෙල්ලා කොත්තමල්ලි ටිකක් බීලා බලන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා මැතිවරණ වේදිකාවල කිව්වේ, ප්‍රතිපත්ති ප්‍රකාශනවල දැම්මේ, "අධ්‍යාපනය තමයි දරුවෙකුට අත්තටු" කියලා. බලයට පත් වුණු වහාම සියලු පාසල් උපකරණවල VAT එක සම්පූර්ණයෙන්ම ඉවත් කරනවාය කිව්වා. නමුත්, දෙවසරක් ගත වෙලාත්, සියලු පාසල් උපකරණ කෙසේ වෙතත් තවම අභ්‍යාස පොත්වල VAT එකවත් අඩු කර ගන්න මේ රජයට බැරි වෙලා තිබෙනවා. දශක ගණනාවක් තිස්සේ දේශපාලන වේදිකාවල තමුන්නාන්සේලා හැඳින්වූයේ, නිර්ධන පන්තියේ දේශපාලන ව්‍යාපාරයක් කියලා. තමුන්නාන්සේලා පෙනී ඉන්නේ පුංචි මිනිසුන්ගේ, නැතිබැරි මිනිසුන්ගේ ගැලවුම්කාරයෝ විධියට කියලා තමයි හැම තිස්සේම කිව්වේ. නමුත් අද වනකොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ධනපති ආණ්ඩු යැයි කියපු ආණ්ඩුවලින් දීපු අස්වැසුමත් කපලා. ලක්ෂ 24ක් අස්වැසුම ගත්ත එක ලක්ෂ 16ට අඩු කරලා තිබෙනවා. මේ වනකොට ලක්ෂ ගණනකගේ අස්වැසුම කපලා. එහෙම අස්වැසුම කැපුවේ, ඒ අයගේ දුප්පත්කම තුරන් වෙලා නිසාද කියලා අපට අහන්න සිද්ධ වෙනවා. ධනපති ආණ්ඩු යැයි කියපු ආණ්ඩු විසින් දීපු ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඉතුරුම් ගිණුම්වල පොලියටත් අද වනකොට තට්ටු කරලා තිබෙනවා. කිරි සප්පයාගේ සිට ළමා ඉතුරුම් ගිණුම්වලට දෙන සොච්චම් පොලියෙනුත් නැවත රඳවුම් බද්ද කියලා සියයට 10ක් කපා ගන්නවා. මේ ඔක්කෝම ධනපති ආණ්ඩු යැයි තමුන්නාන්සේලා හඳුන්වපු ආණ්ඩුවලින් දීපු ඒවා. නිර්ධන පන්තිය, පීඩිත පන්තිය යැයි කියා ගන්නා ඔබේ රජයෙන් ඒ ධනපති ආණ්ඩු කියලා හඳුන්වපු ආණ්ඩු දීපු ඒවා ඔක්කෝම තමුන්නාන්සේලා කපන්නේ නිර්ධන ආණ්ඩුවක් හැටියට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව විනාඩි දෙකක් ඔබතුමාගෙන් ඉල්ලා ගන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, you get two minutes.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝක බැංකු දත්තවලට අනුව අපේ රටේ සමස්ත ආර්ථිකයෙන් හයෙන් එකක් දායක වෙන්නේ කෘෂි කර්මාන්තයට. රටේ සේවා නියුක්තිකයන්ගෙන් සියයට 40ක් කෘෂි කර්මාන්තය මත පදනම් වෙච්ච රටක්, අපේ රට. ඒ නිසායි අපේ පැරැන්නෝ "මඩ සෝදාගත් කළ ගොවියා රජකමටත් සුදුසුයි" කියලා ඔවුන්ට වටිනාකමක් සහ ගෞරවයක් ලබා දුන්නේ. නමුත් ගොවි ජනතාවට ඓතිහාසිකව ලබා දීපු ඒ වටිනාකම පළමු වතාවට බිඳ දැම්මෙත් මේ රජය කියන එක අපට කියන්න වෙනවා. පරම්පරා ගණනාවක් අපේ රටට බත සපයපු ගොවි ජනතාව, මීළඟ පරම්පරාව කුඹුරට බහීද කියන කුතුහලයෙනුයි අද වනවිට ඉන්නේ. මේක තමයි තමුන්නාන්සේලා ගොවීන්ට දීපු ලස්සන ජීවිතය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියනවා. මේ රටේ ජනතාව අද අහනවා, මේ රජයට ගොවියා ගැනවත්, දරුවෝ ගැනවත්, වැඩිහිටියෝ ගැනවත්, අපේ ආගම දහම ගැනවත්, සංස්කෘතිය ගැනවත්, අඩුම ගාණේ රටට සම්පතක් වෙච්ච සතා සිවුපාවා ගැනවත් සහකම්පනයක් තිබෙනවාද කියලා. ඒ හැම ප්‍රශ්නයටම ප්‍රායෝගික විසඳුම් නොදී සුපුරුදු උද්ධච්ච උත්තර දෙන මේ ආණ්ඩුවේ දේශපාලනඥයන්ට අද ගොවි හමුවලට යන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ජනාධිපතිතුමා ඊයේ - පෙරේදා ගොවි ප්‍රදේශවලට ගිහිල්ලා ගොවි හමු පවත්වනකොට විෂය භාර ඇමතිවරු කොළඹ හංගලා තමයි එතුමාට යන්න වුණේ. අනෙක් අමාත්‍යාංශවලටත් ඒ තත්ත්වය තමයි ඇති වෙන්නේ කියා අපට පෙනෙන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව තත්පර කීපයක් ඉල්ලනවා. වර්තමාන රජය බලයට පත් වනකොට පෙරහැරේ කසකාරයෝ වාගේ ඉස්සරහින්ම තැපැල් ඡන්ද ප්‍රතිඵලය දීපු මිනිස්සු තමයි රාජ්‍ය සේවකයෝ කියන්නේ. හැබැයි, රාජ්‍ය සේවකයාට දීපු ලස්සන ජීවිතය මොකක්ද කියලා අද වනකොට අහන්න වෙලා තිබෙනවා. ඒ මිනිස්සු මාසයේ පඩිය අරගෙන ඊළඟ මාසයේ පඩිය ගන්න ළං වෙනකොට ණයකාරයෝ වෙලා. එක්කෝ ලයිට් බිල arrears; එක්කෝ වතුර බිල arrears; එක්කෝ කාට හරි ණය වෙලා. වී ගොවියාගේ, අපේ පළාත්වල කුඩා තේ වතු හිමියන්ගේ, ඒ වාගේම කුරුඳු ගොවියාගේත්, ධීවරයාගේත්, ත්‍රිරෝද රථ රියදුරාගේත්, පෞද්ගලික අංශයේ සේවය කරන අයගේත් - මේ ඔක්කෝම අයගේ - ඇත්ත කතන්දරය ඒක තමයි. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යථාර්ථය වටහාගෙන මේවාට ප්‍රායෝගික විසඳුම් කඩිනමින් ලබා දෙන්න කියන ඉල්ලීම රජයෙන් කරමින් විපක්ෂය වෙනුවෙන් මම මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න කාලය දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. S.M. Marikkar, you have eight minutes to second the Motion moved by the Hon. Gayantha Karunathilleka.

[අ.භා. 1.19]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගයන්ත කරුණාතිලක මැතිතුමා ගෙනාපු යෝජනාව මම ස්ථිර කරනවා. ආණ්ඩුව දැන් එකම කණ්ඩායමක් රට වටේ එක්කරගෙන ගිහිල්ලා, වසර දෙක සුබයි කියලා කියනකොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුනෙන් එකකින් විදුලි බිල අඩු කරනවා කියලා සියයට 50කින් විදුලි බිල වැඩි කරපු එක ගැන මම මතක් කරන්නේ නැහැ. ආහාර, අධ්‍යාපනය, සෞඛ්‍යය සඳහා වන වැට් එක පළමු අය වැයෙන්ම අයින් කරනවාය කිව්වත් දැන් අය වැය දෙකක් ඉදිරිපත් කරලාත් ඒ අයට ඒක කර ගන්න බැරි වුණා. අය වැය දෙකක් නොවෙයි, ඇත්තවශයෙන්ම තුනක් ඉදිරිපත් කළා. අය වැය දෙකක් ඉදිරිපත් කරලාත් ඒ අයට ඒක කර ගන්න බැරි වුණා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාළු අල්ලන app එක, මුහුදු වතුරෙන් සල්ෆියුරික් අම්ල හදලා අපනයනය කරන එක, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් විතරක් ණය බේරන එක වාගේ ඒවා ගැන අපි මතක් කරලා වැඩක් නැහැ. මොකද, ඒවා

ඡන්ද ගන්න කියපු බොරු කියලා ඒගොල්ලන්ම පිළිඅරගෙන තිබෙනවා. ඒක මිනිස්සු රවටන්න කියපු දේවල් කියලා ඒගොල්ලන්ම පිළිගෙන තිබෙනවා. ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්න හිතෙන ලස්සන රටක් හදනවා කියලා කිව්වාට අද ඒකේ ඇත්ත තත්ත්වය මොකක්ද කියලා මිනිස්සුන්ට දැනෙන්න පටන් අරගෙන තිබෙනවා. බඩගින්නට කන්න බදු ගෙවන්න ඕනෑ නැහැ, ලෙඩ වුණාම බෙහෙත් ගන්න බදු ගෙවන්න ඕනෑ නැහැ, දරුවා ඉගෙන ගන්න බදු ගෙවන්න ඕනෑ නැහැ කිව්වාට අධික බදු බරින් මිරිකවලා කොත්තමල්ලි බීලා ගෙදර ඉන්න කියලා තමයි ඔන්න දැන් වෙනස කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වේල කාපු ජනතාවට දෙවේල කන්න සිද්ධ වුණාට, දෙවේල කාපු කට්ටියට එක වේල කන්න සිද්ධ වුණාට, ළමයි ඉස්කෝලේ යන ප්‍රමාණය අඩු වුණාට, කනකර ආභරණ ටික ඉතිහාසයේ වැඩිම ප්‍රමාණයකින් උකස් තියන්න සිද්ධ වුණාට ආණ්ඩුවට ගාණක් නැහැ.

හැබැයි, ඒගොල්ලන්ගේ ආණ්ඩුව කාලයේ කන්ටේනර් 323ක් පන්නලා වංචාවක් සිද්ධ වුණා. ඒ සම්බන්ධයෙන් තවම වාර්තාවක් දෙන්නේ නැහැ. ඒ වාගේම හැකර්ලා ගහලා ඩොලර් මිලියන 2.5ක් නැති වුණා. ඒ ගැන වගේ වගක් නැහැ; කථාවක්වත් නැහැ. බාල ගල් අඟුරු ගෙනැල්ලා සියල්ල විනාශ කරලා වගේ වගක් නැතිව ඉන්නවා. තව හෝදන්නත් එනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බාල ගල් අඟුරුවලින් ඇති වුණු පාඩුව විතරක් රුපියල් මිලියන 18,368.819ක්. මේකට තවත් ඒවා එකතු වෙන්න ඕනෑ.

බාල ගල් අඟුරු ගෙන්වීම නිසා තුන්වැනි පාර්ශ්වයකින් රසායනාගාර පරීක්ෂණයකට යන්න වුණා. ඒ සඳහා එක නැවකට රුපියල් මිලියන 1.4 ගණනේ නැව් 19කට ගෙවලා තිබෙනවා. එතකොට තව රුපියල් මිලියන 26.6ක් මේ පාඩුවට එකතු වෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ජනවාරි මාසයේ ඉඳලා බාල ගල් අඟුරු ගෙන්වීම නිසා සැප්තැම්බර් 14වැනි දා වෙනකල්ම අතිරේකව විදුලිය මිලදී ගෙන තිබෙනවා. එතකොට එහෙම අතිරේකව විදුලිය මිලදී ගැනීම සඳහා අවසර දෙන විට ලෝක වෙළෙඳ පොළේ ඩීසල් මිල ඉහළ යෑම නිසා අපට මතකයි ජනාධිපතිතුමා වරින් වර කිව්වා, රුපියල් 100ක සහනාධාරයක් දිගටම දෙනවා කියලා. ඒ වෙලාවේ වැඩිපුර පාවිච්චි කරපු ඩීසල්වලට ගෙවපු මුදලත් මෙහිදී ගණනය කරලා නැහැ. අප්‍රේල් වාගේ මාසයක ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඩීසල් ලීටරයකින් රුපියල් 250ක විතර පාඩුවක් ලැබුවා. මොකද, ඒ වෙලාවේ කිව්වා, ලෝක වෙළෙඳ පොළේ මිල අනුව ඩීසල් ලීටරයක පිරිවැය රුපියල් 700යි; ආණ්ඩුවෙන් රුපියල් 100ක සහනාධාරයක් දෙනවා; ලීටරයකට රුපියල් 250ක විතර පාඩුවක් තෙල් සංස්ථාව දරනවා කියලා. එහෙමයි රුපියල් 350ට ඩීසල් ලීටරයක් දෙනවා කිව්වේ. මේ පාඩුවේදී ඒ ටිකත් ගණනය කරලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකත් ගණනය කළා නම් මේ පාඩුව රුපියල් බිලියන 20කට වැඩියි. මහ බැංකු බැඳුම්කර මංකොල්ලය වගේ දෙගුණයක් විශාලයි මේ පාඩුව. දැන් ඕකට කියයි, penalty එක ගන්නවා, performance bond එක withhold කරනවා කියලා. ගන්නවා කිව්වට ඒවා එහෙම එකවර ගන්න බැහැ. එහෙම කළොත් නඩු පවරන්නත් පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔහොම තමයි මහ බැංකු බැඳුම්කර සිද්ධියේදී අර්ජුන් ඇලෝසියස්ගේ company එකේ accounts ටික freeze කළේ. ඒකෙන් රුපියල් බිලියන 10ක් ආණ්ඩුවට ගත්තා. එහෙම වුණත් නඩු නතර වෙලා නැහැ; පරීක්ෂණ නතර වෙලා නැහැ. එහෙම කියලා මේ සිද්ධිය යට ගහන්න බැහැ. මේක ඉතින් අර හිටපු ඇමතිට ජනවාරි මාසයේ ආයෙත් ඇමතිකම දෙන්න ගහන plan එකක්. ඒක නේ දැන් ඉන්න ඇමතිතුමාට විශාල විෂය පථ දෙකක් දීලා තිබෙන්නේ. අපි මේ ගැන රටට හෙළි කරන්න ඕනෑ. බලශක්ති ඇමතිතුමාගේ කථාවේදී සාධාරණ දෙයක් කිව්වා, සති අන්තයේ peak demand එකක් නැති වෙලාවක ගල් අඟුරු සමාගම මේ නඩත්තු කටයුතු දමාගත්තේ මොකද කියලා එතුමාත් ප්‍රශ්න කරනවා. මම කියනවා, ඒක අපට කියන්න එපා, ආණ්ඩුව ඔයගොල්ලන්ගේ කියලා. බාල ගල් අඟුරු පාවිච්චියෙන් machineriesවලට වෙලා තිබෙන පාඩුව හොයලා බලන්න. තාක්ෂණික වාර්තා ගන්න. ඒවා ගණනය කරලා බලන්න. යථා තත්ත්වයට ගේන්න නම්, ඒ යන්ත්‍ර අලුත්වැඩියා කරන්න ඕනෑද කියලා බලන්න. ඒ කාලයේ නම් කිව්වා, කරන්ට් එක දෙන්නේ නැත්නම් ආණ්ඩුව වග කියන්න ඕනෑ කියලා. හැබැයි, මේ ආණ්ඩුව ආ පසු මුළු රටටම විදුලිය නැතිවීමේ අත්දැකීම අපි දෙවරක් ලැබුවා. එක්වරක් නොවෙයි, දෙවරක්. පළමුවෙනි වර විදුලිය නැතිවීම සම්බන්ධයෙන් ඒ සඳහා ගත යුතු පියවර ගැන සඳහන් කරලා මේ වනකොට වාර්තාවක් දීලා තිබෙනවා. එතකොට ඒවා අනුගමනය කළාද, නැද්ද කියන එක ඇමතිවරයා රටට කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් චීන ආයෝජකයෝ වරාය ඇතුළෙන් ඩොලර් මිලියන 392ක ආයෝජනයක් අයින් කරගෙන යනවා. ඊයේ-පෙරේදා පැවති ආර්ථික සමුළුවකදී ගරු ජනාධිපතිතුමාම කිව්වා, රුපියල් හොයලා තිබෙනවා කියලා. ඔව්, බදු ගහලා ගහලා රුපියල් හොයලා තිබෙනවා. හැබැයි, ඩොලර් සම්බන්ධයෙන් පොඩි ප්‍රශ්නයක් තිබෙනවා කියලාත් කිව්වා. පොඩි ප්‍රශ්නයක් නොවෙයි, ආයෝජන එන්නේ නැහැ. ආනයන අපනයන පරතරය දිගින් දිගටම ඉහළ යනවා. ජනාධිපතිතුමා පොඩි ප්‍රශ්නයක් කියලා කිව්වාට ඇත්තටම ඒක ලොකු ප්‍රශ්නයක්. ඒ කථාව හරි. මේ, අපට ඩොලර් අවශ්‍ය වෙලාවක්. හැබැයි, අපට ආපු ආයෝජනත් හරවාගෙන යනවා නම් මොකක්ද තත්ත්වය? අපි ඒක නේ දැක්කේ.

මෙතැනදි මොන තරම් බයිලා ගැහුවත්, මිනිස්සු ආණ්ඩුව ප්‍රතික්ෂේප කරලා දැන් අවුරුද්දකට වැඩියි. ජනාධිපතිතුමාට විතරයි ජනප්‍රියතාවක් තිබුණේ. බදුල්ලේ පැවති රැස්වීමෙන් ඒකත් ඉවර වුණු හැටි අපි දැක්කා. ගෝඨා ගිය පාරෙම තමයි යන්නේ. ජනාධිපතිතුමාගේ live speech එකට වැස්සක් වගේ එන්නේ reactions. මේ, ගෝඨා ගිය පාරම තමයි. ගෝඨා අසූචි පොහොර නැවෙන් පටන් අරගෙන ආවා වාගේ තමයි ගල් අඟුරුවලින් පටන් අරගෙන ජනාධිපතිතුමාටත් මේ තත්ත්වය ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා ආණ්ඩුවේ ක්‍රියාදාමය අපට දැන් පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් පත් වුණේ මේ කොළඹ දිස්ත්‍රික්කයෙන් නේ? අපිත් පත් වුණේ මේ කොළඹ දිස්ත්‍රික්කයෙන්. අපි මළ ගෙදර ගිහිල්ලා, මඟුල් ගෙදර ගිහිල්ලා, බණ ගෙදර ගිහිල්ලා, හැම දෙයකටම උදව් කරලාත් අපට වැඩිය මනාප ඔයගොල්ලන්ට දුන්නා නේ. ඔබතුමාට මනාප දුන්නා නේ, අපට වැඩිය. මම ඔබතුමාට blame කරන්නේ නැහැ. ජනතාවට ඒ තරම් විශ්වාසයක් තිබුණේ. උදාහරණයක් විධියට ගත්තොත්, ඔබතුමාට කොළොන්නාවේ ජනතාව මනාප 12,000ක් දුන්නා. මටත් වැඩිය මනාප දුන්නා. ඊට පසුව ගංවතුර ආවාම එන්න බැරි වුණා. ඒකට කමක් නැහැ, ප්‍රශ්නයක් නැහැ. එහෙම අසීමාන්තික විශ්වාසයක් තිබුණු මිනිස්සුන්ට අද වෙලා තිබෙන්නේ මොකක්ද? මාලිගාවත්ත, මට්ටක්කුලිය, මෝදර, වැල්ලම්පිටිය, ඔරුගොඩවත්ත, සේදවත්ත කියන වතුවලට ගිහින් බලන්නකෝ, ඒ ජනතාව ජීවත් වන විධිය. ඔබතුමාත් දන්නවා, ඒ වතුවල ඉන්න කාන්තාවන්ගේ duty එක මැක්සියක් දාගෙන උදේට, දවල්ට, රෑට වෙන වෙනම උයන එක බව. අද ඔවුන් ලෙවකනවා, ගිහිල්ලා බලන්න. මම නම් යනවා. මම පසුගිය ඉරිදාත් ගියා. මම ඔබතුමාගෙන් ඉතාම ආදරයෙන් ඉල්ලන්නේ ඒ මිනිස්සු ජීවත් වන විධිය ගිහිල්ලා බලන්න කියලායි.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම වෙලා තිබෙන්නේ වෙනසක් නොවෙයි, මහා විනාශයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොනවා කරලා මේවා වහන්න හැදුවත්, එහෙම වහන්න බැහැ කියලා අපි පැහැදිලිව කියන්න කැමැතියි. හැබැයි, අපි ආණ්ඩුවට මේ කාරණය කියන්න කැමැතියි. ආණ්ඩුවට අවුරුදු පහකට ජන වරම දුන්නා නේ. තව අවුරුදු තුනක් තිබෙනවා. ඉතින්, මේ අය වැයෙන්වත් මිනිසුන්ගේ රිරි මාංස උරා බොනවා වාගේ ගන්න බදු ටික අඩු කරන්න. අධ්‍යාපනයෙන් බද්ද අයින් කරන්න, සෞඛ්‍යයෙන් බද්ද අයින් කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. S.M. Marikkar, your time is up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම කථාව අවසන් කරනවා, තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කොත්තමල්ලි බොන්න කියන්න එපා, තමන්ට ඡන්දය දුන් මිනිස්සුන්ට. පව් නේ. එහෙම නෝංජල් කරන්න එපා. ඒ වාගේම සෘජු විදේශ ආයෝජන ගේන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න. එහෙම නැත්නම් ගෝඨාට වැඩිය විනාශයක් වෙයි කියලා තමයි මට කියන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Harshana Nanayakkara. You get 11 minutes to speak on this Adjournment Debate and the Floor is yours.

[අ.භා. 1.28]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේදී සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත පළමුවර කියවීම මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. එහෙම ඉදිරිපත් කළාම සාමාන්‍යයෙන් අපි දෙවනවර කියවීමේ විවාදයේදී තමයි කරුණු දක්වන්නේ. නමුත් මට අද දින ඒ ගැන යම් කරුණක් දක්වන්න වනවා. මක්නිසාද, මේ වන විට මුහුණුපොත පුරා සමාජ මාධ්‍ය තුළ ඉතා විකෘති අර්ථ කථන දෙමින් යම් තොරතුරු ගණනාවක් හුවමාරු වන නිසා. විශේෂයෙන් ඔවුන් කියන්නට යෙදෙනවා, මේ ගෙනෙන අලුත් නීතිය යටතේ කොණ්ඩය වවලා තිබුණොත්, පච්ච කොටලා තිබුණොත් ඒවා හිරේ යන්න පුළුවන් අපරාධමය වැරදි, ඒ නිසා මේකේ ලොකු භයානක තත්ත්වයක් තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගෙනෙන අණ පනත් විවේචනය වන එකට අපි කැමැතියි. විවේචනය වෙන්න ඕනෑ නේ, එහෙම නේ නීතියක් හැදෙන්නේ. ඒ වාගේම අපි කැමැතියි, අපි ගෙනෙන අණ පනත් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් වනවාට. ඒක හොඳයි. මොකද, ඒ අනුව තමයි නීතිය තවත් ශක්තිමත් වෙලා ජනතාවට සේවයක් වන නීතියක් හැදෙන්නේ. අපි සියලුදෙනා දන්නවා, සංවිධානාත්මක අපරාධ මේ රටට විශාල පිළිලයක් වෙලා තිබෙන බව. අයිස් ඇතුළු මත්ද්‍රව්‍ය ජාවාරම්, මිනී මැරුම්, පැහැරගෙන යෑම්, දේපළ හානි, පුද්ගල හානි කෙළවරක් නැහැ. එවන් රටක අපි දේශපාලනික වශයෙන් සහ ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දුවක් ගත්තා, මේ රටේ දූෂණය, වංචාව නවත්වනවා වාගේම පාතාල ක්‍රියාකාරකම් මර්දනය කරන්න ඕනෑය කියලා; විශේෂයෙන් අයිස් මත් ද්‍රව්‍යය ජාවාරම මර්දනය කරන්න ඕනෑය කියලා.

නමුත් ඒ සඳහා අපේ රටේ තිබෙන නීති රීති ප්‍රමාණවත් වුණේ නැහැ. ඒ නිසා සංවිධානාත්මක පාතාල කල්ලි විසින් කරන අපරාධ නැවැත්වීම සඳහා එනම්, ඒවා විමර්ශනය කිරීම, ඒවාට නඩු පැවරීම සහ දඬුවම් දීම සඳහා වූ අලුත් පනතක් අපි ගේනවා. අපේ ගරු ජනාධිපතිතුමාත් කිව්වේ, මේ රටේ පාතාලය, අපරාධකරණය අපි නවත්වනවා, තිබෙන නීති මදි නම් අලුතින් නීති ගෙනැල්ලා හරි මේක නවත්වනවා කියලායි. ඒ අනුව ගෙනා පනත් කෙටුම්පතක් තමයි මේක. එතකොට අරමුණ පැහැදිලියි. එහෙමනම් මොකක්ද මේ එන කථාව?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පතේ 4 (1) වගන්තියේ කියනවා, සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයකු වී සිටීම සම්බන්ධව. 4(2) වගන්තියේ කියනවා, ඒ පුද්ගලයා පාතාල හෝ අපරාධ කණ්ඩායමක සාමාජිකයෙක් වෙන්න සලකා බැලිය හැකි කරුණු මොනවාද කියලා. In English, we call it "a rebuttable presumption" - it is not conclusive evidence, but a rebuttable presumption. එහි කරුණු 12ක් සඳහන් වනවා. ඒ කරුණු 12න් එක කරුණක් ගැන මම කියන්නම්.

සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පතේ 4(2) (ඇ) වගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ ප්‍රකට සාමාජිකයන් භාවිත කරන ඇඳුම් විලාසිතා, හස්ත මුද්‍රා, භාෂාව හෝ පච්ච සටහන් ඒ තැනැත්තා විසින් භාවිත කරන්නේද යන්න;"

මෙන්න මේකට තමයි විකෘති අර්ථ කථනය දෙන්නේ. මෙතැන ඒ විකෘති අර්ථ කථනය දෙන්න ඒගොල්ලන් කරන මූලික දෙයක් තමයි, එක වචනයක් හිතාමතා පාවිච්චි කරන්නේ නැතිකම. ඒ, මොකක්ද? "සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ ප්‍රකට සාමාජිකයන්". මතක තබා ගන්න, තනි තනි පුද්ගලයන්ට නොවෙයි, සංවිධානයක් එක්ක වැඩ කරන සාමාජිකයන්ට තමයි මේ පනත් කෙටුම්පත බලපාන්නේ කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේක අහසින් ගලවලා ගත්තේ නැහැ. අපේ රටේ සුලබ නොවුණාට අපි දන්නවා, ජපානය, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව වාගේ රටවල යම් සංවිධාන ඉන්නවාය කියන එක. මම ඒ අපරාධ කල්ලිවල නම් කියන්න යන්නේ නැහැ. ඔවුන් යම් අවස්ථාවලදී යම් හස්ත මුද්‍රා - hand signals, rituals, යම් අවස්ථාවල තමන් ඒ group එකට අයිතියි කියලා පෙන්වන tattoo එකක් එහෙමත් නැතිනම් යම් ආකාරයකින් තමන් ඒ කණ්ඩායම තුළ ඉන්න තත්ත්වය - rank එක - පිළිබිඹු කරන්න ඒවා පාවිච්චි කරනවා. එතකොට යමෙක් අපරාධ කල්ලියක සාමාජිකයෙකුද කියලා බලන්න අන්තර්ජාතිකව විමර්ශකයෝ පාවිච්චි කරන එක yardstick එකක් තමයි, මෙන්න මේ tattoos සහ ඇඳුම් පැලඳුම්. මේ පනත් කෙටුම්පතේ කොහේවත් කොණ්ඩයක් ගැන සඳහන් වෙන්නේ නැහැ. ඒක කොයි ලෝකයෙන් ආවාද කියන්න මා දන්නේ නැහැ!

මේ පනත් කෙටුම්පතින් අර්ථවත් කරන්නේ එහෙම දෙයක් විනා වෙනත් කාරණාවක් නොවෙයි. ඒක නොදැන නොවෙයි, මේ තොරතුරු ප්‍රචාරය කරන කට්ටිය ප්‍රචාරය කරන්නේ. මොකද, සමහර අය නීතිඥවරු. ඔවුන්ට මේක කියවන්න බැරිකමක්, අඩුපාඩුවක් නැහැ. නමුත්, ඔවුන් කොටසක් අත්හරිනවා. ඒ මොකක්ද? "Known-criminal group" කියන එක. ඒක අපේ රටේ සුලබ නැහැ. එහෙම නම් සමහරෙකු අහන්න පුළුවන්, එහෙම නම් නීතියේ ඒ කොටස ගෙනෙන්නේ ඇයි කියලා. ඒක ගෙනෙන්න හේතුව තමයි, ඉදිරි අනාගතය ගැන පුරෝකථනය කරලා, ඒ ආකාරයේ පාතාල සංවිධාන තිබෙනවා නම් ඒකත් අපට සලකා බැලිය හැකි එක් කාරණාවක් - "a rebuttable presumption". ඒක තමයි නීතියෙන් කියන්නේ; conclusive නැහැ. කෙසේ හෝ වේවා, අද අපේ මේ පනත් කෙටුම්පතේ සඳහන් වන මේ කොටස අපි ඇත්තටම ගන්නේ සිංගප්පූරුවේ Organised Crime Act 2015 කියන එකෙන්. ඒ කියන්නේ මොකක්ද? අන්තර්ජාතිකව පිළිගත්ත නිර්වචනයක් තමයි අපි මෙතැන යොදන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව මම මේ කියන්න උත්සාහ කරමින් යන්නේ මේකයි. මේ ජනතාවට ඇති කරන භීතිය මොකක්ද? කොණ්ඩය වැව්වොත් අල්ලා ගෙන යනවා - ඒක අපරාධයක්, පච්චයක් කෙටුවොත් අපරාධයක්, ඇඳුමක් ඇන්දොත් අල්ලා ගෙන යන්න පුළුවන්, ඒ වරද කළාම පොලීසියට පුළුවන් ඕනෑම කෙනෙක් අල්ලා ගෙන ගිහිල්ලා දවස් ගණන් ඇතුළේ තියා ගන්න කියන එක සම්පූර්ණ අසත්‍ය, නොමඟ යවන සුළු එකක්. මම දන්නවා, සමාජ මාධ්‍ය හරහා යම් දේශපාලන පක්ෂත් දැන් ඒක උස්සාගෙන දුවන ගතියක් පෙන්නුම් කරන බව.

මම මේ රටේ ජනතාවට කියන්නේ මෙච්චරයි. තමන් කැමැති ඇඳුමක් අඳින එක, තමන් පච්චයක් කොටන එක, තමන්ට අවශ්‍ය කොණ්ඩා මෝස්තරයක් තියා ගන්න එක තමන්ගේ මූලික අයිතිවාසිකමක්. තමන්ට ඒ අයිතිවාසිකම තිබෙනවා. මේ වාගේ ප්‍රකාශ කරනවාට වඩා හොඳයි, ශ්‍රේෂ්ඨාධිකරණයට යන එක. එතැනට ගිහිල්ලා මේක වැරදි නම්, ව්‍යවස්ථා විරෝධී නම් කරුණාකරලා ඒකට අභියෝගයක් කරන්න. විවේචන අපි භාර ගන්න සූදානම්. මේ පනත් කෙටුම්පත පිළිබඳවත් අපි හොඳ විවාදයක් කරමු. මම හිතන්නේ හෙට Consultative Committee එකක් තිබෙනවා. එතැනටත් එන්න, අදහස් දෙන්න.

ඒ පිළිබඳව නොවෙයි මේ ගැටලුව තිබෙන්නේ. මේක දේශපාලන අරමුණු ඉෂ්ට කර ගන්න මිනිස්සු කලබල කිරීමක්. සතිපතා මොකක් හරි අසත්‍ය එක කෑල්ලක් දුවවනවා. ඒක අල්ලා ගෙන පහර ගහමින් දුවනවා. මෙන්න මේ හේතුව නිසා තමයි අද මේ විපක්ෂය මේ සභාවේ කථා කරන ඒවාත් මිනිස්සු පිළිගන්නේ නැත්තේ.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, කලින් කථා කරපු මන්ත්‍රීතුමා කියන්නට යෙදුණා, සෞඛ්‍යයට ප්‍රතිපාදන වෙන් කරන්නේ නැතුව අපේ නායකයා කොත්තමල්ලි බොන්න කිව්වා ලු කියලා. කොච්චර out of contextද මේවා ගන්නේ? Prevention is better than cure; ඉස්පිරිතාලයට යන්න කලින් යම් යම් remedies ගන්න පුළුවන්. ඒ ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථාන පිහිටුවන්නේ ඒ දේ සඳහායි. මම කියන්නේ මේකයි. අපි දේශපාලනය කරමු, සාකච්ඡාව ගෙනියමු. නමුත්, මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න කිසි කෙනෙකුට වුවමනාවක් තිබෙන්න බැහැ. මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න වුවමනාව තිබෙන්න පුළුවන් සාමාන්‍යයෙන් ගත්තොත් පාතාල කල්ලිවලට සම්බන්ධ සාමාජිකයන්ට. ඔවුන්ගෙන් ඒ විරෝධතාව එන්න පුළුවන්. පාතාලයත් එක්ක ගනුදෙනු තිබෙන දේශපාලනඥයන්ට ඒකට විරුද්ධ වෙන්න අවශ්‍ය වෙන්න පුළුවන්. නමුත්, අපි මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ රටේ සහ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන්, සංවිධානාත්මක අපරාධ ක්‍රියාවලින් නැවැත්වීමේ කාරණාව උදෙසායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ මූලික කරුණු ටික තමයි මට කියන්න තිබෙන්නේ.

ඒ අනුව මම අවසන් වශයෙන් ජනතාවට නැවතත් කියනවා, මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ ප්‍රකට සාමාජිකයන් භාවිත කරන ඕනෑම tattoo එකක්, ඕනෑම hand signal එකක් සම්බන්ධව නොවෙයි කියන එක. ඒක අපේ රටේ සුලබ තත්ත්වයක් නොවෙයි. එහෙම එකක් අපේ රටේ මේ දක්වා හඳුනා ගෙන තිබෙනවා කියලා මම විශ්වාස කරන්නේ නැහැ. නමුත්, ඉදිරියේදී අවශ්‍ය වුණොත් කියලා තමයි ඒක තිබෙන්නේ. ඒක නිසා ඔබ පෞද්ගලිකව ගහන පච්චය, ඔබ පෞද්ගලිකව වවන කොණ්ඩය කියන ඒ කිසිවක් මේකට අදාළ වෙන්නේත් නැහැ. කොණ්ඩය කියන වචනය ගැන මේ පනත් කෙටුම්පතේ ඇත්තේත් නැහැ. අන්න ඒ කරුණු ටික තමයි මට සඳහන් කරන්න තිබෙන්නේ. ඒ නිසා දැන්වත් ජනතාව නොමඟ යවන එක නවත්වා තමන්ගේ විද්වත්භාවය, තමන්ගේ දැනුම රටේ ජනතාවගේ යහපතට පාවිච්චි කරන මෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Gnanamuththu Srineshan. You have six minutes to speak on the Adjournment Motion.

[பி.ப. 1.36]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் இந்தச் சபையில் நாட்டின் தற்போதைய நிலைமை பற்றிய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. இந்த இடத்தில் நாட்டின் தற்போதைய நிலைமையோடு, எங்களுடைய மாவட்டத்தின் நிலைமையையும் இணைத்துப் பேசுவது பொருத்தமானதாக இருக்குமென நினைக்கின்றேன். நாட்டில் பொருளாதார ரீதியாக இருக்கின்ற அழுத்தங்கள் பற்றிய விடயங்கள் இங்கு பேசப்பட்டு இருக்கின்றன. பொருளாதார ரீதியாகப் பார்க்கின்றபோது, விவசாயம் சார்ந்து தொழில் செய்கின்றவர்கள் எதிர்நோக்கும் இடர்பாடுகள் என்ன? தொழில்வாய்ப்புகள் இல்லாமல் இளைஞர், யுவதிகள் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் என்ன? தொழில்வாய்ப்புகளைப் பெற்றுக்கொள்ளக்கூடிய விதத்தில் தொழிற்சாலைகள் அமைக்கப்பட்டு இருக்கின்றனவா? என்ற கேள்விகள் இருக்கின்றன. அதுமாத்திரமன்றி, தொழில் இல்லாத காரணத்தால் எமது இளைஞர், யுவதிகள் வெளிநாடுகளுக்குச் சென்று சொல்லொணா தொல்லைகளை அனுபவித்துக்கொண்டு இருக்கின்றார்கள். இவ்வாறு பல விடயங்கள் இருக்கின்றன.

நான் இங்கு இன்னொரு விடயத்தைச் சுட்டிக்காட்ட வேண்டும். அதாவது, மயிலத்தமடு, மாதவனை போன்ற இடங்களில் நடைபெற்றுக்கொண்டு இருக்கின்ற அநியாயமான செயல்களைப் பற்றி சொல்ல வேண்டும். எமது கால்நடை வளர்ப்பாளர்கள் பல தசாப்தங்களுக்கும் மேலாக விவசாயம் செய்து வருகின்றார்கள்; கால்நடைகளை வளர்த்து வருகின்றார்கள். இவர்கள் விவசாய நிலங்களில் பயிர்ச்செய்கை செய்கின்ற காலங்களில், தங்களுடைய

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

கால்நடைகளை அந்த விவசாய நிலங்களில் இருந்து அகற்றி, மயிலத்தமடு, மாதவனை, வட்டமடு, மேசைக்கல், கார்மலை, கறுவாச்சோலை போன்ற இடங்களுக்குக் கொண்டுசென்று விடுவார்கள். மாவட்ட அரசாங்க அதிபர் தலைமையில் கூடுகின்ற ஆரம்பக் கூட்டத்தில், DSமார், விவசாயம் சம்பந்தமான உத்தியோகத்தர்கள், கால்நடை சம்பந்தமான உத்தியோகத்தர்களுடன் கலந்துரையாடி, பயிர்ச்செய்கை செய்கின்ற காலத்தில் வயல் நிலங்களில் இருந்து கால்நடைகளை காட்டுப்புறமாகக் கொண்டுசென்று வளர்க்கலாம் என்று முடிவு எடுக்கப்பட்டே, எங்களுடைய கால்நடை வளர்ப்பாளர்களுக்கு இதற்கான அனுமதி வழங்கப்படுகின்றது. அதற்கு அமைவாக, மாதவனை, மயிலத்தமடு, வட்டமடு போன்ற இடங்களுக்குக் கால்நடைகளைக் கொண்டுசென்று எந்தவொரு பிரச்சினையும் இல்லாமல் சுயசார்பு பொருளாதாரத்தை அவர்கள் செய்துகொண்டு வந்தார்கள். அவர்களுக்கு எவ்விதமான குறுக்கீடுகளோ, இடையீடுகளோ இருக்கவில்லை. கடந்த கால அரசாங்கங்களில் குறுக்கீடுகள் இருந்தாலும், அத்துணை அதிகமாக இருக்கவில்லை.

ஆனால், தற்பொழுது என்ன நடக்கின்றது என்றால், மயிலத்தமடு, வட்டமடு, மாதவனை போன்ற இடங்களில் அந்த விவசாயிகள் எந்த புற்றரையை நோக்கித் தமது கால்நடைகளைக் கொண்டு செல்கின்றார்களோ, அந்த இடம் உழவடிக்கப்படுகின்றது; நெருப்பிட்டுத் தீ வைக்கப்படுகின்றது. அவர்கள் கடந்த காலத்தில் இயல்பாகத் தங்களது கால்நடைகளை வளர்த்து வந்த புற்றரைகள், வெறும் தரைகளாக்கப்படுகின்றன. இதன் காரணமாக, மயிலத்தமடு, மாதவனை போன்ற இடங்களில் பல பிரச்சினைகள் எழுந்திருக்கின்றன. இங்கே இருக்கின்ற அரசாங்கத் தரப்பு MPஆன கந்தசாமி பிரபு அவர்களுக்கும் இந்த விடயம் தெரியும். அதேபோன்று, கௌரவ பிரதி அமைச்சர் அருண் ஹேமச்சந்திரா அவர்களுக்கும் தெரியும்.

திருகோணமலையில் மேய்ச்சல் தரை gazette பண்ணப்பட்டு இருப்பதாக நாங்கள் அறிகின்றோம். ஆனால், மட்டக்களப்பிலும் அம்பாறையிலும் மேய்ச்சல் தரை வர்த்தமானியில் பிரகடனம் செய்யப்படவில்லை. இதன் காரணமாக அங்கு முறுகல் நிலை உருவாகின்ற சூழ்நிலை காணப்படுகின்றது. இதில் யார் யார் சம்பந்தப்பட்டு இருக்கின்றார்கள் என்று எங்களுக்குத் தெரியவில்லை. இப்பொழுது துப்பாக்கிகளை வைத்திருக்கக்கூடாது என்று சொல்கிறார்கள். ஆனால், துப்பாக்கிகளால் மாடுகளைச் சுட்டிருக்கின்றார்கள். அதனால் அவை காயப்பட்டு இருக்கின்றன. இப்படியெல்லாம் பல பிரச்சினைகளை எதிர்நோக்கிக்கொண்டு இருப்பதால், நாங்கள் இந்த விடயம் சம்பந்தமாக எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில், அதன் Chairmanஆக இருக்கின்ற கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்களிடம் முறையிட்டோம். மாண்புமிகு சனாதிபதி அவர்கள் அங்கு வந்தபோது அவரிடமும் முறையிட்டோம். அவர் இந்தப் பிரச்சினையைத் தீர்த்துத் தருவதாகச் சொன்னார். அரசாங்கத்தின் மூன்று துறைகளில் ஒன்றான சட்டவாக்கத்துறையுடன் சம்பந்தப்பட்ட பாராளுமன்றத்தில் நான் உட்பட பல MPs இந்த விடயம் தொடர்பில் பேசி இருக்கின்றோம். அதேபோன்று, நிறைவேற்றுத்துறைக்குப் பொறுப்பாக இருக்கின்ற மாண்புமிகு சனாதிபதி அவர்களிடமும் பேசி இருக்கின்றோம்; அமைச்சர்களிடமும் பேசி இருக்கின்றோம். மிகுதியாக இருக்கின்ற, மூன்றாவது துறையான நீதித்துறையுடன் சம்பந்தப்பட்ட நீதிமன்றத்திலும் வழக்குத் தாக்கல் செய்தபோது, கொழும்பு மேன்முறையீட்டு நீதிமன்றமானது, "சட்டவிரோதமான முறையில் புற்றரைகளை அழித்து, அங்கு பயிர்ச்செய்கையில் ஈடுபடுகின்றவர்கள் வீணான இனமுறுகலை ஏற்படுத்துகின்றவர்கள்; அவர்கள் அங்கிருந்து வெளியேற்றப்பட வேண்டும்" எனத் தீர்ப்பளித்தது.

இதே தீர்ப்பை ஏறாவூரில் இருக்கின்ற நீதிமன்றமும் 2 தடவை வழங்கி இருக்கின்றது. எனினும், இந்தத் தீர்ப்புகள் எதுவும் நடைமுறைப்படுத்தப்படவில்லை. மூன்று துறைகளிலும் முறையிட்டும் இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண முடியாத நிலையில் நாங்கள் காணப்படுகின்றோம். எங்களுடைய கால்நடை வளர்ப்பாளர்கள் சொல்லொணாத் துயரத்தில் இருக்கின்றார்கள். அவர்கள் தங்களுடைய கால்நடைகளை விற்றுவிட்டு, தெருக்களில் பிச்சை எடுக்கும் நிலைக்குத் தள்ளப்பட்டு இருக்கின்றார்கள். இது குறித்து நாங்கள் பல தடவை இந்த உயர்ந்த சபையில் பேசியும் அதற்குரிய பிரதிபலிப்பு எதுவும் தெரியவில்லை. மாண்புமிகு சனாதிபதி அவர்கள் ஒத்துக்கொண்ட விடயமும் நடக்கவில்லை. நாங்கள் மீண்டும் ஒரு தடவை இந்த விடயம் சம்பந்தமாக சனாதிபதியிடம் பேச விரும்புகின்றோம். நாங்கள் ஜனநாயக வரம்புக்கு உட்பட்டு இந்தப் பிரச்சினைகளைத் தீர்த்துக்கொள்ளவே நினைக்கின்றோம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Srineshan, your time is up.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, give me one more minute, please.

பொறுப்புள்ள அமைச்சர்கள் இங்கு இருக்கிறார்கள். நாங்கள் கடந்த பாராளுமன்ற அமர்வின்போது, கௌரவ அமைச்சர்களான சுனில் ஹந்துன்னெத்தி, கே.டீ. லால் காந்த, தம்மிக பட்டபெந்தி ஆகியோரோடு இது பற்றி பேசினோம். இந்தப் பிரச்சினை சுமுகமாகத் தீர்க்கப்படுமெனச் சொல்லப்பட்டது. ஆனால், சுமுகம் இல்லை. மிக மோசமான நிலையில், அங்கு அந்தக் கால்நடையாளர்கள் பல பிரச்சினைகளை எதிர்நோக்கிக்கொண்டு இருக்கின்றார்கள். அவர்களுடைய கண்ணுக்கு முன்னாலே புற்றரைகள் எரிக்கப்பட்டு தீச்சுவாலை வந்துகொண்டு இருக்கின்றது; உழவு அடிக்கப்படுகின்றது.

அம்பாறை மாவட்டத்தில் புற்றரைகள் இருக்கின்றன. அதேபோன்று, பொலன்னறுவை மாவட்டத்திலும் இருக்கலாம்! அவ்வாறு இருக்கையில், மாவட்டம் விட்டு மாவட்டம் கடந்து இங்கு வருவது, வீண் பிரச்சினையை உருவாக்கி, எங்களையும் தெருக்களில் நின்று போராடக்கூடிய நிலைமையை உருவாக்கி இருக்கின்றது. இது மிகவும் வேதனையான ஒரு விடயம். எனவே, தயவுசெய்து மாண்புமிகு சனாதிபதி உட்பட சிரேஷ்ட அமைச்சர்கள் தலையிட்டு இந்தப் பிரச்சினையைத் தீர்த்து வைக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please wind up?

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

ஒரேயொரு விடயத்தைக் கூறி முடிக்கிறேன். போட்டிப் பரீட்சைகள் நடாத்தப்படுகின்றன. எனினும், புள்ளிகள் வெளிப்படைத் தன்மையுடன் வெளிவருவதில்லை. மருந்தகக் கூட்டுத்தாபனத்தில் நடாத்தப்பட்ட போட்டிப் பரீட்சையின் அடிப்படையில், இரண்டாவது இலக்கமிடப்பட்டு நேர்முகப் பரீட்சைக்குச் சென்றவரிடம் கேட்கப்பட்ட விடயம் என்னவென்றால், அகில இலங்கை ரீதியாகப் பெறப்பட்ட விளையாட்டுச் சான்றிதழ் உங்களுக்கு இருக்கின்றதா? என்றுதான். மருந்தகக் கூட்டுத்தாபனத்தில் வேலை செய்வதற்கு அகில இலங்கை மட்டத்திலான விளையாட்டுச் சான்றிதழைக் கேட்கின்றார்கள். எனவே, நான் சொல்லக்கூடிய விடயம் என்னவென்றால், தயவுசெய்து வெளிப்படைத் தன்மையுடன், பாரபட்சம் இல்லாமல், உங்களுடைய போட்டிப் பரீட்சை முடிவுகளை வெளியிட வேண்டும் என்றுதான். அத்துடன், பாதிக்கப்பட்டவர்களுக்கு நியாயம் கிடைக்க வேண்டும்; தகவலறியும் உரிமைச் சட்டத்தின் அடிப்படையில் உரிய பதில்கள் கிடைக்க வேண்டும்; மயிலத்தமடு - மாதவனைப் பிரச்சினைக்குத் தீர்வு கிடைக்க வேண்டும். Bachelor of Education degree முடித்தவர்களுக்குப் போட்டிப் பரீட்சை இன்றி ஆசிரியர் நியமனம் வழங்கப்படுமெனச் சொல்லப்பட்டது. பட்டதாரிகளை ஆசிரியர் சேவைக்கு ஆட்சேர்ப்பதற்கான பரீட்சை முடிந்திருக்கிறது. அதற்குப் பின்னர், இதனைச் செய்ய வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Anton Jayakody. You have eight minutes to speak on the Adjournment Debate before the House.

[අ.භා. 1.43]

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද මම මේ ගරු සභාවට කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. කාවන්තිස්ස ඇතා මිය යාමත් සමඟම පරිසර අමාත්‍යාංශය විධියටත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විධියටත් මොනවාද අපි කර තිබෙන්නේ කියා මේ දිනවල සමාජ මතයක් මතු වෙමින් පවතිනවා. පරිසර අමාත්‍යාංශය ලෙස අපි කිසිදු දෙයක් කර නැහැ වාගේයි එවැනි මතයක් මතු වන්නේ. හරියට සියඹලා ගෙනැල්ලාම නැහැ වාගේ තමයි අපිට චෝදනා එල්ල වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ වසර දෙකක කාලය තුළ මිනිසුන් සහ වනඅලි අතර තිබෙන ගැටුම අවම කරන්න ක්ෂේත්‍ර පහක් යටතේ වැඩ පිළිවෙළ හඳුනා ගත්තා. ඒ ක්ෂේත්‍ර පහ ඔස්සේම අපි අදාළ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමින් ඉන්නා මොහොතක් මේක.

එහි පළමු කාරණය ගත්තොත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තමයි මෙහි නියාමන කටයුතු කරන්නේ; එම දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කර තිබෙනවා. ඊළඟට මම ඒ පිළිබඳව කියන්නම්.ඊට පස්සේ, අලි- ඇතුන්ගේ සංචරණයට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙනවා. ඒ වාගේම, ඔවුන්ගේ පෝෂණය සඳහා අවශ්‍ය පියවර අපි අරගෙන තිබෙනවා. එසේම, අලි- ඇතුන්ගේ යහපත් සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධයෙන් හා ඔවුන් කළමනාකරණය කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම ගත්තොත්, පසුගිය වසර දෙක තුළ මීට පෙර පැවති කිසිදු ආණ්ඩුවක් සිදු නොකළ තරමේ වැඩ කොටසක් මේ සම්බන්ධයෙන් අපි ක්‍රියාත්මක කර තිබෙනවා වාගේම, ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ඒ පිළිබඳව මම පොඩ්ඩක් පැහැදිලි කරන්නම්.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම සඳහා අපි කටයුතු කළා. එම දෙපාර්තමේන්තුවේ මානව සම්පත් හා භෞතික සම්පත් සම්බන්ධයෙන් විශාල හිඟයක් තිබුණා. අන්න ඒ මානව සම්පත් සහ භෞතික සම්පත් ලබා දීමට අපි කටයුතු කළා. විශේෂයෙන්ම, වසර ගණනාවක් තිස්සේ එම දෙපාර්තමේන්තුවේ සේවක පුරප්පාඩු පුරවලා තිබුණේ නැහැ. අපේ රජය යටතේ අලි වැට ආරක්ෂා කිරීම ඇතුළු කටයුතුවල නිරතව සිටින සේවකයින් 3,451දෙනෙක් ස්ථිර කිරීමටත් අපි කටයුතු කළා. ඒ වාගේම, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් 5,000ක් මේ කටයුතු සඳහා අනුයුක්ත කිරීමටත් කටයුතු කළා. අඩවි ආරක්ෂක නිලධාරින්, නියාමකවරුන් ඇතුළු පුරප්පාඩු වී තිබූ සියලුම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමටත් අපේ රජය බලයට පත්වීමෙන් පසු අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සලසා දුන්නා.

ඊළඟට, භෞතික සම්පත් ලබාදීම සම්බන්ධයෙන්ද අපි පියවර අරගෙන තිබෙනවා. ඒ අනුව විශේෂයෙන්ම, කැබ් රථ 100ක් ලබා දීමට අපි කටයුතු කළා. ඒ අතරින් double cabs 16ක් ලබා දී තිබෙනවා. තවත් single cabs 84ක් මේ වනවිට ශ්‍රී ලංකාවට ඇවිල්ලා තිබෙනවා. දැන් ඒවා field එකට යොදාගත හැකි පරිදි සකස් කරමින් පවතිනවා. ඒ වාගේම, මෝටර් බයිසිකල් 180ක් ගෙනැල්ලා, මේ වෙනකොට ඒවා ලබා දී තිබෙනවා. එමෙන්ම, ට්‍රැක්ටර් රථ 9කුත් ලබා දී තිබෙනවා. එම දෙපාර්තමේන්තුවට අවශ්‍ය භෞතික සම්පත් සැපයීම අපි මේ ආකාරයට සිදු කර තිබෙනවා. විශේෂයෙන්ම, මුරකුටි 161ක් නිර්මාණය කිරීම සඳහා අපි රුපියල් මිලියන 1,050ක මුදලක් වෙන් කර තිබෙනවා. එමෙන්ම, විදුලි වැට නඩත්තු කිරීම සඳහාත් අපි මෙයින් සැලකිය යුතු කොටසක් වෙන් කර තිබෙනවා. ඒ අනුව, පසුගිය වසර දෙක තුළ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම සඳහා මීට පෙර පැවැති ආණ්ඩු එකක්වත් නොකළ ආකාරයේ වැඩ පිළිවෙළක් අපි සකස් කර ක්‍රියාත්මක කර තිබෙනවා.

ඊළඟට අලි- ඇතුන් ගත්තොත්, විවිධ හේතු නිසා ඔවුන්ගේ සංචරණය සීමා වෙලා තිබුණා. ඒ නිසා ඔවුන්ගේ සංචරණය වැඩි කරන්න අපි ක්‍රමානුකූලව අවශ්‍ය වැඩ පිළිවෙළවල් සකස් කළා. ඒ යටතේ, අමාත්‍යතුමා හැටියට මම විශේෂයෙන් වනාන්තර 114ක් ගැසට් කිරීමට කටයුතු කර තිබෙනවා. ඒ යටතේ අක්කර 180,000ක පමණ භූමි ප්‍රමාණයක් අලි- ඇතුන් ඇතුළු වනසතුන්ගේ ආරක්ෂාව තහවුරු කෙරෙන වනාන්තර ප්‍රදේශ බවට පරිවර්තනය කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර පැවැති එකදු රජයක් හෝ අලිමංකඩ ගැන කථා කළේ නැහැ. ඒ වාගේම අලිමංකඩ declare කරන්න බය වුණා. නමුත්, අපේ රජය බලයට පත්වෙලා වසර දෙකක් ඇතුළත අලිමංකඩ 3ක් declare කරලා ගැසට් කරලා තිබෙනවා. ඒවා තමයි, හඳපානාගල-දෙමෝදර, වැටහිරකන්ද සහ කෝලංගල යන අලිමංකඩ. ඒ වාගේම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහකනදරාව සහ නාච්චාදූව අලිමංකඩ සම්බන්ධයෙන්ද ඉදිරි පියවර අරගෙන තිබෙනවා. ඒ සඳහා දිස්ත්‍රික්

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලැබී තිබෙන අතර, මේ වෙනකොට අදාළ ගැසට් නිවේදනය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවලා තිබෙනවා. එය නැවත ලැබුණු වහාම අපි ඒකත් ගැසට් කරනවා. ඒ වාගේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ තවත් අලිමංකඩ කිහිපයක් ගැසට් කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහකනදරාව සහ නාච්චාදූව ප්‍රදේශ තමයි මේ දිනවල කථිකාවට ලක්වෙලා තිබෙන අග්බෝ ඇතාගේ නිජබිම. එම ප්‍රදේශවල තමයි එම ඇතා වාසය කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට අලි- ඇතුන්ගේ පෝෂණ ක්‍රියාවලිය පිළිබඳවත් මම සඳහන් කරන්න කැමැතියි. අලි - ඇතුන්ගේ සුපෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය, මීට පෙර පැවැති කිසිදු රජයක් ක්‍රියාත්මක නොකළ ආකාරයෙන් අපි පටන් අරගෙන තිබෙනවා. වනාන්තර තුළ තණ පිටි නිර්මාණය කිරීමේ සහ වනාන්තර තුළ තිබෙන වැව් සංවර්ධනය කිරීමේ කටයුතුත් අපි ආරම්භ කර තිබෙනවා. ජාතික වැඩ පිළිවෙළක් හැටියට අපි තබ්බෝව වැව් පිටියේ තිබූ සියලුම ආක්‍රමණික ශාක ඉවත් කර, එම ප්‍රදේශය තණ පිටියක් බවට පරිවර්තනය කරලා, මේ වනවිට එම භූමිය අලි- ඇතුන් ගැවසෙන භූමියක් බවට පත් කරලා තිබෙනවා. ඒ වාගේම, මෙම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී Clean Sri Lanka වැඩ සටහනේ සහයෝගයද සහිතව අපි ඒකාබද්ධව කටයුතු කළා. කලාවැව ආශ්‍රිතවත් අපි මේ ක්‍රියාවලියම සිදු කර තිබෙනවා. ඒ අනුව අපි මේ වනකොට ආක්‍රමණික ශාක බොහොමයක් ඉවත් කරමින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අලින්ගේ සෞඛ්‍ය සඳහා ජංගම රෝහලක් ඉදි කිරීමට අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. මේ වනකොට ඒ සඳහා සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. කැබ් රථයට අවශ්‍ය modifications කළාට පස්සේ අපට ඉතාම නුදුරු අනාගතයේදී ඒ හරහා අවශ්‍ය සේවාවන් ලබා දීමට පුළුවන් වනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු අපි සකස් කරලා තිබෙනවා. ඒ වාගේම වනජීවී රෝහලක් අනුරාධපුරයේ උළුක්කුකුලම ප්‍රදේශයේ ඉදි කිරීම සඳහාත් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ලබන අවුරුද්ද වනකොට එම රෝහල ඉදි කිරීමට අවශ්‍ය පියවර ගන්නවා. ඒ වාගේම අපි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ "ඇත්තුරු සෙවණ" ආරම්භ කිරීමට කටයුතු කරනවා. අලි කළමනාකරණය කිරීම සඳහා හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිතය තුළ කළමනාකරණ ඒකකයක්, ගැසට් කරලා පිහිටුවීමට අවශ්‍ය කරන කටයුතු අපි සම්පාදනය කළා. ඒ වාගේම, මාස දෙකකට පමණ පෙර Cabinet Paper එකක් දමලා, අපේ රටේ ඉන්න විශේෂඥයන්ගෙන් team එකක් හදලා අලි-මිනිස් ගැටුම කළමනාකරණය කිරීමේ ජාතික ක්‍රියාකාරි සැලැස්ම හදන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි හදාගෙන යනවා. ඒ වාගේම අපි ඒ ඒ දිස්ත්‍රික්කවල ඉන්න මන්ත්‍රීවරුන් නියෝජනය කරමින් අධීක්ෂණ කමිටුවක් පිහිටුවා තිබෙනවා; දිස්ත්‍රික්කවලට අදාළව අලි කළමනාකරණ කමිටු පිහිටුවීමත් ආරම්භ කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is up.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් විනාඩියක කාලයක් දෙන්න.

අප මේ වසර දෙක තුළ ගත් ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල මේ වනකොට ලැබෙමින් පවතින ආකාරය අපට දකින්න පුළුවන්. මෙච්චර වැඩ ප්‍රමාණයක් කරලා තිබෙන මෙවැනි වකවානුවක් තුළ තමයි අප මෙසේ විවේචනයට ලක් වන්නේ. අපේ පරිසර අමාත්‍යවරයා හැටියට ගරු වෛද්‍ය දම්මික පටබැඳි මැතිතුමා මේ වෙනුවෙන් ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් ගෙන තිබෙනවා. අපි බොහෝ සෙයින් කනගාටු වෙනවා, ඒ කිසිදු එකක් සැලකිල්ලට නොගෙන එතුමාට එල්ල කරන විවේචන සම්බන්ධයෙන්. මේ විවේචන එල්ල කරන්න කලින් මේ ආණ්ඩුව පත් වෙලා වසර දෙකක කාලය තුළ අලින් වෙනුවෙන් පරිසර අමාත්‍යාංශය සිදු කර තිබෙන ක්‍රියාදාමය අධ්‍යයනය කරලා කථා කිරීම වඩාත් සුදුසුයි කියා යෝජනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Rajapaksa. You have seven minutes to participate in the Debate before the House.

[අ.භා. 1.53]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ආණ්ඩුවේ අය දැන් උගුරට හොරා බෙහෙත් බොනවා. පරිසර අමාත්‍යාංශය කරපු ඒවා ගැන දැන් කථා කරනවා. දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය, කාවන්තිස්ස ඇතාට වෙඩි තියපු එකයි; මාසයක්, මාස එකහමාරක් යනකල් ඒ පිළිබඳව අවධානය යොමු නොවෙච්ච එකයි. අපි දන්නවා, අලිමංකඩවල් සුද්ද කරන්න ඕනෑ කියලා. හැම ආණ්ඩුවක්ම කාලානුරූපීව ඒක කරගෙන යනවා. හැබැයි, කවුද තුවක්කු දුන්නේ? ඔබතුමන්ලාගේ අමාත්‍යවරයා තුවක්කු දීලා, එන සතුන්ට වෙඩි තියන්න කියලා පාර්ලිමේන්තුව ඇතුළේ කිව්වා. හැබැයි ඉතින් "දිට්වා" සුළි කුණාටුව වෙලාවේදී roofing sheet එකක් ගියත් ලක්ෂ 10ක් දෙනවා කියලා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී බොරුවක් කිව්වා වාගේ ඇමතිතුමා කියපු දේත් සමහර විට වැරැදියට තේරුම් ගත්තාද දන්නේ නැහැ. තමන්ගේ හේනට, පැලට, ගෙදරට සතෙක් ආවොත් වෙඩි තියන්න කියලා ඇමතිතුමා උපදෙස් දීලා, ඒකට තුවක්කුවකුත් දීලා දැන් එනවා ඒ සිදුවීම කොහොමද වුණේ, මොනවාද කළේ කියලා කියන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලිවම එසේ තුවක්කු දීම තුළ වෙඩි තැබීමක් සිදු වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා සංවිධානාත්මක අපරාධ නවත්වන්න පනත් ගෙන ඒම ගැන කථා කරනවා. අද හැම හන්දියක් ගාණේම වෙඩි තියලා යනවා; එක පිට එක මරලා දානවා. එහෙව් එකේ වන සතුන්ට වෙඩි තියන එක අහන්න දෙයක්ද? ඔව්, ඔබතුමන්ලාට හිනා යනවා ඇති, මේවා කියන කොට. කවුද වෙඩි තියන්නේ කියලා ඔබතුමන්ලා දන්නවා නේ. එහෙම නේද, ඇමතිතුමනි? වෙඩි තියන අය කවුද, තුවක්කු දුන්නු අය කවුද, ඒ අය රකින්නේ කවුද කියලා දන්නවා ඇති නේ. ඒවා වෙලාවට එළියට එයි. *[බාධා කිරීමක්]* ඔව්, ඔව්, "කික් කික්" ගගා ඉන්න. ඒ තොරතුරු වෙලාවට එළියට එනකොට තමයි කට්ටියට දුවන්න පාරවල් හොයා ගන්න බැරි වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි අවධාරණයෙන් ඉල්ලා සිටිනවා, අද කාවන්තිස්ස ඇතාට වෙච්ච අසාධාරණය කරුණාකර හෙට අනෙක් සතුන්ට වෙන්න ඉඩ තියන්න එපා කියලා.

දැන් ඔබතුමන්ලා තාක්ෂණය ගැන කථා කරනවා. පසුගිය කාලයේ අග්බෝ ඇතා නැති වෙලා කියලා හතරවටේ හොයන්න ගියා. ඒ සඳහාත් තාක්ෂණය පාවිච්චි කරන්න; තාක්ෂණය පාවිච්චි කරලා monitoring system එකක් හදන්න. ඒකට මුදල් වෙන් කරන්න. ඇත්තු කී දෙනාද ඉන්නේ?

ආයේ මෙතැනට ඇවිල්ලා සුරංගනා කථා කියන්න එපා. අපි ඉතිහාසයේ ඔය සුරංගනා කථා අහලා තිබෙනවා නේ. ඔබතුමන්ලා ආර්ථිකය ගැන කියපු සුරංගනා කථා කොහොමද? අද වනකොට - මේ මාසයේ- උද්ධමනය සියයට 8යි. ආහාර උද්ධමනයත් වැඩි වෙලා. අසීමිත බදු ප්‍රතිපත්තියක් ආණ්ඩුව අනුගමනය කරන්නේ. ඒක ජනතාවට දරා ගන්න බැහැ. අනෙක් පැත්තෙන් මොකක්ද වෙමින් තිබෙන්නේ? විරැකියාව වැඩි වෙනවා, කර්මාන්තශාලා වැහෙනවා. ඔබතුමන්ලා බලයට ආපු ගමන් එක සමාගමක් එළවා ගත්තා. ඒක ඉන්දියානු සමාගමක්. ඔන්න දැන් චීන සමාගමකුත් ගිහිල්ලා. හොඳ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා කියන්න නම් ඒක හොඳයි. එයා ගිය නිසා මෙයාත් යැව්වා කියලා කියන්න පුළුවන්. හැබැයි ඔබතුමන්ලාගේ න්‍යාය පත්‍රය මොකක්ද?

එක පැත්තකින්, මේ රටට ආයෝජකයෝ ගෙනෙනවා, ආයෝජකයන්ගේ පැමිණීම ප්‍රවර්ධනය කරනවා කියලා ඔබතුමන්ලා කියනවා. අනෙක් පැත්තෙන්, ඉන්න ආයෝජකයෝ හැරිලා යනවා. හැරිලා යනවා විතරක් නොවෙයි, හැරිලා යන ආයෝජකයා වන්දිත් ලබා ගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලජ්ජයි! *[බාධා කිරීමක්]* ඔව්, ලජ්ජයි! වන්දිත් ගන්නවා. එවැනි ප්‍රතිපත්තියක් තුළ මේ රටේ ජනතාව පිට තවදුරටත් පීඩනය පටවන්න එපා.

ඔබ තුමන්නාන්සේලා බලයට ඇවිල්ලා දැන් අවුරුදු දෙකයි. එක පැත්තකින්, විරැකියා ප්‍රශ්නය; උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය තවම තිබෙනවා. තවත් පැත්තකින්, ගමේ තරුණයාගේ ගැටලුව. තවත් පැත්තකින්, කෘෂි කර්මාන්තයේ ගැටලු; ගොවියා අසරණ වෙලා, පොහොර ටික නැහැ, ඔවුන්ගේ නිෂ්පාදනයට නිසි මිලක් නැහැ. මේ කාරණාවලට ඔබ තුමන්නාන්සේලා මැදිහත් වෙන්නේ කොහොමද? "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වූ හානිවලට අදාළ වන්දි මුදල් ලංකාවට ලැබෙනවා. ඒ වන්දි මුදල් ලංකාවට ආවාම ඒවායින් සියයට පොඩි ප්‍රමාණයයි වියදම් වෙලා තිබෙන්නේ. ඉතිරි ටික හැරිලා යනවා, ඒවාට අදාළ වැඩ ටික කර ගන්න බැරි වෙලා. කර ගන්න බැරි වෙලාද, කරන්න වුවමනාවක් ඔබතුමන්ලාට නැද්ද කියන ප්‍රශ්නය අහන්න වෙනවා.

මහ ලොකු නීතියක් ගැන දැන් කථා කරනවා නේ. ඔබතුමන්ලා නීතිය ක්‍රියාත්මක කරන හැටි අපි දන්නවා. එය කොහොමද වෙන්නේ කියලාත් අපි දන්නවා, පිටිපස්සෙන් ඉන්නේ කවුද කියලාත් අපි දන්නවා, ඇඟ බේරා ගන්න එක එක්කෙනාට බෝලය පාස් කරන්නේ කොහොමද කියලාත් අපි දන්නවා. මොකද, ඔබ තුමන්නාන්සේලාගේ න්‍යාය පත්‍රය අපි දන්නවා.

ඔබතුමන්ලා මහා ලොකු කයිවාරු ගැහුවාට, ගල් අඟුරු නැව් 19ක් බාල වුණා නේ. නැව් දෙකක් ගිල්ලා නේ. ගිල්ලේ කවුද කියලා කියන්න කෝ. ජනාධිපතිතුමා කිව්වා නේ, කාලා බැලුවේ නැහැ කියලා. බලන කොට ගිලලා නේ. ගිලපු එකක් ආයේ කාලා බලන්න විධියක් නැහැ නේ; උගුරෙන්ම ගිහිල්ලා නේ; බඩටම ගිහිල්ලා නේ. ගල් අඟුරු නැව් දෙක ගිල්ලේ කවුද? දැන් ඒකේ පාඩුව විඳින්නේ කවුද? ජනතාව. විදුලිය කැපෙන කොට, විදුලි බිල වැඩි කරන කොට කවුද ඒක ගෙවන්නේ? රටේ ජනතාව. ඔබ තුමන්නාන්සේලා අනෙක් පැත්තට ඒක රටේ ජනතාව පිට දමනවා. විදුලියත් කප්පාදු කරනවා. ඔබතුමන්ලා බලයට එනකොට කියපු කථා බලයට ආවාට පස්සේ කියන්නේ නැහැ නේ. මොකද, ඒවා ඔබ තුමන්නාන්සේලාට දැන් මතක නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පැහැදිලිව මේ කාරණය කියනවා. මේ රටේ ගම්වල ඉන්න ජනතාවට අද ආර්ථික ප්‍රශ්නයක් තිබෙනවා; විරැකියා ප්‍රශ්නයක් තිබෙනවා; ජීවන වියදම් ප්‍රශ්නයක් තිබෙනවා. ඒක ඔබ තුමන්නාන්සේලාට විහිළුවක් වෙන්න පුළුවන්. ඔබ තුමන්නාන්සේලාගේ දේශපාලන න්‍යාය ඇතුළේ පුරුදු, උද්ඝෝෂණය කරන එක විතරයි. ඉතින් ඔබ තුමන්නාන්සේලා අදත් කරන්නේ උද්ඝෝෂණය කරන එක විතරයි. ඔබ තුමන්නාන්සේලාට හිතවත් නිලධාරීන් ආයතනවලට පත් කර ගත්තා. ඒ අයට ඒ ආයතන පවත්වා ගෙන යන්න පුරුද්දක් නැහැ, දැනුමක් නැහැ. මොකද, විපක්ෂයේ ඉන්න කාලයේ ඉඳන් ඔබ තුමන්නාන්සේලා වෙනුවෙන් ඒ අය කළේ ආයතන කඩාකප්පල් කරපු එක විතරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Namal Rajapaksa, you have two minutes left.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
හොඳමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

Plug එක ගහනවා වෙනුවට plug ගලවපු එකයි කළේ. Plug ගලවපු අය තනතුරුවල වාඩි කළාම විදුලිය කැපෙනවා තමයි. කලින් විදුලිය කැප්පෙව්වා; දැන් විදුලිය කපනවා. ඇයි? වැඩේ කර ගන්න තේරෙන්නේ නැහැ. ඒ නිසා අපි ඔබ තුමන්නාන්සේලාට පැහැදිලිව කියනවා, වර්තමානය වන විට මේ රටේ ග්‍රාමීය ජනතාව දැවැන්ත පීඩනයක ජීවත් වන බවත් මතක තබා ගන්න කියලා.

පසුගිය කාල සීමාව තුළ එක්නැලිගොඩ නඩුව High Court එකේ විභාග වුණා. අංක 725/2019 නඩුවේ සාක්ෂි විභාගයේදී LTTE ත්‍රස්තවාදියා මොකක්ද කියන්නේ? ඔහු එහිදී කිව්වා, ඒ කාලයේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා කැබිනට් අමාත්‍යවරුන් එක්ක හෝ ගුවන් යානයක යනකොට ඝාතනය කරන්න සැලැස්මක් තිබුණා කියලා. ඒක කියන කොට ඔයගොල්ලන්ට හිනා. මොකද, ඔයගොල්ලන්ට වුන් නේ, ඒක වුණා නම්. ඒක වෙනකල් නේ බලාගෙන හිටියේ. ඒක වෙනකල් තමයි බලාගෙන ඉඳලා තිබෙන්නේ. ඒකට විරුද්ධව යම් ප්‍රකාශයක් කරපු, හඬක් නඟපු ඥානසාර හාමුදුරුවන්ට ජනාධිපති සමාව දුන්නාම, දැන් ජනාධිපති සමාව දීම පිළිබඳව ඔබ තුමන්නාන්සේලා නිර්වචනය කරනවා. කලින් ජනාධිපතිවරයා වරද්දලා දීලා තිබෙනවා නම් දැන් හදන්න පුළුවන් නේ. ඇයි, හදන්න බැරි? ඔබ තුමන්නාන්සේලා එක පැත්තකින් මහා සංඝ රත්නයට අගෞරව කරනවා; මඩ ගහනවා. ඔබ තුමන්නාන්සේලා ජාතිවාදය අවුස්සන්නේ නැහැ කියන න්‍යාය පත්‍රය ඉස්සරහට දමාගෙන ජාතිවාදය අවුස්සනවා. මම නැවත වතාවක් මේ කාරණය ආණ්ඩුවට මතක් කරනවා.

ඔබතුමන්ලා හිතනවා නම් මේ රටේ බහුතරයක් ඉන්න බෞද්ධ ජනතාව පාගලා, ඒ පාගන එක අනෙක් ජාතීන්ට ඔප්පු කරලා පෙන්නන්න "අපි ජාතිවාදී නොවෙයි" කියලා; ඒ වැරදිලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
Sir, please give me one more minute. ඔබතුමන්ලා එහෙම හිතනවා නම්, ඒ වැරදිලා. ඒ හින්දා අපි

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

පැහැදිලිව ඔබ තමුන්නාන්සේලාට කියන්නේ, කරුණාකරලා දැන්වත් ඇහුම්කන් දෙන්න කියායි. නායක හාමුදුරුවරු පෙරටු කොටගෙන මහා සංඝරත්නය නුවර ඉඳන් කොළඹට පා ගමනක් ආවා. ලේකම් කෙනෙක් එතැනට ගිහිල්ලා කියනවා, මාසයකින් උත්තරයක් දෙන්නම්ලු. මාසයකින් දෙන්න නොවෙයි, ජනාධිපතිතුමා බදුල්ලේ රැස්වීමේදී එහෙම දෙන්නම් කිව්වා නම් ඉවරයි නේ. එතැනදීත් බොරු කියන්නේ ඇයි? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලිවම අපි මේ ආණ්ඩුවට කියන්නේ මේකයි. කරුණාකරලා මේ බොරුව නවත්වන්න; බොරුව නවත්වන්න.

අධිකරණ ඇමතිතුමා කියනවා මම දැක්කා, "පව්ව ගහගෙන හිටියාට අල්ලන්නේ නැහැ. එක්තරා පව්වයක් විතරක් ගැහුවොත් අල්ලනවා" කියලා. ඒකට පනතක් ඕනෑද? සංවිධානාත්මක අපරාධකරුවන්ගේ ලාංඡනයක පව්වයක් ගහගෙන ඉන්නවා නම් අල්ලන්න පනතක් ඕනෑද? ඒක අල්ලන්න පුළුවන්නේ. ඔබ තමුන්නාන්සේලා තනිකරම මර්දනයට එන්න හදන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සර හිටියා නේ IRC කියලා කොටසක්. නේද? කොණ්ඩේ වවාගෙන හිටියොත්, රැවුල වවාගෙන හිටියොත්, ඔහු IRCකාරයෙක් කියලා අල්ලාගෙන ගිහින් ඇතුළට දානවා. දැන් ඔබ තමුන්නාන්සේලාගේ 1988-89 කාලයේ න්‍යාය පත්‍රය දැන් නීතියක් කරලා ගේන්න හදනවා. ඒ හින්දා අපි පැහැදිලිව ඔබතුමන්ලාට කියනවා, කරුණාකරලා මේ රටේ ජනතාව රවට්ටන්න එපා කියලා. මේ රටේ ජනතාව දැවැන්ත ආර්ථික පීඩනයකින් ඉන්නවා; සමාජ පීඩනයකින් ඉන්නවා. ඒ සඳහා අවශ්‍ය පිළිතුරු දැන්වත් ලබා දෙන්න. එසේ ලබා දෙන්න කටයුතු කළේ නැත්නම් මේ රටේ ජනතාව පාරට බහින එකත් නවත්වන්න බැරි වේවි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Upali Pannilage. You have 11 minutes.

[අ.භා.2.01]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ විවාදයට ප්‍රස්තුත කාරණය වුණේ ප්‍රධාන වශයෙන්ම විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් වෙච්ච කාරණායි. මේ වෙනකොට විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් කළා, රට තුළ උද්ධමනය සියයට 8ක මට්ටමට පැමිණිලා තිබෙනවා කියලා. ඒත් එක්කම රට තුළ සිටින ජනතාවගේ ජීවන බරට යම් බලපෑමක් ඇති වුණා කියන කාරණය පිළිබඳවත් මූලික වශයෙන් කරුණු ඉදිරිපත් කරනු ලැබුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තෝරා ගත් භාණ්ඩ කිහිපයක් පදනම් කරගෙන විපක්ෂයේ මන්ත්‍රීවරු ඒවායේ මිල ඉහළ යෑම පිළිබඳව මෙතැන කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. මූලික වශයෙන් අපි පිළිගන්නවා, විශේෂයෙන්ම 2026 අවුරුද්දේ අගෝස්තු මාසයේදී මේ කියන විධියට ලක්ෂ්‍යමය උද්ධමනය, මිල ඉහළ යෑම සියයට 8ක මට්ටමට පැමිණ තිබෙන බව. හැබැයි, ඒකත් එක්කම අර තෝරා ගත් භාණ්ඩ කිහිපයක් කිව්වා. නමුත්, නොකියපු තව භාණ්ඩ list එකක් තිබෙනවා. ඒවා ඉතාමත් අත්‍යවශ්‍ය භාණ්ඩ. සහල්, සීනි, පරිප්පු, අල, ලූනු වාගේ දේවල් ගත්තොත්, 2024 සැප්තැම්බර් මාසයේ සිට අද වෙනකම් මිල අඩුවෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්තයක් විධියට අපි කල්පනා කරන්න ඕනෑ, අපේ රටේ උද්ධමනය වැඩිවෙලා තිබෙන්නේ ඇයි කියලා. එසේ වැඩි වුණාට පස්සේ වග කිවයුතු ජනතාවාදී ආණ්ඩුවක් විධියට කුමක්ද කළ යුත්තේ කියන කාරණය පිළිබඳවයි අපි ආණ්ඩුවක් විධියට අවධානය යොමු කරන්නේ. මම පොඩි උදාහරණයක් කියන්නම්. 2021 වර්ෂයේදී උද්ධමනය සියයට 10 ආසන්නයට ගියා. ඒ කියන්නේ, සියයට 9.9යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022දී අපේ සාමාන්‍ය උද්ධමනය සියයට 68ට ගියා කියන එක අපට අමතක වෙලා නැහැ. 2025දී අපි ආණ්ඩු බලය ගත්තාට පස්සේ උද්ධමනය පාලනය කරමින් අපි ඒක සියයට 2.1ට ගෙනාවා. ඒ වාගේම, 2026 මුල් මාස අටේ මේ රටේ භාණ්ඩ හා සේවාවන්ගේ මිල ඉහළ යෑමේ වේගය, එහෙම නැත්නම් උද්ධමනය සියයට 5ට ආසන්න මට්ටමක පවත්වාගෙන යන්නට අපට හැකියාව ලැබුණා. වාර්ෂිකව තමයි අපි උද්ධමනය හරියට බලන්න ඕනෑ, වැඩිවෙලා තිබෙනවා ද, නැද්ද කියන එක. මේ අගෝස්තු සහ සැප්තැම්බර් කියන මාස දෙකේ ලක්ෂ්‍යමය උද්ධමනයේ ඇති වෙච්ච මේ විචලනය, මේ චලනයන් ඉතාමත් කෙටි කාලයකදී අපිට පාලනය කර ගැනීමට හැකියාවක් ලැබෙයි කියලා අපේක්ෂා කරනවා. ඒ අනුව අපේ කාර්ය භාරය කුමක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපේ කාර්ය භාරය තමයි, ජන ජීවිතයට බලපාන භාණ්ඩ හා සේවාවන්ගේ මිල ඉහළ යනවා නම්, අන්න ඒ අවස්ථාවේදී ජනතාවට සහන දීලා රැකබලා ගත යුතු ජන කණ්ඩායම් රැකබලා ගන්නා එක. අන්න ඒ ආකාරයට ජන ජීවිතයට ඇතිවෙන බලපෑම අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම තමයි වග කිවයුතු රජයක් විධියට අපේ කාර්ය භාරය වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ රටේ සියලු ජනතාව දන්නවා, ඒ වාගේම මුළු ලෝකයම දන්නවා, මැදපෙරදිග යුද්ධයක් ඇතිවෙලා ඉන්ධන මිල ඉහළ යෑම මඟින් තමයි අපේ රටේ භාණ්ඩ හා සේවාවන්ගේ මිල ඉහළ යෑම මේ වන විට සිද්ධවෙලා තිබෙන්නේ කියලා. ලෝක වෙළෙඳ පොළේ ගෑස් මෙන්ම ඉන්ධනවල මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ ගියා විශේෂයෙන්ම 2026 වර්ෂයේ පෙබරවාරි 28වැනි දිනෙන් පස්සේ ඇති වෙච්ච මැදපෙරදිග යුදමය තත්ත්වය නිසා. එතකොට වග කිවයුතු රජයක් විධියට අපි කුමක්ද කළ යුත්තේ? ලෝක වෙළෙඳ පොළේ මිල ඉහළ යන වේගයටම අපි ජනතාව මත ඒ බර පටවන්නේ නැතිව, ජනතාවට යම් සහනාධාර දෙමින් ඔවුන්ගේ ජීවන තත්ත්වයට ඇති වන බලපෑම අවම කිරීම තමයි වගකිව යුතු රජයක් විධියට අපේ කාර්ය භාරය වන්නේ. ඒ නිසා තමයි ඉන්ධන මිල ඉහළ යෑමත් සමඟම මුල් අවස්ථාවේදී ඩීසල්වල මිල ඉහළ යෑම ඒ විධියටම ජනතාව මත පටවන්නේ නැතිව අපි ඩීසල් ලීටරයකට රුපියල් 100ක සහනාධාරයක් දුන්නේ. ඒ විධියටම පෙට්‍රල් ලීටරයකට රුපියල් 22ක් රජය - භාණ්ඩාගාරය - මඟින් දරාගෙන, පෙට්‍රල් මිල ඉහළ දමන්නේ නැතිව සාමාන්‍ය ජනතාවට වන බලපෑම අවම කිරීමට අපි කටයුතු කළා. අපි එතැනින් නතර වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ අවස්ථාවේත් නැවත වතාවක් ඩීසල් ලීටරයකට රුපියල් 70ක සහනාධාරයක් දීලා, ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඉහළ යනකොට එයින් සාමාන්‍ය ජනතාවට වන බලපෑම අවම කරන්න අපි කටයුතු කළා. අපි දන්නවා, තෙල් මිල ඉහළ ගියාම තෙල් ආශ්‍රිත භාණ්ඩවල මිල ඉහළ යනවා; ඒ ආශ්‍රිත නිෂ්පාදනවල මිල ඉහළ යනවා; ප්‍රවාහන

ගාස්තු ඉහළ යනවා කියා. ප්‍රවාහන ගාස්තු ඉහළ යෑමත් එක්ක භාණ්ඩ ප්‍රවාහනයට යන වියදම් වැඩි වී භාණ්ඩවල මිල ඉහළ යනවා. ඒවා පාලනය කරගැනීම සඳහා අපි පියවර රාශියක් ගෙන තිබෙනවා. මේ මොහොතේත් අපි ඒ පියවර ගනිමින් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම, මා ඉතාම වැදගත් කාරණයක් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂයේ සිටින සමහර මන්ත්‍රීවරු මේ මස මුල් පාර්ලිමේන්තු සතියේත්, අද දිනත් යම් වාර්තාවක් පදනම් කරගෙන අසත්‍ය කරුණු සමාජගත කරන්න උත්සාහ කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝක බැංකුව විසින් 2026 අප්‍රේල් මාසයේ දත්ත පදනම් කරගෙන 2026 අගෝස්තු මාසයේ 17වැනි දා වාර්තාවක් ඉදිරිපත් කළා, "Macro Poverty Outlook for Sri Lanka: April, 2026" කියලා. මේ වාර්තාවේ ඉතා පැහැදිලිව අපේ රටේ දරිද්‍රතාවයේ ස්වභාවය පිළිබඳ කරුණු කිහිපයක් ඉදිරිපත් කරනවා. මේ වාර්තාවේ ප්‍රධාන වශයෙන් කාණ්ඩ 3ක් යටතේ දරිද්‍රතාව පිළිබඳ කරුණු ඉදිරිපත් කරනවා. පළමු කාණ්ඩය තමයි, international poverty rate එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් ලෝක බැංකුව විසින් international poverty rate එක ගණනය කරන්නේ දවසකට ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 3ට වඩා අඩු ආදායම් තිබෙන රටවල් සම්බන්ධවයි. International poverty rate එක අනුව අපේ රටේ දරිද්‍රතාව 2021දී සියයට 20.8යි. එය 2026 වෙනකොට සියයට 6.9ක්, 2027දී සියයට 6.5ක්, 2028දී සියයට 6.2ක් විධියට තමයි ගණනය කර තිබෙන්නේ. දැන් මේ ගැන කිසිම කථාවක් කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ වාර්තාවේ තිබෙන දෙවැනි කාණ්ඩය තමයි, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 4.2ට වඩා අඩු දෛනික ආදායම් ලබන රටවල්. ඒ රටවලට අපි කියනවා, lower middle-income රටවල් කියලා. එතකොට මේ lower middle-income poverty rate එක ගණනය කරන්නේ ඇමෙරිකානු ඩොලර් 4.2ට වඩා අඩුවෙන් දෛනික ආදායම් ලබන රටවල් සම්බන්ධවයි. ඒ කාණ්ඩයට තමයි සාමාන්‍යයෙන් ලංකාව ඇතුළත් වන්නේ. ඒ අනුව, 2023දී සියයට 27.6යි. 2026 වෙනකොට ඒක සියයට 20.1 දක්වා අඩුවෙලා තිබෙනවා. මේ වාර්තාවේම පුරෝකථනය කරලා තිබෙනවා, 2027දී සියයට 19.5ක්, 2028දී සියයට 18.9ක් විධියට මේක අඩු වෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කනගාටුයි කියන්න, මේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් වාගේම විපක්ෂ නායකතුමාත් මේ වාර්තාව උපුටා දැක්වූවා. එය උපුටා දක්වමින් මම මේ කියන තුන්වැනි කාණ්ඩය විතරක් පදනම් කරගෙන අසත්‍ය කරුණු සමාජගත කරන්න හැදුවා. මම දැක්කා, සමහර මාධ්‍ය නාළිකා ඒක පාවිච්චි කරපු ආකාරය. මේ පාර්ලිමේන්තුවේ නැති දේශපාලන පක්ෂ නියෝජිතයනුත් මේ අසත්‍ය කරුණු සමාජගත කරන්න උත්සාහ කළා.

මෙන්න මේ කරුණ විතරයි ඔවුන් ගත්තේ. ඒ කියන්නේ, අර upper middle-income රටවල්. ඒ කාණ්ඩයට දෛනික ඒකපුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 8.3 සීමාවේ ඉන්න රටවල් අයත් වෙනවා. මෙන්න, මේ කාණ්ඩයේ දත්ත අරගෙන අපේ රටේ දිළිඳුකම වැඩි වෙනවාය කියා අසත්‍ය කරුණු සමාජගත කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ කාණ්ඩය අනුව එක් පුද්ගලයෙකුගේ මාසික ආදායම රුපියල්වලට හරවා ගත්තොත්, සාමාන්‍යයෙන් රුපියල් 82,170ක් වෙන්න ඕනෑ. පවුලක 4දෙනෙක් ඉන්නවා කියලා ගත්තොත්, ඒ පවුලේ මාසික ආදායම රුපියල් 328,680ට වඩා අඩුයි නම් තමයි මෙන්න මේ කාණ්ඩයට වැටෙනවා කියලා කියන්න පුළුවන් වෙන්නේ. ඒ අනුව, වැරදි තොරතුරු පදනම් කරගෙන අපේ රටේ දරිද්‍රතාව ඉහළ යනවාය කියන කාරණය සමාජගත කරන්න උත්සාහ කළා. මේ ලෝක බැංකු වාර්තාවේම ඉතා පැහැදිලිව කියා තිබෙනවා, අපි අයත් වන කාණ්ඩය මොකක්ද කියලා. ප්‍රතිශතයක් වශයෙන් ගත්තාම අපේ රටේ දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාව 2023දී සියයට 27.6 සිට 2026දී සියයට 20.1 දක්වා අඩුවෙලා තිබෙනවා. එය 2027දී සියයට 19.5 දක්වාත්, 2028දී සියයට 18.9 දක්වාත් අඩු වන බව තමයි මේ වාර්තාව මඟින් පැහැදිලි කර තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය තමයි, මම කලින් කිව්වා වාගේ අපේ රටේ සාමාන්‍ය ජීවන තත්ත්වය, ඒ කියන්නේ භාණ්ඩ හා සේවාවන්ගේ මිල ඉහළ යනවා නම් අපි කුමක්ද කළ යුත්තේ කියන එක. මම කලින් කිව්වා වාගේ සමාජයේ පහළම ස්තරවල ඉන්න කණ්ඩායම්වලට මේ බලපෑම ඇති වන එක අපි අවම කරන්න ඕනෑ. ඒ නිසා තමයි අපි සමාජයේ පහළ ස්තරවල ඉන්න ජනතාවට ලබා දෙන සහනාධාර ප්‍රමාණය වැඩි කළේ. අපේ රටේ සියයට 24ක ජනතාවක් ගොවිතැනින් ජීවත් වනවා. ඒ නිසා තමයි ඔවුන්ට වී ගොවිතැන සඳහා හෙක්ටෙයාරයකට ලබා දෙන පොහොර සහනාධාරය වන රුපියල් 15,000 සිට රුපියල් 30,000 දක්වා වැඩි කළේ. ක්ෂේත්‍ර භෝග සඳහාත් හෙක්ටෙයාර දෙකක උපරිමයකට යටත්ව ඒ විධියටම පොහොර සහනාධාරය ලබා දුන්නා. ගොවි පවුලකට විතරක් හෙක්ටෙයාර දෙකක් සඳහා රුපියල් 60,000ක පොහොර සහනාධාරයක් අපි ලබා දෙනවා. අන්න එතකොට ගොවි නිෂ්පාදනවල මිල අඩු කරන්න පුළුවන්. ඒක එක පැත්තක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි ධීවරයන්ටත් සහනාධාර ලබා දුන්නා. ඒ වාගේම මේ රටේ දිළිඳු සහ අන්ත දිළිඳු කණ්ඩායම් වන අස්වැසුම ආධාර ලබන කණ්ඩායම්වලට අපි විශේෂ ආධාර ලබා දුන්නා. මේ සිදුවීම වුණේ මේ අවුරුද්දේ මාර්තු මාසයේ. අපි අප්‍රේල් මාසයේ අස්වැසුම ප්‍රතිලාභ දීමනාව විධියට මාසයකට රුපියල් 17,500ක් ලබන අයට රුපියල් 25,000ක දීමනාවක් ලබා දුන්නා. ඒ වාගේම අස්වැසුම ප්‍රතිලාභ දීමනාව විධියට රුපියල් 10,000ක් ලබන අයට රුපියල් 15,000ක දීමනාවක් අපි ලබා දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න ඒ වාගේ සමාජ කණ්ඩායම් බලාගැනීම සඳහා අපි කටයුතු කළා. ඒ වාගේම ඉදිරි මාස තුනට අස්වැසුම ප්‍රතිලාභ දීමනාව ලබන අඩු ආදායම්ලාභී කණ්ඩායම්වලට -අන්ත දිළිඳු සමාජ කණ්ඩායම් සහ දිළිඳු කණ්ඩායම්වලට- මාසිකව ලබා දෙන මේ ආධාරය ලබන නොවැම්බර් මාසයේ සහ දෙසැම්බර් මාසයේ තවදුරටත් වැඩි කිරීම සඳහා අපි මේ වනකොට තීරණය කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා උද්ධමනය - භාණ්ඩ හා සේවාවන්ගේ මිල ඉහළ යෑම- ගැන අපට හුදෙකලා කරලා කථා කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වගකිව යුතු ජනතාවාදී රජයක් විධියට උද්ධමනය පාලනය කරන්න අපි අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද, ඒ වාගේම උද්ධමනය නිසා ජනතාවට ඇතිවන බලපෑම අවම කරන්න අපි කටයුතු කරන්නේ කෙසේද කියන එක තමයි ඉතාම වැදගත් වන්නේ.

අනෙක් පැත්තෙන් ගත්තාම, අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළා, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූලික වැටුප වැඩි කළා, වතු කම්කරු ජනතාවගේ වැටුප් වැඩි කළා. අපි මේ සියල්ල හරහා ජනතාවට වන බලපෑම අඩු කරලා තිබෙනවා. ඒ වාගේම අපි කිසිම ආකාරයකින් බදු වැඩි කළේ නැහැ. අපි බලයට එනකොට සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ 12ට තිබුණු වාර්ෂිකව බදු නිදහස් කිරීමේ සීමාව අපි රුපියල් ලක්ෂ 18 දක්වා වැඩි කළා. මාසිකව ගත්තොත්, එම සීමාව රුපියල් 100,000 සිට රුපියල් 150,000 දක්වා වැඩි කළා. මේ සියල්ල හරහා අපි උත්සාහ කරන්නේ ඉහළ යන ජීවන වියදම පාලනය කරලා ඒකෙන් ජනතාවට වන බලපෑම අවම කිරීමටයි.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මම අවසාන වශයෙන් කියනවා, අපි ජනතාවාදී, ඒ වාගේම වගකිව යුතු රජයක් විධියට මේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව ඉතා හොඳින් අධ්‍යයනය කරමින්, විශ්ලේෂණය කරමින් මේ රටේ ජනතාවට එයින් වන බලපෑම හැකිතාක් අවම කර ගැනීම සඳහා මේ වනකොටත් ක්‍රියාමාර්ග රාශියක් ගෙන තිබෙන බව. ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, ජනතාවට ඇතිවන මේ බලපෑම අවම කිරීම සඳහා ලබන මාසයේ ඉදිරිපත් කරන 2027 වර්ෂයේ අය වැය තුළින් මීටත් වඩා ක්‍රියාමාර්ග ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) V.S. Radhakrishnan. You get seven minutes to speak on the Debate before the House.

[பி.ப. 2.14]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று ஐக்கிய மக்கள் சக்தியினரால் கொண்டுவரப்பட்டு இருக்கின்ற நாட்டின் தற்போதைய நிலைமை சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு ஒருசில விடயங்களைப் பேசலாமென நினைக்கின்றேன்.

அண்மைக் காலத்தில் இந்த நாட்டில் ஏற்பட்ட பல்வேறு பிரச்சினைகள் பற்றி நான் இந்தச் சபையில் சொல்லலாமென நினைக்கின்றேன். சவூதி அரேபியாவில் அனோஜன் என்ற இளைஞனுக்கு மரண தண்டனை விதிக்கப்பட்டு இருந்தது. அந்தத் தண்டனையைக் குறைப்பதற்கு அல்லது நீக்குவதற்கு நடவடிக்கை எடுத்த மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் வெளிநாட்டலுவல்கள் அமைச்சர் கௌரவ விஜித ஹேரத் அவர்களுக்கும் எமது நாட்டிலிருந்து சவூதி அரேபியாவுக்குச் சென்ற சட்டத்தரணிகளுக்கும் எங்களுடைய நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். இது இந்த நாட்டுக்கு முன்மாதிரியான ஒரு செயலாகும். ஒருவரை மரண தண்டனை யிலிருந்து காப்பாற்றுவதற்கு நடவடிக்கை எடுத்ததற்காக நாங்கள் அரசாங்கத்தைப் பாராட்ட வேண்டும்.

அதேநேரத்தில், மதகுருமாரின் ஆடையைக் களைவது என்பது, இந்த நாட்டில் இன்னொரு பிரச்சினையாக இருந்தது. இது தொடர்பில் அரசாங்கம் ஆரம்பத்தில் எடுத்த சில தீர்மானங்கள் பிழையாக இருந்தாலும், பிறகு அதைக் களையக்கூடாதென எடுத்த தீர்மானம் வரவேற்கக்கூடியது. அது பௌத்த மதத்துக்கு மட்டுமல்லாமல், இந்து, முஸ்லிம், கிறிஸ்தவ மதங்களுக்கும் உரித்தாக வேண்டும். இது தொடர்பான சட்டத்தைக் கொண்டுவரும்பொழுது அது எல்லோருக்கும் சமமாக இருக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். மாண்புமிகு சனாதிபதி அவர்கள் சொல்கின்றார், "சட்டம் எல்லோருக்கும் சமம்" என்று. ஆகவே, இது எல்லா மக்களுக்கும் சமமாக இருக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். அதுமட்டுமல்ல, இந்த நாட்டில் சமத்துவம் எல்லோருக்கும் இருக்க வேண்டும். அது சிங்களவர்களாக இருந்தாலும் சரி, தமிழர்களாக இருந்தாலும் சரி, முஸ்லிம்களாக இருந்தாலும் சரி, கிறிஸ்தவர்களாக இருந்தாலும் சரி! எல்லோருக்கும் சமமான முறையில் அது இருக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம். அரசாங்கம் செய்கின்ற நல்ல வேலைகளை ஏற்றுக்கொள்கின்ற அதேவேளை, அரசாங்கம் நடைமுறைப்படுத்துகின்ற சில விடயங்களிலுள்ள குறைகளைச் சுட்டிக்காட்ட வேண்டிய பொறுப்பு எதிர்க்கட்சி என்ற அடிப்படையில் எங்களுக்கு இருக்கின்றது. விசேடமாக, அரசாங்கம் கடந்த தேர்தல் காலங்களில் பல்வேறு வாக்குறுதிகளைக் கொடுத்தாலும், இன்று அவற்றை நிறைவேற்ற முடியாமல் திணறுகின்றது என்பதுதான் உண்மையான விடயமாகும்.

இன்று நாட்டில் பணவீக்கம் 8 சதவீதமாக அதிகரித்து இருக்கின்றது. அமைச்சர் சொல்கின்றார், 'இல்லை' என்று. ஆனால், Central Bank சொல்கின்றது, பணவீக்கம் 8 சதவீதமாக இருக்கின்றது என்று. ஒரு நாட்டில் பணவீக்கம் 5 சதவீதத்துக்கும் மேல் சென்றால், அந்த நாட்டில் வறுமைக் கோட்டுக்குக்கீழ் வாழுகின்ற மக்களின் எண்ணிக்கை அதிகமாகும். இன்று இலங்கையில் வறுமைக் கோட்டுக்குக்கீழ் வாழுகின்ற மக்கள் அதிகமாக இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. இதற்குக் காரணம், அண்மைக் காலத்தில் பொருட்களின் விலை அதிகமாக உயர்ந்து இருப்பதுதான். பொருட்களின் விலை உயர்வுக்கு, டீசல், பெற்றோலின் விலை அதிகரிப்பும் ஒரு காரணமாக இருக்கலாம். வெளிநாடுகளில் யுத்தம் நடந்துகொண்டு இருப்பதால் டீசல், பெற்றோலின் விலை அதிகரித்து இருக்கின்றது. ஆனாலும்கூட, மக்கள் மீதான வரிச்சுமை அதிகமாக இருக்கின்றது; மக்களின் பிரச்சினைகளும் அதிகமாக இருக்கின்றன. எங்களைச் சார்ந்த மக்களுக்குப் பிரச்சினைகள் அதிகமாக இருப்பதற்குக் காரணம், இந்த விலை அதிகரிப்பு ஆகும். அதை அரசாங்கம் கண்டுகொள்ளாமல் இருப்பதுதான் எங்களுக்கு வருத்தமாக இருக்கின்றது.

விசேடமாக, இன்று ஒரு கிலோகிராம் பருப்பின் விலை 230 ரூபாயிலிருந்து 260 ரூபாயாக உயர்ந்திருக்கின்றது; 900 ரூபாயாக இருந்த ஒரு கிலோகிராம் பயறு, 1,050 ரூபாயாக உயர்ந்திருக்கின்றது. ஒரு லீற்றர் தேங்காய் எண்ணெயின் விலை 100 ரூபாயால் அதிகரித்து இருக்கின்றது. அதேபோல், ஒரு கிலோகிராம் மிளகாயின் விலை 150 ரூபாயால் அதிகரித்து இருக்கின்றது. இப்பொழுது வெளிநாட்டிலிருந்து கொண்டு வரப்படும் மிளகாயானது, harbourஇல் இறக்கிய பின்னர், check பண்ணுவதற்காக labக்கு அனுப்பப்படுகின்றது. அந்த report வருவதற்கு அதிக காலமெடுக்கிறது. அதுவரைக்கும் அந்த மிளகாய் harbourஇல் இருப்பதால் வெளிநாடுகளிலிருந்து வருகின்ற மிளகாய்க்குத் தட்டுப்பாடு ஏற்படுகின்றது. இதுதான் மிளகாயின் விலை அதிகரிப்பதற்குக் காரணமாக இருக்கின்றது. எனவே, இது தொடர்பில் அரசாங்கம் கவனம் செலுத்தி, lab reportஐ விரைவாகக் கொடுப்பதற்கு உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்கள் இங்கு இருக்கிறார். அவருக்குத் தெரியும், எதிர்வரும் 8ஆம் திகதி முழு உலகிலும் தீபாவளி கொண்டாடப்பட இருக்கின்றது என்பது. மலையகத் திலுள்ள அதிகமான மக்கள் தீபாவளியைக் கொண்டாடு வார்கள். இதன்போது அவர்களுக்கு பருப்பு, பயறு, மிளகாய் போன்ற பொருட்கள் மிகவும் முக்கியமானது. இவற்றின்

விலை அதிகரித்து இருப்பதன் காரணமாக அவர்களால் அப்பண்டிகையைக் கொண்டாட முடியுமா? என்ற பிரச்சினை எழுந்திருக்கின்றது. மலையக மக்கள் கொண்டாடுகின்ற மிக முக்கியமான பண்டிகை தீபாவளி ஆகும். இன்று ஒரு கிலோகிராம் கோதுமை மாவின் விலை 22 ரூபாயால் அதிகரித்து இருக்கின்றது. நீங்கள் கொடுத்திருக்கின்ற 200 ரூபாய் சம்பள அதிகரிப்பு கோதுமை மா வாங்குவதற்கே போதாது. ஆகவே, இந்தக் காலத்தில் மேற்குறித்த பொருட்களின் விலையைக் குறைப்பதற்கு உரிய நடவடிக்கை எடுக்க வேண்டும் என்பது என்னுடைய கருத்தாக இருக்கின்றது.

பெருந்தோட்டத் துறைக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் இங்கு இருப்பதால், நான் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, இன்று தோட்டங்களில் 17-18 கிலோகிராம் தேயிலைக் கொழுந்து பறித்தால், அரை நாளுக்குரிய சம்பளம்தான் கொடுக்கிறார்கள். இவ்வாறு கொடுக்கும்போது, அரசாங்கத்தால் கொடுக்கப்படுகின்ற 200 ரூபாயில் 100 ரூபாய்தான் கிடைக்கின்றது. இதுவும் அவர்களுக்கு நட்டத்தையே ஏற்படுத்துகின்றது. இவ்வாறான சூழ்நிலையில், அந்தத் தோட்டத்தொழிலாளர்களுக்கு அரை நாளுக்குரிய சம்பளம் என்றால், 800 ரூபாயும் கொடுப்பனவு 100 ரூபாயும் சேர்த்து 900 ரூபாய்தான் கிடைக்கின்றது. கௌரவ அமைச்சர் அவர்கள் இதனைக் கருத்திலேகொண்டு, உரிய நடவடிக்கை எடுப்பதற்கு ஆவன செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

இந்த நாட்டில் முப்பது வருடங்கள் யுத்தம் நடந்தது. அப்போது வட, கிழக்கில் இருந்த தமிழர்களில் அதிகமானோர் இங்கே இருக்க முடியாதென வெளிநாடுகளுக்குப் போனார்கள். இன்றைக்கு அவர்கள் அங்கு settleஆகி இருக்கிறார்கள். இந்த நாட்டில் Colombo Port City என்ற ஒன்றை உருவாக்கி இருப்பதால், இன்றைக்கு சீன நாட்டவர்கள் நிறையப் பேர் எமது நாட்டுக்கு வந்திருக்கிறார்கள். இதன் காரணமாக, கொள்ளுப்பிட்டி, பம்பலப்பிட்டி, வெள்ளவத்தை போன்ற பகுதிகளில் எங்களுடைய மக்கள் வீடுகளை வாடகைக்கு எடுக்க முடியாத நிலையுள்ளது; சாதாரண business செய்ய முடியாதுள்ளது. ஏனென்றால், சீன நாட்டவர்கள் 100 ரூபாய் சொன்னால் 300 ரூபாய்க்கு வாங்குகிறார்கள். அதேபோல், ஓர் இலட்சம் ரூபாய் சொன்னால் 3 இலட்சம் ரூபாய்க்கு வாங்குகிறார்கள். இதனால் அங்கிருக்கின்ற தமிழர்களுக்கோ, சிங்களவர்களுக்கோ, முஸ்லிம்களுக்கோ எந்தவொரு propertyஐயும் வாங்க முடியாத நிலை இருக்கின்றது. இதனைக் கருத்திற்கொண்டு எதிர்காலத்தில் நம்முடைய இனத்தவர் களுக்கும் - தமிழர்கள், சிங்களவர்கள், முஸ்லிம்கள் - சந்தர்ப்பம் வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். இன்னொரு நாட்டைச் சேர்ந்த வர்களை - சீனர்களை - இங்கே கொண்டுவந்து, அவர்களுக்கு முதலிடம் கொடுப்பதிலோ, அவர்களுடைய businessஐ விஸ்தரிப்பதிலோ எங்களுக்குப் பிரச்சினை இல்லை. ஆனால், நாங்களும் இந்த நாட்டில் உரிமையோடு வாழ வேண்டும் என்பதைப் புரிந்துகொள்ள வேண்டுமெனக் கேட்டு, என்னுடைய பேச்சை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.21]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය විසින් ගෙනාපු සභාව කල්තැබීමේ යෝජනාව පිළිබඳව තමයි අද විවාද කරන්නේ. මේ රටේ පසුගිය ඉතිහාසයට සාපේක්ෂව බලනකොට මේ වනවිට ජනතාවට සියලු සහන ලැබිලා තිබෙනවාය කියලා මම කියන්නේ නැහැ. නමුත් ජීවන වියදම ඉහළ ගිහිල්ලා තිබුණු අවස්ථා, මීට වඩා බරපතළ අවධි මිනිස්සු පසු කරලා තිබෙනවා. ඒ වාගේම විපක්ෂය අද මේ නඟන ප්‍රශ්නය, විපක්ෂයේ ක්‍රියාකාරින්ටත් තිබෙන්න පුළුවන්. හැබැයි, සාමාන්‍ය ජනතාව දන්නවා, මිනිසුන්ට දෙන්න පුළුවන් සහන ලබා දෙන්න වර්තමාන ජනාධිපතිතුමා වන අනුර කුමාර දිසානායක මැතිතුමාගේ මේ ආණ්ඩුව උත්සාහ ගන්නවා කියලා.

හැබැයි, මම එක කාරණයක් පිළිගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. යම් යම් පිරිස්වල සහන කපලා තිබෙනවා, අපේ ආණ්ඩුව. යම් යම් පිරිස්වල සහන කපලා තිබෙනවා. තවත් පිරිසකට සහන දීලා තිබෙනවා. එතකොට මේ විපක්ෂයෙන් නඟන චෝදනාව එතුමන්ලාගේ පැත්තෙන් සාධාරණයි. මොකද, ඒ සහන කැපුණු ගොඩට අහු වෙලා තිබෙන්නේ මෙතුමන්ලා. සහන ලැබුණු ගොඩේ ජනතාව ඉන්නවා. මම ඒ ගැන පැහැදිලි කරන්න කැමැතියි. මේ රටේ වරප්‍රසාද අහිමි කරපු, සහන කපපු කණ්ඩායම ගත්තොත්, මේ කණ්ඩායම ඉන්නකොට අත් ඔසවලා සම්මත කරලා තිබුණා, 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත කියලා එකක්. අපි ඇවිල්ලා ඒක අහෝසි කළා. දැන් මෙතුමන්ලාගේ සහන කැපුණා. මෙතුමන්ලාගේ උද්ධමනය වැඩි වෙලා ඇති. ඒ නිසා අමාරුවක් ඇති කියන එක අපි පිළිගන්නවා.

ඊළඟට, මේ රටේ විශ්‍රාමික ජනාධිපති වරප්‍රසාද සම්බන්ධයෙන් පනතක් තිබුණා. සැහෙන බෙදා හදා ගත්තා. 2025 සැප්තැම්බර් 10වැනි දා, 2025 අංක 18 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත ගෙනැල්ලා අපි ඒකත් කැපුවා. දැන් ඒ පැත්තට යම් උද්ධමනයක් ඇති. ඒ නිසා අමාරුවක් ඇති. ඒක මේ රටේ ජනතාව සතුටෙන් භාර ගත්තේ. මේ කට්ටිය ආණ්ඩු කරපු සෑම කල්හිම තීරු බදු රහිත වාහනයක් මන්ත්‍රීවරුන්ට හම්බ වුණා. තීරු බදු රහිත වාහනය දෙන එක අපි නැවැත්වූවා. ඒ නිසා දැන් අසහනයක් ඇති. ඒක අපි පිළිගන්නවා. සහනයක් කැපිලා තිබෙනවා. ඊට පස්සේ අපි ඇමති මණ්ඩලය අඩු කළා. ඇමතිවරුන්ට නිල නිවාස ලබා දීම නැති කළා. ඒවායේ අධිකරණ විවෘත කළා. එතකොට මෙතුමන්ලා හිතනවා ඇති, අනාගතයේදී - හීනෙන් හරි - ආණ්ඩුවක් එයි කියලා. එතකොට ඇමති නිල නිවාස නැති වෙනවා. ඒ නිසා යම් අසහනයක් ඇති, ප්‍රශ්නයක් ඇති. මම හිතනවා, මේ රටේ ජනතාව ඒ කාරණය තේරුම් ගනීවි කියලා. ඊට පස්සේ ජනාධිපතිවරයාට තිබුණා, රට පුරා ජනාධිපති මන්දිර. දැන් ඒවායේ විශ්වවිද්‍යාල විවෘත වෙනවා, සංචාරක හෝටල් ආරම්භ කරන්න නියමිතව තිබෙනවා. ඉතින්, වෙන්න ඉන්න ජනාධිපතිලාට අසහනයක් ඇති, ප්‍රශ්නයක් ඇති. එහෙම සිහින දකින අය ඉන්නවා නේ. නමුත්, ජනතාවට ප්‍රශ්නයක් නැහැ. එම නිසා ඒ කාරණය තේරුම් ගන්න කියලා මම කියන්න කැමැතියි.

අපි මේ රටේ බලයට එනකොට ඔබතුමන්ලා හදපු චක්‍රලේඛනවලට අනුව ඇමතිවරයෙකුට තිබුණා, මාසයකට තෙල් ලීටර 2,200ක්. ඒ, අමාත්‍යාංශයෙන් දෙන ප්‍රමාණය. ඒක ලීටර

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

900ට අඩු කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් ඒ චක්‍රලේඛන හදලා තිබෙන්නේ. "වෙන්න ඇමති" හරි, මෙතුමන්ලාට හීනයක් ඇති නේ. නමුත් "වුණත් නැහැ" කියනකොට ප්‍රශ්නයක් එනවා. අසහනයක් ඇති. සහන කැපුවා. ඒ නිසා අපි පිළිගන්නවා, එහෙම වුණා කියලා. මෙතුමන්ලා අත ඔසවලා හදලා තිබුණා, ජනතා බදු මුදලෙන් මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂ 10ක රක්ෂණාවරණයක් දෙන්න. අපි ඒ රක්ෂණාවරණය රුපියල් ලක්ෂ දෙකහමාරට අඩු කළා. කැන්ටිමේ රුපියල් 150ට තිබුණු කෑම එකක මිල රුපියල් 2,000ට විතර වැඩි වුණා. ඒ නිසා අසහනයක් ඇති, ප්‍රශ්නයක් ඇති. අපි ඒක පිළිගන්නවා. ඒ ඔක්කෝම අපි කැපුවා. හැබැයි, මේ රටේ ජනතාව සන්තෝෂයෙන් ඉන්නවා.

ජනාධිපති අරමුදල කියලා එකක් තිබුණා. නමට ජනාධිපති අරමුදල වුණාට ඒක පසුගිය ඉතිහාසයේ මැති ඇමතිවරුන්ගේ අරමුදල වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලා දන්නවා, 2023-2024 කාලයේ ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂ 1,314ක් හිටපු පළාත් සභා මන්ත්‍රීවරු, හිටපු පාර්ලිමේන්තු මැති ඇමතිවරු වෛද්‍යාධාර විධියට ගත් බව. ජනාධිපති අරමුදල පනතේ තිබෙන්නේ කොහොමද? දිළිඳු අයට සෞඛ්‍ය සහන සහ දිළිඳු අයට අධ්‍යාපන සහන ගැන. දිළින්දෝ ටික මේ ඉස්සරහින් ඉන්නේ. ඒ කට්ටිය රුපියල් ලක්ෂ ගණන් ගත්තා. දැන් ඒවා කාටවත් නැහැ. මේ අවුරුදු දෙකේ කවුරු හරි මැති ඇමති කෙනෙක් ජනාධිපති අරමුදලෙන් මොනයම් හෝ ආධාරයක් අරගෙන තිබෙනවා නම් කියන්න. අද ඔබතුමන්ලාගේ නම් මෙතැන හෙළිදරව් කරලා තිබෙනවා. සහන කැපුණා. අනාගතයේදීවත් ගන්න බැහැ කියලා හිතෙනවා, සිහින දකිනවා නම්. ඒ නිසා අමාරුවක් ඇති, වේදනාවක් ඇති. නමුත් කරන්න දෙයක් නැහැ. කොත්තමල්ලි නොවෙයි, ජාපාල බීලා තිබෙන්නේ. ඒකයි අපට කියන්න වෙන්නේ. සහන කැපුණේ ඒ පැත්තේ.

මම දැන් කියන්නම්, ජනතාවට දීපු සහන ගැන. ඔතැනින් කපලා, භාණ්ඩාගාරයට අරගෙන මෙතැනින් බෙදුවා. කාටද බෙදුවේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපේ උපාලි පන්නිලගේ ඇමතිතුමාත් ඒ ගැන පැහැදිලි කළා. ඔබතුමන්ලා මේ රට පාලනය කරලා, අපට භාර දෙනකොට අස්වැසුම දීමනාව වශයෙන් තිබුණේ කීයද? අස්වැසුම දීමනාව වශයෙන් ඔබතුමන්ලා උපරිම ලෙස දුන්නේ රුපියල් 15,000යි. දැන් කීයද? රුපියල් 17,500යි. පසුගිය සිංහල-හින්දු අලුත් අවුරුද්දට අපි ඒ දීමනාව රුපියල් 25,000 කළා. පසුගිය ඔක්තෝබර් මාසයේ විතරක් පවුල් 197,728කට රුපියල් බිලියන 11.16ක් අපි අස්වැසුම දීමනාව ලෙස බෙදා තිබෙනවා. ජනතාවට අස්වැසුම දීමනාව ලෙස අපි එවැනි මුදලක් බෙදා තිබෙනවා. ඒවා අඩු කරලා නැහැ.

ඔබතුමන්ලා අවුරුදු 76ක් මේ රට පාලනය කරලා, ඩිංග ඩිංග වැඩි කරලා, වැඩිහිටි දීමනාව වශයෙන් වැඩිහිටියන්ට දීපු මාසික ආධාරය කීයද? රුපියල් 3,000යි. ඔබතුමන්ලා අවුරුදු 76ක් මේ රට පාලනය කරලා දුන්නේ රුපියල් 3,000යි. අපි බලයට පත් වෙලා අවුරුදු 2ක් ගත වනකොට ඒ ප්‍රමාණය කීයට වැඩි කළාද? ඒ දීමනාව රුපියල් 5,000ක් කළා. ඔබතුමන්ලා ආබාධ සහිත ප්‍රජාවට අවුරුදු 76ක් ගත වෙලාත් දීපු මුදල කීයද? රුපියල් 7,500යි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි අවුරුදු 2ක් තුළ ඒ දීමනාව කීයකට ගෙනාවාද? රුපියල් 10,000ට ගෙනාවා. ඔබතුමන්ලා අවුරුදු 76ක් මේ රට පාලනය කරලා අවසානයේ බැටන් එක අපට භාර දෙනකොට වකුගඩු රෝගියෙකුට දුන් මාසික ආධාරය කීයද? රුපියල් 7,500යි. අපි බලයට පත් වෙලා අවුරුදු 2ක් ගත වනකොට ඒ දීමනාව කීයක් කළාද? රුපියල් 10,000ක් කළා. ඉතින්, කොහොමද අපි සහන නොදුන්නා කියන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිළිගන්නවා, ඒ මුදල මදි කියලා. මේ රටේ ජනතාව මෙහෙම දෙයක් දන්නවා. සාමාන්‍යයෙන් අපේ රටේ සංස්කෘතිය තුළ කථාවක් තිබෙනවා, අම්මලා තාත්තලා දරුවන්ට ආදරෙයි නම් ගෙදර තිබෙන දේවල් දරුවන්ට දීලා, සමහර වෙලාවට අම්මලා තාත්තලා දංකුඩ කනවා, කන්නේ නැතිව ඉන්නවා කියලා. ගම්වල එහෙම කරනවා. හැබැයි, ඉස්සර තිබුණේ කොහොමද දන්නවාද? දරුවන්ට නොදී දෙමව්පියන් කෑවා, පාලකයෝ කෑවා. මම ඉස්සෙල්ලා කිව්වේ ඒවා තමයි. දැන් එහෙම නොවෙයි. ජනාධිපතිතුමාගේ ඉඳලා තිබෙන දේවල්, තමන්ගේ දේවල් කප්පාදු කරගෙන මෙන්න මේ විධියට ජනතාවට සහන ලබා දෙනවා. එතකොට ඒ වේදනාව ඔබතුමන්ලාට ඇති; ජනතාවට යම් සතුටක් ඇති. අවබෝධයක් තිබෙන අය ඒ ගැන තේරුම් ගන්නවා.

අස්වැසුම ලබන පවුල්වල දරුවෙකුට අධ්‍යාපන කටයුතු කර ගන්න පසුගිය අවුරුදුවල හැම ජනවාරි මාසයකම අපි රුපියල් 6,000 ගාණේ දුන්නා. ඔබතුමන්ලා අවුරුදු 76ක් මේ රට පාලනය කරලා, පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වන දිළිඳු පවුල්වල දරුවන්ට මාසය ගාණේ දුන්නේ කීයද? රුපියල් 750යි. අවුරුදු 76යි, රුපියල් 750යි! අපි බලයට පත් වෙලා අවුරුදු 2යි, දැන් රුපියල් 1,500යි; දෙගුණ කළා. ඔබතුමන්ලා පෙර පාසල් දරුවන්ට දිවා ආහාරය වෙනුවෙන් ලබා දීපු රුපියල් 60, අපි රුපියල් 100 කළා.

ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ කඳුළු ගෑස් කාලා, බැටන් ප්‍රහාරවලට ලක් වෙලා, පොලිස් අත්අඩංගුවට පත් වෙලා, මැරුම් කාලා, මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 50කින්, රුපියල් 30කින් වැඩි කරගෙන, ඔබතුමන්ලා අපට රට භාර දෙනකොට එම දීමනාව තිබුණේ රුපියල් 5,000ට. අපේ පාලන කාලයේදී ශිෂ්‍යයෝ පාරට බැස්සේ නැහැ. බැටන් පොලු ප්‍රහාර එල්ල වුණේ නැහැ. කඳුළු ගෑස් වැදුණේ නැහැ. දැන් ඒ රුපියල් 5,000 කීයද? අවුරුදු 76ට රුපියල් 5,000යි, අවුරුදු 2ට රුපියල් 10,000යි. ඉතින්, ඔබතුමන්ලාට යමක් තේරෙන්නේ නැද්ද කියායි මම අහන්නේ. ඒ නිසා කුහක වෙන්න එපා. නිකම් නොදන්නා විධියට යෝජනා ගෙනැල්ලා ඒවා වහන්න හදන්න එපා. සත්‍ය වසන් කරන්න හදන්න එපා. දැන් මාසික මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 10,000යි.

මේ රටේ රාජ්‍ය සේවකයෙකුට රුපියල් 24,250ට තිබුණු අවම මූලික වැටුප අපි පසුගිය අවුරුද්දේ රුපියල් 40,000 දක්වා වැඩි කළා. ඔබතුමන්ලා අවුරුදු 76ක් මේ රට පාලනය කරලා, ගොවියාට පොහොර එක එක විධියට දීලා, අපට රට භාර දෙනකොට හෙක්ටෙයාරයකට පොහොර සහනාධාරය වශයෙන් ලබා දුන්නේ කීයද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? රුපියල් 15,000යි. අවුරුදු 76ට රුපියල් 15,000යි. දැන් කීයද? වසර 2ක් අවසන් වනකොට රුපියල් 25,000යි. මේ යල කන්නයට පොහොර සහනාධාරය වශයෙන් හෙක්ටෙයාරයකට රුපියල් 30,000ක් දුන්නා. හෙක්ටෙයාර 2ක් නම් රුපියල් 60,000ක් දුන්නා. ඔබතුමන්ලා දුන්නේ රුපියල් 30,000යි. අපි එය දෙගුණ කළා. ඒ අනුව අපි ජනතාවට පොහොර සහනාධාරය ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඔක්කෝම කළේ එක පැත්තකින් "දිට්වා" ආපදාව ආපු තත්ත්වයක් තුළ, ලෝක යුද්ධයක් ඇවිළෙන තත්ත්වයක් තුළ සහ බංකොලොත් ආර්ථිකයක් භාර ගත්ත තත්ත්වයක් තුළ. ඔබතුමන්ලාට තිබෙනකොටත් දුන්නේ නැහැ. අපි මේ අමාරු තත්ත්වය තුළත් ඔබතුමන්ලා දුන්නු ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් දෙන බව බුද්ධිමත් ජනතාව තේරුම් ගන්නවා ඇති කියලා මම හිතනවා.

අපි එක්දින ධීවර යාත්‍රාවකට භූමිතෙල් දීමනාව ලෙස මාසයකට රුපියල් 31,250ක සහනාධාරයක් දුන්නා. බහුදින ධීවර යාත්‍රාවලට අපි රුපියල් 150,000ක් දුන්නා. එතකොට කොහොමද සහනාධාර දීලා නැහැ කියන්නේ. සහනාධාර බෙදලා තිබෙනවා. දෙන්න පුළුවන් උපරිම දේවල් අපි ජනතාවට දෙමින් ඉන්නවා. කරන්න බැරි දේවල් කියන්න අමාරුයි නේ.

දැන් ඔබතුමන්ලා මේ සභාවේදී කිව්වා, "බදු ගැහුවෝ, බදු ගැහුවෝ" කියලා. නමුත්, ගහපු බද්දක් නැහැ. තිබුණු බදු නම් අඩු කළ තැන් තිබෙනවා. තිබුණු බදු එහෙමම තිබෙන තැනුත් තිබෙනවා. ඔබතුමන්ලා ආදායම් මත බදු ගැහුවා. රුපියල් ලක්ෂ 12ක ආදායමක් වාර්ෂිකව ලැබුවා නම් බද්දක් ගැහුවා. අපි මොකක්ද කළේ? රුපියල් ලක්ෂ 12 සීමාවට බදු ගහන එක නවත්වලා, රුපියල් ලක්ෂ 18 දක්වා ඒක වැඩි කරලා දුන්නා. රුපියල් ලක්ෂ 18න් එහාට තමයි දැන් බදු ගහන්නේ.

දැන් ඔබතුමන්ලා දන්නවා, අරාබිකරයේ යුද්ධයක් ඇවිළෙනවාය කියන එක. ඒ නිසා ඉන්ධන මිල ඉහළ ගිහිල්ලා. ලෝකයේ සමහර රටවල ලංකාවට වැඩිය ඩීසල්වල, පෙට්‍රල්වල මිල වැඩියි.

නමුත් අපි මේ රටේ ජනතාවගේ කර මත ඒ බර පැටවුයේ නැහැ. ඩීසල් ලීටරයකට රජයෙන් රුපියල් 100ක සහනාධාරයක් ලබා දුන්නා. පෙට්‍රල් ලීටරයකට රුපියල් 20ක සහනාධාරයක් ලබා දුන්නා. ඔබතුමන්ලා ගහන තෙල් ලීටරයටත් මේ ආණ්ඩුව ගෙවා තිබෙනවා. මේවා සඳහා රුපියල් බිලියන 100ක් වැය කර තිබෙනවා. ඒ විධියට ජනතාවට සහන ලබා දී තිබෙනවා. අපි නැවත නැවතත් කියනවා, මේ රටේ ජනතාවට තවත් සහන ලබා දිය යුතුයි කියලා. රටේ ආර්ථිකය ශක්තිමත් වන ප්‍රමාණයට, භාණ්ඩාගාරය ශක්තිමත් වන ප්‍රමාණයට අපි ඒ සහන ජනතාව අතර බෙදා දීමට සූදානම්. ඒවා අපි තියාගෙන ඉන්නේ නැහැ. ඒ කාලයේ මොනවාද වුණේ? ඔබතුමන්ලාට මතක ඇති, අපි ඒවාට ගම්වල ඒ කාලයේ කිව්වේ, "මේ අය ගැහුවේ, සවලෙන්. මේ අය ගැහුවේ බැකෝ එකෙන්. ජනතාවට කන් හැන්දෙන් බෙදනවා" කියලා. දැන් අපි ඒ තත්ත්වය වෙනස් කරලා, මේ අයට බෙදපු ප්‍රමාණය අඩු කරලා ජනතාවට බෙදා දෙමින් යනවා. මේ අයට ජනතාව බෙදලා තිබෙනවා. ඒ නිසා මේ අයට රිදිලා තිබෙනවා. ඒකට අපට කරන්න දෙයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙතුමන්ලා තවත් ප්‍රශ්නයක් මතු කළා, අපේ අමාත්‍යාංශයට අදාළව. ඒ ගැනත් සඳහන් කරන්න ඕනෑ. වැවිලි ක්ෂේත්‍රයට අමාරුයි කියලා කිව්වා. ඔව්, අමාරුයි. සියලු ප්‍රශ්න විසඳිලා නැහැ. මම හිතනවා, වැවිලි ක්ෂේත්‍රයේ ඉන්න පිරිස ඒ කාරණය බුද්ධිමත්ව තේරුම් ගනීවි කියලා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කය වන ගාල්ල දිස්ත්‍රික්කය ගැන මම කියන්නම්කෝ, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කළ නිසා. 2024 වර්ෂයේදී තේ ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දී තිබෙන්නේ 21,786 දෙනෙකුටයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ අවුරුද්දේ මුලදී තේ පොහොර සහනාධාරය 45,447කට ලබා දුන්නා. මෙතුමන්ලා ලබා දුන් ප්‍රමාණය වාගේ දෙගුණයකට අපි ලබා දුන්නා. 2024 වර්ෂයේදී මෙතුමන්ලා තේ පොහොර සහනාධාරය ලබා දී තිබෙන්නේ ගොවීන් 84,472කටයි. අපි මේ වනවිට QR ක්‍රමවේදය හරහා ගොවීන් 195,663කට එම සහනාධාරය ලබා දී තිබෙනවා. 2024 වර්ෂයේදී මෙතුමන්ලා තේ ගොවීන්ට ලබා දී තිබෙන පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 13,000යි. අපි මේ අවුරුද්දේ මෙට්‍රික් ටොන් 22,104ක පොහොර ලබා දී තිබෙනවා. මදි. තවත් දෙන්න ඕනෑ. නමුත් අපි පුළුවන් ආකාරයට ලබා දෙනවා. ඒ විතරක් නොවෙයි. ලෝකයේ යුදමය තත්ත්වයක් ඇති වූ අවස්ථාවේ ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කිව්වා, "වී ගොවියාටත් අතිරේක සහනාධාරයක් ලබා දෙන ගමන් කුඩා තේ වතු ගොවියාටත් සහනාධාර ලබා දෙනවා" කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, your time is up.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

කුඩා තේ වතු ගොවියාටත් අතිරේක සහනාධාරයක් ලබා දීමට රුපියල් මිලියන 2,500ක් දුන්නා. ඒ මුදල් ගිණුම්වලට බැර කරමින් සිටිනවා. ඒ කටයුතු තවම අවසන් වී නැහැ. ඒ වාගේම පොල් වගාව සම්බන්ධයෙන් සඳහන් කළොත්, අවුරුදු ගණනාවක් පොහොර යොදා තිබුණේ නැහැ. අපි රුසියාවෙන් මෙට්‍රික් ටොන් 56,700ක් පොහොර ගෙනැල්ලා පොල් ගොවීන්ට නොමිලේ ලබා දුන්නා. ඊට අමතරව මෙවර අය වැයෙන් තවත් රුපියල් මිලියන 2,500ක් පොල් ගොවීන් අතර බෙදා දීමට වෙන් කර තිබෙනවා. අපි ඒ මුදලුත් බෙදා දෙමින් සිටිනවා.

ඒ වාගේම ඔබතුමාට තවත් කාරණයක් මතක් කරන්න කැමැතියි. අපේ රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමාත් වතු කම්කරු ජනතාව පිළිබඳව කථා කළා. වතු කම්කරු ජනතාව උද්ඝෝෂණ කරලාවත් ඔබතුමන්ලා ඔවුන්ගේ දෛනික වැටුප වැඩි කළේ නැහැ. හැබැයි, අපේ කාලයේ කිසිදු උද්ඝෝෂණයක් සිදු කළේ නැහැ. තේ දලු නෙළන එක නැවැත්වුයේ නැහැ. ෆැක්ටරිවල වැඩ නැවැත්වුයේ නැහැ. අපි ජනතාව පාරට බහින්න ඉස්සෙල්ලා රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළා වාගේම වතු කම්කරුවන්ගේත් ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩිවීම ලබා දුන්නා. දෛනික වැටුප රුපියල් 400කින් වැඩි කළා. ඒ සඳහා ආණ්ඩුවේ භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කවදාවත් නොකළ ආකාරයට අපි ඒ කටයුතු සිදු කළා.

ඒ නිසා අපට කියන්න තිබෙන්නේ, ඇඩුවාට දොඩුවාට පලක් නැහැ කියන එකයි. ඒ පැත්තේ අය බලාපොරොත්තු වෙන තවත් සහන ටිකක් තිබෙනවා, කපලා දාන්න. ඒවාත් කපලා, මේ රටේ ජනතාවට පොරොන්දු වූ ආකාරයට අපි ඒ කටයුතු ඉෂ්ට කරනවා. වසර දෙකයි, රටට සුබයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ, එක් කොටසකට. ඒ වාගේම වසර දෙකයි, රටේ කොටසකට අසුබයි. ඒ අසුබ කොටස ඉන්නේ විපක්ෂයේ. අන්න ඒ කට්ටියට කුඩු ටික අල්ලනකොට, හොරකම්වලට දඬුවම් දෙනකොට අසුබයි. අසුබ වෙනකොට මොකද කරන්නේ? ජනතාව අවුස්සන්න බලනවා. ජාතිවාදය අවුස්සන්න බලනවා. ඒවා සුම්මා! ඒ නිසා අපි මේ රටේ ජනතාවට මේ කාරණය කියනවා. ඔබ දැන් අවුරුදු දෙකක් බලාගෙන හිටියා. රට හරි පාරේ යනවා කියලා දැන් තේරෙනවා. ඉතිරි අවුරුදු තුනත් යමු. අපි මේ රටේ ජනතාවට පොරොන්දු වූ ආකාරයට ලබා දිය හැකි උපරිම සහන ලබා දීමට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව සූදානම් කියන පණිවුඩය ලබා දෙමින් මම නවතිනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Mujibur Rahuman. You have seven minutes.

[අ.භා. 2.35]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඇමතිතුමා ආණ්ඩුව ඉටු කළ පොරොන්දු රාශියක් කියාගෙන, කියාගෙන ගියා. ඒ කියන ගමන් එතුමාට අමතක වෙච්ච පොරොන්දු ටිකකුත් තිබෙනවා. මම ඒවා මතක් කළා නම් ඔබතුමන්ලාට පුළුවන් Budget එකට කලින් ඒ ටික දෙන්න. ඔබතුමන්ලා ජනාධිපතිවරණ වේදිකාවේදී කිව්වා, සෞඛ්‍ය උපකරණවලට පනවා තිබෙන VAT එක ඉවත් කරනවා කියලා. ඊළඟට ඔබතුමන්ලා කිව්වා, පාසල් උපකරණවලට පනවා තිබෙන සියයට 18ක VAT එක ඉවත් කරනවා කියලා. ඊළඟට අත්‍යවශ්‍ය භාණ්ඩවලට පනවා තිබෙන බදු ගැන කිව්වා. අපි කන බොන දේවල්වලට මොකටද බදු ගෙවන්නේ කියලා ජනාධිපතිතුමා එදා වේදිකාවලදී ඇහුවා. ඒ කන බොන දේවල්වලට බදු ගෙවන්න ඕනෑ නැහැ කියලා කිව්වා. ඒවා ඉවත් කරනවා කියලා කිව්වත් තවම ඉවත් කළේ නැහැ. මාස හයෙන් හයට රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කරනවා කිව්වා. ඊළඟට කිව්වා, විට්ස් කාර් එකක් රුපියල් ලක්ෂ දහහතරක මුදලකට ලබා දෙනවා කියලා. ඔබතුමාද ඒක කිව්වේ කියලා මට මතක නැහැ. නමුත් රුපියල් ලක්ෂ දහහතරකට දෙනවා කියපු විට්ස් කාර් එක දැන් රුපියල් ලක්ෂ හැට, හැත්තෑවක් වාගේ මුදලක් වෙනවා. ඊළඟට ජපානයෙන් මෝටර් සයිකල් ගෙනැල්ලා දෙනවා කියලා කිව්වා පදින්න. දැන් ජපන් මෝටර් සයිකලයක් තියා pushbike එකක්වත් ගන්න බැහැ. ඒ තරමට මිල ගණන් වැඩි වෙලා තිබෙනවා. ඊළඟට ඔබතුමන්ලා කිව්වා, ත්‍රිරෝද රථ ලබා දෙනවා කියලා. රුපියල් ලක්ෂ හයකට ගන්න පුළුවන් කියලා කිව්වා. ඒ කිසිවක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා නොකියපු ටිකක් මම ඔබතුමාට මතක් කර දුන්නේ. මොකද, මේවා තමයි පොදු ජනතාවට වැදගත් වෙන සහන.

ඒ වාගේම තව වැදගත් දෙයක් කිව්වා. වරායේ බාන ගණනට තෙල් ටික ගෙනැල්ලා දෙනවාය කිව්වා; ඇමතිවරයාට යන කොමිෂන් එකත් නවත්වලා ඒ ගණනට දෙනවා කිව්වා. අපි දන්නේ නැහැ මොන ඇමතිවරයාටද දැන් ඒ කොමිෂන් යන්නේ කියලා. බාන ගණනට දෙන එක කෙසේ වෙතත්, මාසයේ හැම දවසකම තෙල් මිල වැඩි වෙන බව නම් අපිට පෙනෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඇමතිතුමාට ඒ ටිකත් මතක් කරන්න ඕනෑ. මොකද, එතුමාට ඒ ටික අමතක වෙලා තිබුණේ. මම මතක් කරලා දුන්නා මේ ටිකත් අපිට ජනතාව වෙනුවෙන් කරලා දෙන්න කියලා. මොකද, අද වනවිට ආහාර උද්ධමනය සියයට 7.8ක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. අද දරිද්‍රතාව වැඩි වෙලා තිබෙනවා. ඇති නැති පරතරය වැඩි වෙලා තිබෙනවා. මිනිස්සුන්ගේ භාණ්ඩ ගැනීමේ හැකියාව, ක්‍රය ශක්තිය අඩු වෙලා තිබෙනවා. මේක පිළිගන්න ඕනෑ. මේකයි යථාර්ථය. මේ යථාර්ථය අමතක කරලා කථා කරන්න එපා. මේ රටේ පාරවල්වලට බැහැලා මිනිස්සු එක්ක කථා කළාම තමුන්නාන්සේලාට දැන ගන්න පුළුවන් මිනිස්සු කොයි තරම් අමාරුවෙන්ද ජීවත් වෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වෙනකොට ජාත්‍යන්තරව තිබෙන ප්‍රශ්න ගණනාවකට අපිට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, මේ වෙනකොට දීර්ඝ කාලීනව අපිට රටක් හැටියට උදව් කරපු ඉරානය සම්බන්ධව නැවත වතාවක් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මොකද, අද වෙනකොට ලංකාවේ මුහුදු සීමාව අසලට ඉරාන වාණිජ නැව් 20ක් ඇවිල්ලා තිබෙනවා. මාස තුනක් තිස්සේ - ගිය අගෝස්තු මාසයේ ඉඳන් - ඔවුන් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් විදේශ අමාත්‍යාංශයට ඉල්ලීම් කරනවා, මේ නැව්වලට මානුෂික ආධාර ලබා ගන්න ඉඩ දෙන්න කියලා. ඒ නැව්වලට අවශ්‍ය කෑම බීම, බෙහෙත් ලබා දෙන්න කියලා අපේ ආණ්ඩුවෙන් ඉල්ලා තිබෙනවා. මේ නැව්වල සේවකයෝ 600ක් පමණ ඉන්නවා. ඉන්දියානු ජාතිකයෝ ඉන්නවා. බංග්ලාදේශ ජාතිකයෝ ඉන්නවා. පිලිපීන ජාතිකයෝ ඉන්නවා. තවත් නොයෙකුත් රටවල ජාතිකයන් මේ නැව්වල වැඩ කරනවා. පසුගිය අගෝස්තු මාසයේ ඉඳන් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් කරන මේ ඉල්ලීමට විදේශ අමාත්‍යාංශය කිසිදු උත්තරයක් දෙන්නේ නැහැ, නිශ්ශබ්දව ඉන්නවා. ඒ ගැන කනගාටුයි. නමුත්, අපි දැක්කා මාධ්‍ය සාකච්ඡාවේදී විදේශ ඇමතිතුමා කියලා තිබුණු කාරණා. ඔක්තෝබර් මාසයේ 4වෙනි දා ඇමතිතුමා "The Sunday Times" පත්තරයට ප්‍රකාශයක් කරලා තිබුණා, "එහෙම දෙන්න එපා කියලා අපට ඇමෙරිකාවෙන් බලපෑමක් නැහැ. නමුත්, අපි දෙන්න බැඳිලාත් නැහැ" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර වශයෙන් අපි අත්සන් කරපු ප්‍රඥප්ති - conventions - තිබෙනවා. අපි 1974දී අත්සන් කරලා තිබෙනවා, International Convention for the Safety of Life at Sea සඳහා. ඊළඟට, 1979දී International Convention on Maritime Search and Rescue සඳහා අත්සන් කර තිබෙනවා. ඊළඟට, 1982දී United Nations Convention on the Law of the Sea සඳහා අත්සන් කර තිබෙනවා. මේ ජාත්‍යන්තර මට්ටමේ Conventions තුනෙන්ම අපි බැඳිලා ඉන්නවා, මානුෂික ආධාර ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමෙරිකාවෙන් බලපෑම් නැහැයි කියලා විදේශ ඇමතිතුමා කියනවා නම් ඇයි මේක කරන්නේ නැත්තේ? මේ රටේ පෞද්ගලික ආයතන ඉල්ලා තිබෙනවා මේක කරන්න දෙන්න කියලා. මේ නැව්වලට supply එක දෙන්න කියලා ඉල්ලා තිබෙනවා. දැනට මාස එකහමාරකටත් වැඩි කාලයක් අපේ මුහුද අවට ඒ වාණිජ නැව් ටික නවත්වා තිබෙනවා. ඒවාට අවශ්‍ය වතුර ටික දෙන්න, කෑම ටික දෙන්න, බෙහෙත් ටික දෙන්න කියලා අපෙන් ඉල්ලනවා. ඇමෙරිකාවෙනුත් බලපෑම් නැත්නම් ඇයි මේක දෙන්න බැරි? එහෙම නම්, කාගෙන්ද බලපෑම තිබෙන්නේ? මොකක්ද, මේ කරන කැත වැඩේ? අපි ජාත්‍යන්තර මට්ටමෙන් ප්‍රඥප්තිවලට අත්සන් කරලා බැඳිලා තිබෙන රටක්. අපිට තේරෙන්නේ නැහැ, ඇයි මේක මඟ හරින්නේ කියලා. අද වෙනකොට මේ ප්‍රශ්නය අපි මඟ හරිමින් යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මම උමා ඔය ව්‍යාපෘතිය ගැන මතක් කරන්න ඕනෑ. ඉරානය ඩොලර් මිලියන 514ක් වැය කර උමා ඔය ජල ව්‍යාපෘතිය ඉදිකර දුන්නා. ඒ උමා ඔය ජල ව්‍යාපෘතිය නිසාම අද හම්බන්තොට, මොනරාගල, බදුල්ල දිස්ත්‍රික්කවලට ගොවිතැන් කරන්න ජලය ලබා දෙන්න, පානීය ජලය ලබා දෙන්න හැකි වෙලා තිබෙනවා. මෙගාවොට් 120ක විදුලි බලය උපදවන්න හැකි වෙලා තිබෙනවා. Uma Oya Project එකෙන් අපේ රටට ඒ වාසි ලබා ගෙන තිබෙනවා. එදා අපිට පානීය ජලය ලබා දෙන්න උමා ඔය ජල ව්‍යාපෘතිය වෙනුවෙන් ඩොලර් මිලියන 514ක් ලබා දුන්නු ඒ රටේ ඒ නැව්වලින් අද අපෙන් වතුර බෝතලයක් ඉල්ලනකොට අපි කියනවා, වතුර බෝතලයක් දෙන්න බැහැ කියලා. එහෙම නම්, මොකක්ද අපේ තිබෙන සදාචාරය? මොකක්ද අපේ තිබෙන මානුෂිකත්වය? ඒ කාරණයේදී අපි මොකක්ද මේ කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? You must think about that. It is humanitarian aid they are requesting for, from the Sri Lankan Government. But, the Government is refusing that. Iran had helped us a lot in the past, throughout the history. They had funded our Uma Oya Project with nearly US Dollar 514 million, but we are refusing to help them, saying "no". Actually, they are asking for a bottle of water! It is a shame! Shame on you all! ලජ්ජයි! මෙහෙම කරන්නේ ඇයි කියලා අපට තේරෙන්නේ

නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක ඇමතිතුමා කියනවා, ඇමෙරිකාවෙන් බලපෑමක් නැහැ කියලා. බලපෑමක් නැත්නම්, උදවු කරන්න ඉඩ දෙන්න. මොකද, පෞද්ගලික ආයතන ඉල්ලන්නේ ඒ නැව්වලට උදවු කරන්න ඉඩ දෙන්න කියලායි. එහෙම උදවු කළාම අපට ඩොලර් හම්බ වෙනවා. ඒවා නිකම් උදවු නොවෙයි. ඒක ව්‍යාපාරයක්. එම ව්‍යාපාරය කරන පෞද්ගලික ආයතනවලටත් ආණ්ඩුව threaten කරනවා, දෙන්න එපා කියලා. ඒ ඇයි කියලා මට තේරෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

ඉතිහාසය පුරාම ඉරානය අපට උදවු කරලා තිබෙනවා. අපට ජාත්‍යන්තර වශයෙන් බලපෑම් එල්ල වුණු වෙලාවල, ජිනීවාවලදී මානව හිමිකම් කඩ කිරීමේ චෝදනා අපට එල්ල වනකොට සහ අපට තෙල් අර්බුද එනකොට ඉරානය අපට උදවු කරලා තිබෙනවා. ඉරානය කියන්නේ එලෙස අපට හැම දාම උදවු කරපු, අපත් සමඟ අවුරුදු දහස් ගණනකට එහා සම්බන්ධතා පවත්වපු රටක්. ඉරානය හැමදාම අපට උදවු කරලා තිබෙනවා. ඒ, අපේ තේ මිල දී ගන්නා ප්‍රධාන ගැනුම්කරුවා. ඉරානය බොර තෙල් හදන්න අපට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීලා තිබෙනවා. අපි ඒ ණයවත් තවම ගෙවා නැහැ. එහෙම උදවු කළ රටක්, අද ඒ වාණිජ නැව්වල වැඩ කරන සේවකයන්ට මානුෂික පැත්තෙන් ආහාර ටිකක් දෙන්න, බෙහෙත් ටිකක් දෙන්න, වතුර ටිකක් දෙන්න කියලා අපෙන් ඉල්ලන කොට අප එය ප්‍රතික්ෂේප කරනවා නම්, මට තේරෙන්නේ නැහැ මේ ආණ්ඩුවේ ඇත්ත මුහුණ මොකක්ද කියලා. අද අපට ඒක ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ananda Wijepala. You get 11 minutes.

[අ.භා. 2.43]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විපක්ෂය විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව හරහා අපට පැහැදිලිව පෙනී යන්නේ, මෙය රට තුළ යම් ආර්ථික අස්ථාවරත්වයක්, සමාජ අස්ථාවරත්වයක් තිබෙනවා කියලා උලුප්පා පෙන්වීම සඳහා දරන උත්සාහයක් - ප්‍රයත්නයක් - බවයි. මට පළමුව කියන්න තිබෙන්නේ එයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප මේ ගත කළ අවුරුදු දෙකක කාලය තුළ ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට අප ලබාගෙන තිබෙන ජයග්‍රහණ පිළිබඳව කථා කිරීමට පෙරාතුව විශේෂයෙන් අප සලකා බැලිය යුත්තේ අප රට භාර ගත්තේ මොන වාගේ ආර්ථික තත්ත්වයක් තුළ ද කියන කාරණයයි. ඔබ දන්නවා, අපි ආණ්ඩුව භාර ගන්න මොහොත කොට මේ රටට අත් විය හැකි සියලු ව්‍යසන අත් වෙලා තිබුණු බව. රට ආර්ථික වශයෙන් බිඳ වැටිලා තිබුණා; බංකොලොත්භාවයට පත් වෙලා තිබුණා; ආනයන අත්හිටුවා තිබුණා; වෙන එකක් තබා තෙල් පිරිපහදුව පවා වසා දමා තිබුණා. ඒ විතරක් නොවෙයි, දිගු පෝලිම් තිබුණා. මිනිස්සු පෝලිම්වල මිය ගියා. ඒ වාගේ දැඩි ආර්ථික පීඩාකාරී තත්ත්වයක තිබුණු රටක් තමයි අපි භාරගෙන වසර දෙකක කාලයක් තුළ යම් ආර්ථික ස්ථාවරත්වයක් දක්වා ගෙනැවිල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පිළිගන්නවා සමහර භාණ්ඩවල මිල ඉහළ යැමක් තිබෙන බව. රටේ ජනයාට යම් ජීවන බරක් පැටවිලා තිබෙනවා කියන කාරණය අපි ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. හැබැයි, ආණ්ඩුව හැටියට අපි ඒ පිළිබඳව දැඩි අවධානය, සුවිශේෂී අවධානය යොමු කරලා ඒ සඳහා ගත හැකි ඉතාම සාධනීය පියවර රාශියක් මේ වනකොට ගෙන තිබෙනවා. අපේ ඇමතිවරුන් කිහිපදෙනෙකුත් ඒ පිළිබඳව ප්‍රකාශ කළා.

අපි දන්නවා, අපේ රටේ ජනතාව, පවුල් ලක්ෂ 60ක් විතර ඉන්න බව. ඔවුන් පිළිබඳව අවධානය යොමු කරමින්, ඉලක්කගත කණ්ඩායම් පිළිබඳව අවධානය යොමු කරමින් රජය විශේෂ තීන්දු තීරණ රාශියක් ගත්තේ, පහළ ආදායම් කාණ්ඩවල ජනතාවගේ භාණ්ඩ මිල දී ගැනීමේ හැකියාව - ක්‍රය ශක්තිය - වැඩි කිරීම සඳහායි. යම් යම් භාණ්ඩවල මිල ගණන් ඉහළ යනකොට, උද්ධමන අනුපාතය ඉහළ යනකොට, ඒ සඳහා රජයක් හැටියට ගත හැකි සෑම පියවරක්ම අපි අරගෙන තිබෙනවා.

පළමුවෙනි පියවර තමයි පහළ ආදායම් කාණ්ඩවලට යම් සහනයක් ලබා දීම. ඒ සහනය තමයි ලබා දීලා තිබෙන්නේ. ඒ සහනය අද වෙනදාට වඩා ලබා දීලා තිබෙනවා; ඔවුන්ට ඔවුන්ගේ ක්‍රය ශක්තිය වැඩි කර ගන්න ඉඩ කඩ හදා දීලා තිබෙනවා. රාජ්‍ය සේවයේ නියුතු අය සහ ඔවුන්ගෙන් යැපෙන පවුල්වල සාමාජිකයන් ගත්තාම ලක්ෂ දහහතරහමාරක් විතර ඉන්නවා. ඒ අයට අවස්ථා තුනකදී වැටුප් වැඩි කරලා උත්සාහ කරමින් ඉන්නේත් ඒ අයගේ භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ හැකියාව - ක්‍රය ශක්තිය - වැඩි කිරීමටයි. ඒ සඳහා තමයි ඒ පියවර අරගෙන තිබෙන්නේ. ඒ අනුව ගිය අවුරුද්දේ සහ මේ අවුරුද්දේ වාගේම ලබන අවුරුද්දේ ජනවාරි 01වන දා වනකොටත් නැවත වැටුප් වැඩි වීමක් තිබෙනවා. ඒ වැටුප් වැඩි කිරීමට විතරක් රුපියල් කෝටි 33,000ක මුදලක් වැය කරන්න පුළුවන් ආර්ථිකයක් අපි මේ අවුරුදු දෙක තුළ හදලා තිබෙනවා. කලිනුත් කිව්වා වාගේම සහනාධාර වැඩි කරන්න පුළුවන් ශක්තිමත් ආර්ථිකයක් අපි මේ වසර දෙක තුළ හදලා තිබෙනවා.

අප ආණ්ඩුව භාර ගන්න කොට තිබුණු තැන ඉඳලා තමයි අපි කල්පනා කරන්න ඕනෑ. ඒ වනකොට ගුවන් තොටුපළේ සියලු ව්‍යාපෘති නතර කරලා දාලා තිබුණේ, අධිවේගී මාර්ග ව්‍යාපෘති සියල්ල නතර කරලා දාලා තිබුණේ, ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සියල්ල නතර කරලා දාලා තිබුණේ, තෙල් පිරිපහදුව වහලා දාලා තිබුණේ. ඉතින් මේ සියලු ව්‍යසනයන් අත් වෙලා තිබුණු තත්ත්වයක් හමුවේ රට භාරගෙන වසර දෙකක් තුළ ඒ සියල්ල සක්‍රිය කරලා තිබෙනවා. අපි අධිවේගී මාර්ග ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා; නාගරික සංවර්ධන අධිකාරියේ - UDA එකේ - ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා; CPC එක හරහා තෙල් ටැංකි නැවත අලුත්වැඩියා කිරීම වාගේම අලුත් තෙල් ටැංකි ඉදි කිරීම ද ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම, තවත් ව්‍යාපෘති රාශියක් ආරම්භ කරලා තිබෙනවා. ඒ ව්‍යාපෘති රාශිය ආරම්භ කරන ගමන් තමයි අර කියපු ඉලක්ක සහගත කණ්ඩායම් තෝරාගෙන ඔවුන්ට සහන ලබා දෙන ක්‍රියාමාර්ග අපි අනුගමනය කරමින් ඉන්නේ. එම ජනතාව නඟාසිටුවන්න තමයි අප එමඟින් උත්සාහ කරන්නේ. මොකද, හැම වෙලාවේම යම් ආර්ථික ගැටලුවක්, එහෙම නැත්නම් ජීවන වියදම පිළිබඳ ප්‍රශ්නයක් ආවාම ඒකේ පීඩාවට පළමුවෙන්ම භාජන වන්නේ පහළ ආදායම් කාණ්ඩවල, එහෙම නැත්නම් පහළ ආදායම් ලබන ජනතාවයි. ඒ ජනතාව කෙරෙහි අප විශේෂ අවධානය යොමු කර තිබෙනවා කියන එක නැවත නැවතත් ප්‍රකාශ කළ යුතු වන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

රටක් හැටියට ආර්ථික ජයග්‍රහණ අත් කර ගැනීම විතරක් නොවෙයි අප කරන්නේ. ආර්ථික ජයග්‍රහණ අත් කර ගන්නවා වාගේම මේ වසර දෙකක කාලය තුළ ලබා ගත්තු සුවිශේෂී ජයග්‍රහණ ද රාශියක් තිබෙනවා.

[ගරු ආනන්ද විජේපාල මහතා]

විශේෂයෙන් මෙතැන බොහෝ අය කථා කරන්න පටන් ගත්තා, නීතියේ ආධිපත්‍යය ගැන. ඇත්ත වශයෙන්ම මේ වසර දෙක ගත්තාම, නීතියේ ආධිපත්‍යය ශක්තිමත්ව ක්‍රියාත්මක කරපු වකවානුවක් බවට මේ වසර දෙක පත් වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නා පරිදි විමර්ශන ඉතාම පුළුල්ව, විධිමත්ව, ශක්තිමත්ව අද ක්‍රියාත්මක වෙනවා. ශ්‍රී ලංකා පොලීසිය ඒ සඳහා ව්‍යුහාත්මක ක්‍රියාමාර්ග රාශියක් ගෙන තිබෙනවා. ඒ වාගේම, අධිකරණ අමාත්‍යාංශය හරහා අණ පනත් රාශියක් සම්මත කරගෙන තිබෙනවා. ඒ අනුව විමර්ශන ක්‍රියාවලිය පුළුල් කර තිබෙනවා. මේ රටේ මහජනයාගේ දේපළ කොල්ල කාපු බොහෝ දෙනා විමර්ශන ක්‍රියාවලිය පුළුල් කිරීම හරහා නීතියේ රැහැනට හසු වෙමින් තිබෙනවා. මේවා තව තවත් ශක්තිමත් කරන්න අවශ්‍යයි. හොරු නීතියේ රැහැනට හසු කර ගන්න අවශ්‍යයි. මේ සභාවේ කවුරුවත් ප්‍රතික්ෂේප කරන එකක් නැහැ, විරුද්ධ වෙන එකක් නැහැ හොරු, එහෙම නැත්නම් මහජනයාගේ ධනය කොල්ල කාපු අය, අල්ලස්, දූෂණ, වංචා ක්‍රියාවල යෙදුණු අය, මහජන මුදල් අවභාවිත කරපු අය නීතියේ රැහැනට හසු කරනවාට. ඒ සම්බන්ධයෙන් කිසිකෙනෙකු විරුද්ධ වෙන එකක් නැහැ කියා මා විශ්වාස කරනවා. එදා අපේ මැතිවරණ වේදිකාවල පොරොන්දු වුණා සේම අපි ඒ කාර්යය කරමින් ඉන්නවා. අපි එම කටයුතු පුළුල් කරලා තිබෙනවා; ශක්තිමත් කරලා තිබෙනවා. ඒ අනුව අත් අඩංගුවට ගැනීම් ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. අල්ලස, දූෂණය, වංචාව, මූල්‍ය අවභාවිතය විතරක් නොවෙයි, මේ රටට බරපතළ ව්‍යසනයක් වෙලා තිබෙන මේ මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහිවත් අපි ඒ විධියටම ක්‍රියාත්මක වෙලා තිබෙනවා; පාතාලයට එරෙහිවත් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

මෙතැනදී කියැවුණා, තැන තැන වෙඩි තැබීම් සිද්ධ වෙනවා කියලා. ඔව්, තැන තැන වෙඩි තැබීම් සිද්ධ වෙන්න පුළුවන්. ඉදිරියටත් එවැනි දේ සිද්ධ වෙන්න පුළුවන්. ඒත් අපි මේ සියලු අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගන්නවා. අපි පාතාලයටත්, ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ටත් එරෙහිව ක්‍රියාත්මක වනකොට තමයි බොහෝ අය නීතිය ක්‍රියාත්මක වනවාට එරෙහිව මේ වනකොට කටයුතු කරන්න පෙලඹිලා තිබෙන්නේ; එහෙමත් නැත්නම්, කෙඳිරි ගාන්න පටන් අරගෙන තිබෙන්නේ.

මේ රටේ ජනයා හැමදාම බලාපොරොත්තු වුණා, නීතිගරුක සමාජයක්; යුක්තිගරුක සමාජයක්. ඒ වෙනුවෙන් තමයි ජාතික ජන බලවේගයට ජන වරම ලබා දුන්නේ. අප එය තමයි ඉෂ්ට කරමින් ඉන්නේ. ඒ නිසා අපි ඒ කියපු නීතිගරුක, යුක්තිගරුක සමාජය ගොඩනැඟීම සඳහා ඕනෑම අභියෝගයකට මුහුණ දෙමින් අඛණ්ඩව ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. මේ විමර්ශන ක්‍රියාවලිය පුළුල් වීම හරහා අධිකරණ ක්‍රියාවලිය ශක්තිමත් කර ගන්නත් අවශ්‍ය වෙනවා. විමර්ශන ක්‍රියාවලිය විතරක් නොවෙයි, අධිකරණ ක්‍රියාවලියත් ශක්තිමත් කරන්න අවශ්‍යයි. මොකද, නඩු ලක්ෂ 11ක් විතර ගොඩ ගැහිලා තිබෙනවා. ඒවා සක්‍රියව, කඩිනම්ව, කාර්යක්ෂමව විසඳීම සඳහා තමයි පසුගිය කාලයේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සම්මත කරලා ශක්තිමත්ව පියවර ගත්තේ.

ඉතින්, අපි මේ අවුරුදු දෙක තුළ මේ ආකාරයේ ක්‍රියාමාර්ග රාශියක් ගෙන තිබෙනවා වාගේම ඉදිරියටත් ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඒ නිසා කිසිදු ආකාරයේ සමාජ අස්ථාවරත්වයක් හෝ ආර්ථික අස්ථාවරත්වයක් ගොඩ නැඟිලා නැහැ. ක්‍රමක්‍රමයෙන් ආර්ථිකය ස්ථාවර වෙනවා. ජනයා තෘප්තිමත් සමාජයක් ගොඩ නැඟෙමින් තිබෙනවා. ඒකට හේතුව, අපේ ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා කිව්වා වාගේ, දේශපාලන සංස්කෘතිය අද වෙනස් වෙලා තිබීමයි. බොහෝ අයගේ සහන කප්පාදු වනකොට මේ රටේ ජනයා බලාපොරොත්තු වුණු සැබෑ දේශපාලන සංස්කෘතිය අපි මේ රටේ නිර්මාණය කර තිබෙනවා; සැබෑ මහජන නියෝජිතයන් හදලා තිබෙනවා. වරදාන, වරප්‍රසාද ඉවත් කරලා සැබෑ ලෙසම මහජනයා වෙනුවෙන් සේවය කරන ගෞරවාන්විත සේවාවක් බවට මේ මහජන සේවාව, මේ දේශපාලනය පත් කරලා තිබෙනවා; දේශපාලන නියෝජිතයා පහළට ගෙනැල්ලා තිබෙනවා. මතු මහලේ වරප්‍රසාද සහිතව වැජඹුණු මහජන නියෝජිතයා වෙනුවට සැබෑ මහජන නියෝජිතයෙකු නිර්මාණය කිරීමේ කාර්යය අපි මේ වනකොට කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොට විපක්ෂයේ බොහෝ පිරිස් උත්සාහ ගනිමින් ඉන්නවා, අතීතයේ පැවැති තත්ත්වයම ඇති කරන්න. අතීතයේ ඒ බොහෝ අය මේ රට පාලනය කරන කොට කරපු දේ අපි දැක්කා. ඒ අය රාජ්‍ය පාලනය සඳහා හැම වෙලේම උපයෝගී කර ගත්තේ ආගම්වාදය, ජාතිවාදය සහ විවිධ කුමන්ත්‍රණකාරී ක්‍රියායි. ඒවා හරහා තමයි ඔවුන් පාලන බලය පවත්වාගෙන ගියේ. ඒකටම සම්බන්ධ වුණා, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ පාතාල ක්‍රියාකාරකම්. දේශපාලනය සම්බන්ධ කරගෙනයි ඒවා ක්‍රියාත්මක වුණේ. මේ රටේ ජනයා ඒක දන්නවා. ඒ කාලයේ පාතාල ක්‍රියාකාරකම් වර්ධනය වුණේත්, මත්ද්‍රව්‍ය ජාවාරම් වර්ධනය වුණේත් දේශපාලන ආශීර්වාදය සහිතවයි. දැන් ඒ සියල්ල නතර වෙලා ජාතිවාදයට, ආගම්වාදයට, කුමන්ත්‍රණකරුවන්ට ඉඩ අහුරා තිබෙන තත්ත්වය හමුවේ ඒ බොහෝ අයට සිද්ධ වෙලා තිබෙනවා, ඒ තත්ත්වය නැවත මේ සමාජය තුළ ඇති කරලා තමන්ගේ දේශපාලන අභිප්‍රායයන්, අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා කටයුතු කිරීමට. ඒ වෙනුවෙන් ඔවුන් ද්වේෂ සහගතව අසත්‍ය ප්‍රචාර සිදු කරමින් ඉන්නවා. ඔවුන් ද්වේෂ සහගත අසත්‍ය ප්‍රකාශ, වෛරී ප්‍රකාශ සමාජ මාධ්‍ය හරහා මුදා හරිමින් ඉන්නවා. ඒ නිසා එදා කිව්වා වාගේම අපි නැවත නැවතත් මේ සමාජයට අවධාරණය කරන්න අවශ්‍යයි, එවැනි පිරිස් කොතරම් උත්සාහ ගත්තත් කිසිදු ආකාරයේ ජාතිවාදී හෝ ආගම්වාදී ප්‍රවණතාවන්ට අපි ඉඩ දෙන්නේ නැහැ, අතීත හොල්මන්, අතීත නටඹුන් නැවත මේ සමාජය තුළ ස්ථාපිත කරන්න කිසිසේත් ඉඩ දෙන්නේ නැහැ කියන එක. මොකද, ජාතිවාදයට, ආගම්වාදයට තිත තබලායි මේ රටේ ජනයා අපට ජනවරම ලබා දී තිබෙන්නේ. ඒ නිසා අපි සියලු ජනයා ආරක්ෂා කරන, සියලුදෙනා අතර ජාතික සමගිය ආරක්ෂා කරන, ශ්‍රී ලාංකිකයන් හැටියට ජීවත් වෙන්න පුළුවන් සමාජයක් නිර්මාණය කරනවා. ඒ වුවමනාව සහිතව තමයි අප කටයුතු කරමින් ඉන්නේ. ඒ නිසා මේ දිනවල සමහර අය කරන ප්‍රකාශ පිළිබඳව අපි දැඩිව අවධානය යොමු කර තිබෙනවා. පොලීසිය පාර්ශ්වයෙන් ඒ සමහර ප්‍රකාශ පිළිබඳව විමර්ශන ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම, යම් යම් කුමන්ත්‍රණ සඳහා යම් යම් පිරිස් උත්සාහ ගන්නවා නම්, ඒ වෙනුවෙන් අවශ්‍ය පියවර ගන්නත් අපි පසුබට වෙන්නේ නැහැ.

අපි ආණ්ඩුව හැටියට ප්‍රජාතන්ත්‍රවාදීව මේ රට පාලනය කරනවා. නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම, නිදහසේ රැස්වීම, අවශ්‍ය මතවාද ඉදිරිපත් කිරීම වෙනුවෙන් කිසිදු බාධාවක් සිදු කරන්නේ නැහැ. එහෙත්, නැවත නැවතත් මේ රටට අවධාරණය කරනවා කිසිදු ජාතිවාදයකට, කිසිදු ආගම්වාදයකට වාගේම කිසිදු කුමන්ත්‍රණයකට අනාගතයේ ඉඩ කඩ තබන්නේ නැහැ කියන එක. ඒ වාගේම මේ රටේ ජනයාගේ ආරක්ෂාවත්, මේ රටේ ආරක්ෂාවත්, මේ රටේ අනාගතයේ ආරක්ෂාවත් අපි සහතික කරනවා කියන කාරණය මේ ගරු සභාවේදී ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Rauff Hakeem. You have seven minutes to speak on the Debate and the Floor is yours.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Sargarika Athauda to the Chair?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

Sir, I propose that the Hon. (Mrs.) Sagarika Athauda do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[අ.භා. 2.55]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විෂයානුබද්ධව කථා කිරීමට පෙර මම ඉල්ලීමක් කරන්න කැමැතියි. මෙතැන පළමු පෙළේ අමාත්‍යවරු කීප දෙනෙක් ඉන්නවා. විශේෂයෙන්ම සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍ය ගරු හංසක විජේමුණි මැතිතුමාත් මෙහි සිටිනවා. මම එතුමා හරහා සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් මේ ඉල්ලීම කරනවා. අපි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන, ද්‍රවිඩ භාෂාව කථා කරන පක්ෂවල නායකවරු හයදෙනෙක් අත්සන් කරලා ලියුමක් යවා තිබෙනවා, ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට. ඒ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශයක් පිළිබඳවයි. හෙද සහායකයන්ගේ නිල ඇඳුම පිළිබඳව මුස්ලිම් කාන්තාවන්ට තිබෙන වුවමනාව ඉටු කර දීම පිණිස මානව හිමිකම් කොමිසම නියෝගයක් නිකුත් කරලා තිබෙනවා. ඒ නියෝගය පරිදි අවශ්‍ය කම්ටු පත් කරමින්, ඒ නිල ඇඳුමේ අවශ්‍ය වෙනස්කම් සිදු කර දීමට කටයුතු කරන්න කියලා මම මුලින්ම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැනට දවස් කිහිපයකට උඩදී නැවත වාරයක් අකුරණ ප්‍රදේශයේ ජල ගැල්මක් සිදු වුණා. මේ පිළිබඳව අපි නිරන්තරයෙන් කථා කරනවා. මේ සභා ගර්භයේ විතරක් නොවෙයි, පසුගිය අවුරුදු දෙක තිස්සේ ගරු ලාල් කාන්ත අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්, හිටපු ආණ්ඩුකාර සරත් අබේකෝන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී අපි සාකච්ඡා කරලා තිබෙනවා. කමිටු රාශියක් ද පත් කළා. අපේ ගරු හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමාත් මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන කෙනෙක්. එතුමාත් මේ කාරණය දන්නවා. අප මේ පිළිබඳව කථා කරලා නොයෙකුත් පියවර ගෙන තිබුණාට ඒවා විද්‍යානුකූලව සිදු වෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ සම්බන්ධයෙන් යම් යම් පියවර ගත්තා කියලා අපට දැනුම් දුන්නා. විශේෂයෙන්ම පිඟා ඔයේ පතුල හාරනවා, එහි රොන් මඩ ඉවත් කරනවා, ඒ විතරක් නොව ඉවුරු ශක්තිමත් කිරීම සඳහා පැති බැම් හදනවා කියමින් එතැන නොයෙකුත් ක්‍රියාකාරකම් සිදු වුණාට, මෙවර පැය දෙකක ධාරානිපාත වැස්සත් සමඟ විශාල ජල ගැල්මක් ඇති වුණා. ඒකෙන් කෝටි ප්‍රකෝටි ගණනක විනාශයක් සිදු වෙලා තිබෙනවා. එය නිතර දෙවේලේ සිදු වන දෙයක් බව අපි මතක තියා ගන්න ඕනෑ.

පිඟා ඔයේ පළල පිළිබඳව තීරණයක් අරගෙන තිබෙනවා, අඩි 40ක් විය යුතුය කියලා. නමුත් එහි අඩි 60කවත් පළලක් තිබිය යුතුයි. ඒ විතරක් නොවෙයි, කුඩා අතු ගංගාවල මායිම් රක්ෂිතය අඩි 20ක්වත් තිබිය යුතුයි කියන එක නීතිමය අවශ්‍යතාවක්. නමුත් ඒ මායිම් රක්ෂිත සීමාව නොසලකා සිදු කළ අනවසර ඉදිකිරීම් රාශියක් - 90කට වැඩි අනවසර ඉදිකිරීම් ප්‍රමාණයක් - අලවතුගොඩ සිට කටුගස්තොට වනකල් තිබෙන බව කවුරුත් දන්නා කාරණයක්. නාගරික සංවර්ධන අධිකාරිය භාර අමාත්‍යතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. දැන් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින් මර නින්දේ ද කියලා මම අහන්න කැමැතියි. මොකද, ඒ පිළිබඳව නොයෙකුත් පොරොන්දු දුන්නා. "අපි ඇවිල්ලා ඒ අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කරනවා" කියලා කිව්වා. අපි ඊයේ පෙරේදා තොරතුරු දැනගැනීමේ පනත යටතේ ප්‍රශ්නයක් යොමු කළාම අපට පිළිතුරක් ලැබුණා, මෙතෙක් කල් නඩු දෙකයි පවරලා තිබෙන්නේ කියලා. අනවසර ඉදිකිරීම් අනූ ගණනක් තිබෙන නමුත්, පවරා තිබෙන්නේ නඩු දෙකයි කියන එක ඉතා ලොකු ප්‍රශ්නාර්ථයක් තිබෙන කාරණයක්.

ඒ විතරක් නොවෙයි, අකුරණ ප්‍රදේශයේ ඉංජිනේරු මහත්මයෙක් අවුරුදු 20ක් තිස්සේ වර්ෂාපතනය මැනලා විශ්ලේෂණය කරලා ඒ පිළිබඳව වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමා ඇමෙරිකානු විශ්වවිද්‍යාලයක උපාධිය ලැබූ ඉංජිනේරු මහත්මයෙක්. එතුමා ඒ තොරතුරු ලබා දුන්නත්, ඒ පිළිබඳ විද්‍යානුකූලව කටයුතු කරන්න අපි අසමත් වෙලා තිබෙනවා. මේ, එක රජයක් කරපු වැරැද්දක් කියලා අපි කියන්නේ නැහැ. මේ ආණ්ඩුවත් එනකොට විශාල පොරොන්දුවක් දුන්නා, මේ ගැන අපි කටයුතු කරනවා කියලා. නමුත් අවාසනාවකට වාගේ විශාල ජල ගැල්මක් ඇති වෙලා නැවත වාරයක් මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. ඒ හින්දා මේ පිළිබඳව විද්‍යානුකූලව අප කළ යුතු දේ කුමක්ද කියලා බලන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරින් මේ පිළිබඳව කුමක්ද කරන්නේ කියන එක පිළිබඳවත් ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. මේ නිලධාරින් අවශ්‍ය කටයුතු නිසි වෙලාවට කරනවාද, නැද්ද කියන ප්‍රශ්නය අපි නැවත වාරයක් මෙතැනදී මතු කරනවා.

දිගටම කොන්ක්‍රීට් පැති බැම් - retaining walls - පැවතීම ජලය ගමන් කිරීමේ මාර්ගයට විශාල බාධකයක් වෙලා තිබෙනවා. මේවා පිළිබඳව සොයා බලා අවශ්‍ය පරිදි අඩි 20ක මායිම් රක්ෂිතය තහවුරු කරමින් ඒ ක්‍රියාමාර්ගය ගන්නවාද, මේ අනවසර ඉදිකිරීම් ඉවත් කරනවාද කියන එක පිළිබඳව තීරණයක් ගත යුතු කාලය එළඹිලා තිබෙනවා. මේ පිළිබඳව නිතරම අපි සභා ගර්භයේදී කථා කළත්, අපේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී කථා කළත් තවම මේවාට විසඳුමක් නැති බව අපි කියා සිටිය යුතුයි.

මෑතකදී විශ්‍රාම ගත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ Prof. K.D.W. Nandalal, ඒ වාගේම Eng. Niluka වැනි අය මේ පිළිබඳව වාර්තාවකුත් ලබා දීලා තිබෙනවා. ඒ වාර්තාවත් පදනම්

[ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා]

කරගෙන යමක් කරනවා කියලා පොරොන්දු වුණාට, තවම ඒ ගැන කිසි කටයුත්තක් කරලා නැහැ. ඒ වාගේම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව - SLLDC - කියන්නේ මේ රටේ ජල ගැලීම් පිළිබඳව විශේෂඥ දැනුම තිබෙන ආයතනයක්. ඒ ආයතනයෙනුත් යම් වාර්තාවක් අරගෙන, මේ ප්‍රශ්නය නැවත ඇති නොවන ලෙස කඩිනමින් මේවාට තීන්දුවක් ගත යුතුයි. ඒ විතරක් නොවෙයි. තවත් නොයෙකුත් රජයේ ආයතන තිබෙනවා, විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය වැනි ආයතන. ගඟෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ ඊයේ-පෙරේදා දවසක 7වෙනි කණුව ළඟ කුරුගොඩ හන්දියේ තවත් විශාල මාර්ග අනතුරක් වෙලා ජීවිත කිහිපයක් අහිමි වුණා. ඒ මාර්ගය පිළිබඳව, ඒ වංගුවේ තිබෙන නොයෙකුත් ප්‍රශ්න සැලකිල්ලට අරගෙන මේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දිය යුතුයි. එම නිසා මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරයි කියලා අපි බලාපොරොත්තු වනවා.

විශේෂයෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය ආදී නොයෙකුත් ආයතන එකතු කරමින්, මේ සඳහා විවිධ ආයතනවලින් සැදුම්ලත් කාර්යසාධක බලකායක් ඇති කරලා, මෙවර අය වැය හරහා ජනාධිපතිතුමා ඒකට වෙනම මුදලක් වෙන් කරලා, මේ ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.04]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දන්නවා, මෑත කාලයේ සිදු වෙච්ච උද්ධමනයේ යම් යම් වෙනස්වීම් එක්ක අපේ රටේ පුරවැසියන්ගේ ජීවන තත්ත්වයට යම් බලපෑමක් ඇති වෙලා තිබෙන බව. නමුත් මෙතැනදී අපි බලන්න ඕනෑ කාරණයක් තමයි, මේ උද්ධමනයේ ඇති වෙච්ච වෙනස්වීම සහ ඒකත් එක්ක මේ ප්‍රතිවිපාක ඇති වෙලා තිබෙන්නේ ආණ්ඩුව ගත් ප්‍රතිපත්තිමය තීරණයක් නිසාද, එහෙම නැත්නම් පරිපාලනමය තීරණයක් නිසාද කියන එක. විශේෂයෙන්ම අපට බලන්න වෙන්නේ, 2025 සහ 2026 වර්ෂයේ මුල් කාලය තුළ අපේ රටේ උද්ධමනය මොන වාගේ තත්ත්වයකද පැවතිලා තිබෙන්නේ කියලායි. අපි දැනටත් දන්නා විධියට 2025දී සියයට 2ක උද්ධමනයක් තමයි මේ රට තුළ ක්‍රියාත්මක වුණේ. ඒ වාගේම 2026 ජනවාරි සිට පෙබරවාරි දක්වා සියයට 5ක උද්ධමනයක් තමයි පවත්වා ගෙන ගිහිල්ලා තිබෙන්නේ. හැබැයි, හිටපුගමන් සියයට 8ක උද්ධමනයක් එන්නේ ඇයි කියන එක ලෝකයේ ඇති වෙලා තිබෙන වෙනස්කම් දිහා කල්පනා කර බලා අපි තේරුම් ගන්න ඕනෑ. ඒ තත්ත්වය ඇති වෙන්න ප්‍රධාන හේතුවක් තමයි, ලෝක බලශක්ති වෙළෙඳ පොළේ ඇති වෙලා තිබෙන වෙනස්කම්.

අපේ රට සම්පූර්ණයෙන්ම ආනයනය කරන ඉන්ධන මත යැපෙන රටක්. එතකොට, ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිලෙහි මේ වාගේ උච්චාවචන වනකොට අනිවාර්යයෙන්ම අපේ දේශීය වෙළෙඳ පොළට විශාල බලපෑමක් ඇති කරනවා. අපි ගත්තොත් 92 Octane Petrol බැරල් එකක් මේ මැද පෙරදිග යුද්ධය ආරම්භ වෙන්න කලින් පෙබරවාරි මාසයේදී ඇමෙරිකානු ඩොලර් 75.282කට තිබුණේ. හැබැයි, මේ වනකොට ඒ මිල ඩොලර් 145.131 දක්වා වැඩි වෙලා තිබෙනවා. ලෝකයේ මේ මැද පෙරදිග යුද්ධය පටන් ගන්න කලින් පෙබරවාරි මාසයට සාපේක්ෂව බැලුවාම විශේෂයෙන් සිංගප්පූරු වෙළෙඳ පොළේ 92 Octane Petrol බැරල් එකක මිල මේ වනකොට සියයට 192.7කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඊළඟට, පෙබරවාරි මාසය වනකොට ඩීසල් බැරල් එකක මිල වුණේ ඩොලර් 89.933ක්. හැබැයි, මේ වනකොට ඒක ඩොලර් 171.656ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ මිල වැඩි වීමේ ප්‍රතිශතය ගත්තොත්, 190.8කින් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම පෙබරවාරි මාසය වනකොට Murban Crude Oil බැරලයක මිල තිබුණේ ඩොලර් 69.591ට. මේ වනකොට එය ඩොලර් 108.645ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ සියයට 156.1කින් Murban Crude Oil බැරලයක මිල වැඩි වෙලා තිබෙනවා. WTI Crude Oil සාමාන්‍යයෙන් අපි පාවිච්චි කරන්නේ අඩුවෙන්. පෙබරවාරි මාසයේදී WTI Crude Oil බැරලයක මිල ඩොලර් 64.501ක් වුණා. මේ වන විට එම මිල ඩොලර් 91 ශත 34 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ සියයට 141කින් WTI Crude Oil බැරලයක මිල වැඩි වෙලා තිබෙනවා. නමුත් ලෝක වෙළෙඳ පොළේ, විශේෂයෙන් සිංගප්පූරු Platts එකේ මේ විධියට සියයට එකසිය ගණන්වලින් මිල ඉහළ යද්දී, අපේ දේශීය වෙළෙඳ පොළ තුළ මිල ඉහළ ගිහින් තිබෙන්නේ සියයට 45කින්, 46කින් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙහිදී රජය ප්‍රතිපත්තියක් හැටියට අනුගමනය කළ දේ මොකක්ද කියා අපි දන්නවා. ලෝක වෙළෙඳ පොළ තුළ ඇතිවන වෙනස්කම් නිසා එල්ල වන විශාල පීඩනය, විශේෂයෙන්ම අපේ රටේ ඉන්ධන පාරිභෝගිකයින් මත සෘජුවම පටවන්නේ නැතුව එයින් ඉතා සුළු කොටසක් පමණක් අපේ ඉන්ධන පාරිභෝගිකයින්ට ලබා දී වැඩි කොටස රජය සහ ඉන්ධන බෙදා හරින සමාගම් විසින් භාර ගත යුතුයි කියන ප්‍රතිපත්තියට තමයි අපේ රජය ගියේ. ඒ නිසා තමයි අපි මුල් කාලයේදී රුපියල් බිලියන 57කට ආසන්න මුදලක ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්න කටයුතු කළේ. ඊට පසුව ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා රුපියල් බිලියන 41ක ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්න කටයුතු කළා. එසේ කළේ මේ සමස්ත පීඩනය රටේ ජනතාව අතරට යෑම වැළැක්වීම සඳහායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට මතකයි, පොසිල ඉන්ධනවලින් නිපදවන ඩීසල්, නැප්තා වැනි ඉන්ධනවල මිල ලෝක වෙළෙඳ පොළ තුළ විශාල වශයෙන් ඉහළ යෑමත් එක්ක විදුලි ජනන පිරිවැයත් විශාල වශයෙන් ඉහළ ගිය බව. නමුත් රජය ඒ වෙලාවේ කල්පනා කළා, එසේ වැඩි වුණු පිරිවැය සම්පූර්ණයෙන්ම රටේ ජනතාව මත පටවන්නේ නැතුව, විශේෂයෙන්ම දුප්පත් ජනතාව මත පටවන්නේ නැතුව ඒකක 180ට වඩා අඩුවෙන් පාවිච්චි කරන අයගේ විදුලි බිල වැඩි කිරීමක් කරන්නේ නැහැ කියලා. ඒ අනුව ඒකක 180ට වඩා වැඩියෙන් පාවිච්චි කරන අයගේ විදුලි ගාස්තුව තමයි සියයට 18කින් වැඩි කළේ. අන්න ඒකත් එක්ක NSO ඇතුළු අනුප්‍රාප්තික සමාගම්වලට ඇතිවන පාඩුව පියවා ගැනීම සඳහා තවත් රුපියල් බිලියන 15ක් ඒ විදුලි සමාගම්වලට ලබා දෙන්න රජය කටයුතු කළා. ඒ අනුව මුලින් රුපියල් බිලියන 57ක්, ඊට පසුව ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා රුපියල් බිලියන 41ක් සහ තවත් රුපියල් බිලියන 15ක් වශයෙන් ගත්තාම, රුපියල් බිලියන 113කට වැඩි ප්‍රමාණයකින් මේ රටේ ජනතාවට බලශක්ති ක්ෂේත්‍රය තුළ පමණක් සහන දීම සඳහා ආණ්ඩුව කටයුතු කළා.

මෙසේ මිල ඉහළ යෑමත් එක්ක, ප්‍රතිපත්තියක් හැටියට ඉන්ධන සමාගම් විසින් මේකෙන් කොටසක් ලබා ගත යුතුයි කියලා අපි කිව්වාට, සමහර සමාගම් ඒකට සූදානම් වුණේ නැහැ. විශේෂයෙන්ම පෞද්ගලික සමාගම් ඒ සඳහා සූදානම් වුණේ නැහැ. ඒකත් එක්ක ඔවුන් ඉල්ලීමක් කරමින්, විශාල බලපෑමක් කරමින්, තමන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කරමින් ඉන්නවා, ලෝක වෙළෙඳ පොළේ පවතින මිලට සාපේක්ෂව රටේ ඉන්ධන මිල වැඩි කරන්න ඕනෑය කියලා. නමුත් ගරු ජනාධිපතිතුමා ඇතුළු අපේ රජය ඉතා පැහැදිලිව කිව්වා, ඉන්ධන බෙදා හැරීමේ නියුතු පෞද්ගලික සමාගම් ඉල්ලන ඉල්ලන විධියට දේශීය වෙළෙඳ පොළේ මිල ඉහළ දමන්න අපි සූදානම් නැහැ කියලා. ඒ නිසා තමයි දැන් මේ සමහර පෞද්ගලික සමාගම් දේශීය වෙළෙඳ පොළට ඉන්ධන නිකුත් කිරීම යම් ප්‍රමාණයකට සීමා කර තිබෙන්නේ. නමුත් අවාසනාවකට මේ අයත් එක්ක ඇති කරගෙන තිබුණු ගිවිසුම්වල ස්වරූපය අනුව අපට ඔවුන්ගේ මිල තීරණය කරන්න හැකියාවක් නැහැ. එහෙම මිල තීරණය කළොත් අත්සන් කර තිබෙන ගිවිසුම් අනුව, විශේෂයෙන්ම 2022 වසරේ අත්සන් කර තිබෙන ගිවිසුම හරහා ඔවුන්ට වන පාඩුව ගෙවීමට රජය බැඳී සිටිනවා. ඒ නිසා තමයි අපි ඉන්ධන සඳහා ඔවුන්ට නිශ්චිත මිලක් දෙන්න කටයුතු නොකරන්නේ. ඒ වෙනුවට අපි කරන්නේ පසුගිය කාලය තුළ වසා දමන්න, නතර කරන්න තීරණය කළ CPC එක හරහා ලාභ ලබාගෙන ඒ ලාභයේ කොටසක් ලෝක වෙළෙඳ පොළේ වැඩි වුණු ඉන්ධන මිල තුළින් ඇතිවන අලාභය පියවා ගැනීම සඳහා භාවිත කරමින් රටේ ඉන්ධන මිල යම් ස්ථාවර තත්ත්වයකට පවත්වා ගෙන යන්න කටයුතු කිරීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි සාමාන්‍යයෙන් ආයෝජනයක් කරනකොට, විශේෂයෙන්ම පෞද්ගලික අංශයෙන් ආයෝජනයක් කරනකොට බලාපොරොත්තු වන කරුණු කිහිපයක් තිබෙනවා. ඉන් එකක් තමයි, අපට අවශ්‍ය තාක්ෂණය ලබා ගැනීම. සමහර අවස්ථාවලදී රජයට පමණක් එම තාක්ෂණය කැඳවා ගන්න බැරි නම් අපි ඒ වෙලාවේදී කල්පනා කරනවා, පෞද්ගලික අංශයේ දායකත්වයෙන් සිදු කරන ආයෝජනයක් හරහා එම තාක්ෂණය කැඳවා ගන්න ඕනෑ කියලා.

ඒ වාගේම, මහා පරිමාණ ආයෝජන සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය රජයට පමණක් සපයා ගැනීමට නොහැකි අවස්ථාවලදී, එම ප්‍රාග්ධනය සොයා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගන්න ඕනෑ කියලා අපි කල්පනා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එසේත් නැත්නම් යම් අර්බුදකාරී අවස්ථාවකදී වෙළෙඳ පොළේ හිඟයක් ඇති වීම වළක්වා ගැනීම සඳහා, එනම් availability කියන එක තහවුරු කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීමට කටයුතු කරනවා. නමුත්, මේ සියලු කරුණු දිහා බැලුවාම අපට පෙනී යන කාරණය තමයි, විශේෂයෙන්ම ඉන්ධන බෙදා හැරීම සඳහා පෞද්ගලික සමාගම් කැඳවීම තුළින් බලාපොරොත්තු වුණු එම අරමුණු 4න් කිසිවක් අපට ළඟා කර ගන්න නොහැකි වී තිබීම. විශේෂයෙන්ම වෙළෙඳ පොළේ ඇති වන ඉන්ධන හිඟය වළක්වා ගැනීම සඳහා එම සමාගම් කටයුතු කරලා නැහැ. ඉන්ධන බෙදා හැරීම සඳහා අතිවිශාල ආයෝජනයක් අවශ්‍ය වෙන්නේ නැහැ. දියුණු තාක්ෂණයක් හෝ අතිනවීන තාක්ෂණයක් අවශ්‍ය වෙන්නේත් නැහැ. ඒ වාගේම, විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය වෙන්නේත් නැහැ. හැබැයි, අපට වඩාත් වැදගත් වුණේ මේ තරගකාරිත්වය හරහා එක් පැත්තකින් රටේ ඉන්ධන පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට ඉන්ධන ලබා දීම වාගේම මෙවැනි අර්බුදකාරී කාලයකදී රටේ ජනතාවට ඉන්ධන හිඟයකින් තොරව සැපයීමයි. නමුත්, අද වනවිට එම අරමුණු කිසිවක් සාක්ෂාත් කර ගැනීමට නොහැකි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපි තීරණය කරලා තිබෙන්නේ විශේෂයෙන්ම ඒකාධිකාරී තත්ත්වයක් පවතින ප්‍රදේශවල අලුතින් CPC එකට අයත් ඉන්ධනහල් ආරම්භ කිරීමට. නමුත්, සමහරු කල්පනා කරනවා, මේ හරහා අනාගතයේදී ආයෝජන සිදු කිරීමට බලාපොරොත්තු වන ආයෝජකයන්ට යම් බලපෑමක් හෝ තර්ජනයක් එල්ල වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම දැනට පවතින නීතිමය රාමුව සහ ගිවිසුම් අනුව, CPC එකට අලුතින් ඉන්ධනහල් 216ක් ආරම්භ කිරීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව තිබෙනවා. එම ඉන්ධනහල් 216න්, 75ක් තමයි අපි අලුතින් ඉන්ධනහල් වශයෙන් ආරම්භ කිරීමට කටයුතු කරන්නේ. එහෙම නැතුව පවතින නීතිමය රාමුව හෝ ගිවිසුම් අත්තනෝමතික ලෙස උල්ලංඝනය කරමින් කටයුතු කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම තව විනාඩියක් ඇතුළත කථාව අවසන් කරන්නම්.

මේ අවස්ථාවේදී මට කියන්න තව කාරණයක් තිබෙනවා. විශේෂයෙන්ම වරායේ චීන ආයෝජනයක් ඉවත්ව ගියා කියලා ලොකු රාවයක් සමාජය තුළත්, මේ සභාව තුළත් ඇති කිරීමට උත්සාහ කළා. ඇත්තටම 2020 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව තමයි, වරාය භූමියේ අක්කර 14ක logistics hub එකක් හදන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 280ක ආයෝජන ව්‍යාපෘතියක් ආරම්භ කළේ. එම ව්‍යාපෘතිය සඳහා අවුරුදු 10ක lease agreement එකක් ඇති කරගෙන තිබුණා. ඒ වාගේම, එම lease agreement එකට අදාළව premium එක ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 26ක් තැන්පත් කර තිබුණා. එහි ප්‍රධාන පාර්ශ්ව හැටියට China Merchants Port Holdings Company Limited එක, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ Access Engineering PLC එක කටයුතු කළා. නමුත්, කරුණු කිහිපයක් හේතුවෙන්, අවුරුදු 6ක් ගත වනතුරුත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළේ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරගන්න පුළුවන්ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

පොඩ්ඩක් ඉන්න, දයාසිරි මන්ත්‍රීතුමා. දයාවෙන් ඉල්ලන්නේ, පොඩ්ඩක් ඉන්න. මම මේ කාරණය කියලා අවසන් කළාම ඔබතුමාට අවශ්‍ය ඕනෑම දෙයක් අහන්න. මම උත්තර දෙන්නම්.

අවුරුදු 6කට පසුවත් මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු කිසිදු ආකාරයකින් ආරම්භ කර තිබුණේ නැහැ. විශේෂයෙන්ම මැද පෙරදිග කලාපයේ මේ වනවිට ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක logistics hub එකක් සඳහා තිබෙන අවධානය මෙම කලාපයට, විශේෂයෙන් දකුණු ආසියාතික කලාපයට යොමු වෙලා තිබෙනවා. Logistics hub එකක් ඉදිකිරීම සඳහා අපට විශාල ඉඩ ප්‍රස්ථාවක් තිබෙනවා. එවැනි අවස්ථාවකදී අපේ ඉඩම මේ ආකාරයෙන් හිර කරගෙන තබා ගැනීම නිසා එම අවස්ථාව අපට මගහැරී යනවා. ඒ නිසා තමයි අඩුම තරමින් එක ගඩොලක්වත් තබා නැති, එක පස් පිඩැල්ලක්වත් මේ වෙනුවෙන් කපා නැති මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා ඉඩකඩ සලසා දිය යුතු බවට අපි තීරණය කළේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්න බලාපොරොත්තු වන ප්‍රශ්නයට තමයි මම ඊළඟට උත්තර දෙන්නේ. දැන් මෙතැනදී කියනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 26ක මුදලක් ලබාගෙන තිබෙනවා, එයින් බදු මුදල අඩු කරලා චීන සමාගමට ඇමෙරිකානු ඩොලර් මිලියන 21ක් ගෙවනවා කියලා. ඒක නේද ප්‍රශ්නය?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

එහෙම නම්, ඊළඟට අහන්න. *[බාධා කිරීමක්]* හරි. මම හිතුවා, ඒක තමයි ප්‍රශ්නය කියලා. *[බාධා කිරීමක්]* මම ඒ ගැන හිතුවා. හරි, එච්චරයි, එච්චරයි. අහගෙන ඉන්න. *[බාධා කිරීමක්]* ඊළඟට මම කියන දේ අහගෙන ඉන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇමෙරිකානු ඩොලර් මිලියන 26ක මුදලක් තැන්පත් කරලා තිබුණා නේ. ඒකෙන් සියයට 15ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සියයට 15ක් Access Engineering, සියයට 70ක් චීන සමාගම වශයෙන් තමයි තැන්පත් කර තිබුණේ. එතකොට අර බදු මුදල සඳහා තිබෙන VAT එකයි, set-off payment එකයි අයින් කළාම එතැන ඩොලර් මිලියන 4.095ක් තිබෙනවා. ඩොලර් මිලියන 21.95ක් මේ උදවිය තැන්පත් කරපු මුදල්. ඒ තැන්පත් කරපු මුදල් ප්‍රමාණයෙන් ඩොලර් මිලියන 4.095ක් අඩු කරලා, ඉතිරි මුදල් ටික ඒ අයටම නැවත බෙදා දෙනවා. එතකොට චීන සමාගමට ඩොලර් මිලියන 15.335ක් යනවා. ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඩොලර් මිලියන 3.2ක් යනවා. Access Engineering එකට ඩොලර් මිලියන 3.2ක් යනවා. බොහොම සරලයි. ව්‍යාපෘතිය අවසන් වනකොට තැන්පත් කරපු මුදල්, යම් බදු මුදලක් අයින් කරලා ඉවර වෙලා, ඉතිරි ටික ඒ අය තැන්පත් කරපු අනුපාතයට අනුව ඒ අයට නැවත බෙදා දෙනවා. මේකෙන් රජයට කිසිම අලාභයක්, මූල්‍ය අලාභයක් සිදු වෙලා නැහැ. නමුත්, මම කලින් කිව්වා වාගේ logistics centre එකකට ශ්‍රී ලංකාව ඇතුළු මේ දකුණු ආසියාතික කලාපයේ විශාල අවස්ථාවක් තිබෙනවා. මේ ව්‍යාපෘතිය අවසන් කරලා ආයෝජන යෝජනා ඉතා ඉක්මනින් කැඳවීම සඳහා අපි මේ වනකොට කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා, අපිට තිබෙන අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන ඉදිරියේදී කොළඹ වරාය ඇතුළු ලංකාව logistics hub එකක් හැටියට මේ කලාපය තුළ දියුණු කිරීම සඳහා ඉතා ඉක්මනින් කටයුතු කරනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

පැහැදිලි කිරීමක් කරගන්න මට තත්පර කිහිපයක් දෙන්න, ගරු ඇමතිතුමනි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය අවසර දෙනවා නම් ඔබතුමා කථා කරන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට තත්පර 30ක කාලයක් දෙන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඔය ගැන ඇහුවේ නැහැ. ඔබතුමා මගේ හිතේ නැති දෙයක් කියන්න පටන් ගත්තා. කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය සම්බන්ධයෙන් ඔබතුමන්ලා මොකක්ද දැන් කරන්නේ? අපේ සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා ඇතුළු අපි ඔක්කොම පෙළපාළි ගිහිල්ලා, මේ ජැටිය බොහොම අමාරුවෙන් බේරා ගත්තා, ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවෙන් ඒක දෙන්න හදනකොට.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කෙටියෙන් අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමන්ලා ඒක දෙනවාද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඔබතුමා ඒක වෙනම ප්‍රශ්නයක් හැටියට අහන්න. එතකොට මම ඒකට උත්තර දෙන්නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ඉතින් ඒක දැන් කියන්නකෝ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

හරි, හරි. ඒ කාරණය සරල නැහැ නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මට වෙලාව දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා වෙනම ප්‍රශ්නයක් හැටියට අහන්න, මම උත්තර දෙන්නම්. ඔය කාරණය ඔබතුමාට ප්‍රශ්නයක් හැටියට අහන්න ඕනෑ තරම් අවස්ථාව තිබෙනවා නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා ඒක ප්‍රශ්නයක් හැටියට අහන්න. එතකොට මම උත්තර දෙන්නම්. *[බාධා කිරීමක්]* ජනාධිපතිතුමා මේ වෙනකොට පැහැදිලි කර තිබෙනවා, මොකක්ද කරන්නේ කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සිවරාසා අනෝජන් කියන අපේ තරුණයා සවුදි අරාබියේදී මරණීය දණ්ඩනයට නියම වෙලා

හිටියා. සවුදි අරාබියේ නීති ක්ෂේත්‍රය හරහා, එතුමාට මරණීය දණ්ඩනය නොමැතිව යම් සහනයක් ලබා ගැනීමට අපට හැකියාව ලැබුණා. ඒ සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට මම බලාපොරොත්තු වෙනවා. ඊට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මේ කාරණාවේදී අපි සියලුදෙනාම ශ්‍රී ලාංකිකයෝ හැටියට තමයි කටයුතු කළේ. මෙතැනදී අපට දේශපාලනය අදාළ වුණේ නැහැ, ආගම, ජාතිය අදාළ වුණේ නැහැ.

මේ කාරණාවේ ඇති විශේෂත්වය මෙයයි. අතිගරු ජනාධිපතිතුමා, විදේශ කටයුතු අමාත්‍යතුමා, එහි තානාපතිතුමා, අපේ විපක්ෂ නායකතුමා ඇතුළු සමස්ත ශ්‍රී ලාංකික ජනතාවගේම ප්‍රාර්ථනාව සහ කර්තව්‍යය වූයේ අපි මේ අනෝජන්ව මරණීය දණ්ඩනයෙන් බේරා ගන්නේ කොහොමද කියන එකයි. ඒ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා අපට අවසර දුන්නා. ජනාධිපති නීතිඥ උපුල් කුමරප්පෙරුම මැතිතුමා, මම සහ අතිරේක සොලිසිටර් ජනරාල් සහ ජනාධිපති නීතිඥ අසාද් නවාවි කියන අපි සියලුදෙනාම සවුදි අරාබියට ගියා. මුලින්ම මහාධිකරණයේදී සිවරාසා අනෝජන් ඉස්ලාම් ධර්මයේ නබිසල්තුමාට අපහාස කිරීම සම්බන්ධයෙන් ඔහුට අවුරුදු 5ක සිර දඬුවමක් සහ රියාල් මිලියන 3ක දඩයක් නියම කළා. ඒ සම්බන්ධයෙන් සිවරාසා අනෝජන්ගේ දෙමව්පියන්ට අභියාචනයක් ගොනු කිරීමේ අවශ්‍යතාව තිබුණා. හැබැයි, සවුදි රජය විසින් අභියාචනාධිකරණයට අභියාචනා කළා, ඔහුට ලබා දුන් ඒ දඬුවම මදි කියලා. සවුදි ආණ්ඩුව කිව්වා, මොහුට ලබා දී තිබෙන මේ අවුරුදු 5ක සිර දඬුවම මදි කියලා. එහිදී අභියාචනාධිකරණය එම වරද "හද්" යන කාණ්ඩයට දැම්මා. ඒ කියන්නේ, දෙවියන්ගේ නීතිය සම්බන්ධයෙන් වරදක් කියන ගණයට දාලා ඒ තරුණයාට මරණීය දණ්ඩනය තීන්දු කළා. ඉන්පසුව තිබුණු එකම විකල්පය වුණේ ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු කිරීම පමණයි. ඒ කියන්නේ, "හද්" ගණයේ වරදකදී ඒ රටේ රජුට වුණත් සමාව දීමේ හැකියාව නැහැ. ඒ නිසා අපේ රජයට සහ ඔහුගේ දෙමාපියන්ට තිබුණු එකම විකල්පය වුණේ ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු කිරීම. ඒ සම්බන්ධයෙන් එම රටේ සිටින තානාපතිතුමා සමඟ අපි සාකච්ඡා කළා. ඒ වාගේම, අපි නීති සමාගමත් එක්ක දීර්ඝ ලෙස සාකච්ඡා සිදු කළා. ඒ නීති සමාගමට අවශ්‍ය කරන සියලුම ගෙවීම් කරන්න රජය මැදිහත් වුණා. ඒ නිසා අපි - උපුල් කුමරප්පෙරුම මැතිතුමා, මම, හපීල් ෆාරිස් මහතා සහ අතිරේක සොලිසිටර් ජනරාල් අසාද් නවාවි මහතා - ඒ නීති සමාගමත් එක්ක සාකච්ඡා කරලා, එහි සිටින නීතිඥ මහත්වරුන් සමඟ එකතුවෙලා නීති තර්ක කිහිපයක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කළා. එම රටේ පෙත්සම් ගොනු කරන්නේ, online මාර්ගයෙන්. ඊට පස්සේ අපට සුබදායී ආරංචියක් ලැබුණා. ඒ, මරණීය දණ්ඩනය අහෝසි කරලා නැවත මේ නඩුව දැන් මහාධිකරණය වෙත යොමු කරලා තිබෙනවා කියන එක.

මෙහි විශේෂත්වය මේකයි. සාමාන්‍යයෙන් "හද්" කාණ්ඩයේ, ඒ කියන්නේ දෙවියන්ට අපහාස කිරීම, දෙවියන්ගේ නීතිය සම්බන්ධයෙන් වරදක් කළාම, ඒ සඳහා නීතියෙන් නියම කර ඇති දඬුවම් ඒ රටේ උසාවි පද්ධතිය වෙනස් කරලා නැහැ. ඒ අනුව ගත්තාම, මේක ලාංකිකයන් හැටියට අප ලැබූ විශේෂ ජයග්‍රහණයක් හැටියටයි අපි දකින්නේ. ඒ වාගේම, මේ සිදුවීම ජාතික සමගියටත් හොඳ උදාහරණයක්. හේතුව, මෙහිදී කිසිම කෙනෙකුට ඒ පුද්ගලයාගේ ජාතිය, ආගම වැදගත් වුණේ නැහැ. ඒ පුද්ගලයා කල්මුණේ ප්‍රදේශයේ තරුණයෙක්. ඒ ප්‍රදේශයේ මුස්ලිම් සහ දෙමළ කියන ජන කොටස් දෙකම ජීවත් වෙනවා. ඉතින්, මෙවැනි ක්‍රියාදාමයන් තුළින් අපට ජාතික සමගිය තව තවත් ශක්තිමත් කරන්න පුළුවන් වෙයි. ඒක තමයි මගේ ප්‍රාර්ථනාව.

මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් අපි මුහුණ දිය යුත්තේ කොහොමද? ඔහු සාමාන්‍ය සේවකයෙක් නොවෙයි, ඉංජිනේරුවරයෙක්. ලාංකිකයන් පිට රට යනකොට අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයට විශේෂ වගකීමක් තිබෙනවා, ඒ රටේ සංස්කෘතිය, නීතිය පිළිබඳ ඒ පුද්ගලයන්ව දැනුවත් කරන්න. මම විශ්වාස කරනවා, අපේ පහළ මට්ටමේ ශ්‍රමිකයන්ට දැන් ඒ දැනුවත් කිරීම කරනවා කියලා. මේ පුද්ගලයා ඒ post එක දාලා විනාඩි 10කින් ඒක ඉවත් කළා. ඒක දෙමළ භාෂාවෙන් පළ කරපු post එකක්. හැබැයි, ඒ විනාඩි 10 ඇතුළත වෙන කෙනෙක් ඒක පරිවර්තනය කරලා අදාළ අංශවලට භාර දීම තුළින් තමයි මේ සිදුවීම වුණේ. ඒ නිසා අපි සෑම විටම බැලිය යුතුයි, මෙවැනි අභියෝගවලට අපි මුහුණ දෙන්න ඕනෑ කොහොමද කියලා. අපේ ලාංකිකයෝ හුඟක් ඉන්නවා, වෙනත් රටවල ශ්‍රමිකයින් වශයෙන්. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 10කට වැඩි ප්‍රමාණයක් මැද පෙරදිග සහ අනෙකුත් රටවල ශ්‍රමිකයන් හැටියට කටයුතු කරනවා. ඒ පුද්ගලයන්ට නොයෙක් අවස්ථාවලදී නොයෙක් අභියෝගවලට මුහුණ දීමට සිදු වෙනවා. ඒ නිසා මා විශ්වාස කරනවා, ඒ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි ශක්තිමත් ස්වේච්ඡා සංගමයක් පිහිටුවිය යුතුයි කියලා. ඒ වාගේම, මේ ශ්‍රමිකයන් හරහා අපට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ලැබෙන නිසා ඔවුන් සම්බන්ධයෙන් අපි වෙනම fund එකක් ඇති කළ යුතුයි. මේ අවස්ථාවේදී විදේශ කටයුතු ඇමතිතුමාගේ සහ ජනාධිපතිතුමාගේ මැදිහත්වීමක් සිදු වුණේ නැත්නම් අනිවාර්යයෙන්ම ඒ පුද්ගලයාට මරණීය දණ්ඩනය ක්‍රියාත්මක වෙනවා. කලින් රිසානාගේ සිදුවීම දෙස බලනකොට එහිදී දේශපාලන මට්ටමින් තමයි අපි සම්බන්ධ වුණේ. මෙහි තිබෙන විශේෂත්වය තමයි, අතිගරු ජනාධිපතිතුමාට මේ ගැන පැහැදිලි කිරීමක් කළාට පසු එතුමා තීන්දු කළා අධිකරණය හරහා තමයි මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වන්නේ කියලා. ඒ වාගේම, 27වැනි දා මේ සම්බන්ධ නඩුව මහාධිකරණයේ කැඳවනවා. අපි බලාපොරොත්තු වෙනවා, එහිදී ඔහුගේ දඬුවම ලිහිල් කරයි කියලා. We hope that he would get a lesser sentence or would be deported. Nobody could take away the fact that there was an insult to the Holy Prophet, which is wrong. However, we, as Sri Lankans, did our best to safeguard his interests and to save him from death sentence. There are so many prisoners in Saudi Arabia facing similar situations. So, he is lucky that the Supreme Court took this lenient approach by saying that this does not fall within "*Hadd*", but within "*Tazir*". What is "*Tazir*"? "*Tazir*" means man-made law. The five years' imprisonment which was originally given for cybercrimes and that fine of 3 million Saudi Riyals was on the premise that it fall within "*Tazir*".

We should also realize that in Saudi Arabia, any criticism of their religion is taken very seriously because their culture and religion form part of governance. ඒ කියන්නේ, සවුදි අරාබියේ නීතිය සහ ආගම අතර කිට්ටු බැඳීමක් තිබෙනවා. දණ්ඩනීය තීන්දු හුඟක් සිදුවෙන්නේ ආගම ආශ්‍රිතව බිහිවුණු නීතියක් නිසා. So, we have to be very cautious.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Once again, I say that this approach of all of us working together as Sri Lankans should continue and this incident has created racial harmony and we have acted as true Sri Lankans.

Thank you.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.27]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අද දිනයේදී විපක්ෂය විසින් ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ යෝජනාව ගැන කරුණු ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් කාරණයක් කියන්න ඕනෑ. මට කලින් කථා කරපු ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය ගැන එතුමාට රජය හැටියට අපත්, ශ්‍රී ලාංකික පුරවැසියෙක් හැටියට, මේ සභාව නියෝජනය කරන මහජන නියෝජිතයෙක් හැටියට මමත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත්, ඔබතුමා සමඟ ගිය නියෝජිත කණ්ඩායමත් අපේ රට නියෝජනය කළා. රට නියෝජනය කරන්න ඕනෑ වෙලාවේ අපි පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපේ රට නියෝජනය කරනවා කියන එක ඔබතුමන්ලා පෙන්නුම් කළා. ඇත්තටම ඔබතුමාට ගොඩක් ස්තුතියි, ඒකට නායකත්වය දුන්නාට; ඒකට මැදිහත් වුණාට. මම වාගේම මේ සභාවේ සියලුදෙනා ඔබතුමාටත්, ඒ කණ්ඩායමේ සියලුදෙනාටත් ඒ වෙනුවෙන් නැවතත් ස්තුතිය පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින විපක්ෂය විසින් විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මඟින් ඉදිරිපත් කර තිබෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවේ මූලික කාරණා කිහිපයක් තිබෙනවා. එකක් තමයි, රටේ උද්ධමනය වැඩියි කියන එක. ඊළඟට භාණ්ඩ මිල ඉහළ ගිහිල්ලා, කෘෂි හා වැවිලි ආර්ථිකයේ නිෂ්පාදන ක්‍රියාවලියේ පිරිවැය වැඩිවෙලා බරපතළ බලපෑමක් වෙලා තිබෙනවාය කියනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය ඖෂධ මිල වැඩිවෙලා, ශල්‍ය උපකරණවල මිල වැඩිවෙලා ඒ ක්ෂේත්‍රය බිඳ වැටිලා, අධ්‍යාපනය බිඳ වැටිලා, අත්‍යවශ්‍ය පොත්පත් සහ උපකරණවල මිල ඉහළ ගිහිල්ලා, ඉන්ධන මිල ඉහළ ගිහිල්ලා, පිරවුම්හල්වල ඉන්ධන සීමාවෙලා, රට පුරා ගෑස් හිඟයක් තිබෙනවා, විදුලි බිල ඉහළ ගිහිල්ලා, විදුලි සැපයුම කඩා වැටිලා, ප්‍රවාහන ගාස්තු ඉහළ ගිහිල්ලාය කිව්වා. පරිසර ප්‍රශ්න තිබෙනවා, සංස්කෘතික ප්‍රශ්න තිබෙනවා, ජන ජීවිතය කඩාවැටිලා තිබෙනවාය කියනවා. මේ විධියට ගත්තාම මුළු රටම වැටිලා; ගන්නම දෙයක් නැහැ; බරපතළ අර්බුදයක් තිබෙනවා. ඒක තමයි මේ යෝජනාව තුළින් එතුමා ඉදිරිපත් කරන කාරණය. මට කලින් කථා කරපු ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා, එතුමාට ලැබිච්ච කාලය තුළ වැදගත් සාකච්ඡාවක් සිදු කළා. එතුමාට මේ ප්‍රශ්න තිබුණේ නැහැ. ඒ වාගේම රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කථා කරනවාත් මම අහගෙන හිටියා. එතුමා එතුමාගේ දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රශ්න ටිකක් නියෝජ්‍ය ඇමතිතුමාට යොමු කළා. ඒවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් විසඳාගන්න තිබෙන ගැටලු ටිකක්. මුස්ලිම් කොංග්‍රසය හැටියටවත්, විපක්ෂය හැටියටවත් එතුමාට මේ ප්‍රශ්න ටික තිබුණේ නැහැ. එතකොට මම කල්පනා කළා, මේ ප්‍රශ්න තිබෙන්න පුළුවන් කාටද කියලා. මේ ප්‍රශ්න අඩු වැඩි වශයෙන් අපේ රටේ ජනතාවට තිබෙනවා කියන එක අපි පිළිගන්නවා වාගේම අපි ඒක දන්නවා.

නොරොච්චෝලේ බලාගාරයේ ඇති වෙච්ච ප්‍රශ්නයත් එක්ක විදුලිය සම්බන්ධයෙන් අර්බුදයක් ඇති වුණා. ඒ system එකට එකවරම ඇතිවෙච්ච පීඩනය දරාගන්න බැරිවීම නිසා ඇති වෙච්ච shock එකෙන් සිදුවුණු වෙනස්කම් පිළිබඳව විදුලිබල ඇමතිතුමා පැහැදිලි කළා. ඉන්ධන මිලෙහි ඇතිවෙච්ච තත්ත්වය ගත්තාම, ලෝකයේ ඇතිවෙලා තිබෙන යුද්ධය තත්ත්වයත් එක්ක ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල සියයට 198කින්, 156කින් විතර වැඩිවෙලා තිබෙනවා. අපිට සියයට 45කින්, 46කින් තමයි ඉන්ධන මිල වැඩිකරන්න සිද්ධ වුණේ. යුරෝපයේ රටවල තරමටවත් අපි අපේ රටේ ජනතාවට ඒ පීඩනය දීලා නැහැ.

අද යුරෝපයේ ඔබතුමන්ලාගේ පරමාදර්ශී රටවල් වන ඉතාලියේ සහ ප්‍රංශයේ පැරිස් නගරයේ දැවැන්ත උද්ඝෝෂණ පැවැත්වෙනවා; ශිෂ්‍යයෝ පාරවල්වල ගහගන්නවා; වීථිවල සටන් සිදුවෙනවා. ජනතාව ආණ්ඩු එක්ක ගැටෙනවා, ජාත්‍යන්තර මට්ටමින් ඇතිවෙලා තිබෙන යුද්ධය තත්ත්වය තුළ ඇති වූ මේ ආර්ථික අර්බුදය නිසා. හැබැයි, ලංකාවේ අයට ඒක ඒ තරම් දැනෙන්න දීලා නැහැ. ඒක මේ රටේ ජනතාව දන්නවා. හැබැයි, මට තේරුම් ගන්න පුළුවන්, විපක්ෂය මේ තරම් සංකීර්ණ විධියට මේ යෝජනාව ඉදිරිපත් කළේ ඇයි කියලා. මොකද, ආණ්ඩු බලය අහිමි වුණාට පස්සේ විපක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවකට මේ ප්‍රශ්න ටික මතුවෙලා තිබෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රශ්න මතුවෙලා තිබෙනවා. ජනාධිපති අරමුදලෙන් නොමිලේ සල්ලි අරගෙන, සිංගප්පූරුවට ගිහිල්ලා ඒ රෝහල්වලින් බෙහෙත් ගත් කට්ටියට; ජනතාවගේ බදු මුදලින් බෙහෙත් ගත් කට්ටියට ඒක දැන් අහෝසි වෙලා තිබෙනවා. ඒගොල්ලන්ට දැන් සාමාන්‍ය මිලට බෙහෙත් ගන්න සිදුවෙලා තිබෙනවා. විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට ජනාධිපති අරමුදලේ පහසුව නැති වෙච්ච නිසා ඔවුන්ට බෙහෙත්වල - ඖෂධවල - ප්‍රශ්නයක් තිබෙනවා කියලා මට හිතෙනවා. ඒක එක කාරණයක්.

ඊළඟට, වාහන අර්බුදයක් තිබෙනවා. ප්‍රවාහන වියදම් ප්‍රශ්නය මෙතුමන්ලාට තදටම තිබෙනවා. මම ඒක පිළිගන්නවා. ඒ, වාහන permit එක අහෝසි කරපු නිසා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විශේෂයෙන්ම පසුගිය කාලයේ වාගේ unlimited වාහන permit එක තිබුණා නම්, වාහන permit එක විකුණලා, ඒකෙන් ආදායමකුත් හොයාගෙන ඒකට තව වාහනයකුත් ගන්න පුළුවන්කම තිබුණා. ඒක නිසා ප්‍රවාහන ප්‍රශ්නයක් තිබෙනවා ඇති. ඒත් තම තමන්ගේ වාහන තිබෙනවා නේ, හුඟක් දෙනෙකුට. හැබැයි, නොමිලේ ප්‍රවාහනය නැහැ, දැන්.

ඊළඟට, ඉන්ධන ප්‍රශ්නය, විදුලි බිලේ ප්‍රශ්නය, ටෙලිෆෝන් බිලේ ප්‍රශ්නය අනිවාර්යයෙන්ම විපක්ෂයේ ඔබතුමන්ලාට තිබෙන්න පුළුවන්. ඒ, ඇමති නිල නිවාස නැති නිසා. මොකද, බලය තිබුණු කාලයේ ඔබතුමන්ලාට ඇමති නිල නිවාස තිබුණා. ඒ කාලයේ ඔබතුමන්ලාට විදුලි බිල ගෙව්වේ ආණ්ඩුවෙන්, ඉන්ධන පොත ආණ්ඩුවෙන්. ඒවායෙන් ඇමතිතුමාත් ගහ ගන්නවා, වටේ පිටේ අයත් ගහ ගන්නවා, නෑදෑයෝත් ගහ ගන්නවා, යාළු මිත්‍රයෝත් ගහ ගන්නවා; ඒ ඔක්කෝටම බෙදා ගන්නවා. නමුත්, දැන් අර්බුදයක් තිබෙන්න පුළුවන්, අපේ රජයේ ප්‍රතිපත්තිය අනුව අපි ඒවා අහෝසි කරලා තිබෙන නිසා. වාහන, ඉන්ධන, විදුලි බිල පිළිබඳ ප්‍රශ්න තිබෙන්න පුළුවන්, නිල නිවාස අහෝසි කරපු නිසා. ලයිට් බිල්, වතුර බිල්, ටෙලිෆෝන් බිල් ගැන ඔබතුමන්ලාට දැන් ටිකක් දැනෙනවා. කලින් ඔබතුමන්ලාට ඒවා දැනුණේ නැහැ, රජය ජනතාවගේ බදු මුදල්වලින් ඒ වියදම් සියල්ල කළ නිසා. අත්‍යවශ්‍ය භාණ්ඩවල ප්‍රශ්නයකුත් ඇති කියලා මට හිතෙනවා. මොකද, ඉස්සර වාගේ ටෙන්ඩර්, කොමිස් නැහැ; දැන් zero corruption. ඔය ඇතුළට ගිහිල්ලා ඉන්න සමහර අයගේ බිල් බලනකොට, ඒගොල්ලන්ට ලැබුණු ඒවා බලනකොට, ඒගොල්ලන් අරගෙන තිබෙන තැන් බලනකොට අපට හිතෙනවා, ඔබතුමන්ලාට ඇත්තටම ප්‍රශ්නයක් තිබෙන්න පුළුවන් කියලා. බහුතරයකට ප්‍රශ්නයක් තිබෙන්න පුළුවන්. මොකද, ඔය

බහුතරයක් දෙනා ජනතාවගෙන් තමයි යැපිලා තිබෙන්නේ. සමහරු jewellery shopsවලින් අරගෙන තිබෙනවා. සමහරු මැණික් බිස්නස් කරන අයගෙන් අරගෙන තිබෙනවා. එහෙම ගත්තු කට්ටිය දැන් ඒවා වමාරනවා. සමහරු පෞද්ගලික ලේකම්ලා එකතු කරගෙන අරගෙන තිබෙනවා. පෞද්ගලික ලේකම්ගේ ගෙදර පරීක්ෂා කරනකොට, එතැන සේප්පුවක් තිබෙනවා. ඒ කියන්නේ, තමන්ගේ ගෙදර තියන්න ඉඩ නැති හින්දා පෞද්ගලික ලේකම්ගේ ගෙදරත් තියලා තිබෙනවා. එහෙම අයට දැන් ප්‍රශ්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප කියන්නේ මේකයි. මේ රටේ ජනතාවට ප්‍රශ්න නැහැ නොවෙයි, තිබෙනවා. ආණ්ඩුවක් හැටියට අපි ඒක හොඳින්ම දන්නවා. අපට ඒක දැනෙනවා. හැබැයි, ඒ ප්‍රශ්නවලට අපි මේ අවුරුදු දෙක ඇතුළත උත්තර සොයලාත් තිබෙනවා, සොයමිනුත් ඉන්නවා. උදාහරණයකට, දරුවන්ට අත්‍යවශ්‍ය පොත් සහ පාසල් උපකරණ පිළිබඳව ඔබතුමන්ලා මේ යෝජනාවේ සඳහන් කර තිබෙනවා. ජනවාරි 01වන දා සිට නොමිලේ පොත් ටික දෙනවාට අමතරව අඩු ආදායම්ලාභී පවුල්වල සෑම දරුවෙකුටම රුපියල් 6,000ක ලිපි ද්‍රව්‍ය දීමනාවක් දුන්නා. ඔබතුමන්ලා ඒකත් සිහිපත් කරලාම මේවා කිව්වා නම් හොඳයි. සපත්තු ජෝඩුව පාසල් ළමුන්ට නොමිලේ දෙන්න තීරණය කළා. වවුචරය අරගෙන ගිහිල්ලා කඩවලින් ඉල්ලනකොට පරණ -expire - වෙච්ච stocksවලින් නිදහස් කරන සපත්තු දෙන හින්දා අපි දැන් සපත්තු companies ගෙන්වලා, ඒ companies එක්ක සාකච්ඡා කරලා ඒ companiesවලින්ම අලුත් සපත්තු ජෝඩුව පාසල් දරුවන්ට පාසලටම ගෙනිහිල්ලා දෙනවා. ඒ නිසා පාසල් වාරය ආරම්භ වනකොට දැන් හම්බ වෙන්නේ තොග - stocks - අවසන් කිරීමේ සපත්තු ජෝඩු නොවෙයි. අපට එහෙම ගැටලු ඇවිල්ලා තිබුණා. අධ්‍යාපන අමාත්‍යාංශයත්, අපේ කර්මාන්ත අමාත්‍යාංශයත් සාකච්ඡා කරලා සපත්තු හදන companiesවල සහයෝගයෙන් ඔවුන්ගේම බෙදා හැරීමේ යාන්ත්‍රණය හරහා පාසලටම අලුත්ම සපත්තු ජෝඩුවක් අපි නොමිලේ ලබා දෙනවා. ඒ, රජයේ අලුත් ප්‍රතිපත්තිය අනුවයි.

ඊළඟට අපි අස්වැසුම දීමනාව වැඩි කර තිබෙනවා, වැඩිහිටි දීමනාව වැඩි කර තිබෙනවා, වකුගඩු රෝගීන්ට දෙන දීමනාව වැඩි කර තිබෙනවා, රුපියල් 15,000ක්ව තිබුණු පොහොර සහනාධාරය රුපියල් 30,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ ආකාරයෙන් අපි ජනතාවට සහන දීලා තිබෙනවා. සාමාන්‍ය ජනතාවට අර්බුද තිබුණත්, ඒ ජනතාව දන්නවා මේ ආණ්ඩුව ප්‍රශ්න විසඳන්න මැදිහත් වෙනවා, මහන්සි වෙනවා, ජනතාව දුක් විඳිද්දී හොරකම් කරලා සැප විඳින ජීවිතයක් අපට නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතාවගේ ප්‍රශ්න නොවෙයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න මේ තිබෙන්නේ. මේ තිබෙන්නේ නිල නිවාස නැති වීම නිසා, වාහන permit එක නැති වීම නිසා, අවුරුදු පහෙන් පහට ගත්තු pension එක නැති වීම නිසා තිබෙන ප්‍රශ්න. Pension එක ගත්තු මන්ත්‍රීවරුන්ටත් දැන් පඩි ප්‍රශ්නයක් තිබෙනවා නේ. Pension එක අහෝසියි. අන්න ඒගොල්ලන්ගේ ප්‍රශ්න මේ තිබෙන්නේ. පෞද්ගලික කාර්ය මණ්ඩලයට ගෙදර කට්ටිය දාගෙන ඒ සල්ලිත් account එකට දාගත්තු සමහර කට්ටිය හිටියා. ඒගොල්ලන්ට ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම, ටෙන්ඩර්වලින් හොරකම් කරපු ඒවා තිබෙනවා, පගාව ගත්තු ඒවා තිබෙනවා. ඒ ජීවිත ගත කරන්න දැන් බැරි නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න තිබෙනවා. ඉතින් මොකද කරන්නේ? බලය තිබෙනකොට ඒවා තිබුණාට බලය නැති වුණාට පස්සේ ඒවා නැති වෙන බව දැනගෙන ඉන්න ඕනෑ. එහෙම නැති නිසායි මේ ප්‍රශ්න. ඒ වාගේම, වෙනදා ඒගොල්ලන්ගේ පැත්තෙන් මේගොල්ලන්ට බලය මාරු වනකොට සමහර අර්බුද බේරාගන්නත් පුළුවන්කම තිබුණා. දැන් එහෙමත් බැහැ නේ. කථා කරලා ඒ අර්බුද බේරාගන්නත් බැහැ. ඒ නිසා ඔබතුමන්ලාට ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා තමයි මේ ප්‍රශ්න. ඔබතුමන්ලා මේ යෝජනාව සංශෝධනය කළා නම් ගැළපෙනවා, "ජනතාව" කියන වචනය වෙනුවට "විපක්ෂයේ මන්ත්‍රීවරුන්" කියලා යොදලා. ඒ කියන්නේ මේ විධියට.

"එබැවින්, මෙම කාරණාවලදී රජයේ දැඩි අසංවේදී බව හේතුවෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් තව තවත් පීඩාවටත්, අර්බුදයටත් ලක් වී ඇති හෙයින්, රජය වහාම මේ පිළිබඳ අවධානය යොමු කර විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අවශ්‍ය කඩිනම් හා ස්ථාවර විසඳුම් ලබා දිය යුතු බවට සභාවට යෝජනා කරමි"

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එහෙම යෝජනා කළා නම් අපට ගිහිල්ලා මේක ගැන පොඩ්ඩක් කථා කරන්න තිබුණා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ ඉඳගෙන කම්කරුවාත් එක්ක මහ පාරේ වීදි සටන් කරලා ආණ්ඩු බලය ලබාගෙන දැන් කැබිනට් වලාකුළුවල ඉඳගෙන, කෙඳි වලාකුළුවල ඉඳගෙන දොඩවන බහුබූත මේ රටේ ලක්ෂ 220ක ජනතාවක් අහගෙන ඉන්නවා. මේ රටේ ලක්ෂ 220ක ජනතාව වෙනුවෙන් මම අහන්න කැමැතියි, ප්‍රශ්න කිහිපයක්. මම රජයට ආරාධනා කරනවා, කෙළින් උත්තර ටික දෙන්න කියලා. උද්ධමනය ඉහළ ගිහිල්ලා, ජීවන වියදම, ජීවන බර වැඩි වෙලා. මොකක්ද, ඒකට රජයේ විසඳුම? දුප්පත්කම, බහුමාන දරිද්‍රතාව - multi-dimensional poverty - නිසා අඩු ආදායම්ලාභී පවුල් පීඩනකාරී තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මොකක්ද ඒකට උත්තරය, මොකක්ද විසඳුම? ආහාර මිල ඉහළ ගිහිල්ලා, පෝෂණ ගැටලු නිර්මාණය වෙලා, මව්වරුන්ගේත්, දරුවන්ගේත් මන්දපෝෂණය වැඩි වෙලා. මොකක්ද ඒකට විසඳුම, මොකක්ද උත්තරය? වැටුප්වල, ආදායමේ ක්‍රය ශක්තිය පහළ වැටිලා. යම් මුදලකට එදා ලබාගත හැකිව තිබූ භාණ්ඩ ප්‍රමාණය අද අඩු වෙලා. මේ ගැටලුවට මොකක්ද විසඳුම, මොකක්ද උත්තරය? ඉන්ධන මිල ඉහළ ගිහිල්ලා, නිෂ්පාදන පිරිවැය ඉහළ ගිහිල්ලා. මොකක්ද ඒකට ආණ්ඩුවේ විසඳුම, මොකක්ද උත්තරය?

විදුලි බිල අඩු කරනවා කියලා කිව්වා, සියයට 33කින්. ඊටත් වඩා වැඩි ප්‍රමාණයකින් දැන් විදුලි බිල වැඩි කරලා. රුපියල් 9,000 විදුලි බිල රුපියල් 6,000 කරනවා කිව්වා. රුපියල් 3,000 විදුලි බිල රුපියල් 2,000 කරනවා කිව්වා. බොරු; ටොන්පව දේශපාලනය තුළින් රටේ බලය ගත්තා. අධික විදුලි බිල නිසා පීඩාවට පත් වන ජනතාවට මොකක්ද දෙන විසඳුම, මොකක්ද දෙන උත්තරය? ගෑස් මිල ඉහළ ගිහිල්ලා. මොකක්ද ඒකට රජය දෙන උත්තරය සහ විසඳුම? ප්‍රවාහන ගාස්තු ඉහළ ගිහිල්ලා. දෛනික ජීවන බර දරා ගන්නට බැහැ. මොකක්ද ඒවාට රජය දෙන උත්තරය, මොකක්ද රජය දෙන විසඳුම? තේ කර්මාන්තය කඩා වැටිලා. පිරිවැය ඉහළ ගිහිල්ලා. කෘෂි කර්මාන්තය කඩා වැටිලා. ගොයම්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කකා කිව්වේ, වී කිලෝවකට රුපියල් 150ක සහතික මිලක් ලබා දෙනවා කියලා. අද ගොවි ජනතාව සහමුලින්ම අනාථ වෙලා. මොකක්ද ඒකට දෙන විසඳුම, මොකක්ද දෙන උත්තරය? රෝහල් පද්ධතියේ ඖෂධ හිඟයක් තිබෙනවා, උපකරණ හිඟයක් තිබෙනවා. රෝහලෙන් චිට් එක හම්බ වෙනවා, නොමිලේ. ගිහිල්ලා පෞද්ගලික ෆාමසියකින් බෙහෙත් ගන්නලු. මොකක්ද ඒකට රජය දෙන උත්තරය, මොකක්ද දෙන විසඳුම? පාසල් උපකරණවලට VAT එක පනවනවා. අධ්‍යාපන පද්ධතිය කඩා වැටිලා. මොකක්ද ඒකට ආණ්ඩුව දෙන උත්තරය, මොකක්ද දෙන විසඳුම? ආහාර අනාරක්ෂිතභාවය නිර්මාණය වෙලා. දරුවන්ට ලැබිය යුතු පෝෂ්‍යදායී අහාර වේල ලබා දෙන්නට අද අතිබහුතරයක් ජනතාව, දෙමව්පියන් අසමත් වෙලා. රජය මොකක්ද ඒකට දෙන විසඳුම සහ උත්තරය? ආපදා තත්ත්වයන් නිර්මාණය වෙලා. ඒවාට විසඳුම් නැහැ. ඒ අයට සහන නැහැ.

විශේෂයෙන්ම අද ආර්ථික වර්ධනය ගැන කථා කරනවා. වර්ධනය වෙලා තිබෙන්නේ මේ රටේ කෝටිපතියන්ගේ, ට්‍රිලියනපතියන්ගේ ආදායම් මාර්ග පමණයි. පුංචි මනුස්සයාට තැනක් නැහැ, සාමාන්‍ය ජනතාවට තැනක් නැහැ, මැද පන්තියට තැනක් නැහැ, වෘත්තියවේදීන්ට තැනක් නැහැ. අද උගතුන් පෝලිමේ රට අත්හැර යනවා. බුද්ධි ගලනයට මොකක්ද දෙන උත්තරය, මොකක්ද දෙන විසඳුම? ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52ක දායකත්වයක් ලබා දෙනවා, ලක්ෂ 40කට ජීවනෝපාය සපයනවා. නමුත්, ඒ පද්ධතියම අද කඩා වැටිලා. මොකක්ද, ඒකට දෙන විසඳුම? මොකක්ද, ඒකට දෙන උත්තරය? ඉතින් මේ තත්ත්වය තුළ අද රටේ ජනතාවගේ සමාජ ආරක්ෂණය, ආර්ථික ආරක්ෂණය බිඳ වැටිලා, පහළටම බැහැලා, දුප්පත්කමේ පීඩනයෙන්, අසහනයෙන් මැද පන්තිය ඇතුළු මේ රටේ සමස්ත සමාජ ස්තරයම අස්ථාවරභාවයට පත්වෙලා, දැවැන්ත ආර්ථික, සමාජයීය ව්‍යසනයකට මුහුණ දෙනවා. මොකක්ද, ආණ්ඩුවට මේ සම්බන්ධයෙන් තිබෙන උත්තරය? මොකක්ද, තිබෙන විසඳුම?

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, වේදිකාවට නඟින්න ඉස්සෙල්ලා අඩුම ගණනේ ජනාධිපතිතුමායි, අගමැතිතුමියයි දෙදෙනා කථා බහ කරලා, ජනතාවගේ ප්‍රශ්නවලට හරියට විසඳුම් ලබා දෙන්න පුළුවන් උත්තර ටිකක් සපයන්න කියලා. කරුණාකරලා කියන්න, ඔය තිබෙන රැලිවලදී අගමැතිනියගෙන්වත්, ජනාධිපතිතුමාගෙන්වත් ජනතාවගේ ප්‍රශ්නවලට උත්තර ලැබෙනවාද කියලා. අඩුම ගණනේ දෙදෙනා හරියට කථා වෙලා එක කථාව හරි, එක පවය හරි, එක ටොන් පවය හරි කියන්නකෝ. එක්කෙනෙක් කියනවා, ආචාර්යවරුන් දෙදහස් ගණනක් බඳවා ගන්නවා කියලා. අනෙක් කෙනා කියනවා, වෙනත් ගණනක්. තවත් වෙලාවක කියනවා, ගුරුවරුන් 30,000ක් බඳවා ගන්නවාලු. අනෙක් කෙනා කියනවා, තවත් ගණනක්. දැන් ඉතින් කොහොම හරි ටොන් පව දේශපාලනය කරලා තැනට ආවා නේ. තැනට ආවාට පස්සේත් තමන්ගේ ටොන් පවය ප්‍රවර්ධනය කරනවා. ටොන් පවය ව්‍යාප්ත කරනවා. ඕනෑ නම් පවය කථා වෙලා කියන්න. හැබැයි, පෙර පාසල් දරුවාගේ ඉඳලාම දන්නවා, මේ රට පාලනය කරන්නේ ටොන්ම ටොන් පව ආණ්ඩුවක්ය කියන එක. ඒක ඉතාම පැහැදිලියි.

මතක තබාගන්න, මේ රටේ ජනතාව අවස්ථාවක් එනකල් බලාගෙන ඉන්නවා. ඒ කියන්නේ, මැතිවරණයක් හරහා ඒ තමන්ගේ හදවතේ කැකෑරෙන දුක, කඳුළ, වේදනාව, පීඩනය, අසහනය පිට කරන්න. රජයේ වගකිවයුත්තන්ට කොන්දක් තිබෙනවා නම්, වහාම පළාත් සහා මැතිවරණය පවත්වන්න. පළාත් සහා මැතිවරණයේදී ආණ්ඩුවට හොඳ එකෙන් උත්තර දෙන්නට මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවාය කියලා මා ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.46]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ අනිල් ජයන්ත අමාත්‍යතුමාගේ කාලයෙන් විනාඩි තුනක කාලයක් මා හට ලබාගෙන තිබෙනවා, එයත් මගේ කාලයට එකතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කථාව ඇහුවාම මට හිතුණේ, ඇත්තටම එතුමාට ලොකු ලණුවක් දීලා කියලායි. එතුමාට කථාවක් ලියලා දීලා; එතුමාට කවුද කථාවක් ලියලා දීලා, එතුමා අමාරුවේ දමන්න. මට නම් හිතෙන විධියට මේ ඉන්නේ සජිත් ප්‍රේමදාස නොවෙයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ කියන්නේ නමත් වෙනස් වෙලා. ඒ නිසා විපක්ෂ නායකතුමනි, ඔබතුමා ඔච්චර අමාරුවේ වැටෙන්න එපා. එක එක්කෙනාට කියලා කථා ලියවගන්න එපා. ඔබතුමාම කථාවක් හදාගෙන කියන්න කියලා මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයෙන් ඉදිරිපත් කරලා තිබෙන මේ Adjournment Motion එක බැලුවාම මට නම් හිතෙන්නේ මේ දේ. ඇත්තටම සාපේක්ෂව ගත්තාම එතුමන්ලාගේ ආණ්ඩුවලට වඩා අපේ ආණ්ඩුව නරක් වෙන්න එපා යැ, මේ විධියට කියනවා නම්. දැන් අපේ හඳුන්නෙත්ති අමාත්‍යතුමා ඒ list එකම කියෙව්වා. ඒ නිසා මම ඒවා කියන්නේ නැහැ. පොදුවේ ගත්තාම, උද්ධමනය ඉහළ ගිහිල්ලා, සංස්කෘතිය ඇතුළු සියල්ල බිඳ වැටිලාය කියලා නේ කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ දිහා අපි සාපේක්ෂව බලමු. අපි බලය ගන්න පෙර පොරොන්දු රාශියක් දුන්නා. ඒ පොරොන්දු රාශියේ සාරාංශය ගනිමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි කිව්වා, හොඳ සංස්කෘතියක් සහිත රටක් හදන්නම් කියලා. දැන් මේගොල්ලන්ගේ Motion එකේ තිබෙනවා, සංස්කෘතිය වැටිලා කියලා. දේශපාලන සංස්කෘතියත්, දේශපාලන සදාචාරයත් අතින් මේගොල්ලන්ට සාපේක්ෂව ගත්තොත්, මිරිස් කුඩු පාර්ලිමේන්තුවට සාපේක්ෂව ගත්තොත් මේ පාර්ලිමේන්තුව තැනකට ඇවිල්ලා නැද්ද? හැබැයි මේ Motion එකේ කියලා තිබෙනවා, සංස්කෘතිය වැටිලා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි පොරොන්දුවක් දුන්නා, ආර්ථික වශයෙන් වැටුණු රට අපි නව මානයකින් නඟලා ගන්නම් කියලා. අවුරුදු 76ක් රට පාලනය කරලා එක්තරා වෙලාවක මේගොල්ලන්ට සිද්ධ වුණා, -ඔබතුමියටත් මතක ඇති- මේගොල්ලන් පාලනය කළ මහ බැංකුවෙන් ලෝකයට නිවේදනයක් නිකුත් කරන්න, අපේ රට බුන්වත් කියලා. අනේ, මේ තව කයිය ගහනවා. එක්තරා වෙලාවකදී ලෝකයට signal එකක් දුන්නා, අපේ රට බුන්වත් කියලා. බුන්වත් කියන්නේ මොකක්ද? පුද්ගලයෙක් බුන්වත් වුණාම පංචස්කන්ධය විතරයි, කවුරු හරි කන්න දුන්නොත් ඒක කාලා මැරෙන්න පුළුවන්. මේගොල්ලන් පුද්ගලයෙක් බුන්වත් කළා නොවෙයි, රටත් බුන්වත් කළා, රටත් බංකොලොත් කළා. රට බංකොලොත් කරලා ඒගොල්ලන්ම අපට ඇඟිල්ල දික් කරලා කියනවා, මේ බලන්නකෝ අධ්‍යාපනය වැටිලා, උද්ධමනය සම්බන්ධයෙන් ගැටලු තිබෙනවා, සංස්කෘතියේ ගැටලු තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ Motion එක ගේන්න මේගොල්ලන්ට කිසිසේත්ම සදාචාරාත්මක හෝ වෙනත් හැකියාවක් නැහැ. අපි මේ රට ගන්නකොට ආර්ථිකය සම්බන්ධයෙන් වසර 76ක් තිස්සේ පිටිකර බැන්ද බෙහෙත්වලින් පය බරවාය සුව නොවන බව පැහැදිලිවම තේරුම් අරගෙන තිබුණා. ඒ වාගේම වසර 76ක් තිස්සේ අතිසාරයට ගැසූ අමුඩය තවදුරටත් තද කරන්න බැහැ කියලාත් අපි දැනගෙන හිටියා. එහෙම දැනගෙන තමයි අපි මේ ආර්ථිකය ගත්තේ.

අපි දැක්කා, ඒ කාලයේ තෙල් නැව මුහුදේ පාවෙනවා, ගෙවන්න ඩොලර් නැහැ. එහෙම කාලයක් අපි ගත කළේ. මිනිස්සු තෙල් පෝලිම්වල මිය ගියා. එහෙම අතීතයක් තිබුණු මිනිස්සු අපට ඇඟිල්ල දික් කරලා කියනවා, මාර වැඩේ තෙල්වල ගැටලු තිබෙනවා, ආර්ථිකයේ යම් යම් ප්‍රශ්න තිබෙනවා කියලා. මේ Motion එක ගේන්න විපක්ෂයට තිබෙන උපරිම සදාචාරය තමයි, ඒගොල්ලන්ට වඩා අපි නරක් වෙලා නම්, ඒගොල්ලන්ට වඩා ආර්ථික වශයෙන්, සංස්කෘතික වශයෙන් මේ රට නරක් වෙලා නම්. අන්න එහෙමනම් ඒගොල්ලන්ට මේ Motion එක ගේන්න හැකියාවක් තිබෙනවා.

මේ සභාවේ කථා කළ මහත්වරුන් කිහිපදෙනෙකුටම මම උත්තර දෙන්න කැමැතියි, විශේෂයෙන් නාමල් රාජපක්ෂ මහත්තයාට. නාමල් රාජපක්ෂ නැඟිට්ට ගමන් මොකක්ද කිව්වේ? මේ රටට මාර ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා කිව්වා. ඒගොල්ලන් හදපු රට අපි නැති කළා වාගේ තමයි කථා කළේ. මොකක්ද කිව්වේ? ආර්ථිකය ගැන කියපු සුරංගනා කථා තිබෙනවාලු, නීතියේ අර්ථ කථන, නීතියේ භාවිතාව වැරදියිලු, නීතිය ක්‍රියාත්මක කරන විදිය වැරදියිලු, ගල් අඟුරු කන්ටේනර් දෙකක් ගිල්ලාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ගල් අඟුරු කන්ටේනර් දෙකක් ගිල්ලා කියලානේ කිව්වේ. හැබැයි, දැන් එතුමාට එයාර්බස් ගිලලා වමාරන්න වෙලා. දැන් අධි චෝදනා පත්‍ර ඉදිරිපත් වෙලා. ඒ විතරක් නොවෙයි. දැන් එතුමා කියනවා, නීතියේ අර්ථ කථන වැරදියිලු, තැනින් තැන වෙඩි තියනවාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ භූමියේ පාතාලය හදලා, ආයුධ බිස්නස්වලට සම්බන්ධ වෙලා, පාතාලයට කිරි පොවලා, පාතාලය පෝෂණය කරලා, කජ්ජව හදලා, වම්බොට්ටාව හදලා, චණ්ඩි මල්ලිව හදලා - ජුලම්පිටියෙ අමරෙව නිර්මාණය කළේ කවුද? එක්තරා වෙලාවක අපේ සභානායකතුමා හිටපු වේදිකාවට වෙඩි තිබ්බා. එතකොට ජුලම්පිටියෙ අමරෙ තමයි ඒ කෙනාගේ බොඩිගාඩ්. එහෙම ඉතිහාසයක් තිබෙන කෙනා අපට ඇඟිල්ල දික් කරලා කියනවා, තැනින් තැන වෙඩි තියනවා කියලා. මාර කථාවක්නේ ඒක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පැහැදිලිවම ඒගොල්ලන්ගේ අස්වැන්න තමයි මේ. ඒගොල්ලන් වපුරපු දේවල් තමයි මේ.

ඒක කියන්නේ මම නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණය. ශ්‍රේෂ්ඨාධිකරණය SC FR No. 195/2022 නඩුවේ මොකක්ද කිව්වේ? ඒගොල්ලන් ආර්ථිකය නැති කළා කියලා කිව්වේ. ඒ නඩු තීන්දුවේ 118 පිටුවේ කියන්නේ මොකක්ද? It states, I quote:

> " 'Public trust' is an inherent responsibility bestowed on all officers who exercise powers which emanate from the sovereignty of the People. Therefore, as public officers, the respondents were obliged,..."

"Respondents" කියන්නේ, මේ නඩුවේ වගඋත්තරකරුවන්; ඒගොල්ලන්ගේ පවුලේ උදවිය. එහි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

> "...at all times, to act in a manner which honoured the trust reposed in them. We..."

කවුද මේ? විනිශ්චයකාරතුමන්ලා.

> "...are of the view that by the actions,..."

ඒකෙන් කියන්නේ, ක්‍රියාවලි පිළිබඳව.

> "...omissions, ..."

ඒ කියන්නේ, නොකර හැරීම්වලින්.

> "...decisions..."

ඒ කියන්නේ, තීරණවලින්.

> "...and conduct hereinbefore identified to have demonstrably contributed to the economic crisis..."

ඒ කියන්නේ, ආර්ථික අර්බුදයට ඒ ඒ දේවල් බලපෑවා ලු.

> "...and we are of the view that the 2nd (Mahinda Rajapaksa), 2A (Basil Rajapaksa),..."

> "...29th (Nivard Cabraal),..."

> "..32A (Gotabaya Rajapaksa)..."

ඊට පස්සේ මෙන්න මේ තීරණය කියනවා:

> "…respondents had violated the Public Trust reposed in them and we hold that they were in breach of the fundamental right to equal protection of the law ordained by Article 12(1) of the Constitution."

රාජපක්ෂ පවුලේ අය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබෙන බවට තීන්දුවක් දීලා තිබෙනවා. එහෙම උදවිය අපට ඇඟිල්ල දික් කරලා කියනවා, අපි මේ ආර්ථිකය විනාශ කළාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බලන්න, ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියන්නේ ඒගොල්ලන්ගේ පවුලේ උදවිය රටේ ආර්ථිකය නැති කළා කියලා. එහෙම මිනිස්සු අද මෙතැනට ඇවිල්ලා මොකක්ද කියන්නේ? අපි තමයිලු මේ රට විනාශ කළේ. ඒගොල්ලන් තමයි මේ රටේ පාතාලය හදලා, මත්ද්‍රව්‍ය ව්‍යසංගතය බෝ කරලා ඒ තත්ත්වයන් ඇති කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊයේ අපේ පොලීසියට වාර්තාවක් ආවා, "රටම එකට" ජාතික මෙහෙයුම යටතේ මේ රටේ පාතාලයත්, මත්ද්‍රව්‍යත් අපි පාලනයට ලක් කරලා

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

තිබෙන්නේ කොහොමද කියලා. අපි එක පැත්තකින් supply ජාලය ඇතුළේ, අනෙක් පැත්තෙන් demand එක ඇතුළේ "ඉවත් වෙනු" කියන තේමාව යටතේ මේ දෙකම මර්දනය කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2024.09.23 ඉඳලා 2026.10.17 දක්වා අත්අඩංගුවට ගැනීම් බලන්න. ඔය කියන කාල වකවානුව ඇතුළේ හෙරොයින් විතරක් අපි කිලෝග්‍රෑම් 3,652ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. කිලෝ 50 සිමෙන්ති කොට්ට හැටියට ගත්තොත්, සිමෙන්ති කොට්ට 73ක බරට හෙරොයින්; සිමෙන්ති කොට්ට 566ක බරට ගංජා කිලෝග්‍රෑම් 28,300ක්අපි අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. කොකේන් - ටිකක් පොහොසත් එක - කිලෝග්‍රෑම් 310යි. ඒ කියන්නේ සිමෙන්ති කොට්ට 6.2ක බරට කොකේන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඊට පස්සේ අයිස්, සිමෙන්ති කොට්ට නම් 124යි, කිලෝ නම් 6,200යි. අපි මේ රටේ මේ පමණට මත්ද්‍රව්‍ය අත්අඩංගුවට අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් අපට ඇඟිල්ල දික් කරනවා, මාර වැඩේ, ගල් අඟුරු වංචාවක් වෙලා තිබෙනවා, කන්ටේනර් 323 ප්‍රශ්නයක් තිබෙනවා කියලා. කන්ටේනර් 323 සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන් හතර දෙනෙක් ඉන්න කමිටුවක් අපි පත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි එහෙම දෙයක් කළා නම්, මෙහෙම කමිටුවක් පත් කරයිද? කන්ටේනර් 323 සිද්ධිය සම්බන්ධයෙන් අද එවැනි දේශපාලනික ඇඟිලි ගැසීමක් නැහැ කියලා ඒ විපක්ෂයේ මන්ත්‍රීවරුන් හතරදෙනාගේ හෘදය සාක්ෂිය දන්නවා.

ඒ විතරක් නොවෙයි. අපි ගල් අඟුරු සිද්ධියටත් වෙනම කොමිසමක් දාලා තිබෙනවා. මේ කොමිසම ඇතුළේ මොකක්ද වුණේ? අර ඉඳුරුවේ ආචාරියාට වෙච්ච වැඩේ තමයි සමහරුන්ට වුණේ. මොකක්ද? "එකක් කඩතොලු මකාගන්නට ගොසින් මට වුණු කාරියා, දෙකක් කඩතොලු විවර කෙරුවයි ඉඳුරුවේ ආචාරියා" කියලා කිව්වා වාගේ මුල පටන් සියලුදෙනාගේම තොරතුරු හොයලා වාර්තා කරන්න දැන් ගල් අඟුරු සිද්ධිය සම්බන්ධව කටයුතු කරන කොමිසම කටයුතු කරමින් යනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් සමහරු බියට පත් වෙලා තිබෙනවා. මොකද, තමන් අතීතයේ කරපු වැරැද්ද තමන්ට සිහිපත් වන නිසා. අතීතයේ කරපු වැරැද්ද සිහිපත් වෙලා දැන් සමහර උදවිය කලබල වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ගල් අඟුරුවලින් යම් වංචාවක් කළා නම් අපි පූර්ණ බලැති කොමිසමක් දානවාද? පූර්ණ බලැති කොමිසම හමුවේ ඔයගොල්ලනුත් ගිහිල්ලා සාක්ෂි දෙන්න, අපිත් ගිහිල්ලා සාක්ෂි දෙන්නම්. බලමු, කවුද හරි කවුද වැරදි කියලා. යකාට බය නම් අපි සොහොනේ ගෙවල් හදන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කියන්නේ, එදා කිසියම් පොරොන්දුවක් දුන්නා නම්, ජන වරමක් ගත්තා නම්, ඒ ජන වරම මත පිහිටා කටයුතු කරන ආණ්ඩුවක්, රජයක්. එම නිසා මේ ඉදිරිපත් කර තිබෙන Motion එක ගේන්න මෙතුමන්ලාට සදාචාරමය අයිතියක් නැහැ. නෛතික අයිතියක් තිබෙනවා, සදාචාරමය අයිතියක් නැහැ. මොකද, මේ තිබෙන හැම කාරණයකටම අපි උත්තර දීලා තිබෙනවා, උත්තර දෙමින් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.59]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. මට කලින් කථා කළ ඇමතිතුමා ගල් අඟුරු ගැන කියපු නිසා මම මේ කාරණය මුලින්ම කියන්න ඕනෑ. ඊයේ - පෙරේදා අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවට වාර්තාවක් ලැබුණා, එහි පාඩුව රුපියල් බිලියන දහසයක් කියලා. ඒක වංචාවක්ද, පාඩුවක්ද කියන එකත්, ඒ රුපියල් බිලියන දහසයේ ප්‍රමාණය සිමෙන්ති කොට්ටවලින් හරි, මෙට්‍රික් ටොන්වලින් හරි එහෙම නැත්නම් වෙනත් මිනුමකින් හරි සන්සන්දනය කරලා පැහැදිලි කරලා දුන්නොත් හොඳයි. ඔබතුමා මොනවා කිව්වත් මේ ආණ්ඩුව යටතේ මේ නිලධාරීන් ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වෙනවා, ගල් අඟුරු සම්බන්ධයෙන් රුපියල් බිලියන දහසයක පාඩුවක් සිදු වී තිබෙනවා කියලා. මම ඒ ගැන ඊට වඩා කියන්නේ නැහැ.

ඔබතුමන්ලා බොහොම දක්ෂයි, අනුන්ගේ කලිසම අගේට ඇඳගෙන තමන්ගේ වාගේ යන්න. ඔබතුමා ඉස්සෙල්ලා කිව්වා, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව නඩුවක් දැම්මා කියලා. ඒ නඩුව දැම්මේ අපේ උපුල් ජයසූරිය නීතිඥතුමා, මොරයාස් මහත්මයා, අතුල සමරකෝන් මහත්මයා සහ මහීම් මෙන්ඩිස් ආචාර්යතුමා. ඒ නඩුවෙන් තමයි මේ රට බංකොලොත් කිරීම පිළිබඳව අදාළ පුද්ගලයන්ගේ නම් සඳහන් කරමින් තීන්දුව ලැබුණේ. ඒ නඩුව දැම්මේ අපේ කට්ටිය. ඔබතුමා ඒ නඩුව ගැන කථා කරන්නේ ඔබතුමා දැම්මා වාගේ. ඔබතුමා පඩි පෙළේ නීතිඥයෙක් නේ. ඔබතුමා ඒ නඩුව අහලා තිබෙනවා, අර පඩි පෙළේ ඉඳන්. ඒ පඩි පෙළේ ඉඳන් දැනගත්ත තොරතුරු ටික අරගෙන මෙතැන කියනවා, හරියට ඔබතුමා නඩු කිව්වා වාගේ. ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් නඩුවක්වත් දැම්මේ නැහැ.

මම කථා කරන්න බලාපොරොත්තුවෙන් ආපු කාරණා ගැන දැන් කථා කරන්නම්. ඔබතුමන්ලා ආණ්ඩු බලයට පත් වනවිට ලබා දුන් හොඳම පොරොන්දුවක් තමයි, අලි-මිනිස් ගැටුම විසඳනවා කියන එක. අපේ නාමල් කරුණාරත්න මැතිතුමාත් මේ සභාවේ දැන් ඉන්නවා. අලි-මිනිස් ගැටුම මාස හයකින් විසඳනවා කියලා එතුමා කිව්වා. ඒ දවස්වල අලියෙක් මැරුණත්, මනුෂ්‍ය ඝාතනයක් සිදු වුණත්, වගාවකට හානියක් වුණත් එතුමා තමයි දුවගෙන ගිහින් ඉස්සෙල්ලාම ඉදිරිපත් වුණේ.

දැන් ඔබතුමන්ලා ආණ්ඩු බලයට පත් වෙලා අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා. ඔබතුමන්ලා දැන් අලි-මිනිස් ගැටුම විසඳලාද තිබෙන්නේ? ගල්ගමුවේ ජීවත් වුණු අපේ රටටම ආඩම්බරයක් වූ කාවන්තිස්ස ඇතා ඊයේ-පෙරේදා දවසක මැරුණා. ඒ සතාව මැරුවා කියලා කියනවා. ඒ ඇතා, අපේ අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමාගේ වයසේ වාගේ අවුරුදු 43ක්- 44ක්- 45ක් පමණ වන ඇතෙක්. සාමාන්‍යයෙන් අලි ඇතුන් අපේ ජීවිත කාලය වාගේ අවුරුදු 70ක් - 80ක් පමණ ජීවත් වෙනවා. ඒ වාගේ කාලයක් ජීවත් වෙන්න හිටපු ඇතෙක් තමයි මෙලෙස මිය ගියේ. එතකොට දැන් ඔබතුමන්ලා අලි-මිනිස් ගැටුම විසඳලාද? මේ ඇතා වෙන කොහේවත් නොවෙයි මැරිලා වැටුණේ, පොලිසිය භාර ඇමති ආනන්ද විජේපාල මැතිතුමාගේ ගමේ. පොලිසිය භාර

ඇමතිතුමාගේ ගමේ තමයි මේ ඇතා මැරිලා වැටුණේ. ඇතාව ආරක්ෂා කර ගන්න බැරිව රට ආරක්ෂා කරන්නේ කොහොමද? දැන් වෙඩි තැබූ මිනිස්සු හොයනවා. දැන් හොඳම කතන්දරය තමයි වෙඩි තැබූ පුද්ගලයන් කියලා මිනිස්සු අට- නවදෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබීම. ලයිසන් තුවක්කු තිබුණු හුණුගල්ලැව ප්‍රදේශයේ නවදෙනෙක් අත්අඩංගුවට අරගෙන ඒගොල්ලන්ට කියනවා, මේ වරද භාර ගන්න කියලා. දැන් ආණ්ඩුව තමන්ගේ හෙළුව වහගන්න හදන්නේ මේ හුණුගල්ලැව කියන ගමේ බලපත්‍ර සහිත තුවක්කු තිබුණු පුද්ගලයන් කිහිපදෙනෙක් අත්අඩංගුවට අරගෙන. ඒ අය වෙඩි තැබූ බවට මොකක් හරි සාක්ෂියක් තිබෙනවා නම් අපට කියන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. වෙඩි තැබූ අයට දඬුවම් දෙන්න ඕනෑ තමයි. හැබැයි, අද තමන්ගේ හෙළුව වහගන්න, මේ දැවැන්ත තරුණ හස්ති රාජයාගේ මරණයේ වගකීම වෙනත් පුද්ගලයන්ගේ පිට පටවලා පොලීසිය භාර ඇමතිතුමා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ආණ්ඩුව බේරෙන්න හදනවා. මේක බොහොම වැරදියි.

ඔබතුමන්ලා මාස හයෙන් අලි ප්‍රශ්නය විසඳනවා කියලා කිව්වා. කෝ, විසඳුවාද? විසඳනවා තියා අලි ප්‍රශ්නය දැන් බරපතළ වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලාට මේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැ. මේ ප්‍රශ්නය දැන් බරපතළ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒක නිසා බොහොම පැහැදිලිව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාගේම පොලීසිය භාර පිරිස ඇතුළු මේ සියලුදෙනාම මේ දැවැන්ත හස්ති රාජයාගේ මරණයට වගකියන්න ඕනෑ. මේ ඇතාට වෙඩි වැදුණාට පස්සේ හරි වනජීවී නිලධාරින් මේ පිළිබඳව හරියට සොයා බැලුවා නම්, ඇතා පිළිබඳව අධ්‍යයනය කළා නම්, මේ ඇතාට ප්‍රතිකාර කරලා සුවපත් කර ගැනීමට ඒ අයට හැකියාව තිබුණා. නමුත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කියන කතන්දරය තමයි, මේ ඇතා පසුගිය මාස පහ, හය තුළ ඊරියාව කියන ගමෙන් පිටතට ගියේ නැහැ කියන එක. හැබැයි, හුණුගල්ලැව කියන ගම තිබෙන්නේ ඊරියාව කියන ගමටත් එහා. හුණුගල්ලැව ගමේ නවදෙනෙක් තමයි අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ. තමන්ගේ හෙළුව වහගන්න කවුරු හරි අල්ලාගෙන, ඒ අයට වගකීම භාර ගන්න, අපි ඇප අරගෙන දෙන්නම් කියන තත්ත්වයට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. ඒක නිසා ඒ සම්බන්ධයෙන් අපේ විරෝධය පළ කරනවා.

මේ ඇතා විතරක් නොවෙයි, හෙයියන්තුඩුවේ "රාමා" කියන ඇතා ගැනත් අපි දන්නවා. ඒකදන්ත - ඒ ඇතාට එක දළයක් විතරයි තිබෙන්නේ. ඒ ඇතා 1977දී විමලා කන්නන්ගර මහත්මිය විසින් වත්තල සීලරතන හාමුදුරුවන්ට භාර දුන්නා. හැබැයි, සීලරතන හාමුදුරුවන්ට කැලණිය පන්සලේ පෙරහැර කරන්න කියලා භාර දුන්නු ඇතා භාර ගන්නේ ටියුඩර් ගුණසේකර මහත්මයා. ගුණසේකර පවුල සතුව අවුරුදු 49ක් මේ "රාමා" කියන ඇතා හිටියා. පසුගිය අවුරුදු දහය තුළ ඒ පරපුරේ හසිත් ගුණසේකර මහත්මයා තමයි ඒ ඇතා බලා ගත්තේ. මීට මාස හතරකට කලින් මේ ඇතා අරගෙන යනවා. අරගෙන යන්නේ කොහොමද? වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ලියුමක් කියලා එකක් අරගෙන ඇවිල්ලා කැලණිය පන්සලේ හාමුදුරුවෝ මේ ඇතාව අරගෙන යනවා.

ඒ ඇතා අවුරුදු 49ක් හිටියේ එක තැනක. ඇතාව අරගෙන ගියාට පස්සේ ඇතාගේ කකුල් දෙකම කොර ගහනවා. ඇතාගේ බඩ යට තුවාලයක් වාගේම පිට ප්‍රදේශයේත් තුවාලයක් තිබෙනවා. මේ ඇතා රත්නපුර, වේරගම කියන ගමේ හංගලා බෙහෙත් කරනවා. මේ ඇතා ඉතාම කලාතුරකින් දකින්න ලැබෙන එක දළයක් තිබෙන ඇතෙක්. ඒ ඇතාට උපතින්ම එක දළයයි පිහිටා තිබෙන්නේ. මේ ඇතාට අද බෙහෙත් කරන්න මොකක්ද කරන්නේ? බෙහෙත් කරන්න සත්වෝද්‍යානයට මේ ඇතාව අරගෙන එන්න ඕනෑ නැත්නම් ඇතාව අවුරුදු 49ක් බලා කියා ගත්ත ගුණසේකර පවුලට දෙන්න ඕනෑ. ඒගොල්ලන් ළඟ සිටියදී මේ ඇතා හොඳට හිටියා. අවුරුදු 49කට පස්සේ මේ ආණ්ඩුවේ තිබෙන වුවමනාව මත තවත් තැනකට මේ ඇතා මාරු වෙලා තිබෙනවා. මේ විධියට අද වනකොට අපේ රටේ ඇත් පරපුර, අලි පරපුර විනාශ වෙමින් යන්නේ.

දළදා පෙරහැර අවසන් වුණාම අපේ ජනාධිපතිතුමාට දියවඩන නිලමේතුමා කිව්වා, මේ හීලෑ ඇතුන් වැඩි කරන්න ඕනෑ කියලා. අපේ සංස්කෘතික පෙරහැරවලට, නොයෙක් කටයුතුවලට මේ හීලෑ ඇතුන් අවශ්‍යයි. මොකද, අපේ රටේ අලි ගහනයත් වැඩි වෙලා තිබෙන්නේ. අලි ඇතුන් යම් ප්‍රමාණයක් හීලෑ ඇතුන් බවට පරිවර්තනය කරලා බලා කියා ගන්න පුළුවන් අයට දෙන එක නරක වැඩක් නොවෙයි. අපේ ප්‍රදේශයේ තිබෙන බිංගිරිය පන්සලේ අක්කර 953ක් තිබෙනවා, දෑදුරු ඔයට මායිම්ව. ඒකෙන් අක්කර 400, 500කම කැළය තිබෙන්නේ. අපේ පන්සලෙන් අලියෙක්, ඇතෙක් දෙන්න කියලා හැමදාම ඉල්ලනවා. ඒ, අපේ පන්සලෙන් අලියෙක්, ඇතෙක් නඩත්තු කරන්න පුළුවන් නිසා. කැලයේ කෑම තිබෙනවා, වතුර තිබෙනවා. හැබැයි, මේ ආණ්ඩුවට එහෙම වුවමනාවක් නැහැ. මේ හීලෑ ඇතුන් වැඩි කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් අපේ සංස්කෘතික පෙරහැරවල්වලට, දළදා පෙරහැරට, කැලණිය පන්සලේ පෙරහැරට, ගංගාරාමයේ පෙරහැරට ගෙනියන්න තවත් අවුරුදු 5, 6කින්, අවුරුදු 7, 8කින් මම හිතන්නේ ඇතෙක් හොයා ගන්න බැරි වෙනවා. ඒ තත්ත්වයට අද වනකොට අපේ රට පත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපේ කනගාටුව පළ කරනවා. අපේ ආණ්ඩුවට එහෙම දේවල් කරන්න වුවමනාවක් නැහැ. මම දන්නේ නැහැ, මේගොල්ලන්ට සංස්කෘතිය රකින්න වුවමනාවක් නැද්ද කියලා. ඒ තත්ත්වයට අද වනවිට අපේ රට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කියන්නේ මොකක්ද? වරප්‍රසාද අහිමි වූ නිසා ලු අපි කෑ ගහන්නේ. වරප්‍රසාද වුවමනාවකට නොවෙයි, අපි කෑ ගහලා කියන්නේ රටේ මිනිස්සුන්ගේ ප්‍රශ්න ගැනයි. අවුරුදු දෙකක් ගත වෙලාත් අවුරුදු 76ක ශාපයයි, අපේ වරප්‍රසාද ගැනයි නොවෙයි කියන්න ඕනෑ. රටේ මිනිස්සුන්ගේ ප්‍රශ්න ගැනයි උත්තර දෙන්න ඕනෑ. දැන් මේ සභාවට ඇවිල්ලා ආපසු කියනවා, පෙන්ෂන් එක කැපුවා ලු, පර්මිට් එක කැපුවා ලු කියලා. පර්මිට් එක කැපුවේ ගෝඨාභයගේ කාලයේ ඉඳන්. ගෝඨාභයගේ කාලයේ ඉඳන් මේ රටේ පර්මිට් තිබුණේ නැහැ. ඒ නිසා වරප්‍රසාද ප්‍රශ්නයක් ගැන නොවෙයි අපි කථා කරන්නේ.

අපි දැක්කා, ඊයේ-පෙරේදා ප්‍රසිද්ධ වස් කවියක් සමාජ මාධ්‍යයේ පළ වෙනවා. ඒකටත් ආණ්ඩුව කලබල වෙලා. ඒකේ තිබෙනවා, "බොරුවෙන් රජ වූ එකාට නැති වෙන්නම තළාපන්" කියලා. ඉතින්, මේකට ආණ්ඩුව කලබල වෙලා. දැන් වස් කවි ලියපු කෙනාත් හොයනවා ලු. ඉතින්, බොරු කරලා රජ වෙලා දැන් වස් කවියටත් භය වෙලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බොරුවෙන් රජ වෙන්න හදන කෙනාට.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බොරුවෙන් රජ වූ කෙනාට, වෙන්න හදන කෙනාට නොවෙයි. "බොරුවෙන් රජ වූ එකාට ඇති වෙන්නම තළාපන්".

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

බොරු කළා නම් ඒ වාගේම දිට්ඨධම්ම වේදනීය කර්මය පඩිසන් දෙනවා දෙනවාමයි. මොකද කරන්නේ? *[බාධා කිරීමක්]* ඔව්, භය වෙලා. මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රියාස් ෆාරුක් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 4.07]

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රටේ වත්මන් තත්ත්වය පිළිබඳව විපක්ෂය විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න මටත් අවස්ථාව ලැබීම ගැන මම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම පසුගිය දිනවල ඇද හැලුණු වර්ෂාවත් සමඟ නුවර දිස්ත්‍රික්කයේ කිහිප තැනක ගංවතුර සහ පස් කඳු කඩාගෙන වැටුණා. ඒ වාගේම ඇද හැලුණු අධික වර්ෂාව හේතුවෙන් ගම්පොල, අම්බුලුවාව පූජා භූමිය අවට ප්‍රදේශයට සහ අකුරණට දැඩි ගංවතුර තත්ත්වයක් ඇති වී මිනිසුන්ට විශාල හානියක් සිදු වුණා. එම ආපදාවෙන් එක් කෙනෙක් මිය ගියා.

ඒ වාගේම ඔයගොල්ලන් දකින්න ඇති, ඊයේ අකුරණදී accident එකක් සිදු වනවා. ඒ අනතුරින් හතරදෙනෙක් මිය ගිහිල්ලා, හයදෙනෙක් රෝහල්ගත කළා. තුන්දෙනෙක් දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටිනවා. කාලයෙන් කාලයට මේ වාගේ සිදුවීම් වෙනවා. මීට කලින් කිහිප වතාවක් අකුරණට ගංවතුර උවදුර ඇති වුණා. ඒ වාගේම එම ස්ථානයේ කිහිප වතාවක් accidents සිදු වෙලා තිබෙනවා. ඇත්තටම ඒ වෙලාවේ පොලීසිය ඇතුළු රාජ්‍ය නිලධාරින්, ගම්වාසීන්, පල්ලිවල සිටි තරුණ සහෝදරවරු ඉක්මනට එම ස්ථානයට ඇවිල්ලා එම accident එකෙන් විපතට පත් වුණු අය බේරා ගන්නට ලොකු සහයෝගයක් දෙමින්, මහන්සි වෙලා වැඩ කළා. ඒ වාගේම ඒ වෙලාවේ එතැනට අවශ්‍ය වන forklift, backhoe, crane වැනි යන්ත්‍ර දීලා කට්ටිය උදවු කළා. අනතුරට පත් වුණු අය රෝහල්ගත කරන්න එක්කරගෙන යන්න ත්‍රීවිලර්, කාර් හා වෑන් දීලා හැමෝම එක විධියට උදවු කළා. ඒ සියලුදෙනාටම මගේ ස්තුතිය පුද කරනවා.

ඇත්තටම මම පුළුවන් තරම් උත්සාහ කරනවා, රවුෆ් හකීම් මන්ත්‍රීතුමා ගැන කථා නොකර ඉන්නට. Senior මන්ත්‍රී කෙනෙක් විධියට එතුමාට ලජ්ජාවක් තිබෙනවා ද නැද්ද කියලා මම දන්නේ නැහැ. නමුත්, අපට ලජ්ජාවක් තිබෙනවා. ඒ ඇයි කිව්වොත්, අපි පාර්ලිමේන්තුවට අලුතින් පත් වෙලා ආවාට අපේ පක්ෂයේ ඉඳගෙන හොඳ දේශපාලනය අවුරුදු 25ක්, 30ක් තිස්සේ ඉගෙන ගත්ත කට්ටිය. එම නිසා අපට ලජ්ජාව කියන දේ තිබෙනවා.

එතුමා දැන් අකුරණ ගංවතුර ගැන කථා කළා. ඊයේ අකුරණ සිදු වුණු accident එක ගැන මා එක්ක කථා කරන්නට කණ්ඩායම් කිහිපයක් ආවා. එම accident එක සිදු වුණු වෙලාවේ මමත් එතැන හිටියා. ඇත්තටම එතැන පල්ලමක් එක්ක ලොකු වංගුවක් තිබෙනවා. ඒ ගැන මම ඊයේ ආපදා කළමනාකරණ කමිටුවේදී RDA එකත් එක්ක කථා කළා. ලබන අවුරුද්දේ අපි එම පාරේ development project එක පටන් ගන්නවා. ඒ කටයුත්තේදී එම වංගුව කෙළින් කරලා පාර සකස් කරන්න අපි සාකච්ඡා කළා. මීට මාස 6කට ඉස්සෙල්ලා මම RDA එකත් එක්ක කථා කරලා එතැන rubber bumpers දාලා, shine boards එහෙමත් දාලා හදලා තිබෙන්නේ. නමුත්, එය ප්‍රමාණවත් මදි බවයි පෙනෙන්නේ. ඒ සියල්ල ගැන මම ඇමතිතුමා එක්ක කථා කළාම RDA එකේ ඉංජිනේරුවන් එක්ක කථා කරලා, එය කරලා දෙන්නම් කිව්වා.

ඒත් එක්කම අනවසර ඉදිකිරීම් ගැන, ගංවතුර ගැන ඒ ආපු කට්ටිය මාත් එක්ක සාකච්ඡා කළා. රවුෆ් හකීම් මන්ත්‍රීතුමා ඇහුවා නේ, ගංවතුරට විසඳුම මොකක්ද කියලා. ඇත්තට අවුරුදු 30ක්, 35ක් ඒ ඇළ තියාගෙන දේශපාලනය කරපු එක්කෙනෙක් තමයි රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. එතුමා කියනවා නේ, ඇළට අඩි 40ක මායිමක් තියාගෙන ඉන්නවා කියලා. ඇත්තටම දැන් අපි තමයි ඒ මායිම තියාගෙන ඉන්නේ. ඒගොල්ලන්ගේ කාලයේ පාලම් හදලා තිබෙන්නේ, බිල්ඩින් හදලා තිබෙන්නේ අඩි 20ත්, 25ත් ඇතුළත. දැන් ගංවතුර ඇති වන්නට හේතුව, ලොකු බිල්ඩින් ටිකක් ඇළ මැද තිබීමයි. ඇළට අඩි 10කවත් මායිමක් නැහැ. ඒ ඔක්කෝම අයිති එතුමන්ලාගේ ආධාරකාරයින්ට.

එතුමා විෂය භාර ඇමතිවරයා විධියට හිටියා. ඒ වාගේම එතුමා කැබිනට් අමාත්‍ය ධුර කීයක හිටියාද? මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන තවත් මන්ත්‍රීවරු කිහිපදෙනෙක් එතුමාත් එක්ක ඉන්නවා. ඒ ඔක්කෝම අකුරණට ඇවිල්ලා තමයි දේශපාලනය කරන්නේ. දැන් UDA එකේ නිලධාරින්ට එක එක දේවල් කියනවා. එදා ඒගොල්ලෝ මොනවාද කළේ? සභාව අනවසර ඉදිකිරීම් සඳහා අනුමැතිය දෙනවා කියනවා. සභාව කාගේද? ඒගොල්ලන්ගේ සභාව.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
මට තව පොඩි වෙලාවක් දෙන්න.

අපි ආණ්ඩු බලය ගත්තාට පස්සේ අනවසර ඉදිකිරීම් එකක්වත් සඳහා අනුමැතිය දීලා නැහැ. පසුගිය කාලයේ පාලම් එකසිය ගණනක් හදලා තිබෙනවා. අපි තවම එක පාලමකටවත් අනුමැතිය දීලා නැහැ. එතුමා කිව්වා නේ 8 කණුව, අලවතුගොඩ පැත්තේ හදනවා කියලා. ඒගොල්ලන්ගේ සභාව තමයි තිබෙන්නේ. හොරෙන් අනුමැතිය දීලා හදනවා. දැන් එතුමා question එකක් ඉදිරිපත් කරලා ගියා නේ, ජනාධිපතිතුමා බිල්ඩින් ටික කඩන්න

මුදල් වෙන් කරලා දෙයි ද කියලා. එතුමන්ලාට ඡන්දය කරන්න සල්ලි දීපු එක්කෙනෙක්ගේ බිල්ඩින් එකක් කඩන්න කියලා උසාවියෙන් නියෝගය ආවා. ඒගොල්ලන්ගේ සභාවෙන් සල්ලි නැහැ කියලා ඒ බිල්ඩින් එක කඩන්නේ නැතුව හිටියා. ඒ වාගේම තව බිල්ඩින් කිහිපයක් තිබෙනවා. ඒ ටික කඩන්න මම ජනාධිපතිතුමාගෙන් ලබන වසරේ අය වැයෙන් මුදල් ඉල්ලා තිබෙන බවත් මම ඊයේ කිව්වා. ඒ ඔක්කෝම දැනගෙන තමයි, එතුමා ඒ කථාව කියලා ගියේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
එතුමා දැන් ඒක අවුස්සන්න බලනවා. කඩනවා ද නැද්ද කියලා ඒ තොරතුරු දැන ගෙන අවුස්සන්න බලනවා. මම කියනවා, අවහිර කර තිබෙන බිල්ඩින් ටික කඩනවා කියලා. ඒ සඳහා ජනාධිපතිතුමා මුදල් ලබා දෙයි කියලා මම බලාපොරොත්තු වනවා.

ඒ වාගේම එතුමා දිස්ත්‍රික් කමිටුව ගැනත් කථා කළා. ඇත්තටම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට එතුමා දෙසැරයක් තමයි ආවේ. හංසක නියෝජ්‍ය ඇමතිතුමාටත් පොඩ්ඩක් කොක්කක් දාලා ගියා. එක සැරයක් ආවේ ගංවතුර ප්‍රශ්නයට අපි විසඳුම් ගැන කථා කරනකොට ඒක turn කරන්න. ඒකට එක සැරයක් ඇවිල්ලා ලාල් කාන්ත ඇමතිතුමාගෙන් අහගෙන ගියා. ඊට පස්සේ ආවේ, ජනාධිපතිතුමා ආපු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට. ඉන්පස්සේ අවුරුදු දෙකක් වෙනවා, අකුරණ සම්බන්ධීකරණ කමිටුවට තවම එක සැරයක්වත් ඇවිල්ලා නැහැ. ඒ ගැන සාකච්ඡා කරලත් නැහැ. පට්ටපල් බොරුවක් කිව්වා. ඡන්දයට ඉස්සෙල්ලා මිනිස්සු ඔහුට "හූ" කියලා එළවලා, අකුරණ ඉඳලා, මේ ගංවතුර ප්‍රශ්නය හින්දා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.15]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මම හිතනවා, එතුමාට දුන්නා වාගේ මටත් පොඩ්ඩක් කාලය ඇදලා දෙයි කියලා.

විශේෂයෙන්ම විපක්ෂයෙන් අද මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ, මේ රටේ ප්‍රධාන ඇමතිවරු දෙදෙනකු කරපු කථාව මම ඉස්සෙල්ලාම බැලුවා. ඒ තමයි, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගේ සහ සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාගේ කථා. මේ දෙදෙනාම මේ ගෙනාපු යෝජනාව ගැන තමන්ගේ අදහස් ඉදිරිපත් කරපු එක නොවෙයි කළේ. එතුමන්ලා විපක්ෂයට තිබෙන ප්‍රශ්න ගැන කථා කරනවා. අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් මම එතුමන්ලාගෙන් කාරණයක් අහන්න කැමැතියි. තමුන්නාන්සේලා කිව්වා නේ, වාහන ගන්නේ නැහැ; ආණ්ඩුවේ වාහන ගන්නේ නැහැ කියලා. Vehicle permits ගන්නේ නැහැ කියපු කට්ටිය නේ, මේ. මම අහන්න කැමැතියි, මාදිවෙල නවත්වලා තිබෙන ඒ කැබ් රථ කාගේ ඒවාද කියලා. ඒ, තමන්ගේ පෞද්ගලික මුදලින් ගත්ත ඒවාද? ඒවා ඔක්කෝම මේ ආණ්ඩුවේ තැන් තැන්වලින් දුන්න වාහන. ඒ විස්තර ලැයිස්තු පිටින් මගේ ළඟ තිබෙනවා. ඒවා එළියට දාන්න පුළුවන් නම් පිටින්. එක එක අමාත්‍යාංශවල විස්තර ටික මම ඔක්කෝම අරගෙන තිබෙන්නේ. ඉතින් ඒ නිසා මේ බොරුව කරන්න හදන්න එපා. වාහනයක් අමාත්‍යාංශයකින් දුන්නා නම්, ඒක අරගෙන පාවිච්චි කරන්න, මෙතැන ඇවිල්ලා කයිය ගහන්න එපා. ඒකයි මම කියන්නේ. මේ ගෙනාපු යෝජනාව ගැන කථා කරන්න නේ තිබුණේ. ඒක පැත්තකින් තියලා වෙන කාරණා කථා කරනවා.

විශේෂයෙන් මේ රටේ මහා සංඝරත්නයට අද මේ ආණ්ඩුව ගහන ගැහිල්ලේ ඉවරයක් නැහැ. තමන් සල්ලි දීලා හදපු ඩෝබි බලකාය උදේ ඉඳන් රෑ වෙනකම් හාමුදුරුවරුන්ට ගහනවා; ශාසනයට ගහනවා. මේකේ ඉවරයක් නැහැ. අද ඥානසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙනුවෙන් අපි එක ඉල්ලීමයි කරන්නේ. ඒ ඉල්ලීම වෙන එකක් නොවෙයි, තමන්ගේ පූර්වගාමීයා දුන්න ජනාධිපති සමාවේ ප්‍රශ්නයක් තියෙනවා නම්, ඒ ප්‍රශ්න ටික විසඳලා ඒක ලබලා දෙන්න කියන එකයි කියන්නේ. එච්චරයි. ආපසු අධිකරණ තීන්දුවලට යන්න ඕනෑ නැහැ. ජනාධිපතිතුමා එදා කියනවා, අධිකරණයක් දුන්න තීන්දුවලට යටත් වෙනවාලු. එතුමා යටත් වුණා නම් කොහොමද, එක්ස්ප්‍රස් පර්ල් නැව සම්බන්ධ කාරණයේදී 5දෙනෙක් දුන්න නඩු තීන්දුව වෙනස් කළේ? ඩොලර් බිලියනයක්, මිලියන 1,000ක්, කෝටි 35,000ක් රටට ගන්න හදපු වැඩේ. ජනාධිපතිතුමාට ලියුම් දෙකයි එව්වේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ තුන්දෙනෙක් දාලා ඒ නඩු තීන්දුව සම්පූර්ණයෙන් වෙනස් කෙරුවා. ඒ, ලංකාවට ලැබෙන්න තිබ්ච්ච කෝටි 35,000ක්. අධිකරණයට යටත් නම් ඉතින් ඒක එහෙම තියෙන්න එපා යැ. එහෙම තිබුණේ නැහැ නේ. මම එතුමාගෙන් ඉල්ලනවා ජනාධිපතිතුමා ඔය කිව්වා වාගේ කරුණාකරලා මේවා ගැනත් කියන්න කියලා. කවුද මේක පත් කළේ, ඔබතුමාට මෙහෙම ලියුම් දෙකක් ආවේ නැද්ද, ඊළඟට, නීතිපති එකෙන් කවුද මේකට ගිහිල්ලා, මේ motion එක දැම්මේ, එතකොට පස් දෙනෙක් දීපු නඩු තීන්දුව තුන්දෙනෙක් විසින් කොහොමද වෙනස් කළේ? මේ ගැන කථා කරන්න, අධිකරණයට යටත් නම්.

ඒ වාගේම පුද්ගලයන් වෙනුවෙන් නීති හදන්න බැහැයි කිව්වා. මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පුද්ගලයෙක් වෙනුවෙන් හදපු එකක්. අපේ අග්‍ර විනිශ්චයකාරතුමාගේ සේවා කාලය දික් කරන්න තමයි ඒක ගෙනාවේ. ඊට පස්සේ ඒක ශ්‍රේෂ්ඨාධිකරණයෙන් එහාට මහාධිකරණයට ගිහිල්ලා, අභියාචනාධිකරණයට ගිහිල්ලා, ඔක්කෝටම ගිහිල්ලා නතර වුණා.

මම කියන්නේ මේකයි. මේ රටේ බුද්ධ ශාසනයට, ඒ වාගේම අපේ ස්වාමීන්ද්‍රයන් වහන්සේලාට පහර දෙන එක කරුණාකරලා නවත්වන්න. අපි එදාත් මේ ගැන කිව්වා. ඕනෑ නම් මම හෙට අනිද්දා කියන්නම්, මේ පාර්ලිමේන්තුවේ ඉන්න සිවුරු ඇරපු අපේ ගෞරවනීය හිටපු ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ නම් ටික. එකින් එක කියන්න පුළුවන්. දැනුත් මෙතැන කිහිප දෙනෙක් ඉන්නවා ඕනෑ නම්, මට කියන්න පුළුවන්. කරුණාකරලා මේ රටේ අපේ ශාසනයට ගහන්න එපා.

ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණ පෙළපාළි, උද්ඝෝෂණ ඔක්කෝමවලදී නීතිය කඩ කළා. තමුන්නාන්සේලා ඉස්සර

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

පොලීසියෙන් අවසරයක් ගත්තාද, ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරන්න? ඉස්සර තමුන්නාන්සේලා පෙළපාළියක් එන්න පොලීසියෙන් අවසර ගත්තාද? අධිකරණයෙන් අවසර ගත්තාද? පාර අයිනේ උද්ඝෝෂණය කරනකොට උදේ 9.00ට ගිහිල්ලා කොටුව මහේස්ත්‍රාත්තුමාව ඇහැරවලා - උදේ 9.00ට, 9.30ට තමයි පටන් ගන්න තිබුණේ - තහනම් නියෝගය අරන් ඇවිල්ලා තමයි අපේ ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ඉවත් කෙරුවේ. අපට අමතක වෙන්නේ නැහැ, එදා ජනතා විමුක්ති පෙරමුණේ අය කටයුතු කළ ආකාරය. අද මේ හාමුදුරුවරුන්ගේ සිල්වත් බව ගැන කථා කරන ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලාගේ හිතවත් හාමුදුරුවරු තමයි ඒ කාලයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තාප්ප උඩ නැඟලා හිටියේ. අද සිල්වත්භාවය ගැන කථා කරනවා. තමුන්නාන්සේලාට හමුදාව ගැන, පොලීසිය ගැන විශ්වාසයක් නැහැ. තමුන්නාන්සේලාට මේ රටේ රාජ්‍ය නිලධාරින් ගැන විශ්වාසයක් නැහැ; බුද්ධි අංශ ගැන විශ්වාසයක් නැහැ. තමුන්නාන්සේලා මේ ගෝත්‍රික ක්‍රියාවලිය ඉදිරියට කරගෙන යන්න එපා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන වැඩේ කරන්න.

SriLankan Airlines එකේ අද ඇති වෙලා තිබෙන තත්ත්වය ගැනත් කියන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අද අපට විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. 2026 ජූනි 27, 29 කියන දවස් දෙකේදී SriLankan Airlines එකේ PRTG system එක BLACKNET-00 කියන ආයතනයකින් සම්පූර්ණයෙන්ම hack කළා. ඊට පස්සේ darkwebdecorded.com එකේ දාලා තිබෙනවා, "අපි claim කරනවා, අපි දැන් මේක hijack කරලා තිබෙන්නේ" කියලා. SriLankan Airlines එකේ සම්පූර්ණ system එකම ඒගොල්ලන් hijack කළා. එහෙම කරලා වීඩියෝ පටයකුත් දැම්මා. මම ඒ ගැන කියන්නම්. අන්තිමටම ඒගොල්ලන් දාලා තිබෙනවා Bitcoinවලින් US Dollars 50,000ක් දෙන්න, මේකෙන් ඒගොල්ලන්ට ඇතුළට එන්න පුළුවන් කියලා. දවස් ගණනක් වෙනවා. තවමත් ඒ පද්ධතිය ගැන විශ්වාසයක් නැහැ. ඒ ක්‍රියාවලිය තුළ emails ඔක්කොම hack කළා. ඒ emailsවල තිබ්බ දේවල් නැති කළේ හදිස්සියේ. ඒ email protection system එක හදිසියේම අවලංගු වුණා. ඔබතුමන්ලා දන්නවා Dubai account එකෙන් Rs. 80 million ගිය බව. ඊට පස්සේ Madrasවල account එකෙන් මුදල් ගියා. මේ ඔක්කොම ගියේ SriLankan Airlines එකේ සල්ලි. Hackersලා ඇවිල්ලායි ඒ ගැහුවේ. අද වෙනතුරු ඒක ගැන නිසි පරීක්ෂණයක් කරලා නැහැ. ඇමතිතුමා උත්සාහයක් කළා. දැන් ඒක නවත්වලායි තිබෙන්නේ. ඒක කරන්න හදපු මනුස්සයාට විරුද්ධව පරීක්ෂණයක් කරන්න කියලා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් දන්වා එවනවා. SriLankan Airlines එක දැන් ඒ hackersලාගේ අතේයි තිබෙන්නේ. ඕනෑම වෙලාවක ඒක බිම දමන්න පුළුවන්. විශාල අර්බුදයක් තිබෙනවා. Singaporeවල තිබෙන US assistance agency එකේ Defence Attaché කිව්වා, "අපි Government-to-Government ඇවිල්ලා මේකට උදවු කරන්නම්; තමුන්නාන්සේලාගේ hack කරලා තිබෙන system එක අපි හදලා දෙන්නම්" කියලා. හැබැයි, අද වනතුරු ඔවුන්ගෙන් ඒ උදව්ව ගත්තේ නැහැ. ඒ නිසා කරුණාකර ඒ ගැන බලන්න.

අද විශ්‍රාමිකයෝ විශාල පිරිසක් පාර දිගේ උද්ඝෝෂණයක ඉන්නවා. තමුන්නාන්සේලා ගිය අවුරුද්දේ අය වැයෙන් කරපු ක්‍රියාවක අහිතකර ප්‍රතිඵලයක් නිසා විශ්‍රාමිකයෝ 154,000ක් අද පාරවල් දිගේ ඉන්නවා. අය වැය ඉදිරිපත් කරන්න කලින් දවසේ විශ්‍රාම ගිය මනුස්සයාට වඩා අය වැයෙන් පස්සේ දවසේ විශ්‍රාම ගිය මනුස්සයාගේ වැටුපේ වෙනස රුපියල් 50,000යි; 70,000යි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව තත්පර කීපයක් දෙන්න.

අපි ආණ්ඩුවෙන් ඉල්ලනවා අඩුම තරමේ මේ අය වැය තුළින්වත් මේ විශ්‍රාමිකයන්ට දීමනාවක් දෙන්න කියලා. එහෙම නොවුණොත් ඔවුන්ට අමාරුයි මේ ජීවන බර දරාගෙන යන්න.

මට තවත් තත්පර කීපයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. තමුන්නාන්සේලා ගුරුවරුන් බඳවා ගැනීමේ exam එකක් තිබ්බා. මුළු පත්වීම් ගණන 23,000යි. සියයට 70ක් ගන්නවා කිව්වේ සංවර්ධන නිලධාරින්ගෙන්. එතකොට 16,100යි. සියයට 30ක් - 6,900ක් - ගන්නවා කිව්වා, උපාධිධාරින්ගෙන්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව පොඩි වෙලාවක් දෙන්න.

තමුන්නාන්සේලා රුපියල් 2,500 ගණනේ කෝටි 24ක් උපාධිධාරින්ගෙන් ගත්තා. අද මොකද වෙලා තිබෙන්නේ? 17,000ක් ගන්නවා කියලා දැන් ඒ නම් ටික දාලා තිබෙනවා. Cut-off mark එකක් නැහැ; කීයකටද ගන්නේ කියලා දන්නේ නැහැ; කිසිම දෙයක් දන්නේ නැහැ; interview කරන්නේ කොච්චර ප්‍රමාණයක්ද දන්නේ නැහැ. 23,000ක් ගන්නවා නම් අඩුම තරමේ දෙගුණයක් interview කරන්න ඕනෑ. නමුත් ඒක අද සිද්ධ වෙලා නැහැ. ඒ නිසා මේ රටේ උපාධිධාරිනුත් අද විශාල අර්බුදයකට මුහුණ දීලා ඉන්නවා. මේවා ගැන තමයි අපි කථා කළේ. තමුන්නාන්සේලා ඒවා විහිළුවක් විධියට අරගෙන තිබෙනවා. මේ ක්‍රියාවලිය ඉදිරියට ගියොත් තමුන්නාන්සේලාට විශාල අර්බුදවලට මුහුණ දෙන්න වෙනවා කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හංසක විජේමුණි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.23]

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද පැවැත්වෙන්නේ, විපක්ෂය ඉදිරිපත් කරපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ විවාදයයි. එහිදී අපි බලාපොරොත්තු වුණා, මේ ඉදිරිපත් කරපු කාරණා සම්බන්ධව සංඛ්‍යා දත්ත එක්ක යම් දෙයක් කියාවි කියලා. ඒක නිසා මම අද වන විට ලැබී තිබෙන සංඛ්‍යා දත්ත ටිකක් - update එකක් - ලියාගෙන ආවා. නමුත්, ඒවා කථා කරන බවක් පෙනුණේ නැහැ. කාවන්තිස්ස හස්ති රාජයා නැත්නම් අද විවාදය මේ දක්වා පවත්වාගෙන යන්න වෙන්නේ නැහැ. මේ වෙනුවට අපට වෙනත් නමක් දමාගන්න තිබුණා. ඒ කියන්නේ, මෙච්චර ලොකු මාතෘකාවක් දමාගන්නේ නැතුව කථා කරන්න පුළුවන් මාතෘකා ටික විතරක් දමාගන්න තිබුණා.

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා යෝජනාවක් කළා, පිහා ඔය සම්බන්ධව. ඇත්තටම එතුමා කරපු ඒ යෝජනාව බොහොම හොඳයි. ඒ ප්‍රදේශයේ සජබයේ ප්‍රාදේශීය සභාවක් තිබෙන්නේ. අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී දිගින් දිගටම ඒ ප්‍රාදේශීය සභාවට කිව්වා, ඒ අනවසර ඉදිකිරීම් ඉවත් කරන්න කියලා. අනවසර ඉදිකිරීම් 100කට ආසන්න ප්‍රමාණයක් ඒ පිහා ඔය ආශ්‍රිතව තිබෙනවා. ඒවා ඉවත් කිරීමට ඒ මන්ත්‍රීතුමාත් කැමැති වෙනවා කියන්නේ, මා හිතන විධියට ඒක සජබයේ මතය වෙන්න ඇති. අකුරණ ප්‍රදේශයට පොඩි වැස්සකින් පවා ලොකු ගංවතුරක් එනවා. ඒ අනවසර ඉදිකිරීම් ඉවත් කළා නම් අකුරණ ජනතාවට ඒකෙන් බේරෙන්න පුළුවන්. ඒක හුඟක් හොඳ යෝජනාවක් සහ ඉදිරිපත් කිරීමක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතැනදී කිව්වා, ඖෂධ හිඟයක් ඇති වෙනවා කියලා. ඒ නිසා මම අපේ දැන් තිබෙන දත්ත ටික ඉල්ලා ගත්තා. සාමාන්‍යයෙන් priority දී තිබෙන drugs තිබෙනවා. ඒ කියන්නේ, බෙහෙත් සම්බන්ධයෙන් අපේ priority list එකක් තිබෙනවා. ඒ drugs ටික තමයි අපි රෝහල් පද්ධතියට ලබා දෙන්නේ. එවැනි drugs 883ක් තිබෙනවා. ඒ drugs 883න් 630ක් තමයි සාමාන්‍යයෙන් රෝහල්වල තිබෙන්නේ. ඉතිරි බෙහෙත් වර්ග සමහර රෝහල්වලට විශේෂිත වෙච්ච ඒවායි. එහෙම නැත්නම්, ඒ සමහර ඒවා සමහර අවස්ථාවල අපි patientගේ නමටම අරගෙන දෙන ඒවායි. මෙන්න මේ කියන බෙහෙත් වර්ග 630න් සියයට 95ක ප්‍රමාණයක්, හරියටම කිව්වොත් සියයට 94.9ක ප්‍රමාණයක් අද වනකොට තිබෙනවා. හුඟක් වෙලාවට "බෙහෙත් නැහැ, බෙහෙත් නැහැ" කිය කියා ඉන්න කිහිප දෙනෙක් ඉන්නවා. ඔවුන් බොහෝ දුරට අපේ අමාත්‍යාංශයෙන් අයින් වෙච්ච හෝ වැඩ තහනම් කරපු පුද්ගලයන්. ඔවුන්ගෙන් ලබා ගන්නා තොරතුරු මත පදනම්ව පාර්ලිමේන්තුවේ එවැනි ප්‍රකාශ කිරීම හෝ ඒ තොරතුරු පාර්ලිමේන්තුවේ සටහනකට දමා ගැනීම කිසිම තේරුමක් නැහැ. අද වනකොට තිබෙනවා කියන සියයට 94ක drugs ප්‍රමාණයට අමතරව ඉතිරි සියයට 6 සඳහා අපි local purchase කරන්නේ. ඒ කියන්නේ, ප්‍රාදේශීය මිල දී ගැනීම් කරන්න අවස්ථාව දීලා තිබෙනවා.

මෙහිදී බොහොම සුළු බෙහෙත් වර්ග සංඛ්‍යාවක් ලංකාවේ ෆාමසිවල නැහැ. මොකද, ලංකාවේ ඒ බෙහෙත් සම්බන්ධව ඒජන්තවරයෙක් නැහැ. දිගින් දිගටම ඒ ප්‍රශ්නය තිබුණා. අපි ඒ ප්‍රශ්නය විසඳීම සඳහා UNDP එකත් එක්ක කථා කරලා ගිවිසුමකට ආවා. ඒ ගිවිසුම අනුව UNDP එක ලංකාවේ වෙළෙඳ පොළේ නොමැති බෙහෙත් වර්ග සියල්ල මින් ඉදිරියට අපට ලබා දෙනවා.

ඒ වාගේම සැපයුම් ජාලවල පොඩි gaps එන එක වැළැක්වීම සඳහා අපි Framework Agreement කියන සංකල්පයට ගිහින් තිබෙනවා. ඒ නිසා අපි මේ මාසයේ ඉඳලා අපේ බොහෝ ශල්‍ය උපකරණ සහ drugs ගන්නේ Framework Agreementsවලටයි. අපේ සැපයුම් ජාලයේ තැනින් තැන බිඳ වැටීම් සිදු වනවා නම් ඒවා නවතිනවා.

අපි අපේ සෞඛ්‍ය පද්ධතිය මනා සැලැස්මක් ඇතිව තමයි මේ අවුරුදු දෙකේම අරගෙන ආවේ. අවුරුදු 3කදී කොතැනටද අරගෙන යන්නේ, අවුරුදු 4කදී කොතැනටද අරගෙන යන්නේ, අවුරුදු 5කදී කොතැනටද අරගෙන යන්නේ කියලා අවුරුදු 10ක් යනකල් අපි මේ පද්ධතිය සැලසුම් කරලා තිබෙනවා. ඒ කියන්නේ, මේක master plan එකකට යන්නේ. ඉස්සර රෝහල්වල master plan එක කියලා හැදුවේ, කොළයක් අරගෙන ඒ කොළයේ තැන තැන ගිනි පෙට්ටි වාගේ ටිකක් ඇඳලා මෙතැන මේ බිල්ඩින් එක, මෙතැන මේ බිල්ඩින් එක කියලා බිල්ඩින් අඳින එකයි. ඒ විධියට බිල්ඩින් අඳින එක විතරක් නොවෙයි, master plan එකක් කියන්නේ. එය ඊට එහා ගිය එකක්. අපේ master plan එක ඇතුළේ බිල්ඩින් වාගේම අපි උපකරණ මිල දී ගන්නේ කොහොමද, ඒ ඒ කාලවලදී උපකරණ අයින් කරන්නේ කොහොමද, අලුත් උපකරණ මිල දී ගන්නේ කොහොමද, ඒවා නඩත්තු කරන්නේ කොහොමද, සැපයුම් ජාල පවත්වා ගන්නේ කොහොමද, මානව සම්පත - human resource එක - බඳවා ගැනීම් කරන්නේ කොහොමද යනාදිය පිළිබඳ ලොකු සැලැස්මක් තිබෙනවා. එවැනි ලොකු සැලැස්මක් ඇතිව තමයි අපි කටයුතු කරගෙන යන්නේ. ඒ නිසා පුළුල් කිරීම්, ඉදිරියට යෑම් සියල්ල අප සිදු කරන්නේ මනා සැලැස්මක් ඇතිවයි.

ඒ වාගේම අපට ලොකු ප්‍රශ්න ටිකක් තිබුණා. රෝහල් පද්ධතිය සහ MOH system එකට අමතරව, සෞඛ්‍ය පද්ධතියෙන් ගිලිහී ගිය සේවා රාශියක් තිබුණා. අන්න ඒ සේවාවන් පටන් ගැනීම සඳහා අපි විශේෂිත වැඩසටහනක් පටන් ගෙන තිබෙනවා, "ආරෝග්‍යා" කියන සංකල්පය යටතේ. ඒකෙන් අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, මෙතෙක් කල් සෞඛ්‍ය සේවයට මඟ හැරුණු බොහෝ දේවල් ඉෂ්ට කරන්න. විශේෂයෙන්ම බෝ නොවන රෝග වළක්වා ගැනීම, බෝ නොවන රෝග මුල් අවස්ථාවේදීම හඳුනා ගැනීම, ඔවුන්ට අවශ්‍ය සරල ප්‍රතිකාර ලබා දීම, බෝ නොවන රෝග හෝ වයස්ගත වීම නිසා ඇති වන නොයෙකුත් ආකාරයේ සංකූලතාවලට ගෙදරටම ගිහිල්ලා ප්‍රතිකාර කිරීම, සියලු පුරවැසියන්ගේ health data තිබෙන පද්ධතියක් සැකසීම ආදී සියල්ල අපි මේ "ආරෝග්‍යා" කියන සංකල්පය යටතේ කරනවා. මේක අපේ රටට අලුත් සංකල්පයක්. නමුත්, අපි ඒක ක්‍රම ක්‍රමයෙන් කරමින් යනවා. දැනට මධ්‍යස්ථාන පොඩි ප්‍රමාණයක් තිබුණත් මේ වසර අග වනවිට මධ්‍යස්ථාන 100ක් සහ ඊට පස්සේ මධ්‍යස්ථාන 2,000ක් දක්වා වැඩි කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා. ඉතින්, අපි මේ යන්නේ බොහොම සැලසුම් සහගත ගමනක්. සෞඛ්‍ය අමාත්‍යාංශයට වාගේම සියලු අමාත්‍යාංශවලට ඉලක්ක තිබෙනවා. ඉලක්ක සහගත ගමනක අපි යන්නේ. ඒ වාගේම අපට ඒ ඉලක්ක ජය ගැනීමට අවශ්‍ය ආර්ථික වටපිටාව මුදල් අමාත්‍යාංශයෙන් සලසා දීලා තිබෙනවා. අපට අවශ්‍ය සේවකයන් ප්‍රමාණය බඳවා ගැනීමට මුදල් දෙනවා. ඒ වාගේම අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට මුදල් දෙනවා. මේ අවුරුදු දෙක ඇතුළත ඒ උපකරණ සහ අනෙකුත් දේවල් සඳහා අපි වියදම් කළ මුදල මෑත කාලීනව කිසිම රජයකින් යොදවා නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.30]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ ආණ්ඩුව භාර අරගෙන මේ වනකොට අවුරුදු දෙකයි. අද විපක්ෂය විසින් ගෙනාපු සභාව කල් තැබීමේ යෝජනාව කියවනකොට අපිට හැඟෙන්නේ, දශක හතකට වැඩි කාලයක් තිස්සේ මේ රට කිරියෙන් පැණියෙන් ඉතිරෙන තැනට, සුඛිත මුදිත රටක් බවට පරිවර්තනය කරලා, ඒ රට මේ කාල පරාසය තුළ විනාශ මුඛයට ඇද දාලා, ප්‍රශ්න ගොඩකට ඇද දාලා තිබෙනවා වාගේ අදහසක්. එහි සැබෑ තත්ත්වය ඒකද? අපේ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ ගැන පැහැදිලි කළා. 2022 අවුරුද්ද වනකොට අපේ රට බංකොලොත් රාජ්‍යයක් බවට ජාත්‍යන්තරය විසින් නිවේදනය කරනවා. ඒත් එක්කම අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නිවේදනය කරනවා, අපේ රටේ ආර්ථිකය බංකොලොත් කිරීමට අදාළ වගඋත්තරකරුවෝ කවුද කියලා. එහෙම නම් ඔන්න ඔය පරිසරය ඇතුළේ තමයි අපි ඉතාම බරපතළ තැනකට වැටුණේ. මිනිස්සු ගෑස් සිලින්ඩර පුපුරලා මැරුණා, තෙල් පෝලිම්වල මැරුණා, ඩොලර් නැහැ, රට වටේ මුහුදේ නැව් කැරකෙනවා, ඒ බඩු ගන්න ඩොලර් නැහැ, ලොකු ප්‍රශ්නකාරී තත්ත්වයකට අපි මුහුණ දුන්නා. ගොවි බිම් විනාශ වුණා, පොහොර තහනම් කළා. ඒ වාගේ වපසරියක් තිබුණේ.

අපේ රට බංකොලොත් රාජ්‍යයක් කියලා ජාත්‍යන්තරය ප්‍රකාශයට පත් කරන්නේ අවුරුදු දෙකක, තුනක කාල පරාසයකට අදාළව විතරක් නොවෙයි. මෙතෙක් රට පාලනය කරපු එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යනාදී නම්වලින් කරපු ආණ්ඩුවල ක්‍රියාවලීන්වල ප්‍රතිඵලයක් විධියට තමයි ඒ තත්ත්වයට අපේ රටට මුහුණ දෙන්න සිද්ධ වුණේ. එහෙම නම් අන්න ඒ රට තමයි, ක්‍රමානුකූලව මේ වෙනකොට ඉස්සරහට ඇවිල්ලා තිබෙන්නේ. අපේ වසර දෙකක කාල පරාසය තුළ තවත් ඉස්සරහට පිම්මක් ඇවිල්ලා තිබෙනවා. ඒක මුළු රටම පිළිගන්නා කාරණයක්.

මේ වෙනකොට අපි රටේ විශාල වෙනස්කම් ප්‍රමාණයක් සිද්ධ කරලා තිබෙනවා. දේශපාලනික සංස්කෘතිය අපි වෙනස් කරලා තිබෙනවා. ඊළඟට හොරකමට, වංචාවට, දූෂණයට, නාස්තියට අපි වැට බැඳලා තිබෙනවා. පාඩු ලබමින් තිබුණු ආයතන ලාභ ලබන තැනට ගෙනැල්ලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, මගේ භාරයේ තිබෙන කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට අයත් වන මිල්කෝ වාගේ ආයතන පාඩුයි කියලා ඉන්දියාවේ අමුල් සමාගමට විකුණන්න අන්තිම ගිවිසුම අත්සන් කරන්න විතරයි තිබුණේ. අපි ගන්නකොට රුපියල් ලක්ෂ 35,000ක් ණය තිබුණා. අපි ඒ ණය ඔක්කොම බේරුවා. ගොවීන්ට රුපියල් කෝටි 18ක බෝනස් දුන්නා. සේවකයෝ 1,228දෙනෙකුට රුපියල් 75,000 ගණනේ බෝනස් දුන්නා. ඒ, අවුරුද්දක් ඇතුළත.

මේ අවුරුද්දේ අපි ඊටත් එහා පිම්මක් පනිනවා. මේ ආයතන කලින් යැපුණේ රාජ්‍ය භාණ්ඩාගාරයෙන්. අද මේ ආයතන රාජ්‍ය භාණ්ඩාගාරයට සල්ලි එකතු කරනවා. ඒ තත්ත්වයත් එක්ක තමයි විපක්ෂය පැත්තේ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට එහා පුටුවේ ඉන්න හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට කියන්න සිද්ධ වුණේ ඉතිහාසයේ පළමුවැනි වතාවට රාජ්‍ය භාණ්ඩාගාරය පිරී ඉතිරී ගොස් ඇත කියලා. අන්න ඒ තත්ත්වයට දැන් ඇවිල්ලා තිබෙන්නේ. එම පරිසරය තුළ මේ වෙනකොට අපි ජනතාවට ලොකු සේවයක් කර තිබෙනවා.

කෘෂිකාර්මික පැත්තෙන් ගත්තොත්, තමුන්නාන්සේලා ආණ්ඩු කරපු කාලයේ ගොවි ජනතාවට නොලැබුණු දේවල්, නොදුන් දේවල් දැන් ගොවි ජනතාවට අපි ලබා දෙනවා. ඒක ගොවි ජනතාව දන්නවා. පොහොර සහනාධාරය ගත්තත්, අපේ ආණ්ඩුව එන්න කලින් තිබුණු ගණන කීයද? දැන් දෙගුණයක් ගෙවනවා. ඊළඟට බඩ ඉරිඟු, අර්තාපල්, ලොකු ලූනු, රතු ලූනු, මිරිස්, කව්පි, උඳු, රට කජු, තල ආදී වශයෙන් වූ භෝග වර්ග 13ක් වගා කරලා තිබෙන ගොවීන්ට, වී ගොවියාට දෙන සහනාධාර මුදලම ලබා දෙනවා. ඒ අනුව වී සහ ඉහත කී භෝග වර්ග වගා කරන ගොවීන්ට අක්කර 5ක් සඳහා රුපියල් 60,000ක් ලබා දෙනවා. කලින් ශත පහක්වත් ගෙව්වේ නැහැ. මේක තමයි තත්ත්වය.

අපේ රටට "දිට්වා" ආපදාව ආවා. ඒකෙන් පසුව ඉතිහාසයේ කවදාවත් නොදුන් විධියට ඒ ආපදාවට මුහුණ දුන් අහිංසක ජනතාවට පුදුම වන්දි ගොඩක් ගෙව්වේ. එකම පුද්ගලයාට හානි 10ක් වුණා නම්, වන්දි 10ක් ගෙව්වා. කවදාද, මෙහෙම කර තිබෙන්නේ? අපි ආණ්ඩුව භාර ගන්නකොට කලින් යල කන්නයේ වගා වන්දි මුදල් ශත පහක් ගෙවා තිබුණේ නැහැ. අපිට පළමුවෙන්ම කරන්න සිද්ධ වුණේ ඒ වන්දි මුදල් ගෙවන එකයි. එහෙමයි වැඩ පටන් ගත්තේ.

අපේ අපනයන භෝග වර්ග 16ක් තිබෙනවා. ඒ අපනයන භෝග වගා කරන ගොවීන්ටත් සහනාධාර විශාල ප්‍රමාණයක් අපි ලබා දෙනවා. පැළ නොමිලේ ලබා දෙනවා. ඊළඟට ආධාර දෙනවා. සමහර භෝග වර්ග හෙක්ටෙයාරයක් වගා කරන ගොවීන්ට රුපියල් 260,000ක් ආධාර විධියට ලබා දෙනවා. ඊළඟට, ඊට අදාළව අගය එකතු කිරීම වෙනුවෙන් මැෂින් ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 20 දක්වා මුදලක් ආධාර විධියට ලබා දෙනවා. ඊළඟට, තව මොනවා හෝ පළිබෝධ හානි, රෝග ඇති වුණොත් ඒවා වළක්වා ගැනීම සඳහා වෙනම උදවු කරනවා. මේක එහෙම ලොකු පැකේජ් එකක්. පොල් වගා කරන අයටත් සහන ගොඩක් ලබා දෙනවා. මෙන්න මේ තත්ත්වයත් එක්ක ජන ජීවිතය තිබුණු තැනින් ඉහළ තැනකට අරගෙන යන්න අපි විශාල මැදිහත්වීමක් කරනවා. අස්වැන්න දෙගුණ කරගෙන තිබෙනවා. ලොකු ලූනු සාම්ප්‍රදායිකව වගා කරලා ගත් අස්වැන්න දැන් දෙගුණ කරගෙන තිබෙනවා. අන්න එතැනට අපි ඇවිල්ලා තිබෙනවා. මේ තත්ත්වයන් ගත්තාම, ජනතාවට ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. මේ ලෝකයේ යුද්ධයක් නිර්මාණය වුණේ නැත්නම් තමුන්නාන්සේලාට මේ විධියට කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරන්නවත් ඉඩකඩක් ලැබෙන්නේ නැහැ. ලෝකයේ යුද්ධයක් නිර්මාණය වෙලා තිබියදීත්, ලෝකයේ දියුණු යැයි සම්මත රටවල මහජනතාව පාරට බැහැලා පෙළපාළි යන තත්ත්වයක් තුළ අර්බුද නිර්මාණය වෙලා තිබියදීත් තමයි අපි මේ කටයුතු කරගෙන යන්නේ.

අර බන්ධනාගාර බස් එකෙන් මෙතැනට ආපු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාටත් මම උත්තරයක් දෙන්න ඕනෑ. එතුමා ප්‍රකාශ කළා, ගල් අඟුරු ගිල්ලාලු, බඩට යනකම්ම ගිල්ලාලු. හැබැයි, එතුමාට බන්ධනාගාර බස් එකේ එන්න වෙලා තිබෙන්නේ ඇයි? එතුමා එයාර්බස් ගිලපු නිසා. එයාර්බස් ගිලපු එකේ ප්‍රතිඵලය විධියට තමයි බන්ධනාගාර බස් එකේ එතුමාට පාර්ලිමේන්තුවට එන්න වෙලා තිබෙන්නේ.

ඊළඟට කිව්වා, ආයෝජකයින් මේ රට දමා යනවා කියලා. ආයෝජකයින් රට දමා ගියේ ඒගොල්ලන්ගේ කාලයේ. ඒ කාලයේ දමා ගියපු ආයෝජකයින් ඔක්කෝම දැන් එනවා. එදා ඒ ආයෝජකයින්ගෙන් කප්පම් අරගෙන, පගා අරගෙන කටයුතු කළ නිසා තමයි අද බන්ධනාගාර බස්වලින් මේ කට්ටියට එන්න වෙලා තිබෙන්නේ. දැන් කී දෙනෙක් බන්ධනාගාර බස් එකෙන් මෙතැනට එනවාද? මේක තමයි තත්ත්වය; ඒගොල්ලන්ගේ පැටිකිරිය.

ඊළඟට, නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කිව්වා, මාස හයෙන් අලි ප්‍රශ්නය විසඳනවාය කියා මම කිව්වාය කියලා. මාස හයෙන් අලි ප්‍රශ්නය විසඳනවාය කියලා අපි කොහේදීවත් කියා නැහැ. හැබැයි, ඔයගොල්ලන්ගේ කාලයේදී සතුන් නිසා ඇති වන ප්‍රශ්න විසඳන්න මැදිහත් වුණු විධියට නොවෙයි, අපි මැදිහත් වෙන්නේ. මේ වෙනකොට අපි වනාන්තර සුපෝෂණය කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. උදාහරණයකට මම කහල්ල රක්ෂිතය ගැන කියන්නම්. මේ වෙනකොට කැලෑ ඇතුළේ සිටින සතුන් වෙනුවෙන් වැව් පහක් සෑදීම සඳහා ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ ආකාරයට විද්‍යාත්මක ක්‍රමවේදයකට මේ සතුන්ගේ ප්‍රශ්නය කළමනාකරණය කරන්න අපි මේ වෙනකොට මැදිහත් වෙමින් ඉන්නවාය කියන කාරණයත් මා මතක් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම රටේ පොදු මහජනතාව තේරුම් අරගෙන තිබෙනවා, "දිට්වා" ආපදාව ආවත්, ලෝකයේ යුද්ධයක් තිබුණත් ඒ ඔක්කෝම මැද ආණ්ඩුව ජනතාවගේ පැත්තේ ඉඳිමින් සුවිශේෂී කාර්යභාරයක් කරමින් ඉන්න බව. ඒ ගැන ජනතාව දන්නවා. ඒ නිසා, ජනතාවගේ ප්‍රශ්නයක් නොවෙයි තමුන්නාන්සේලා මේ මතු කළේ කියන කාරණය අපි මේ වෙලාවේදී මතක් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.39]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා අල්ලස හා දූෂණය පිළිබඳව කථා කළා. ඒ වාගේම මීට පෙර සිටි අයගේ වැරදි පිළිබඳවත් කථා කළා.

දැන් මට කථා කරන්න සිදුවෙලා තිබෙන්නේ, කොළඹ 7 ප්‍රදේශයේ පිහිටි Otter Aquatic Club නැමති ක්‍රීඩා සමාජය පිළිබඳවයි. එය කොළඹ සාමාන්‍ය ජනතාවගේ දරුවන්ට ක්‍රීඩා පහසුකම් සැපයූ ඉතා ජනප්‍රිය ක්‍රීඩා සමාජයක්. එම ක්‍රීඩා සමාජයට අයත් අක්කරයක ඉඩමක් ප්‍රයිම් ලෑන්ඩ්ස් (පෞද්ගලික) සමාගමට ඉතා අඩු මිලකට - තුට්ටු දෙකට - විකිණීම පිළිබඳවයි මා මේ කථා කරන්නේ.

මේ ක්‍රියාවලිය පටන් ගත්තේ මීට කලින් පැවති ආණ්ඩුව. එවක හිටපු ප්‍රසන්න රණතුංග ඇමතිතුමා තමයි මේ ක්‍රියාවලිය පටන් ගත්තේ. දැන් එම ක්‍රියාවලිය ඉදිරියට අරගෙන යන්නේ අනුර කරුණාතිලක ඇමතිතුමා. මගේ අතේ දැන් තිබෙන 2025.03.24 දිනැති ලිපිය අනුව, තරගකාරී ක්‍රමවේදයකින් හෝ තරගකාරී ටෙන්ඩර් පටිපාටියකින් තොරව වෙළෙඳ පොළ වටිනාකමෙන් භාගයකටත් වඩා අඩු මිලකට කොළඹ නගරයේ පිහිටි මෙම ඉඩම ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගමට පවරා දී, එහි සුඛෝපභෝගී මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ඉන් අනතුරුව එම වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යනවා, ගරු බිමල් රත්නායක ඇමතිතුමා. එතුමා අත්සන් කළ 2025.11.21 දිනැති ලිපියත් මා සතුව තිබෙනවා. කොළඹ 7 ප්‍රදේශයේ පිහිටි, Otter Aquatic Club එක සතු ඉඩම් අක්කරයක්, වෙළෙඳ පොළ වටිනාකමට වඩා භාගයකටත් වඩා අඩු මිලකට ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගමට පවරා දීමට එතුමාත් නිර්දේශ කරනවා. මේක තමයි මේ රජයේ ඇත්ත තත්ත්වය. ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගමට යුතුකමක් නැහැ, මේ විධියේ තුට්ටු දෙකේ වැඩ කරන්න. ඒ වාගේම දූෂණය නැති කරන්න බලයට පැමිණි ආණ්ඩුවටත් යුතුකමක් නැහැ, ප්‍රසන්න රණතුංග පටන් ගත් ඒ දූෂිත වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යන්න. ඒක වෙනස් කරන්න කියලා නේ, බලයට ආවේ. එම නිසා, තක්සේරු දෙපාර්තමේන්තුවේ ලේඛනද ඇතුළුව මෙම දූෂණයට අදාළ ලේඛන සියල්ලම මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත්, ඒ පිළිබඳව විමර්ශනයක් සිදු වෙලාත් නැහැ. ඒ වාගේම මේ සම්බන්ධයෙන් නඩු කටයුතුද තිබෙනවා. නමුත්, ඒවා කඩිනම් කිරීමක් සිදුවන්නේත් නැහැ. එබැවින්, මේ ආකාරයේ දූෂණ දිගින් දිගටම සිදුවීම පිළිබඳව අපගේ කනගාටුව සහ විරෝධය පළ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතර තනතුර වන්නේ කථානායක ධුරයයි. එම උත්තරීතර ධුරය දරන කථානායකවරයා ස්වාධීනව සහ අපක්ෂපාතීව එම ධුරයේ කටයුතු කරයි කියලා අපි අපේක්ෂා කරනවා. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගත් සකස් කර තිබෙන්නේ ඒ සඳහා වන ආකෘතිය අනුවයි. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විධිමත් ලෙස අත්සන් කළ විශ්වාසභංග යෝජනාවක් කථානායකවරයාට විරුද්ධව ඉදිරිපත් කර තිබෙනවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ විශ්වාස භංගය ඉදිරිපත් කරලා තිබෙනවා. මෙම විශ්වාසභංග යෝජනාව පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයටත් ඇතුළත් කර තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා, 83වන ස්ථාවර නියෝගය අනුව පූර්ණ යෝජනාවකින්

---
**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

හැර කථානායකවරයාගේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ප්‍රශ්න කළ නොහැකි බව. සහමුලින්ම ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් තමයි මෙතුමන්ලා මේ කථා කරන්නේ. ඊළඟ කාරණය තමයි, මේ සම්බන්ධයෙන් ගරු කථානායකතුමා නියෝගයක් ලබා දී තිබීම.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මොකක්ද, නියෝගය? නියෝගයක් නැහැ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නියෝගයකුත් තිබෙනවා, ස්ථාවර නියෝග 83 අනුවත් ඒක කරන්න බැහැ. මම කලින් කාරණය ගැනත් පසුව කියන්නම්. මේ පාර්ලිමේන්තුවෙන් එළවා දැමූ විවිධ වංචනිකයන්ගෙන් තොරතුරු අරගෙනයි මේවා කරලා තිබෙන්නේ. මේ විශ්වාස භංග යෝජනාවේ ඇතුළත් කරලා තිබෙන්නේ කුණුහරුප නේ. මොනවාද, මේ සඳහන් කරලා තිබෙන්නේ? කථානායකතුමා අපක්ෂපාතී නැහැයි කියන එකක් මේ විශ්වාස භංග යෝජනාවේ කොතැනක හෝ තිබෙනවාද? මේක, කථානායකවරයෙකුට විරුද්ධව ඉදිරිපත් කරන විශ්වාස භංග යෝජනාවක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? අපට කමක් නැහැ, ඕනෑ එකක් සඳහන් කරන්න. මම ඔබතුමියගෙන් ඉල්ලා සිටින්නේ, කරුණාකරලා ස්ථාවර නියෝග අනුව මේ සභාවේ කටයුතු ඉදිරියට අරගෙන යන්න කියායි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මමත් ඇතුළුව මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අත්සන් කළ විශ්වාස භංග යෝජනාවක් භාරදී තිබෙනවා. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව ඒක ප්‍රතික්ෂේප කරලා නැහැ. මගේ ප්‍රශ්නය තමයි, කථානායකවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළාම ඒක විවාදයට නොගන්නේ ඇයිද කියන එක. සභානායකතුමාගේ මතය අනුව, ඒකේ තිබෙන්නේ කුණුහරුප කියලා එතුමාට කියන්න පුළුවන්. සභානායකතුමාට කියන්න පුළුවන්, මේවා අසත්‍ය කරුණු කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, විශ්වාස භංග යෝජනාව භාර අරගෙන තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි ඒ පිළිබඳව කථා කරන්න මට අයිතිය තිබෙනවා. ඇයි මේක විවාද නොකරන්නේ කියලා අහන්න මට අයිතිය තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පිළිබඳව Parliamentary Business Committee එකේදී කථා කළා, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා Parliamentary Business Committee එකේ නැති වුණාට.-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, මේ ගැන Parliamentary Business Committee එකේදී කථා කරලා යම් තීරණයකට එළඹුණා. ඒ සම්බන්ධයෙන් උදේ දැනුම් දීමක් සිදු කළාද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
නැහැ, නැහැ, කිව්වේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මෙහෙමයි. Parliamentary Business Committee එකේ ගත්ත තීරණය තමයි, මෙම විශ්වාස භංග යෝජනාවේ ඉදිරිපත් කර තිබෙන සමහර කරුණු සම්බන්ධයෙන් අධිකරණයේ විවාද වෙනවා කියන එක. අධිකරණයේ මේ සම්බන්ධව නඩු තිබෙනවා. ඒ නිසා මේක නැවත මේ ආකාරයෙන් ඉදිරිපත් කිරීම ලේකම් මණ්ඩලයෙන් කරන ලද වැරැද්දක් ලෙස තමයි Parliamentary Business Committee එකේදී වාර්තා කළේ. *[බාධා කිරීමක්]* ඔව්, එහෙම තමයි. මොකද, Parliamentary Business Committee එකට වගකීමක්, - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැනට අධිකරණයේ ඇති නඩු විභාගයක් සම්බන්ධව, - *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා Parliamentary Business Committee එක තීන්දු කළ දේ තමයි, මේක හරියාකාරව සකස් කරලා ලේකම් මණ්ඩලය, - *[බාධා කිරීමක්]* මම දන්නා තරමින් කියන්නේ. මොකද, මම Parliamentary Business Committee එකේ එදා හිටියේ නැහැ. *[බාධා කිරීමක්]* මම සභානායකවරයා. මම තමයි agenda එක මෙතැනට යෝජනා කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා මම දන්නා තරමින් මේ යෝජනාව සම්බන්ධයෙන් තත්ත්වය මේකයි. මේ සම්බන්ධයෙන් Parliamentary Business Committee එක දැනුම් දීලා තිබෙනවා. මේකේ තිබෙන නුසුදුසු දේවල් වන අධිකරණය තුළ විවාදයට ලක්වන දේවල් අයින් කරලා තමයි මේක ඉදිරිපත් කරන්න තිබුණේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එදා මේ සම්බන්ධයෙන් එකඟතාවකට පැමිණියා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක ලේකම් මණ්ඩලයෙන් කරලා නැහැ. ඒක කරලා දාන්න. එතකම් මේක එන එකක් නැහැ. ඒ නැතත් කොහොමටත් ස්ථාවර නියෝග 83 අදාළයි. ස්ථාවර නියෝග 83ට අනුව තමයි පාර්ලිමේන්තුව කටයුතු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ social mediaවල ගහන මඩ ටිකම මෙතැන එක එක්කෙනා ඇවිල්ලා කියනවා. මේ ඔක්කෝම එකයි. මේ රටට වෙලා තිබෙන්නේ ඒකයි. පිස්සෝ වගේ කථා කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කථා කරන්න. ඔබතුමා නම් එදා ඒ Parliamentary Business Committee එකේ හිටියා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එදා Parliamentary Business Committee එකේ හිටියා. සභානායක කාර්යාලයෙන් යෝජිත න්‍යාය පත්‍රයක් වාගේ එකක් අපට සාකච්ඡා කරන්න දෙනකොට අඟහරුවාදා දවස යොදලා තිබුණේ කථානායකතුමාට එරෙහි විශ්වාස භංගය සාකච්ඡා කරන්න. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඒ වෙලාවේ ඔබතුමා හිටියේ නැහැ. අපි ඒ වෙලාවේ කිව්වා, මේකට එක දවසක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ, මේ වෙනුවෙන් දින දෙක තුනක්වත් අවශ්‍යයි කියලා. මොකද, චෝදනා 50ක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් කථා කරන්න මන්ත්‍රීවරුන් ගණනාවක් ඉන්නවා කියලාත් අපි කිව්වා. ඒ වෙලාවේ තවත් ප්‍රශ්නයක් ආවා, මේ සම්බන්ධව නීතිපතිවරයාගෙන් උපදෙස් ගනිමු කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒක පසුව තීරණය කරමු කියලාත් කථා කළා නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඉතා ඉක්මනින් නීතිපතිවරයාට යොමු කරලා උපදෙස් අරගෙන මේක ගේනවා කිව්වා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මම කියන්නේ දැන් මේ සාකච්ඡාව සම්පූර්ණයෙන් නතර කරලා, නැවත ඒ ගැන Parliamentary Business Committee එකේදී කථා කරමු කියලායි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට මගේ කථාව කරන්න අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ කථාවට අවස්ථාව දෙන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හරියටම කිව්වා, මේ ගැන නීතිපතිගේ උපදෙස් අරගෙන තමයි කටයුතු කරන්න වෙන්නේ කියලා. ඒක තමයි තීන්දුව. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඒ නිසා අඩු ගාණේ එතුමාට ගරු කරලා ඔබතුමා විෂයට අදාළව කථාව කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අදාළ නැති කරුණු හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න. *[බාධා කිරීමක්]* ඔබතුමා කාලය ගන්න, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට සම්පූර්ණ වෙලාව ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හරි, ඔබතුමාගේ කාලය ගන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ *sub judice* කියන මූලධර්මය අදාළ වන්නේ, යම් අධිකරණයක තිබෙන කටයුත්තකට පාර්ලිමේන්තු විවාදයකින් බාධාවක් ඇති වනවා නම්; පාර්ලිමේන්තු විවාදයේදී කරන කථාවලින් බාධාවක් ඇති වනවා නම් පමණයි. එතකොට මේ ඉදිරිපත් කරලා තිබෙන චෝදනා 50ටම ඒක අදාළ වන්නේ නැහැ. ඒ නිසා මම ඒ ගැන කථා කරන්නේ නැහැ. මම මේකත් කියන්න ඕනෑ. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, තමුන්නාන්සේ එදා කිව්වා, "හරි, චෝදනාව ඉදිරිපත් කරන්න, මම ඒක විවාදයට ගන්නම්" කියලා. හැබැයි, විවාදයට දැන් චෝදනා ඉදිරිපත් කළාම අද ඔබතුමා පස්සට යනවා. මේ පස්සට යන්නේ මොකද? එදා ඔබතුමා ලොකු

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කථා නේ කිව්වේ. ඔබතුමා එදා කිව්වේ මොකක්ද? එදා ඔබතුමා කිව්වා, "ඉක්මනට අරන් එන්න, අපි ඉක්මනට ගන්නම්" කියලා. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, මේ වැඩ පිළිවෙළ ලජ්ජයි නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Madam, I rise to a point of Order.

මම ඒ ගැන කියන්නම්. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා අහගෙන ඉන්නකෝ. මම සභානායක ලේකම්තුමාට කිව්වා, අහහරුවාදාට මේක දාලා agenda එක හදන්න කියලා. මොකද, මම ලංකාවේ හිටපු නැති නිසා. හැබැයි, මේ මොකක්ද මේ? මේක කැලෑ පත්තරයක් නේ. මේ වාගේ දේවල් අපි පාර්ලිමේන්තුවේදී දැකලා තිබෙනවා නේ. මෙතැන තිබෙන්නේ මේ මැතිවරණ පරාද වෙලා, අනාථ වෙලා, desperate වෙච්ච පිස්සු කණ්ඩායමක් මෙතැන සම්පූර්ණයෙන්ම බොරු සද්දේ දමන එකයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා ඔබතුමියගෙන් මම ඉල්ලා සිටින්නේ මෙයයි. මෙතුමා එකම දේ, එකම වැරැද්ද කරනවා නම්, ඔබතුමිය අපේ කාලය නාස්ති කරන්න එපා. මෙතැන නිකම් මේ අමුතු පාට් දාගෙන කථා කරන්න එපා. කරුණාකරලා ඔබතුමන්ලා ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ වෙලාව එතුමාට දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමාට වෙලාව දෙන්න බැහැ. එතුමා තමයි වෙලාව නාස්ති කරන්නේ. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු දේ අනුවවත් එතුමා කටයුතු කරන්නේ නැහැ නේ. ඔබතුමා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා වශයෙන් කියපු දේ නොවෙයි නේ එතුමා කරන්නේ. දැන් විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටවත් මේ අය control නැහැ. මේගොල්ලන්ට තිබෙන්නේ වෙන ලෙඩක්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හරි, හරි, බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නොරොච්චෝලේ බලාගාරය ගැන අපි කථා කරමුකෝ. ගල් අඟුරු බාලයි, හොරකමක් සිද්ධ වෙන්නේ, මේකෙන් පාඩු වෙනවා, යන්ත්‍ර කැඩෙනවා කියලා බාල ගල් අඟුරු ප්‍රශ්නය ගැන අපි ජනවාරි මාසයේ මුල් සතියේ කියනකොට කිව්වා, නැහැ, නැහැ, එහෙම වෙන්නේ නැහැ කියලා. නමුත් අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුව වාර්තාවෙන් මොකක්ද කියලා තිබෙන්නේ? මේක නිසා රුපියල් බිලියන 18කට වඩා පාඩුවක් මේ රටට සිදු වෙලා තිබෙනවා. රුපියල් බිලියන 18කට වඩා පාඩුවක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒකේ ප්‍රතිඵලයක් විධියට යන්ත්‍ර කැඩෙනවා, නොරොච්චෝලේ බලාගාරයේ තිබෙන යන්ත්‍රවලට බාල ගල් අඟුරුවලින් බලපෑමක් සිදු වෙනවා කියලා අපි කිව්වා. එතකොට කිව්වා, නැහැ, නැහැ, එහෙම වෙන්නේ නැහැ කියලා. නමුත් දැන් මොකක්ද සිද්ධ වුණේ? ඉතිහාසයේ පළමුවැනි වතාවට අපි බලාපොරොත්තු නොවුණු, සාමාන්‍ය නඩත්තු කටයුතු අතරතුරදී මතු නොවන ආකාරයට නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ යන්ත්‍රයක තිබුණු ධාරිතාව මෙගාවොට් 180 ඉඳලා මෙගාවොට් 5 දක්වා අඩු වුණා. විනාඩි ගණනක් ඇතුළත මුළු රටේම විදුලි පද්ධතිය බිඳ වැටුණා. ඒ පද්ධතිය බිඳ වැටීමේ ප්‍රතිඵලයක් හැටියට දවසකට බිලියන 1.2ක ඩීසල් පුච්චනවා. ඒක, මේ දවස් කිහිපය පුරාම - සුමානයකට වැඩිය - අමතර වශයෙන් සිද්ධ වෙනවා, යන්ත්‍ර තුන එනකල්. එතකොට ඒකට වග කියන්න ඕනෑ කවුද? අනුර කුමාර දිසානායක මහත්මයා ජනාධිපති වන, බිමල් රත්නායක මහත්මයා ඇමතිකම් දරන මේ ආණ්ඩුව තමයි මේ දූෂණයට වග කියන්න ඕනෑ. තමුන්නාන්සේලා අරයාට, මෙයාට පිස්සා කියනවා, හොරා කියනවා, තක්කඩියා කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කුමාර ජයකොඩිට ඇමතිකම දාලා යන්න සිද්ධ වුණේ මේ ගල් අඟුරු හොරකම නිසායි. ගල් අඟුරු හොරකමත් එකයි, Otter Aquatic Club එකේ හොරකමත් එකයි, ඒ වාගේම අනිකුත් හොරකම් කරලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කරන්න බැරි තරම් ලජ්ජා තත්ත්වයට පත් වන එකත් එකයි. ඊට පස්සේ ඒවාට බොරු තාක්ෂණික කරුණු පෙන්වලා ලොකු කථා කියනවා. අරගෙන එන්න අපට මේ යෝජනාව, අපි විවාදයට ගන්නම් කියලා කියනවා. හැබැයි, චෝදනා 50 දැක්කාම බඩ යනවා. ඒක නේ කථාව, බිමල් රත්නායක මහත්මයා. චෝදනා 50 කියෙව්වාම ඔබතුමාටත් ලජ්ජා හිතුණා. ඒවායේ කුණුහරුප තමයි තිබෙන්නේ. ඒක ඇත්ත. ඒකේ අර්ථය ගත්තාම ඒක කුණුහරුපයක්ම තමයි. එහෙම කෙනෙක්ව මේ ඉහළ තනතුරට පත් කරලා ලැබුණු ප්‍රතිඵලවලට ඔයගොල්ලන් වග කියන්න ඕනෑ. එතුමා ආරක්ෂා කරන එකට වග කියන්න ඕනෑ. අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව මේ දුෂ්කරතාවට පත් වෙලා විවාදයක් පවත්වා ගන්න බැහැ, කථානායකතුමාව ආරක්ෂා කරගන්න බැහැ. එතුමා වෙනුවෙන්, එතුමා නිවැරැදියි කියලා ඔබතුමාවත් කියන්නේ නැහැ නේ, කථානායක හරියි කියලා. කථානායක හරි කියලා වචනයක් කියා ගන්න පුළුවන්ද? බැහැ. ඒ නිසා තාක්ෂණික කාරණා පෙන්වලා මේ රටේ මිනිස්සුන්ව අන්දවලා, රවටලා මේ රට ආපස්සට අරගෙන යන්න එපා. තමුන්නාන්සේලාට ජන මතයක් ලැබුණේ, ජන වරමක් ලැබුණේ දූෂණයෙන් තොරව කාර්යක්ෂම ආණ්ඩුවක් අරගෙන යන්නයි. අද

මේ රටට රුපියල් බිලියන 18ක් පාඩුයි කියලා පාර්ලිමේන්තුවට සහතික කරලා තිබෙනවා, ආංශික අධීක්ෂණ කමිටුවක්. පුළුවන් නම් මේවාට උත්තර දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.52]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙච්චර අසරණ වෙච්ච විපක්ෂයක් මම දැකලා නැහැ. අපි කථානායකතුමාව ආරක්ෂා කරන්නේ නැහැලු. අපි කථානායකතුමාව සියයට සියයක්ම ආරක්ෂා කරනවා. කථානායකතුමාට එරෙහි විශ්වාස භංග යෝජනාව හරියට, වැදගත් විධියට ගෙනෙන්න. අපි ඔක්කෝම ඡන්දය දීලා එතුමාව ආරක්ෂා කරනවා. මොකද, ඒක කරන්න පුළුවන් බව අපි හොඳාකාරවම දන්නවා. කථානායකතුමා විතරක් නොවෙයි, මෙතැනට අලුතින් ආපු මන්ත්‍රීවරයාත් අපි ආරක්ෂා කරනවා, අපේ පක්ෂයේ ප්‍රතිපත්ති සම්ප්‍රදායයන්ට අනුව කටයුතු කරනවා නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ විශ්වාස භංග යෝජනාවේ මොනවාද තිබෙන්නේ? මේ පාර්ලිමේන්තුවෙන් ප්‍රශ්නයක් හදාගෙන, ඒකමතික විනය පරීක්ෂණයකින් අයින් කරපු - ඉවත් කරපු - නිලධාරියෙක් ඉන්නවා. මම දන්නා තරමින් ඔහු දමපු නඩුවේ තොරතුරු තමයි මේකේ කියන්නේ. මොනවාද මේ? කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවාම අපි ඒ ගැන විවාද කරමු. පාර්ලිමේන්තුවේ අවම මට්ටමක් තියා ගන්න ඕනෑ. මම දන්නේ නැහැ, විපක්ෂයේ ප්‍රධානීන්ට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. Social mediaවල කුණුහරුපයක් plant කරනවා. ඊට පස්සේ මෙතැනට ඇවිල්ලා ඒ කුණුහරුපය කියාගෙන කියාගෙන යනවා. ඒක තමයි කරන්නේ. අද මෙගොල්ලන්ගේ ඔළුව සම්පූර්ණයෙන්ම විකාර වෙලා තිබෙන්නේ. මෙගොල්ලන් social mediaවල මොකක් හරි post එකක් දාලා, ඒක boost කරලා, troll armies දාලා ඊට පස්සේ තමන්ම ඒකට ආසක්ත වෙලා හිතනවා, මුළු ලංකාවම දැන් ආණ්ඩුවට විරුද්ධයි, ඒක මාරයි කියලා. එහෙම නැහැ. ගම්වලට යන්නකෝ. විදේශගත ශ්‍රී ලාංකිකයින් මුණ ගැහෙන්නකෝ. සාමාන්‍ය මිනිස්සුන්ව හම්බ වෙන්නකෝ. කවුද මේ වැහිලා තිබෙන යකා?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ කථානායකතුමා සම්බන්ධයෙන් මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක මෙගොල්ලන් අපට කියන්න ඕනෑද? අපේ ඇමති කෙනෙක්ගේ මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒකට මෙගොල්ලන්ගේ විනය පරීක්ෂණ එනකල් අපි ඉන්නේ නැහැ. ඔයගොල්ලන් හිතන්නත් කලින් අපි ඒ අය යවනවා. අපි රකින්නේ, ඒ අය රකින්න පුළුවන් නිසා. මෙතැන දැන් වෙලා තිබෙන්නේ මොකක්ද?

අපිට වැඩ තිබෙනවා. අපි රටට වැඩක් කරන්න ඕනෑ. නමුත් සම්පූර්ණයෙන්ම බොරු දේවල්වලට කාලය නාස්ති කරන පාර්ලිමේන්තුවක් හදාගෙන තිබෙනවා, නඩුත් නැති, ඡන්ද දිනන්නත් බැරි set එකක්. තමන්ගේ අනාගතය සහ කාලය දිහා බැලුවාම තේරෙනවා ඇති නේ, ආපසු ඉතින් no return කියලා. ඒ නිසා කාලය කන්නේ නැතිව කරුණාකර මේ රටේ ඇත්ත ප්‍රශ්න විසඳන්න උදවු කරන්න. එච්චරයි මට කියන්න තිබෙන්නේ. ගල් අඟුරු වංචාව සම්බන්ධව අපි කථා කළා. ඒ ගැන පාර්ලිමේන්තුවේදී දවස් දෙකක් විවාද කළා. අපි ඒ පිළිබඳ කරුණු පෙන්වුවා. මම හිතන්නේ දැන් ඒ සම්බන්ධව ජනාධිපති කොමිසමක් පත් කර තිබෙනවා. ඔබතුමාට පුළුවන්, නඩු පවරලා ඒක ඔප්පු කරන්න. රුපියල් බිලියන 18ක් පාඩු වුණාද, රුපියල් බිලියන 16ක් පාඩු වුණාද කියලා ඒ ඇමතිවරු උත්තර දෙයි. මම පැහැදිලිව මේ කාරණයත් කියන්නම්. මෙහෙම දෙයකුත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. සමාවෙන්න, මට වෙලාව බලන්නත් බැරි වුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි 7ක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පැහැදිලිවම අවුරුදු 50ක් - 60ක් තිස්සේ මේ රටේ හදපු සියලුම අවුල් අපට විනාඩියෙන් හදන්න බැහැ; අවුරුදු දෙකෙන් හදන්න බැහැ. අපි මේ රටේ ආර්ථික ප්‍රගතිය ලබාගෙන තිබෙන්නේ කොහොමද? දැන් මේ ගයන්ත මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාවේ තිබෙනවා, ප්‍රවාහනය ගැන. මම අවසාන විනාඩි 5 තුළ ඒ ගැන කියන්න කැමැතියි. මම එතකොට ඔබතුමාට ඒ ගැන කරුණු-කාරණා පෙන්වන්නම්, ගරු ගයන්ත මැතිතුමනි. දැන් මේ යෝජනාව තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය ඖෂධ ගැන, කෘෂි හා වැවිලි ආර්ථිකයේ නිෂ්පාදන ක්‍රියාවලියේ පිරිවැයට එල්ල වී ඇති බරපතළ බලපෑම ගැන සඳහන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, ඉන්ධන මිලේ තිබුණු ප්‍රශ්නය පිළිබඳව. රනිල් වික්‍රමසිංහ මෙගොල්ලන්ගේ අගමැති වශයෙන් සිටි 2001 කාලයේදී තමයි නිවැරදි MoU එකක් නැතිව, Ceylon Petroleum Corporation එක ඩොලර් ලක්ෂයකට IOC එකට දුන්නේ. ඒ, මෙගොල්ලන්ගේ අගමැති හිටපු කාලයේ. ඒ සම්බන්ධව agreement එකක් තිබුණේ නැහැ. අඩු ගණනේ insure කරලා තිබුණේ නැහැ, මට මතක විධියට 2020 අවුරුද්ද විතර වෙනකල්. ගොඩගන්න බැරි මට්ටමට රට කාලා කාලා ඉවර වෙලා,- මම ඒක නේ හැම දාම කියන්නේ, ලංගම හදනවා, හැබැයි ඉක්මනට හදන්න බැහැ කියලා. මොකද, මෙතැන ඉන්න ඔයගොල්ලන්ගේ ලොක්කොම - ඔයගොල්ලන්ගේ මහ ලේකම්ලාම- තමයි ඒ ආයතනවලට සේවකයින් පිරෙව්වේ; ඒ පැත්තෙයි, මේ පැත්තෙයි හිටපු කට්ටිය තමයි හොරකම් කළේ. ඒක අවුරුදු දෙකෙන් හදන්න බැහැ. අධ්‍යාපනය, සෞඛ්‍යය වෙනුවෙන් අපට කරන්න පුළුවන් දේවල් අපි කළා.

සල්ලි වියදම් කරන්නේ නැතිව අපට කරන්න තිබුණු පළමු දේ මොකක්ද? ආයතන වෙනස් කරන්න කලින් අපට කරන්න තිබුණු පළමු දේ මොකක්ද? අපේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන එක. ඒකට මෙගොල්ලන්ගේ බලපෑමක් නැහැ. අනුර දිසානායක ජනාධිපතිතුමා දිවුරුම් දුන් දවසේ ඉඳලා අපි හදපු දේශපාලන සංස්කෘතිය අබමල් රේණුවකින්වත් වෙනස් කරන්නේ නැතිව පවත්වාගෙන යනවා. ඒක පළමු මාසයෙන්ම අපි ඔප්පු කරලා ඉවරයි.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු කථානායකතුමා හෝ ගරු නියෝජ්‍ය කථානායකතුමා හෝ ඔබතුමිය හෝ අපේ ඇමති කෙනෙක් හෝ ඒ සංස්කෘතිය කඩනවා නම්, මේ අජිත් පෙරේරාද අපට ඒවා ගැන කියන්නේ? අපේ සදාචාර නිර්ණය කරන්නේ, අපට උපදෙස් දෙන්නේ මෙතුමන්ලාද? අයියෝ! තියා ගන්න. දේශපාලන සංස්කෘතියට අදාළව අපි ඉතාම හොඳ පියවරක් තබා තිබෙනවා. දැන් මෙතුමන්ලා try කරන්නේ මොකටද? මෙතුමන්ලා පෙන්වන්න ඕනෑ අපට වඩා ඔවුන් හොඳයි කියලා නේ; අපට වඩා ඔවුන් ප්‍රතිපත්තිගරුකයි, අපට වඩා ඔවුන්ගේ දේශපාලන සදාචාරය උසස් කියලා නේ. නමුත්, මෙතුමන්ලා කරන්න හදන්නේ ඒක නොවෙයි. මෙතුමන්ලා පෙන්වන්න හදන්නේ අපිත් අර පරණ set වාගේ කියායි. ඒ කියන්නේ, මෙතුමන්ලා try කරන්නේ අපිත් ඒගොල්ලන් වාගේ කියලා ඔප්පු කරන්න.

2024 සැප්තැම්බර්වලින් පසු අපි මේ රට තබපු මොකක් හෝ උසස් මට්ටමක් තිබෙනවා. ඒක මේ රටේ මිනිස්සු පිළිගන්නවා. ඔබතුමන්ලා මොකක්ද කරන්න ඕනෑ? අපි අඩි 6න් පැනලා නම් ඡන්දය දින්නේ, ඔබතුමන්ලා අඩි 7න් පනින්න ඕනෑ. නමුත් ඔබතුමන්ලා මොකක්ද කරන්න හදන්නේ? ඔබතුමන්ලා මේක අඩි 4ට පල්ලම් බස්සන්න හදනවා. අපිත් ඔබතුමන්ලා වාගේ කියලා කියන්න හදනවා. ඒ ගැන මට කියන්න තිබෙන්නේ එච්චරයි. පැහැදිලිවම අද මෙතැන වෙලා තිබෙන දේ තමයි, නිකම්ම නිකම් social mediaවලින් විශාල සද්දයක් හදාගෙන තිබෙන එක.

මේ රටේ කාලාන්තරයක් තිස්සේ ආපු chronic ප්‍රශ්න තිබෙනවා. ඒවා විසඳන්න යම් කාලයක් ගත වෙනවා. අලි-මිනිස් ගැටුමත් එහෙම ප්‍රශ්නයක්. අනෙක් හුඟක් ප්‍රශ්නත් එහෙමයි. අපට භාර දීපු දේවල් ගත්තොත්, අපට දූෂණය, වංචාව නතර කරන්න භාර දී තිබුණා. අපි දැන් දේශපාලන ක්ෂේත්‍රයේ දූෂණය, වංචාව බින්දුවට බස්සලා තිබෙනවා. අද එක ව්‍යාපාරිකයෙක් ගැන කිව්වා. මොකක්ද ප්‍රයිම් ලෑන්ඩ් එකක් ගැන කිව්වා. ඉතින්, අපට කරන්න පුළුවන් උපරිම විධියට, රටේ තිබෙන නීත්‍යානුකූල ක්‍රමවලට තමයි ඔය ටෙන්ඩර්, අනම් මනම් දීලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි දන්නෙත් නැහැ, ප්‍රයිම් ලෑන්ඩ්, අරකද, මේකද කියලා. ඕනෑ කෙනෙකුට නඩු පවරන්න පුළුවන්. මම හිතන්නේ දැන් නඩුවක් පවරලාත් තිබෙනවා. ඒ නඩුවේ තොරතුරු තමයි ඔය කිව්වෙත්. ඉතින්, ඒ ගැන උසාවියෙන් බලමු.

මම වරාය ඇමති වශයෙන් කටයුතු කළ කාලයේ ඔය South Asia Commercial and Logistics Hub එක ගැන සෑහෙන මහන්සි වුණා. මම ඒ company එකේ ලොක්කා ලංකාවට ගෙන්වූවා. ඒ ගිවිසුම් අත්සන් කර තිබෙන විධියෙන් කොළඹ වරාය ඇතුළේ East Terminal එකයි, West Terminal එකයි අතර හන්දියේ අක්කර 10ක් දෙන්න හදනවා logistic company එකකට. දුන්නාට කමක් නැහැ. ඒක කිසිම ආකාරයක නිවැරදි ක්‍රමවේදයකට නොවෙයි කරලා තිබෙන්නේ. අපි ඒ ප්‍රධානීන් වරින් වර ගෙන්වලා කථා කරලා කිව්වා, investment එකට අපි කැමැතියි, නමුත් මේ විධියට යන්න බැහැ කියලා. අද කියනවා, අපි නිසා ආයෝජකයෝ ගියා ලු කියලා. ඒ වාගේ කෙනෙකුට දුන්නොත් වෙන්නේ අනෙක් ආයෝජකයෝ කොහොමත් යන එක. හොර, තක්කඩිකම් කරලා රට කෑවාට පසු ඒවා නිවැරදි කරන්න යම්කිසි කාලයක් ගත වනවා. ඒ හැරෙන්න අපේ පැත්තෙන් අපි දේශපාලන වශයෙන් මේ රාජපක්ෂලා වගේ - මට ඇහුණා, අද නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කියනවා අපිට දුවන්න වෙයි කියලා. එයාට එළියට එන්න බැරුව ඉන්නේ. බස් එකේ එන්නේ ඔහු තවම.

අපට කියන්න තිබෙන දේ මේකයි. අපි ඉතාම පැහැදිලිව, මේ රටේ දේශපාලන මට්ටමෙන් තිබෙන දූෂණය වාගේ දේවල් වෙනස් කර තිබෙනවා. සමහර ඒවාට කාලයක් ගත වනවා. නමුත්, ඔය ඔක්කොම අස්සේ අන්තර්ජාතික වශයෙන් විශ්වාසය තහවුරු කර තිබෙනවා. මෙතුමන්ලා හැරෙන්න අපිට බණින්නේ කවුද? කවුරුවත් බණින්නේ නැහැ. ජනතාව බණින්නෙත් නැහැ. ජනතාවට තාවකාලික ප්‍රශ්න තිබෙනවා. වී මිලෙහි ප්‍රශ්නයක් ආවා. අපි ඒක පිළිගන්නවා. ඡන්ද දෙකක් අතරදී ජනතාව බැන්නොත් බණින්න ඕනෑ ආණ්ඩුවට තමයි. මොකද, මේගොල්ලන්ට බැණලා වැඩක් තිබෙනවාද? ඉතාම සාධාරණ ප්‍රශ්නවලට ජනතාව අපට විරුද්ධව උද්ඝෝෂණයක් කළාට, බැන්නාට අපිට ප්‍රශ්නයක් නැහැ. මේ තිබෙන්නේ විකාරයක් නේ. රටේ ඕනෑ කුණු ගොඩක් උස්සාගෙන ගිනි තියනවා.

දැන් මම දැක්කා අනුරාධපුර පූජා නගරය සම්බන්ධව කියනවා. මම හිතනවා, ඒ ගරු ස්වාමීන් වහන්සේලා උත්තර දෙයි කියලා. අනුරාධපුර පූජා නගරය වර්ග කිලෝමීටර 28ක ප්‍රමාණය වර්ග කිලෝමීටර 38ක් කරලා ලොකු කරලා තිබෙන්නේ. මට මතක විධියට රුපියල් බිලියන 10කට වැඩි සංඛ්‍යාවක් -මට ඉලක්කම හොඳටම මතක නැහැ- වියදම් කරලා අනුරාධපුර පූජා නගරය හදනවා. ගරු ජනාධිපතිතුමා තමයි මුල් වෙලා ගරු ස්වාමීන් වහන්සේලා ඔක්කොම ගෙනැල්ලා සැලසුම් කළේ. මම දැක්කා ඒකටත් මොකක් හරි කියනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේගොල්ලන් හිතනවා, මොකක් හරි පරණ සිද්ධියක් අල්ලාගෙන දඟලන්න.

මම මගේ කථාව අවසන් කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. විශේෂයෙන්ම ප්‍රවාහනය ගැන ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා යෝජනාවේ සඳහන් කර තිබෙනවා. මම ඔබතුමාට කියන්න කැමැතියි, අපි මේ මාස 24 ඇතුළත අපේ රටේ සල්ලිවලින් නතර කරලා තිබුණු කඩවත - මීරිගම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු පටන් අරගෙන තිබෙන බව. අපි මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම - ගලගෙදර දක්වා කොටසෙහි ඉදිකිරීම් කටයුතු පටන් අරගෙන තිබෙනවා. අපි ඔබතුමාටත් ආරාධනා කරනවා; දෙසැම්බර් පළමු වැනි දා අපි පටන් ගන්නවා, අධිවේගී මාර්ග තුනක ඉදිකිරීම් කටයුතු. කුරුණෑගල - දඹුල්ල කොටස, කහතුඩුව - ඉංගිරිය දක්වා වන මාර්ග කොටස සහ කොළඹ වරාය නගරය සහ මැරයින් ඩ්‍රයිව් එකිනෙකට සම්බන්ධ කිරීමේ මාර්ග ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු පටන් ගන්නවා. Metro Bus service එකක් තිබුණේ නැහැ. අපි ඒක පටන් අරගෙන තිබෙනවා. ඔය ඔක්කොම පටන් අරගෙන තිබෙන්නේ කොහොමද, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි? අපි මේ රටේ මුදල් හරියට පරිස්සම් කරලා ආර්ථිකය වර්ධනය කරලා ලබා ගත්ත සල්ලිවලින්. මේ එකකටවත් එක රුපියලක් ණය නැහැ. කඩවත - මීරිගම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් සඳහා ගත්ත ණයක් විතරයි තිබෙන්නේ. ඒකත් කලින් ගත්ත ණයක්. අනෙක් ඒවා ලංකාවේ සල්ලිවලින් කරන්නේ.

බස් ගාස්තු ගැන ඔබතුමා යෝජනාවේ සඳහන් කර තිබුණා. හරි නම් බස් ගාස්තු විශාල මුදලකින් වැඩි වෙන්න ඕනෑ. ඩීසල් ලීටරයක් සඳහා රුපියල් 70ක සහනයක් දීලා තිබෙන නිසා තමයි මේ වතාවේ බස් ගාස්තු වැඩි කරලා නැතුව තිබෙන්නේ. ඒ නිසා අපට ඔබතුමන්ලාට කියන්න තිබෙන්නේ මේකයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. කරුණාකර අපට සාධාරණ විවේචන කරන්න. නිකම් අපිව තමුන්නාන්සේලාට ඕනෑ ගණනට තමුන්නාන්සේලාගේ දේශපාලන සදාචාරයේ මිටරය ගොඩක් පහළ තිබෙන නිසා අපිව ඒ තැනට දමන්න තමුන්නාන්සේලා වැඩ කළාට වැඩක් නැහැ. මොකද, සමාජය දන්නවා.

අවුරුදු දෙකකට පස්සේ අපි විදේශගත ශ්‍රී ලාංකිකයන් මුණ ගැහුණේ. පින්ලන්තයේ හරි, ස්වීඩනයේ හරි විදේශගත ශ්‍රී ලාංකිකයන්ට අපෙන් ගන්න සමෘද්ධියක් හරි, අස්වැසුමක් හරි නැහැ. හැබැයි අපට හොඳට තේරෙනවා, ඒ මිනිස්සු අපේ හොඳ දේ අගය කරන බව, අඩු පාඩුකම් කියන බව. ආණ්ඩුවක අවුරුදු දෙකක් දිහා බලාගෙන ඉඳලා මිනිස්සු දැන් කථා කරන්නේ. පළමුවෙනි මාසයේ වාගේ "නියමයි ඡන්දය දීනුවානේ!" කියන කථාව නොවෙයි දැන් තිබෙන්නේ. දෙයක් test කරලා කියන්නේ. අපි කරුණාකරලා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ, බොරු දේවල්වලට පාර්ලිමේන්තුවේ කාලය කන්නේ නැතිව දෙයියනේ ඇත්ත විවේචන කරන්න. ඒ සඳහා තමුන්නාන්සේලාට බුද්ධිය පහළ වේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

අකුරණ ප්‍රදේශයේ සිදු වූ අනතුර පිළිබඳව තාවකාලික මට්ටමින් සකස් කර තිබෙන වාර්තාව මම **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒකත් අවශ්‍ය මන්ත්‍රීවරයකුට ලබා ගන්න පුළුවන්. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා.5.03]

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාලය ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වනවා. මුලින්ම කාරණයක් කියන්න ඕනෑ. මෙම කල් තැබීමේ යෝජනාවේ වචන කිහිපයක් තිබෙනවා, අපේ ආණ්ඩුව සම්බන්ධයෙන් එන විවේචන විධියට. එකක්, මේකේ තිබෙනවා, "අසංවේදී" කියලා කථාවක්. ඒ වාගේම අපේ ගරු විපක්ෂ නායකතුමා සඳහන් කළා, දරුවන්ගේ පෝෂණය අනතුරේ කියලා. ආහාර අනාරක්ෂිතභාවයක් ගැනත් කථා කළා. මන්දපෝෂණය වැඩි වෙලාය කිව්වා. අධ්‍යාපනය බිඳ වැටෙනවා කියලා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාත් සඳහන් කළා වාගේ විපක්ෂ නායකතුමන්ට කථාවක් ලියලා දෙනකොට කවුරු හරි හිතවත් කෙනෙකු ලියලා දෙන්න වෙයි කියලායි මට හිතෙන්නේ.

මොකද, සාමාන්‍යයෙන් විපක්ෂ නායක කෙනෙක් වුණාම එතුමා කරන කථාව ලෝකයම පිළිගන්නවා. දැන් එතුමා කියනවා, මන්දපෝෂණය වැඩි වෙලා කියලා. මම එන්න කලින් පොඩ්ඩක් ඒ ගැන විමසා බැලුවා. මන්දපෝෂණය බලන දර්ශක දෙකක් තිබෙනවා. ඒ, මිටි බව සහ කෘෂ බව. දැන් ඒ දෙක අඩු වෙලා - ලංකාවේ මන්දපෝෂණය අඩු වෙමිනුයි තිබෙන්නේ. විපක්ෂ නායකතුමාට මේවා ලියලා දෙන කවුරු හරි කෙනෙක් ඉන්නවා නම් ඒ පිළිබඳ විමසිලිමත් වෙන්න වෙනවා. විපක්ෂ නායකතුමා දිගින් දිගටම කිව්වා, අධ්‍යාපනය බිඳ වැටිලා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙනකොට අපි සුබසාධන වැඩකටයුතු ගොඩක් කරනවා. මේ විවාදයේ විපක්ෂ නායකතුමාගේ කථාව විතරක් කවුරු හරි ඇහුවොත් හිතන්න පුළුවන්, මේ ආණ්ඩුව කිසිම දෙයක් කරලා නැහැ කියලා. අපි මේ කාරණා ඒ සාධක, ඉලක්කම්, දර්ශකත් එක්ක කියනවා මිස නිකම් කට වාචාලෙට කියවනවා නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

පාසල් ළමුන් සඳහා වන පෝෂණ වැඩසටහනට අපි වෙන් කරලා තිබෙනවා, රුපියල් බිලියන 33.6ක්. 2024දී ඒකට වෙන් කරලා තිබුණේ රුපියල් බිලියන 21යි. එහිදී පාසල් ළමුන්ගේ ආහාර වේල සඳහා දෙන මුදල රුපියල් 85 සිට 110 දක්වා වැඩි කරලා තිබෙනවා. මේකෙන් සෘජු ප්‍රතිලාභ එන්නේ දරුවන්ට; දරුවන්ගේ පෝෂණයට. ඒ වාගේම, අපි නිල ඇඳුම් ලබාදීම දිගටම කරගෙන යන අතරතුර, දුෂ්කර සහ අතිදුෂ්කර පාසල්වල ළමුන්ට පාවහන් ලබාදීම ආරම්භ කළා, ඉතිහාසයේ පළමුවැනි වතාවට. කලින් කවුරුත් කළේ නැහැ. ඊට අමතරව විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට, සුරැකුම් නිවාසවල ඉන්න දරුවන්ට වාගේම පිරිවෙන්වල ඉන්න සාමණේර හිමිවරුන්ටත් මේක ලැබෙනවා. කලින් කවුරුත් කළේ නැහැ. එම ප්‍රතිලාභීන් 852,000ක් සඳහා රුපියල් බිලියන 2.5ක් වෙන් කරලා තිබෙනවා. දැන් ඒවා පාවිච්චි වෙනවා. ඒ වාගේම, පාසල් ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා සඳහා රුපියල් බිලියන 1.5ක් වෙන් කර තිබෙනවා. කලින් වෙන් කර තිබුණේ රුපියල් බිලියන 1යි. කලින් ඒවා ලබා දුන්නේ තෝරාගත් අංකයකට විතරයි. දැන් පුළුවන්, 6 වසරෙන් ඉහළ ශ්‍රේණිවල සියලු දරුවන්ට මේවා ලබාගන්න. මේවා අපි කරපු දේවල්.

ඊළඟට පාසල් ළමුන්ගේ ශිෂ්‍යාධාර මුදල දෙගුණ කළා. රුපියල් 750ක්ව තිබුණු මාසික ශිෂ්‍යාධාරය රුපියල් 1,500 කළා. දැන් ඒ සඳහා රුපියල් බිලියන 1.9ක් වැය කරනවා. දැන් "සුරක්ෂා" රක්ෂණාවරණය වැඩිපුර ශිෂ්‍ය, ශිෂ්‍යාවන් ප්‍රමාණයකට ලැබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මෙහි සඳහන් වෙනවා, පොත්පත් ඇතුළු පාසල් උපකරණවල මිල ගැන. අපි ඉතිහාසයේ පළමුවැනි වාතවට පාසල් දරුවන්ට ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වසරකට රුපියල් 6,000ක මුදලක් දෙනවා. අස්වැසුම ප්‍රතිලාභී පවුල්වලට, ළමයින් 300කට අඩුවෙන් ඉන්න ඉස්කෝලවලට, ඒ වාගේම පිරිවෙන්වල ඉගෙනුම ලබන ගිහි පැවිදි සිසුන්ට, විශේෂ අවශ්‍යතා සහිත සහ සුරැකුම් නිවාසවල ඉන්න දරු දැරියන්ට ඒ මුදල ලබා දෙනවා. මේවා කලින් කවුරුත් කළේ නැහැ. අපි මේ ආන්තික ජනතාවට, දරුවන්ට කරන දේවල් කිසිම ආණ්ඩුවක් කළේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඔබතුමිය දන්නවා, අපේ ආණ්ඩුව මේ වෙද්දී විශ්වවිද්‍යාල සිසුන් සඳහා දෙන මහපොළ ශිෂ්‍යාධාරය දෙගුණ කර තිබෙන බව. කලින් දුන්නේ රුපියල් 5,000යි. අපි ඒක රුපියල් 10,000 කළා. කලින් ශිෂ්‍යාධාරය දුන්නේ රුපියල් 4,000යි. අපි ඒක රුපියල් 9,000 කළා. අපි දැන් ඇස් කණ්ණාඩි ලබා දෙනවා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට. ඒක දෙන්නේ කොහෙන්ද; ජනාධිපති අරමුදලෙන්. ඉස්සර කොහොමද ජනාධිපති අරමුදල පාවිච්චි කළේ

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

කියන එක ඔබතුමිය දන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මවුන්ට එලිසබෙත් රෝහලට තමයි දේශපාලනඥයන් බෙහෙත් ගන්න යන්නේ. ඒවා සඳහායි ඒක පාවිච්චි කළේ. දැන් අපි ඒක ජනතාවට දෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතිහාසයේ ප්‍රථම වතාවට විශ්වවිද්‍යාලවල ඉන්න ශිෂ්‍ය, ශිෂ්‍යාවන් අතර ආබාධ සහිත ශිෂ්‍ය, ශිෂ්‍යාවන් ඉන්නවා නම් ඒ අයට රුපියල් 5,000ක මාසික දීමනාවක් දැන් දෙනවා. ඒ වාගේම, විදෙස් විශ්වවිද්‍යාලවලට යන්න Z-score එක වැඩි ළමයින්ට - එක ළමයෙකුට - රුපියල් මිලියන 80ක් -රුපියල් ලක්ෂ 800ක්- දෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

මේ තරම් මුදලක් ඉතිහාසයේ කවදාවත් දීලා නැහැ. විශේෂයෙන් දුෂ්කර පාසලක ඉන්න ළමයෙකුට ලෝකයේ තිබෙන හොඳම විශ්වවිද්‍යාලයට යන්න රුපියල් ලක්ෂ 800ක මුදලක් අපි දෙනවා. අපි වෘත්තීය අධ්‍යාපනය ගත්තොත්, නිපුණතා ශිෂ්‍යත්ව දීමනාව වැඩි කරලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, රුපියල් 6,500ට තිබුණු දීමනාව රුපියල් 7,500 දක්වා වැඩි කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී ඒක රුපියල් 10,000 දක්වා වැඩි කරන්න. දැන් අධ්‍යාපන පද්ධතිය ගැන කථා කරනවා නේ. එය අසංවේදී කියලා කියනවා, කඩා වැටිලා කියලා කියනවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් 16,000කට නේවාසිකාගාර 55ක් හදන වැඩ කටයුත්තක් අපි ක්‍රියාත්මක කර තිබෙනවා. මේ විධියේ දැවැන්ත වැඩ පිළිවෙළක් ඉතිහාසයේ කවදාවත් කරලා නැහැ. විශේෂයෙන්ම එළියේ බෝඩිම් හොයාගෙන, බොහොම අමාරුවෙන් ජීවත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දැන් පුළුවන්, විශ්වවිද්‍යාල පද්ධතිය තුළ හොඳ ආරක්ෂාවක් සහිතව අධ්‍යාපනය ලබන්න. අපි හිතනවා, ඉදිරියේදී හොඳ රටක් තුළ හොඳ අධ්‍යාපනයක් ලබා ගන්න නම්, ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවශ්‍ය සුබසාධන කටයුතු ලබා දිය යුතුයි කියා.

ඊළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සඳහන් කළ නිසා මම කථා කරන්න කැමැතියි, ගුරු විභාගයෙන් පස්සේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන්. එතුමා සඳහන් කළා, ඒ සඳහා ගන්නා කාලය සීමා කරන්න කියලා. මම එතුමාට කියනවා, පොඩ්ඩක් අපි කියපු කථා ටික අහලා බලන්න, අමාත්‍යාංශයෙන් පොඩ්ඩක් හොයලා බලන්න කියලා. අපි කිව්වේ, පළමුවෙන් එක වටයක් බඳවා ගැනීම් කරනවා, ඒ වටයෙන් පස්සේ නැවත වාරයක් දෙවැනි වටයකට හෝ තුන්වැනි වටයකට යන්න පුළුවන් කියලා. ඒක සංකීර්ණ ක්‍රියාවලියක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි. එක පාරට බඳවා ගැනීම් කරන්න අපට පුළුවන් නම්, ඉතාම සතුටුයි. නමුත් ඒ කටයුත්ත නඩු තීන්දුවක් මත සිද්ධ වෙන්නේ; එකඟතාවක් මත සිද්ධ වෙන්නේ. ඒ වාගේම ලොකු ප්‍රමාණයක් විභාගයට ඉඳගත්තා. 141,000ක් විභාගයට ඉඳගත්තා. ඒ නිසා ලොකු ප්‍රමාණයක් interview කරන්න තිබෙනවා. ඒ යථාර්ථය අවබෝධ කර ගන්න ඕනෑ. ඒ නිසා අපේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට මම කියනවා, අපි ඒ සාධක, ඉලක්කම්, දර්ශක එක්ක කථා කරමු; ඒ විවාදයට අපි සතුටුයි කියලා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඊළඟට, ගරු තුරෙෙරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[පි.ව. 5.10]

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாட்டின் தற்போதைய நிலைமை தொடர்பான சபை ஒத்திவைப்பு வேளையின்போதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

2025ஆம் ஆண்டில் முல்லைத்தீவு மாவட்டத்தின் மீன் உற்பத்தி 8,220.49 மெற்றிக்தொன் என அரச தரப்பு புள்ளிவிபரங்கள் குறிப்பிடுகின்றன. வெளியுலகுக்குச் செல்லும் இவ்வாறான புள்ளிவிபரத்தால், முல்லைத்தீவு மாவட்டத்தின் இத்தகைய மீன் உற்பத்தியால் மீனவர்களின் வாழ்வாதாரம் வலுவாக உள்ளது என்ற செய்தி தவறாகவே செல்லும் நிலை காணப்படுகின்றது. ஒருபுறம் முல்லைத்தீவின் பெரும் பகுதி கடற்கரை வெறிச்சோடிப் போயிருக்க, பாரம்பரிய மீனவர்கள் வாழ்வாதாரவலு நலிவுற்று வறுமைப்பட்டிருக்க, அரச தரப்பிலிருந்து வெளிவரும் இத்தகைய புள்ளிவிபரம் உலகுக்குத் தவறான செய்தியையே வெளிப்படுத்தி நிற்கிறது. புள்ளிவிபரப்படி, இவ்வாறான மீன் உற்பத்தியால் மிகுந்த செல்வச் செழிப்போடு வாழ்பவர்கள், முல்லைத்தீவில் சட்டவிரோத தொழில் முறைகளால் மீன்பிடிப்பவர்களே! மீன்பிடித் துறையிலும் டிஜிட்டல் முறையைச் செயற்படுத்தி பதிவு செய்யப்பட்ட ஒவ்வொரு மீனவரிடமிருந்தும், மீன்பிடித் துறைகளிலிருந்தும் பிடிபடும் மீனின் அளவைக் கணக்கிடும்போதே, இத்தகைய மீன் உற்பத்தி ஒட்டுமொத்த முல்லைத்தீவு மாவட்டத்தையும் பிரதிபலிக்கின்றதா என்பதைக் கடற்றொழில் அமைச்சு உறுதிப்படுத்த முடியும். வெறிச்சோடிப்போய் இருந்த முல்லைத்தீவு மாவட்டக் கடற்கரையை கடந்த கிழமையும் நான் நேரில் சென்று பார்வையிட்டேன். முல்லைத்தீவின் கடற்பரப்பில் மட்டுமல்ல, வட மாகாண கடற்பரப்பு முழுவதும் இவ்வாறான சட்டவிரோத தொழில் முறைகளாலேயே அதிகளவான மீன்கள் பிடிக்கப்படுகின்றன. சட்டவிரோதிகள் பெரும் செல்வந்தர்களாவதையும் பாரம்பரிய மீனவர்கள் பட்டினிச் சாவுக்குச் செல்லும் அளவுக்கு வறுமைப்படுவதையுமே தற்போதைய கடற்றொழில் அமைச்சும் கடற்படையும் கடந்த ஈராண்டு காலத்தில் வட கடலில் சாதித்தவை.

முல்லைத்தீவு மாவட்ட கடற்றொழில் நீரியல் வளத் திணைக்கள அலுவலகத்தின் புள்ளிவிபரத்துக்கு அமைவாக, சட்டவிரோத தொழில் முறைகள் தொடர்பில் முல்லைத்தீவில் 2025ஆம் ஆண்டில் 136 மீனவர்கள் கைதுசெய்யப்பட்டு, அவர்களிடமிருந்து தண்டப்பணமாக 7.1 மில்லியன் ரூபாய் அறவிடப்பட்டுள்ளது. 2026ஆம் ஆண்டு மே மாதம் வரையான காலப்பகுதியில், 53 மீனவர்கள் கைதுசெய்யப்பட்டு 1.28 மில்லியன் ரூபாய் தண்டப் பணமாக அறவிடப்பட்டுள்ளது. சராசரியாக 2025இல் மூன்று நாட்களுக்கு ஒரு கைது என்ற அடிப்படையிலும், 2026இல் ஐந்து நாட்களுக்கு ஒரு கைது என்ற அடிப்படையிலும் கடற்றொழில் அமைச்சு சட்டவிரோதிகளை மிகவும் மெத்தனப்போக்கில் அணுகியுள்ளது. ஒரு சட்டவிரோத தொழிலில் ஒரு நாள் மீன்பிடியில் அவர்கள் உழைக்கும் பணத்திலும் சிறிய

அளவிலான தொகையே ஒரு வழக்குக்குரிய தண்டப்பணமாகும்போது, சட்டவிரோதிகள் எவ்வாறு சட்டவிரோதத் தொழிலை நிறுத்தப்போகிறார்கள் அல்லது திருந்தப்போகிறார்கள். சட்டவிரோத தொழில்முறைகள் ஊடாக நூற்றுக்கணக்கான கிலோகிராம் மீன்களை ஒவ்வொரு தடவையும் பிடிக்கும் சட்டவிரோத தொழிலாளர்களுக்கு இவ்வாறான தண்டப்பணமும் தண்டனையும் போதுமானதா? எனக் கேட்க விரும்புகின்றேன். சட்டவிரோத தொழில் முறைகளைக் கட்டுப்படுத்துவதற்கு மேலும் இறுக்கமான தண்டனைகளை வழங்கும் வகையில் சட்டத்திருத்தங்களை அரசு கொண்டுவருதல் வேண்டும். வான்பரப்பிலும் கடலிலும் நிலத்திலுமாக போதையைக் கட்டுப்படுத்தும் அரசு, அதேயளவு சிரத்தையை கடலில் நடைபெறும் இத்தகைய சட்டவிரோத தொழில் முறையை முற்றகாக ஒழிப்பதிலும் எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், கடந்த கிழமையும் எமது மாவட்ட மீனவர்கள், எமது கடற்பரப்பில் இந்திய இழுவைப் படகுகள் மீன்பிடிப்பதை சான்றுப்படுத்தி உள்ளார்கள். அடுத்த மாதத்திலிருந்து தொடங்கவுள்ள இறால்படுகையில், எங்களது மீனவர்களுக்குச் சொற்ப வருவாயேனும் கிடைக்க வேண்டுமென்றால், இவ்வாறாக எல்லை தாண்டிவரும் இந்திய இழுவைப் படகுகளையும் கட்டுப்படுத்த வேண்டும். நான் இச்சபையில் முன்னரும் பதிவுசெய்து இருக்கிறேன்; மீண்டும் சவாலாகவே சொல்கிறேன். வட கடல் பரப்பை முழுமையாகக் கட்டுப்படுத்த கடற்படையால் இயலாவிட்டால், சட்டவிரோத தொழில் முறைகளையும் இந்திய இழுவைப் படகுகளையும் கட்டுப்படுத்த கடற்றொழில் அமைச்சால் இயலாவிட்டால், அதிகாரங்களையும் கருவிகளையும் எங்கள் மீனவர்கள் வரை பரவலாக்குங்கள்! ஒரு மாதத்துக்குள் இவற்றைக் கட்டுப்படுத்திக் காட்டுகிறோம். கடந்த காலத்தில் நாங்கள் எவ்வாறு வார்க்கப்பட்டோம், எவ்வாறு வளர்க்கப்பட்டோம் என்பதை மீண்டும் ஒருமுறை காட்டிவிடுகிறோம்.

அடுத்து, தொடரும் யானை - மனித மோதல் தொடர்பில் கருத்துத் தெரிவிக்க விரும்புகிறேன். கடந்த பாராளுமன்ற அமர்விலும் முல்லைத்தீவின் பல்வேறு இடங்களிலும் யானை - மனித மோதலால் மக்களின் வாழ்வாதார நிலங்கள், சொத்துக்கள், உடைமைகள் அழிவுக்கு உள்ளாகுவதை இச்சபையின் கவனத்துக்குக் கொண்டுவந்து இருந்தேன். அண்மையில் துப்பாக்கிச் சூட்டுக்கு இலக்காகி, நோயுற்று, பின்னர் மரணமான காவன்திஸ்ஸ யானையின் மரணம் தீவளாவிய வகையில் பெரும் பேசுபொருளானது. 2018ஆம் ஆண்டிலிருந்து ஒவ்வோர் ஆண்டும் 300க்கும் மேற்பட்ட யானைகள், மனித - யானை மோதலால் உயிரிழப்பதாக அரச தரப்பு புள்ளிவிபரங்கள் கூறுகின்றன. யானைக் கட்சியின் தலைவர் சனாதிபதியாக இருந்த 2023ஆம் ஆண்டு காலத்தில்தான் ஆண்டொன்றில் அதிகூடியதாக 488 யானைகள் உயிரிழந்ததாகக் குறிப்பிடப்படுகிறது. 2026ஆம் ஆண்டின் முதல் ஏழு மாதங்களில் 180 காட்டு யானைகளும் 35 மனிதர்களும் உயிரிழந்துள்ளனர். ஆண்டொன்றுக்கு சராசரியாக 300க்கும் மேற்பட்ட யானைகளும் 100க்கும் மேற்பட்ட மனிதர்களும் உயிரிழப்பது என்பது மனிதம் சார்ந்த, சூழலியல் சார்ந்த பேரிடராக அமைகின்றது. இன்றும் முல்லைத்தீவின் துணுக்காய் பிரதேசத்திலுள்ள ஆலங்குளத்தில் யானை மோதி ஒருவர் உயிரிழந்து இருக்கிறார்.

இந்நிலையில் தற்போதைய எதிர்க்கட்சித் தலைவர் அவர்கள், கடந்த கிழமை இறந்த காவன்திஸ்ஸ யானையின் மரணத்தில் வெளிப்படைத் தன்மையை உறுதிப்படுத்தும் பொருட்டு, வெளிநாட்டு நிபுணர்களின் ஒத்துழைப்பை வேண்டுவதாக ஊடகங்கள் ஊடாக அறிய முடிந்தது. யானையின் மரணம் தொடர்பில் நீதியான விசாரணைக்கும் வெளிப்படைத் தன்மைக்கும் வெளிநாட்டு நிபுணர்களின் உதவியைக் கோரும் எதிர்க்கட்சித் தலைவர் அவர்களுக்கு எங்களின் நீண்டகாலக் கோரிக்கையை மேலும் விளக்க வேண்டியதில்லை.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me one more minute, Madam.

செம்மணி புதைகுழியில் என்புகளாகியும் நீதிக்காகக் காத்திருக்கும் 580க்கும் மேற்பட்ட எம்முடைய உறவுகள் தொடர்பிலும், இறுதிப் போரில் அரச படையிடமே நம்பி ஒப்படைத்து இன்றளவில் வலிந்து காணாமலாக்கப்பட்ட எம் உறவுகள் தொடர்பிலும், பன்னாட்டு போரியல் அறங்களையும் புறந்தள்ளி இலங்கை அரசு மேற்கொண்ட இனப்படுகொலை தொடர்பிலும், இதுவரை மாறிவந்த இன்றுவரையுள்ள அரசாங்கம் ஒன்றேனும் நீதியைப் பெற்றுத்தராத நிலையில், மேற்படி எமது கோரல்களிலும் வெளிப்படைத் தன்மையையும் நீதியையும் நிலைநாட்டும் பொருட்டு, பன்னாட்டு நிபுணர்களின் தலையீட்டுக்காகவும் பன்னாட்டு நீதி விசாரணைக்காகவும் கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்களும் எம்மோடு சேர்ந்து, எமக்குத் துணைநிற்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.18]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

අද දින විපක්ෂය ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අදාළව කරුණු ඉදිරිපත් කිරීමේදී මම පළමුවෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. මොකද, විපක්ෂයේ මන්ත්‍රීවරු දෙපළක්ම සඳහන් කළා, ගල් අඟුරු ප්‍රශ්නය පිළිබඳව වාර්තා ඉදිරිපත් වෙලා තිබෙනවා කියලා. මා ඉතාම පැහැදිලිව කියන්න අවශ්‍යයි, ඒ ගල් අඟුරු මිල දී ගැනීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් ගැටලු මතු වෙලා තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කිරීම, අධිකරණයට යෑම ආදි ක්‍රියාමාර්ග ගන්න හැකියාව තිබෙන බව. රජය පැත්තෙන් ඒ අවශ්‍ය උපදෙස් දී තිබෙනවා. ඒ ගල් අඟුරු මිල දී ගන්න කොට, අපි අදාළ ප්‍රමිතියට අනුව ආනයනය කිරීම කළා. හැබැයි, ඒ අය ප්‍රමිතියෙන් බැහැර වෙලා තිබුණා නම්, ඒ ගිවිසුමට අදාළව, නීත්‍යනුකූලව ඒ සියලු දඩ මුදල් අපි අය කරගෙන තිබෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඒ මන්ත්‍රීතුමන්ලා සඳහන් කළා, අලාභයක් පිළිබඳව. මම කියන්න සතුටුයි, Trident Chemphar කියන සමාගමෙන්, ගල් අඟුරු නැව් 19කින් ඩොලර් මිලියන 36.496කුත්, ඊට පසුව ගෙනාපු ගල් අඟුරුවලින් ඩොලර් මිලියන 1.005කුත්, ඊටත් අමතරව ඒ ගල් අඟුරු ලබා දීමේ ක්‍රියාවලිය නිසි ආකාරයෙන් නොකළ නිසා ඔවුන්ගේ කාර්ය සාධන බැඳුම්කරය - Performance Bond එක - සඳහා ඩොලර් මිලියන 14.75කුත් වශයෙන් ඩොලර් මිලියන 52යි දශම ගණනක් අය කරගෙන තිබෙන බව. 330ක වාගේ අනුපාතයෙන් එය රුපියල්වලට පරිවර්තනය කළත්, රුපියල් බිලියන 17කට වැඩි ප්‍රමාණයක් එතැනින් අය කරගෙන තිබෙනවා.

අද මේ කල් තැබීමේ යෝජනාවේ සඳහන් කරන්නේ, දැන් මිනිසුන්ට ජීවත් වෙන්න අමාරුයි, උද්ධමනය ඉහළ ගිහිල්ලා, බඩු මිල වැඩි වෙලා, විශාල අමාරු තත්ත්වයක් තිබෙන බවකුයි. නමුත් ඒ කාරණය ඇත්තද, නැත්තද, එහි බලපෑම මොකක්ද කියලා අපට තේරුම් ගන්න වෙන්නේ, අප මේ ආණ්ඩුව භාර ගත්තු දා ඉඳලා මේ අවුරුදු දෙක ඇතුළතදී ගත්තු ක්‍රියාමාර්ගත්, ඒ පැවැති තත්ත්වයත් ගැන බලලායි. අපට ආණ්ඩුව ලබා දුන්නේම, ආර්ථිකමය වශයෙන් රට බිඳ වැට්ටුවාට පස්සේ. ඒ බිඳ වැටීමෙන් රට ගොඩ ගැනීම සඳහා අපි නිවැරැදි ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කරමින්, නිවැරැදි ආර්ථික දෘෂ්ටිය, පාරදෘශ්‍යභාවය ඇති කරමින්, වංචා දූෂණ සියල්ලක්ම නැති කරමින් ක්‍රියාමාර්ග ගන්න කොට විපක්ෂය පැත්තෙන් නිරන්තරයෙන් කරපු දේ තමයි අවිනිශ්චිතතාවක් ඇති කිරීම. එතැනදී කළේ කරන්න බැහැ කියපු එක නොවෙයි. රට හෙට වැටෙනවා, අනිද්දා වැටෙනවා කිය කියා දින ගනිමින්, මහජනතාව තුළ අවිනිශ්චිතතාවක් ඇති කළා. ඒක අපට මුහුණ දෙන්න සිදු වෙච්ච අභියෝගයක්. එවැනි තත්ත්වයකදී රටක් අර්බුදයකට මුහුණ දීලා තිබුණා නම් ගොඩ ගැනීම සඳහා සියලුදෙනා එකට එකතු වෙලා වැඩ කරන්න ඕනෑ. හැබැයි නිතරම සමාජයේ අවිනිශ්චිතතාව පිළිබඳව බොරු බිය මතු කළා. ඒ සියල්ලක්ම අද බොරු බවට ඔප්පු වෙලා තිබෙනවා.

ඒත් එක්කම අපට මුහුණ දෙන්න සිද්ධ වුණා අපි කිසිලෙසකවත් අපේක්ෂා නොකළ බාහිර කම්පන දෙකකට. "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වෙච්ච කම්පනයට ඉතාම සාර්ථකව අපි මුහුණ දුන්නා. එමඟින් වෙළෙඳ පොළ මිලට බලපෑමක් ඇති නොවුණත් අපට පුළුවන් වුණා අපි ඉතිරි කර ගන්නා ලද මුදල් භාවිත කරලා රුපියල් බිලියන 500ක් ඒ සඳහා වෙන් කරන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ වාගේම මැද පෙරදිග යුද්ධය හමුවේදීත් අපට පුළුවන්කම ලැබුණා ඒ පීඩනය අවම කරන්නට. ඇත්තටම අද මේ මොහොත වන විට මැද පෙරදිග යුද්ධයක් තිබෙනවාද, ඒ යුද්ධය නිසා විශාල කම්පනයක් ලංකාවට ඇවිල්ලා තිබෙනවාද කියලා සාමාන්‍ය ජනතාව අතර ලොකු අවබෝධයක් නැති තරම්. මොකක්ද හේතුව? ආණ්ඩුව මැදිහත් වෙලා ගත්ත ක්‍රියාමාර්ග නිසා, එහි ප්‍රතිඵල විධියට මැද පෙරදිග යුද්ධයෙන් වෙළෙඳ පොළ මිලට ඇති විය හැකි බලපෑමේ පීඩනය උපරිමයෙන් අවම කරලා තිබෙනවා. මොකක්ද ඒ පීඩනය? පළමුකොටම ඉන්ධන මිල වැඩිවීම පිළිබඳ ප්‍රශ්නය, ඉන්ධන මිල ඉහළ යාම. ප්‍රවාහන ගාස්තු, නැව් ගාස්තු ඉහළ යාම සහ රක්ෂණ ගාස්තු ඉහළ යාම නිසා ඉන්ධන සඳහා වූ වැය බර වැඩි වෙලා තිබෙනවා. අපි ගිය වර්ෂයේදී, 2025දී ඉන්ධන ආනයනයට සමස්තය ලෙස වැය කළේ ඩොලර් මිලියන 4,022යි, ඩොලර් බිලියන 4කට ආසන්න ප්‍රමාණයක්. හැබැයි මේ වෙනකොටම අපි ඩොලර් මිලියන 4,072ක්, බිලියන 4කට වඩා වැඩි ප්‍රමාණයක් වියදම් කරලා තිබෙනවා. එතැනින්ම පෙන්නුම් කරනවා මෙතැන තිබෙන බලපෑම. හැබැයි අපේ ආණ්ඩුවේ වගකීම වන්නේ මහජනතාවට ඉන්ධන ලබා නොදී හිඟතාවක් ඇති කරනවා වෙනුවට තිබෙන දුෂ්කරතාව පාලනය කරමින්, අනෙකුත් ආනයනත් නිසි පරිදි කළමනාකරණය කරමින්, මුදල් කළමනාකරණය කරමින් කිසිදු ආකාරයක හිඟයක් ඇති වෙන්නේ නැතිව ඉන්ධන ලබාදීමයි. ඒ විතරක් නොවෙයි ඉන්ධන මිල වැඩිවීමෙන් ඇති විය හැකි බලපෑමත් අවම කරලා දුන්නා. අපට කියන්න බැහැ ඉදිරියේදී යුද්ධය මොන තත්ත්වයකට පරිවර්තනය වෙයිද කියලා. එහෙත් අපි ඉදිරියේදී කිසිදු ආකාරයක ඉන්ධන හිඟයක් ඇති වෙන්නේ නැති විධියට පවතින තත්ත්වය කළමනාකරණය කරමින්, දැනටමත් තොග ගබඩා කරලා තිබෙන බව සඳහන් කරන්න කැමැතියි.

උද්ධමනය පිළිබඳ කථාවේදී ඇත්තටම අපි පිළිගන්නවා මැද පෙරදිග යුදමය තත්ත්වය නිසා තමයි උද්ධමනය පොඩි ප්‍රමාණයක් හරි වැඩි වුණේ කියලා. එමඟින් බඩු මිල යම් ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. අපි ඒක කළමනාකරණය කරනවා. ඉදිරියේදී 2027 වෙනුවෙන් ඉදිරිපත් කරන්න තිබෙන අය වැය සංවර්ධනය ඉලක්ක කර ගත්ත අය වැයක්. ඒ සඳහා රුපියල් ට්‍රිලියන 2ක ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කිරීමක් කරලා තිබෙනවා. ඒ අනුව අපි ඒ සංවර්ධන කටයුතු, අපි ලබා දිය යුතු සහන සහ අනෙකුත් කාරණා පිළිබඳවත් ඉතාමත් විධිමත් වැඩ පිළිවෙළක්, ඉලක්කගත වැඩ පිළිවෙළක් සහිතව 2027 අය වැය ඉදිරිපත් කරන්නට සූදානම්.

ඒ වාගේම උද්ධමනය වැඩි වෙලා, මේ සියයට 8ක උද්ධමනය ලංකාවේ වැඩිම උද්ධමනය, මිනිස්සුන්ට මේක දරන්න බැහැ වාගේ අදහසක් සමාජයේ මතු කරනවා. අපි එච්චර ඈතකට යන්නේ නැතිව විපක්ෂයේ කණ්ඩායම් දෙකම පාලනයේ හිටපු 2010 සිට ඉදිරියට අරගෙන බැලුවාම ඇත්තටම 2010-2015දීත් සාමාන්‍ය උද්ධමනය සියයට 5ක් වාගේ ප්‍රමාණයක පැවතිලා තිබෙනවා. ඒ වාගේම 2015-2019 කාලයේදීත් සියයට 6.5ක උද්ධමනයක් පැන නැඟිලා තිබෙනවා. අතීතය අරගෙන බැලුවාම සාමාන්‍ය උද්ධමනය මීට වඩා වැඩි ප්‍රමාණයක තිබිලා තිබෙනවා. උදාහරණයක් විධියට ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද දත්ත අනුව පෙන්නුම් කරනවා, 1977 ඉඳලා මේ වෙනකොට තිබෙන උද්ධමනයේ average එක සියයට 9 දශම ගණනකට වඩා ඉහළ මට්ටමක තිබෙන බව. අපේ කාලය ඇතුළතදී යම් ආකාරයක බඩු මිල වැඩිවීමක් සිදු වුණත් අපි පිළිගන්නවා මේ කාලය ඇතුළතදී උද්ධමනය පාලනය කරන ලද යන්ත්‍රණයක් ඇතුළත තිබෙන බව. ලංකාව flexible inflation target එකකට ඇතුළත් වෙන්නේ 2023දී. අනෙක් රටවල්, දියුණු රටවල්, දියුණු වෙමින් පවතින රටවල් අතීතයේ සිට උද්ධමනය පාලනය කිරීමේ රාමුවක් ඇතුළේ වැඩ කටයුතු කරලා තිබෙනවා. නමුත් අපි 2023 ඉඳලායි උද්ධමනය පාලනය කිරීමේ රාමුවක් ඇතුළේ වැඩ කටයුතු කරන්නේ. එහි ඉලක්කය සියයට 5යි. මේ සියයට 5 ඉලක්කය සියයට 2ක් ඉහළට හෝ සියයට 2ක් පහළට වෙන විධියට කළමනාකරණය කරමින් සෑම අවුරුදු තුනකට වරක්ම විමර්ශනය කරමින් ඉදිරියට යනවා. දැනට අපි ඉන්නේ මෙවැනි තත්ත්වයක.

ලෝකයේ තිබෙන තත්ත්වයන්, යුදමය තත්ත්වය, අපේ රටේ ආර්ථිකයේ තත්ත්වය, - අපි කාර්මික වශයෙන් දියුණු රටක් නොවෙයි - වාගේ සියලු තත්ත්වයන් සැලකිල්ලට භාජන කළාම සියයට 5ක උද්ධමනය ඇතුළේ අපට ගමන් කරන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ ස්ථාවරත්වය අපි අනිවාර්යයෙන් අත්පත් කරගෙන තිබෙනවා. ඒ ස්ථාවරත්වයෙන් ඔබ්බට ගිහිල්ලා අපි අනිවාර්යයෙන් සැබෑ පරිවර්තනය සිද්ධ කරනවා. අපි මේ රට ඇතුළේ ආර්ථික පුනරුදය ස්ථාපිත කරනවා. සියලු දෙනා සහභාගි වෙච්ච ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමේ දිශාවට ගමන් කරන්න සියලු සැකසුම් සකස් කරලා තිබෙද්දී තමයි මෙවැනි චෝදනාවක් ඉදිරිපත් කරන්නේ. ඒ

සියල්ලක්ම බොරු - අසත්‍ය - බව මම ප්‍රකාශ කරනවා. අපි අත්පත් කර ගත් මේ ජයග්‍රහණය අපි විතරක් නොවෙයි, ජාත්‍යන්තර ආයතන, විශේෂයෙන්ම Fitch Ratings වැනි ආයතනය ස්වාධීනව ඇවිල්ලා පරීක්ෂා කරලා බලනවා, රට ඇතුළේ කොච්චර සංචිත තිබෙනවාද, ස්ථාවරද, ආදායම එකතු කරගෙන තිබෙනවාද, සැලසුම් තිබෙනවාද කියලා. ඒ අනුව අපේ රට ඉදිරියට ගමන් කරනවා කියලා B- වැනි ඉහළ මට්ටමක් අපට ලබා දීලා තිබෙනවා. ජාත්‍යන්තරවද, දේශීයවද ආර්ථිකය පැත්තේ ඉන්න හැම කෙනෙක්ම මේ රට ගමන් කරන මාර්ගය නිවැරදි බව ඔප්පු කරනකොට ඉතාම සුළු පිරිසක් තමයි වැරදි චෝදනාවක් එල්ල කරන්නේ. මේ අභියෝගය ජයග්‍රහණය කරන්න අපට එකට එකතුව ඉදිරියට යන්න පුළුවන් කියන අදහස යෝජනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.27]

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද සභාව කල් තබන අවස්ථාවේදී විපක්ෂය මේ යෝජනාව ගෙනැල්ලා පාර්ලිමේන්තුව තුළ තහවුරු කරන්න හදනවා, රට සම්පූර්ණයෙන්ම වැටිලා, රට ඉවරයි, මෙතැනින් එහාට ගමනක් නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුලින්ම කියන්න ඕනෑ, ඒ වැටිච්ච විපක්ෂය තමන්ගේ අඳෝනාව තමයි සභාව ඇතුළේ මේ කියන්නේ කියන එක.

මේ කථාව කියනකොට මට මතක් වෙනවා, පුංචි උදාහරණයක්. අපි කවුරුත් සෙක්කුව ගැන අහලා තිබෙනවා. සෙක්කුව ළඟ ඉඳලා සමහරු හකුරු කනවා, සමහරු චොකලට් කනවා. නමුත්, බලාගෙන ඉන්න අය හිතන්නේ පුන්නක්කු කනවා කියලා. ඒ වාගේ මේ වැටීම් පිළිබඳව අත්දැකීම් තිබෙන, තමන්ගේ පාලන කාල සීමාව තුළ සම්පූර්ණයෙන්ම රට වට්ටපු, ඒ අත්දැකීම් තිබෙන කට්ටිය හිතනවා, දැන් මේ යන ගමනේදී ආණ්ඩුවත් වැටෙනවා කියලා. මොකද, ඔවුන්ට අත්දැකීම් තිබෙන්නේම වැටීම් පිළිබඳවයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවුරුදු දෙකක් යනකොට අපේ පාලනය තුළ අපි අත්පත් කරගත් ජයග්‍රහණ; මේ රටට අත්පත් කර දුන් ජයග්‍රහණ කොයි තරම්ද කියලා රටේ සාමාන්‍ය ජනයා දන්නවා. ඒ සාමාන්‍ය ජනයාගේ අවබෝධය මකන්න, ඒ සාමාන්‍ය ජනයාගේ අවබෝධය වෙනස් කරන්න මේ අය වරින් වර පාර්ලිමේන්තුවේ මේ වාගේ සංදර්ශන වැඩ දානවා. අපි හැමදාම දකිනවා, ටයි කෝට් ඇඳලා තඩි බොරු හයියෙන් කියන විපක්ෂයේ මහත්තයෙක් ඉන්නවා. තඩි බොරු හයියෙන් කියනකොට එතුමා හිතනවා, ඒක ඇත්තක් විධියට රට භාර ගනියි කියලා. අපි හැමදාම දකිනවා, ඒ දර්ශනය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සභාව ඇතුළේ මේ අයට ඕනෑ තරම් සංදර්ශන දාන්න පුළුවන්. හැබැයි රටේ ජනයා දන්නවා, ජනතාවාදී පාලනය මේ අවුරුදු දෙක ඇතුළේ කොයි වාගේ ගමනක්ද ගියේ කියලා. දෙගොල්ලක් එකතු වෙලා අවුරුදු 76ක් තිස්සේ රට බංකොලොත් කරලා, අඩියක්වත් ඉස්සරහට යන්න බැරි තැනක රට තිබෙන වෙලාවක තමයි ජනතාව තීන්දු කළේ අපට පාලනය භාර දෙන්න. එලෙස පාලනය භාරගෙන අවුරුදු දෙකක් ගත වෙනකොට රටේ තත්ත්වය මොකක්ද කියන එක මේ රටේ මිනිස්සු දන්නවා. බංකොලොත් වෙච්ච රට ආර්ථික වශයෙන් ක්‍රමානුකූලව නග්ගලා මේ රටේ ජනයාගේ අවශ්‍යතා ඉටු කරමින් ඉදිරියට යනවා. මේ තත්ත්වය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිළිගන්නවා, ලෝක බැංකුව පිළිගන්නවා, ලෝකයේ මූල්‍ය ආයතන පිළිගන්නවා. හැබැයි, මේ බංකොලොත් වෙච්ච විපක්ෂය ඒක පිළිගන්නේ නැහැ.

අපි කවුරුත් දන්නවා, මේ ගෙවුණු අවුරුදු දෙක ඇතුළේ අපට මුහුණ දෙන්න වුණු බරපතළ අර්බුද දෙකක් තිබුණු බව. එකක් තමයි, පසුගිය අවුරුද්දේ අපි මුහුණ දුන් "දිට්වා" සුළි කුණාටුව. එය, මේ රටේ විශාල ව්‍යසනයක් සිද්ධ වෙච්ච අවස්ථාවක්; ආර්ථික වශයෙන් විශාල හානියක් සිද්ධ වෙච්ච අවස්ථාවක්. ඒ වෙලාවෙත් මේ බංකොලොත් විපක්ෂය ප්‍රාර්ථනා කළේ එතැනින් රට වැටියන් කියලා. නමුත් එහෙම වුණේ නැහැ.

අපි කවුරුත් බලාපොරොත්තු නොවුණු විධියට මේ අවුරුද්දේ මුල් කාර්තුවේදී මැද පෙරදිග ආශ්‍රිතව යුද්ධය පටන් ගත්තා. ඒකත් අපේ රටේ ආර්ථිකයට බලපෑවා. ඒ වෙලාවෙත් මේ විපක්ෂය අර කාලකණ්ණි ප්‍රාර්ථනාව තමන්ගේ හිත් තුළ තියාගෙන වැඩකටයුතු කළා.

නමුත්, ඒ අභියෝග දෙකටම මුහුණ දීලා ඉතාම ශක්තිමත්ව අපේ ආර්ථිකය ඉස්සරහට ගේන්න අපි සමත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම නිසා තමයි, මේ ගෙවී ගිය කාල සීමාව ඇතුළත අපට පුළුවන්කම ලැබුණේ ආර්ථික ප්‍රශ්නවලට මුහුණ දෙන ගමන්ම රාජ්‍ය සේවකයන්ගේ වැටුප මේ වන විට දෙවතාවක් වැඩි කරන්න. 2025 අප්‍රේල් මාසයේ පළමුවැනි දා ඉඳලා ලක්ෂ 14ක් වන රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප අපි වැඩි කළා. ඒ වෙනුවෙන් රජයක් හැටියට අපි රුපියල් කෝටි එකොළොස්දහසක් වෙන් කළා. මෙවර ඉදිරිපත් කළ අය වැයේදී -ඒ කියන්නේ 2026 අවුරුද්දට ඉදිරිපත් කළ අය වැයේදී - නැවත වතාවක් සියලු රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප වැඩි කරන්න අපි රුපියල් කෝටි එකොළොස්දහසක් වෙන් කළා.

තව මාසයකින් ඉදිරිපත් වනවා, 2027 අවුරුද්දට අදාළ අය වැය. ඒ අය වැයේදීත් යෝජනා කරලා තිබෙනවා, රාජ්‍ය සේවකයන්ට නැවත වැටුප් වැඩිවීමක් කරන්න. ඒ වෙනුවෙනුත් රුපියල් කෝටි එකොළොස්දහසක් වෙන් කරනවා. මේ විධියට රුපියල් කෝටි තිස්තුන්දහසක් රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීම වෙනුවෙන් විතරක් වෙන් කරන්න අපි සමත් වුණා, මේ ගෙවී ගිය කාල සීමාව තුළ. ඒ විතරක් නොවෙයි. අපි පෞද්ගලික අංශයේ සේවකයන්ගේත් වැටුප් වැඩි කළා. වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක් කළා. ඒ වෙලාවේත් බංකොලොත් වෙච්ච මේ විපක්ෂය ඒකට විරුද්ධව කොයි තරම් මේ පාර්ලිමේන්තුව ඇතුළේ කෑකෝ ගැහුවාද? කොයි තරම් ඒක වළක්වන්න උත්සාහ ගත්තාද? මේ විපක්ෂයේ තිබෙන්නේ එහෙම තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. ඒ අය පුන පුනා කිව්වා, සංස්කෘතික හානියක් ගැන, එහෙම නැත්නම් සංස්කෘතික වශයෙන් ඇති වෙච්ච ඇදවැටීමක් ගැන. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අයට තිබුණු දේශපාලන සංස්කෘතිය මොකක්ද කියලා මේ රටේ ජනතාව දන්නවා. මේ අය තමන්ගේ දේශපාලන සංස්කෘතිය කොහොමද ගොඩනැඟුවේ? මේ අය

[ගරු ගමගෙදර දිසානායක මහතා]

හැමදාම කල්පනා කළේ තමන් දේශපාලන බලය දරනකොට සියල්ලන්ම තමන්ට වඩා පහළින් ඉන්නවා කියලායි. එහෙම හිතලා තමයි ඔක්කෝම වැඩකටයුතු කළේ. අන්න එහෙම වැඩකටයුතු කරපු අයට තමයි හැමදාමත් "නිල් රැජින" බස් රථයෙන් ඇවිල්ලා පාර්ලිමේන්තුවේ පිවිසුම් දොරටුව ළඟින් බහින්න සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම කටයුතු කරපු නිසා තමයි ඔවුන්ට ඒ විධියට එන්න සිදු වෙලා තිබෙන්නේ. අතීතයේ ඒ අය කොහොමද වැඩකටයුතු කළේ කියලා අපි දන්නවා. රාජ්‍ය සම්පත් කොයි තරම් අවභාවිත කළාද? ඕන්න, සංස්කෘතිය. සමහර දේශපාලනඥයන් පොලිස් ආරක්ෂාවත් තබාගෙන අපේ සංස්කෘතියේ, අපේ උරුමයේ කොටසක්ව තිබෙන නිධන් පවා හැරුවා නේ. මේ අය එහෙම තමයි වැඩකටයුතු කළේ. ඕන්න, සංස්කෘතිය රැකපු විධිය. ඒ විතරක් නොවෙයි. කියන්න ලජ්ජයි. සමහර දේශපාලනඥයන් හිටියා, කාන්තාවන් සියයක් දූෂණය කරලා ඒක සමරන්න උත්සව තියපු. ඕන්න, ඒ අයගේ සංස්කෘතිය. එහෙම සංස්කෘතියක් තමයි මේ අයට තිබුණේ.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, මේ අයගේ මුල් පරම්පරාව, එහෙම නැත්නම් මුල් දේශපාලනය තිබුණු තැන. සමහර විනිශ්චයකාරවරුන් යම් යම් තීන්දු දුන්නාම උසාවිවලට ගල් ගැහුවා. විනිශ්චයකාරවරුන්ගේ ගෙවල්වලට ගල් ගැහුවා, "හූ" කිව්වා. එහෙමයි මේ අය වැඩකටයුතු කළේ. ඒ විතරක් නොවෙයි. අපි මෑතකත් දැක්කා, එවැනි සමහර දර්ශන. රටට මහා පරිමාණයෙන් මත්ද්‍රව්‍ය ගෙනෙන ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගන්න ආරක්ෂක හමුදාව ගියාම, සමහරුන් චොපර් එකකින් එතැනට ගිහිල්ලා ඒ ජාවාරම්කාරයන්ව බේරාගන්නවා. එහෙම නායකයින් හිටියේ. ඕන්න, ඒ අය හදපු දේශපාලන සංස්කෘතිය. එම නිසා මෙතුමන්ලා මේ රටට ඒත්තු ගන්වන්න හදනවා, රට ඉවරයි, ඉදිරි ගමනක් නැහැ කියලා. මේ අය ඔය වැඩේම කළා, මැතිවරණයක් ආසන්න වුණාමත්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මැතිවරණයක් ආසන්න වුණාම ඒ අය වේදිකාවල කිව්වේ මොනවාද? ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක් ආවොත්, NPP ආණ්ඩුවක් ආවොත් මීට පස්සේ ආගමික වැඩකටයුතු ඔක්කෝම ඉවරයි, පන්සල්වල බුද්ධ පූජාවවත් තියන්න දෙන්නේ නැහැ, පෙරහැර කරන්න දෙන්නේ නැහැ කිව්වා. හැබැයි, ඒ සම්බන්ධයෙන් සමගි ජන බලවේගයේ මහලේකම්තුමා ඇතුළු නඩේම ගිය සතියේ මහානායක හාමුදුරුවන්ගෙන්ම හරියට අහගත්තා. ඒ අය ඒ වාගේ බොරු මතවාද හැදුවා.

දැන් තමුන්නාන්සේලා කවුරුත් වාගේ දන්නවා, මේ ගෙවී ගිය අවුරුදු දෙක ඇතුළත කොයි තරම් ආගමික වතාවත් සිදු වුණාද, දළදා ප්‍රදර්ශනය වැනි ධාතු ප්‍රදර්ශන සිදු වුණාද, පෙරහැර මංගල්‍යයන් කොයි තරම් සිදු වුණාද, රාජ්‍ය මැදිහත්වීම ඇතුළේ කොයි තරම් ඒවාට අනුග්‍රහය දැක්වූවාද කියලා. ඒ අය එදාත් ඒ බොරුව හැදුවා. එදා ඒ බොරුව හදනකොට ඒ මතය එළියට අරගෙන ගිය, උස්සාගෙන ගිය නාලිකා දෙක තුනක් තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වෙලාවේත්, ඒ කටයුත්ත ඒ නාලිකාවලින් කළා. මේ වෙලාවේත් ඒ නාලිකා තමයි ඒ බොරුව හදන්නේ. මේ අය පාර්ලිමේන්තුවේ ඉඳලා මේ මතය හදනවා. මේ අයගේ අනුගාමිකයන් එළියේ ඉඳලා මේ මතය හදනවා. තවත් කණ්ඩායමක් මාධ්‍ය නාලිකා කිහිපය පාවිච්චි කරලා ඒක සමාජගත කරනවා. මේක තමයි එදාත් කළේ, අදත් කරන්නේ. ඒක නිසා මේ බොරුව දැන් සමාජය තේරුම් අරගෙනයි තිබෙන්නේ.

පාර්ලිමේන්තුව ඇතුළේ වේවා, පාර්ලිමේන්තුව පිටත වේවා මේ බොරුව හදන්න කොයි තරම් උත්සාහ ගත්තත් ජනතාව දන්නවා, සැබෑ සිද්ධිය මොකක්ද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා මේ අය හදන බොරුවලට වැඩි ආයුෂ නැහැ.

විශේෂයෙන් අද දවසේ දී මන්ත්‍රීතුමන්ලා කිහිපදෙනෙක්ම කථා කළා, ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට කරන යම් යම් අපහාස ගැන. විශේෂයෙන්ම සිරගත වෙලා ඉන්න ඥානසාර හාමුදුරුවන්ගේ සිද්ධිය අරගෙන මේ අය ලොකු මතයක් හදනවා.

අපි දැක්කා, පසුගිය දවස්වල මේ සිද්ධිය මුල් කරගෙන පා ගමනක් ආවා. මේ පා ගමනේ ඉදිරි පෙළේ සිටියේ කවුද? ඉදිරි පෙළේ සිටියේ චීවරය දරා ගත් අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා. හැබැයි, එහි පසුපසින් සිටියේ කවුද? මේ සඳහා මැදිහත් වන හැඟවෙච්ච පාර්ශ්වය කවුද? පරාජිත වෙච්ච දේශපාලනඥයන්. අපි දැක්කා, ඒ පරාජිත වෙච්ච දේශපාලනඥයන් පසුපසින් ඉඳලා මේ වැඩේට උල්පන්දම් දෙනවා. ඔවුන්ට ඕනෑකර තිබෙන්නේ මොනයම් හෝ සිද්ධියක් පදනම් කරගෙන ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ සිද්ධිය මතු වෙච්ච වෙලාවේ ජනාධිපතිතුමා මහානායක ස්වාමීන් වහන්සේලාට ආරාධනා කරලා ජනාධිපති ලේකම් කාර්යාලයට මහානායක ස්වාමීන් වහන්සේලාගේ අනුදැනුම ඇතිව ස්වාමීන් වහන්සේලා වඩම්මවා උන්වහන්සේලාට හරියට කරුණු පැහැදිලි කරලා දුන්නා, බන්ධනාගාර ආඥාපනත අනුව කටයුතු කිරීම කොයි ආකාරයට ද සිද්ධ වන්නේ කියලා. ගෞරවනීය මහා සංඝ රත්නය එතුමාට ඉතාම සාවධානව අහුම්කන් දීලා ඒ අදහස පිළිගත්තා. පිළිගත්තාම, ඊට අදාළ ක්‍රියාමාර්ග රජය විසින් තේරුවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ ආ එකඟතාව අනුව ගරු ජනාධිපතිතුමා පත් කළා, පංච පුද්ගල කමිටුවක්. පංච පුද්ගල කමිටුවක් පත් කරලා කිව්වා, මේ සම්බන්ධව ගත යුතු තීරණය පිළිබඳව සති දෙකක් ඇතුළත වාර්තාවක් ලබා දෙන්න කියලා. ඒ අනුව අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ මැදිහත්වීමෙන්, සභාපතිත්වයෙන් ඒ කණ්ඩායම රැස් වෙලා වාර්තාව සකස් කරලා අපට භාර දුන්නා. ඔවුන්ට මේ වාර්තාව ලබා දීම සඳහා සති දෙකක කාලයක් තිබුණත්, දවස් හයක් ඇතුළත මේ වාර්තාව ලබා දීලා තිබෙනවා. මේ වාර්තාවෙන් කියන්නේ මොකක්ද? බන්ධනාගාර ආඥාපනතේ 356 සහ 550 වගන්තිවල තිබුණු යම් යම් විධිවිධාන වෙනස් කරලා මේ තත්ත්වය සමනය කර ගන්නේ කොහොමද, මේ තත්ත්වය ගළපා ගන්නේ කොහොමද කියලා හරි පැහැදිලිව මේ වාර්තාවෙන් උපදෙස් දීලා තිබෙනවා. මම හිතන විධියට මේ රටේ ජනතාව දැක්කා, එතැනටත් මේ විපක්ෂයේ තඩි බොරුවක් සමාජයට ඒත්තු ගැන්නුවා කියලා. ඒ වෙලාවෙත් මේ අය කිව්වේ මොකක්ද? ඔය නීති රීති හදලා, පාර්ලිමේන්තුවට දාලා, ඕවා සම්මත කරලා ක්‍රියාත්මක වනකොට කොයි තරම් කාලයක් යයිද කියලා කිව්වා. රටේ සිටින බොහෝ ජනතාව තුළ මේ නීතිරීති පද්ධතිය පිළිබඳව හොඳ පුළුල් අවබෝධයක් නැති නිසා ඔවුන් මේ බොරුව පිළිගන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ගමගෙදර දිසානායක මහතා
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

නමුත් අද අපි ඔප්පු කරලා තිබෙනවා, ඒ කටයුතු එහෙම ප්‍රමාද වන්නේ නැහැ කියලා. ඉදිරි දවස් දෙක තුන ඇතුළත මේ සම්බන්ධ ගැසට් නිවේදනය නිකුත් වනවා. අන්න ඒ ගැසට් නිවේදනය නිකුත් වනකොට අපට මහ හැරුණු යම් යම් නෛතික කාර්යයන් ස්ථාපිත වෙලා අදාළ විධියට කටයුතු කරන්න ඉඩ ප්‍රස්ථාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ ගැනත් කියන්න ඕනෑ. අපි දකිනවා, විපක්ෂය උදේට මාධ්‍ය සන්දර්ශනයක් දමන ආකාරය. මේ වාගේ යෝජනා වරින් වර ගෙනැල්ලා සමහර වෙලාවට ඒත්තු ගන්වන්න හදනවා, ආණ්ඩුව අසමත් කියලා. මේ වාගේ කණ්ඩායම් ඔවුන්ගේ පැවැත්ම වෙනුවෙන්, ඇත්තටම ගත්තොත් පාක්ෂිකයා පොඩ්ඩක් තමන් ළඟ රඳවා ගන්න ඕනෑ නිසා ඒ වෙනුවෙන් මේ වාගේ මතවාද හදනවා. ඒ වාගේම එළියේ සිටින මීට සමගාමී කණ්ඩායම් තවත් මතවාද හදනවා. කවුරු කොහොම මතවාද හැදුවත්, ජනතාවාදී පාලනය ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු කරමින් ශක්තිමත්ව අවුරුදු දෙකක ගමනක් ආවා වාගේ ඉදිරි කාලයටත් මේ ගමන යනවා කියන කාරණය තහවුරු කරමින් මම නතර වනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.40ට, 2026 ඔක්තෝබර් 21වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.40க்கு, பாராளுமன்றம் 2026 ஒக்ரோபர் 21, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.40 p.m. until 9.30 a.m. on Wednesday, 21st October, 2026.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 2254/2026 - පිළිතුර දීමට අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මාසයක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு அஜித் பீ. பெரேரா அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 2254/2026 - விடையளிப்பதற்கு, பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்கள் ஒரு மாதகால அவகாசம் கோரியுள்ளார்.

The Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education, has requested one month's time to reply to Question No. 1 - 2254/2026- raised by the Hon. Ajith P. Perera, appearing in today's Order Paper.

### ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ආරක්ෂක සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම: විස්තර
### இலங்கைக்கும் இந்தியாவுக்குமிடையே பாதுகாப்பு ஒத்துழைப்புமீதான புரிந்துணர்வு ஒப்பந்தம்: விபரம்
### MEMORANDUM OF UNDERSTANDING ON DEFENCE COOPERATION BETWEEN SRI LANKA AND INDIA: DETAIS

2258/2026

**2.** ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර 2025.04.05 දින අත්සන් කරන ලද ආරක්ෂක සහයෝගිතා අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ඇති කර ගන්නා ලද එකඟතා කවරේද;

(ii) එම එකඟතා අතරින් මේ වනවිට ක්‍රියාත්මක කර අවසන් කර ඇති කටයුතු කවරේද;

(iii) ගිවිසුම පරිදි ඇති කර ගන්නා ලද එකඟතාවන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රමාදයට හේතු කවරේද;

(v) එම ගිවිසුම ප්‍රකාරව ඉන්දියාව සමඟ ඇති කරගෙන ඇති එකඟතාවන් අනුව ක්‍රියා කිරීම සඳහා ප්‍රමුඛතාවක් ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கும் இந்தியாவுக்கும் இடையில் 2025.04.05ஆம் திகதி கையொப்பமிடப்பட்ட பாதுகாப்பு ஒத்துழைப்பு புரிந்துணர்வு ஒப்பந் தத்துக்கு அமைவாக எட்டப்பட்ட இணக்கப் பாடுகள் யாவை என்பதையும்;

(ii) மேற்படி இணக்கப்பாடுகளுள் இதுவரை நடைமுறைப்படுத்தப்பட்டு, நிறைவுசெய்யப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) ஒப்பந்தத்தின் பிரகாரம், எட்டப்பட்ட இணக்கப் பாடுகளை நடைமுறைப்படுத்துவதில் தாமதம் ஏற்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அத்தாமதத்துக்கான காரணங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி ஒப்பந்தத்தின் பிரகாரம், இந்தியாவுடன் எட்டப்பட்ட இணக்கப்பாடுகளுக்கு அமைய அவற்றை செயற்படுத்துவதற்கு முன்னுரிமை வழங்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the agreements reached in terms of the Memorandum of Understanding on Defence Cooperation signed between Sri Lanka and India on 05.04.2025;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(ii) the activities among those agreements that have been implemented and completed, as at present;

(iii) whether there has been a delay in implementing the agreements reached in terms of the said Memorandum of Understanding;

(iv) if so, the reasons for such delay; and

(v) the reasons for not giving priority to acting in accordance with the agreements reached with India in terms of the said Memorandum of Understanding?

(b) If not, why?

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

(අ) (i) මෙම අවබෝධතා ගිවිසුම මඟින් දෙරටේ ආරක්ෂක සහයෝගිතාව, ආරක්ෂක කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සහයෝගිතාවන් සහ ආරක්ෂක තාක්ෂණ සහයෝගිතාව අරමුණු කෙරේ.

ආරක්ෂක සහයෝගිතාව යටතේ දෙරටෙහි හමුදා අංශයන්හි නිලධාරින්ට පුහුණු වැඩසටහන් සඳහා අවස්ථාව ලබා දීම සිදු කෙරේ. එනම්, ඒකාබද්ධ පුහුණු අභ්‍යාස සිදු කිරීම, මානුෂවාදී සහ ආපදා සහන සේවාවන්ට අදාළ පුහුණුවීම් ලබා දීම, ධාරිතා සංවර්ධන වැඩමුළු ක්‍රියාත්මක කිරීම, විශේෂඥ දැනුම හුවමාරුව, සාම සාධක කටයුතු සඳහා පුහුණුවීම් සිදු කිරීම මෙන්ම නාවුක ක්ෂේත්‍රයේ විවිධ පුහුණුවීම් හා ඩ්‍රෝන භාවිතය සම්බන්ධ තාක්ෂණික දැනුම සහ පුහුණුවීම්, ක්ෂේත්‍ර චාරිකා ලබා දීම ආදිය සිදු කෙරේ.

ආරක්ෂක කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සෘජු අන්‍යෝන්‍ය සබඳතා පවත්වාගෙන යාම මෙන්ම මෙහිදී තාක්ෂණික සහාය අත්දැකීම් බෙදා ගැනීම, සංවර්ධන සහ නඩත්තු කටයුතු පිළිබඳ දැනුම හුවමාරුව අරමුණු කර ඇත.

එසේම, ආරක්ෂක තාක්ෂණ ක්ෂේත්‍රය තුළ තාක්ෂණික කටයුතු පිළිබඳ පුහුණුව, ක්ෂේත්‍රයට අදාළ විද්‍යාඥයන් සහ ඉංජිනේරුවරුන් හුවමාරුව මෙන්ම තාක්ෂණික හුවමාරුවද අපේක්ෂා කෙරේ.

(ii) අදාළ වැඩසටහන් වාර්ෂිකව, අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

(அ) (i) இந்தப் புரிந்துணர்வு ஒப்பந்தம், இரு நாடு களுக்கும் இடையே பாதுகாப்பு ஒத்துழைப்பு, பாதுகாப்புத் தொழில் ஒத்துழைப்பு மற்றும் பாதுகாப்புத் தொழில்நுட்ப ஒத்துழைப்பை மேம்படுத்துவதை நோக்கமாகக் கொண்டுள்ளது.

பாதுகாப்பு ஒத்துழைப்பின்கீழ், இரு நாடுகளின் இராணுவப் பிரிவுகளின் அதிகாரிகளுக்கான பயிற்சித் திட்டங்களுக்கு வாய்ப்புகள் வழங்கப்படும். அதாவது, கூட்டுப் பயிற்சி செயற்பாடுகள், மனிதாபிமான மற்றும் அனர்த்த நிவாரண சேவைகள் தொடர்பான பயிற்சி, திறன் மேம்பாட்டுப் பட்டறைகள், நிபுணத்துவப் பரிமாற்றம், அமைதி காக்கும் நடவடிக்கைகளுக்கான பயிற்சி, அத்துடன் கடற்படைத் துறையில் பல்வேறு பயிற்சிகள் மற்றும் 'ட்ரோன்'களின் பயன்பாடு தொடர்பான தொழில்நுட்ப அறிவு மற்றும் பயிற்சி, களப் பயணங்கள் போன்றவை இதில் அடங்கும்.

பாதுகாப்புத் தொழில்துறையில் நேரடி பரஸ்பர உறவுகளைப் பேணுவதும், தொழில்நுட்ப உதவி அனுபவங்களைப் பகிர்ந்துகொள்வதும், மேம்பாடு மற்றும் பராமரிப்பு நடவடிக்கைகள் குறித்த அறிவுப் பரிமாற்றமும் இதன் நோக்கமாகும்.

மேலும், பாதுகாப்புத் தொழில்நுட்பத் துறையில், தொழில்நுட்ப விடயங்கள் குறித்த பயிற்சி, அத்துறை சார்ந்த விஞ்ஞானிகள் மற்றும் பொறியியலாளர்களின் பரிமாற்றம் மற்றும் தொழில்நுட்பப் பரிமாற்றம் ஆகியவை எதிர்பார்க்கப்படுகின்றன.

(ii) குறித்த நிகழ்ச்சித்திட்டங்கள் வருடாந்தம் தொடர்ச்சியாக நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றன.

(iii) பொருத்தமில்லை.

(iv) பொருத்தமில்லை.

(v) பொருத்தமில்லை.

(ஆ) பொருந்தாது.

(a ) (i) This Memorandum of Understanding aims to promote defence cooperation between the two countries, cooperation in the defence industry sector and defence technology cooperation.

Under defence cooperation, opportunities will be provided for officers of the armed forces of both countries to participate in training programmes. Those will include conducting joint training exercises, providing training in humanitarian assistance and disaster relief operations, conducting capacity-building workshops, exchanging expertise, providing training in peacekeeping operations, conducting various types of naval training, providing technical knowledge and training on the use of drones and arranging field visits, among other activities.

Within the defence industry sector, the objectives include maintaining direct bilateral relations, sharing technical assistance and experience and exchanging knowledge on development and maintenance activities.

Furthermore, cooperation in the field of defence technology is expected to include technical training, the exchange of scientists and engineers in the relevant field and the transfer of technology.

(ii) The relevant programmes are implemented annually on a continuous basis.

(iii) Not relevant.

(iv) Not relevant.

(v) Not relevant.

(b) Not relevant.

## ආයුර්වේද සංරක්ෂණ සභා: විස්තර

ஆயுர்வேத பாதுகாப்புச் சபைகள்: விபரம்

AYURVEDA CONSERVATION COUNCILS: DETAILS

2334/2026

**3. ගරු අජිත් පී. පෙරේරා මහතා**

(மாண்புமிகு அஜித் பீ. பெரேரா)

(The Hon. Ajith P. Perera)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'ආයුර්වේද සංරක්ෂණ සභා' පිහිටුවා ඇති නීතිමය ප්‍රතිපාදන සහ එහි කාර්යභාරය කවරේද;

(ii) මෙම සභා නියෝජනය කරන පාරම්පරික සහ ආයුර්වේද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නියෝජනයන් අතරින් වැඩි නියෝජනයක් හිමි වන වෛද්‍ය කාණ්ඩය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මෙම සභා සතුව පැවති, පාරම්පරික වෛද්‍ය සිසුන් පිළිබඳ රජයේ වගකීම ඉවත් කරන ලද වර්ෂය සහ එසේ සිදු කිරීමේ අරමුණ කවරේද;

(ii) එම සභා පවත්වා ගැනීම සඳහා පසුගිය වර්ෂ 10 තුළ රජය විසින් එක් එක් සභා සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සභා සවිබලගැන්වීම සඳහා රජයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(iv) සභාවල මේ වනවිට පවතින ගැටලු හඳුනාගෙන තිබේද;

(v) එසේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) එම සභා මඟින් 'වෙද ගෙදර' ව්‍යාපෘතිය සිදු කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා පසුගිය වර්ෂ 05 තුළ වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'ஆயுர்வேத பாதுகாப்புச் சபைகள்' நிறுவப் பட்டுள்ளமைக்கான சட்டரீதியான ஏற்பாடுகள் மற்றும் அவற்றின் பணிகள் யாவை என்ப தையும்;

(ii) இச்சபைகளில் பிரதிநிதித்துவம் வகிக்கும் பாரம் பரிய மற்றும் ஆயுர்வேத மருத்துவப் பட்டதாரி களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி பிரதிநிதித்துவங்களில் அதிகளவான பிரதிநிதித்துவத்தைக் கொண்டுள்ள மருத்துவப் பிரிவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) (i) இச்சபைகளிடம் காணப்பட்ட, பாரம்பரிய மருத்துவ மாணவர்கள் மீதான அரசாங்கத்தின் பொறுப்புடைமை நீக்கப்பட்ட ஆண்டு மற்றும் அவ்வாறு மேற்கொள்ளப்பட்டதன் நோக்கம் யாது என்பதையும்;

(ii) இச்சபைகளைப் பேணுவதற்காக கடந்த 10 ஆண்டுகளில் அரசாங்கத்தால் ஒவ்வொரு சபைக்கும் ஒதுக்கப்பட்ட ஒதுக்கீடுகளின் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

(iii) இச்சபைகளை வலுப்படுத்துவதற்கான அரசாங் கத்தின் வேலைத்திட்டமொன்று நடைமுறைப் படுத்தப்படுகின்றதா என்பதையும்;

(iv) சபைகளில் தற்போது நிலவும் பிரச்சினைகள் அடையாளம் காணப்பட்டுள்ளனவா என்ப தையும்;

(v) அவ்வாறாயின், அவை யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி சபைகள்மூலம் "வெத கெதர" கருத்திட்டம் நடைமுறைப்படுத்தப்பட்ட பிரதேச செயலாளர் பிரிவுகள் யாவை என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தை நடைமுறைப்படுத்து வதற்காக கடந்த 5 ஆண்டுகளில் ஒதுக்கப்பட்ட நிதி ஒதுக்கீடுகளின் அளவு ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவு வாரியாகவும் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) legal provisions under which the Ayurveda Conservation Councils have been established and their functions;

(ii) number of graduates in traditional medicine and the number of graduates in ayurvedic medicine representing these Councils; and

(iii) category of medical practitioners which has the highest representation among those categories?

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(b) Will he also inform this House -

(i) the year in which the Government's accountability for students of traditional medicine, which had been vested in these Councils, was withdrawn, and the purpose of doing so;

(ii) separately, the amount of funds allocated by the Government to each Council for its maintenance during the past 10 years;

(iii) whether a Government programme is being implemented to empower the Councils;

(iv) whether the current problems in the Councils have been identified; and

(v) if so, what those problems are?

(c) Will he further inform this House -

(i) the Divisional Secretaries' Divisions in which the "Weda Gedara" Project was implemented by the said Councils; and

(ii) separately, the amount of funds allocated to each Divisional Secretary's Division in the last five years for the implementation of the said project?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) ඈත අතීතයේ සිට පැවත එන වෛද්‍ය ක්‍රමයක් වන දේශීය චිකිත්සා (පාරම්පරික) වෛද්‍ය ක්‍රමය නියාමනය සඳහා තිබූ ක්‍රමවේදය ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිලධාරින්ගේ අධීක්ෂණය සහිතව සංරක්ෂණ සභා එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වේ. ඒ සඳහා ආයුර්වේද පනතේ නීතිමය ප්‍රතිපාදන ලැබී නොමැති අතර, එක් එක් සභාවෙන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව උපදෙස් මාලාවක් දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය විසින් ලබා දී ඇත.

(ii) මෙම සංරක්ෂණ සභා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් පදනම් කරගෙන පිහිටුවා ඇති අතර, එම කොට්ඨාස තුළ සිටින පාරම්පරික වෛද්‍යවරුන් මෙම සභාවල නියෝජනය කළද එය සඳහා සහභාගී වීම අනිවාර්යය නොවේ. එලෙසම ආයුර්වේද උපාධිධාරි වෛද්‍යවරයෙක් වන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මෙම රැස්වීමේ කැඳවුම්කරු වශයෙන් සහභාගි වේ. ඒ හැර අනෙකුත් ආයුර්වේද උපාධිධාරි වෛද්‍යවරු සාමාන්‍යයෙන් මෙම සංරක්ෂණ සභාවලට සහභාගි නොවේ.

(iii) මෙම සංරක්ෂණ සභා සඳහා සහභාගි වන්නේ පාරම්පරික වෛද්‍යවරුන් පමණක් වන අතර, කැඳවුම්කරු වශයෙන් ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - CMO - පමණක් සහභාගි වේ.

(ආ) (i) පාරම්පරික වෛද්‍ය සිසුන් ලියාපදිංචිය සඳහා නිර්දේශ ලබා දීම 2019 වර්ෂය දක්වා සංරක්ෂණ සභාවේ නිර්දේශ හා ග්‍රාම නිලධාරිගේ නිර්දේශ මත ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් ආයුර්වේද වෛද්‍ය සභාවට අයදුම්පතක් යොමු කිරීම සිදු විය. නමුත්, 2019 වර්ෂයේ සිට ආයුර්වේද වෛද්‍ය සභාව විසින් වෛද්‍ය සිසුන් ලියාපදිංචිය සම්බන්ධ නිර්දේශ ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි සහ සංරක්ෂණ සභා වෙතින් ලබා නොගෙන ආයුර්වේද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි - CMO - වෙතින් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව, සංරක්ෂණ සභා හරහා පාරම්පරික වෛද්‍ය ශිෂ්‍යයන් ලියාපදිංචිය සඳහා නිර්දේශ ලබා දීම සිදු නොවේ. එබැවින්, පාරම්පරික වෛද්‍ය සිසුන් සංරක්ෂණ සභා සාමාජිකත්වය ලබා ගැනීම අඩු මට්ටමක පවතී.

(ii) **ඇමුණුම*** මඟින් දක්වා ඇත.

(iii) ඔව්.

සංරක්ෂණ සභා සවිබලගැන්වීම සඳහා පුහුණු වැඩසටහන්, දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් සිදු කිරීම, පාරම්පරික ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීම හා ලබා දුන් කුඩා ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරනු ලබයි.

(iv) ඔව්.

(v) පාරම්පරික වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචි වීම සඳහා වන පරීක්ෂණ නොපැවැත්වීම හා සංරක්ෂණ සභා වෙතින් නිර්දේශ ලබා නොගැනීම නිසා ශිෂ්‍යයන් සාමාජිකත්වය ලබා ගැනීම වැළැක්වීම.

පාරම්පරික වෛද්‍ය වශයෙන් වර්තමානයේ ලියාපදිංචි නොකිරීම හේතුවෙන් දැනට සංරක්ෂණ සභා සාමාජිකත්වය දරන බොහෝ වෛද්‍යවරුන් වයස අවුරුදු 60 ඉක්ම වූ බැවින් රැස්වීම්වලට සහභාගි වීමේ දුෂ්කරතාවන්ට මුහුණ දෙයි.

සංරක්ෂණ සභාවලට ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන, තාක්ෂණික පහසුකම්, ස්ථිර ගොඩනැඟිලි සහ අනෙකුත් භෞතික සම්පත් නොමැති වීම නිසා ඒවායේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම අභියෝගයක් වී ඇත.

නවක වෛද්‍යවරුන්ට ලියාපදිංචිය ලබා නොදීම සහ ගුරු සහතිකය ලබා ගත නොහැකි වීම බාධාවකි. වසර පහකට වරක් යාවත්කාලීන කිරීමේදී අය කරන ගාස්තුව සාධාරණ නොවන අතර, නිෂ්පාදනාගාර ලියාපදිංචි ගාස්තු ගෙවීමට බොහෝ දෙනෙකුට ආර්ථික ශක්තියක් නැත.

ව්‍යාජ වෛද්‍යවරුන් මෙහෙයවන මධ්‍යස්ථාන නිසා මහජනතාවට සිදු වන හානිය වැළැක්වීමටද නිසි ක්‍රමවේදයක් නොමැති වීම.

එමෙන්ම, ඖෂධීය ශාක වගාව සඳහා ආයතනික සහාය නොමැති වීම, අමුද්‍රව්‍යවල මිල ඉහළ යාම

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

සහ ඇතැම් ඖෂධ ද්‍රව්‍ය ලබා ගැනීමේ සීමාකම් හේතුවෙන් ඖෂධ නිෂ්පාදනය දුෂ්කර වී ඇත.

පරම්පරාවෙන් පරම්පරාවට රහසිගතව පැවත ආ දේශීය ක්‍රම හා වට්ටෝරු ලේඛනගත නොකිරීම නිසා ඒවා අභාවයට යාමේ තර්ජනයක් පවතී. මෙම දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නව පරපුරේ උනන්දුව අඩු වී ඇත.

ඖෂධවල ප්‍රමිතිය පරීක්ෂා කිරීමට සුදුසු ක්‍රමවේදයක් නොමැතිකම ගුණාත්මකභාවය පාලනයට බාධාවකි. වෙළෙඳ පොළේ පවතින ඖෂධවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමේ සහ ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ විධිමත් ක්‍රමවේදයක් නොමැතිකම ගුණාත්මකභාවය පාලනයට බාධාවකි.

(ඇ) (i)

| | |
|---|---|
| 1.අත්තනගල්ල - 01 | 22.මාවනැල්ල |
| 2. අත්තනගල්ල - 02 | 23.මැදවච්චිය |
| 3. අම්පාර | 24.මිහින්තලේ |
| 4. අරණායක | 25.මීරිගම |
| 5. ඇඹිලිපිටිය - 01 | 26.මොරවැව |
| 6. ඇඹිලිපිටිය - 02 | 27.රාජාංගනය |
| 7. ඇල්ල | 28.රත්ගම |
| 8. ඇහැටුවැව | 29.ලංකාපුර |
| 9. ඇහැලියගොඩ | 30.ලාහුගල |
| 10. කන්තලේ | 31.වවුනියාව - 01 |
| 11. කැබිතිගොල්ලෑව | 32.වවුනියාව - 02 |
| 12. කැලණිය | 33.වාකරේ |
| 13. සෙවනගල | 34.වැලිකන්ද |
| 14. ගලෙන්බිඳුනුවැව | 35.වැලිපිටිය |
| 15. ගල්නෑව | 36.සියඹලාණ්ඩුව |
| 16. තිහගොඩ | 37.හඟුරන්කෙත |
| 17. දිඹුලාගල | 38.හිඟුරක්ගොඩ |
| 18. පලුගස්වැව | 39.හොරොව්පතාන |
| 19. පල්ලෙපොල | 40.තණමල්විල |
| 20. මහඔය | 41.නිකවැරටිය |
| 21. මහියංගනය | |

(ii) එම හෙළ වෙද ගෙදර ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා පසුගිය වර්ෂ 05 තුළ (2020 - 2025) ප්‍රතිපාදන වෙන් කර නොමැත.

(ඈ) පැන නොනඟී.

(அ) (i) தொன்மைக் காலம் தொட்டு நிலவிவரும் மருத்துவ முறையாகிய சுதேச சிகிச்சை (பாரம்பரிய) மருத்துவ முறையை ஒழுங்குபடுத்து வதற்காக இருந்த முறைமையாக, பிரதேச செயலாளர்கள் மற்றும் கிராம உத்தியோகத் தர்களின் மேற்பார்வையுடன், பாதுகாப்புச் சபைகள் ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவு மட்டத்தில் தொழிற்படுகின்றன. அதற்காக ஆயுர்வேதச் சட்டத்தில் சட்ட ஏற்பாடுகள் கிடைக்கப்பெறவில்லை என்பதுடன், ஒவ்வொரு சபையும் செயற்படும் விதம் குறித்த வழிகாட்டல் தொகுதியொன்று சுதேச மருத்துவத்துறைக்குப் பொறுப்பான அமைச்சால் வழங்கப்பட்டுள்ளது.

(ii) இந்தப் பாதுகாப்புச் சபைகள் ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவையும் அடிப்படையாகக் கொண்டு ஸ்தாபிக்கப்பட்டுள்ளதுடன், அப்பிரிவு களுக்குள் உள்ள பாரம்பரிய வைத்தியர்கள் இச்சபைகளைப் பிரதிநிதித்துவப்படுத்தினாலும், அதில் கலந்துகொள்வது கட்டாயமானதல்ல. அவ்வாறே ஆயுர்வேதப் பட்டதாரி வைத்திய ரான ஆயுர்வேத சமூக சுகாதார வைத்திய அதிகாரி, இக்கூட்டத்தின் அழைப்பாளராகக் கலந்துகொள்கின்றார். அதனைத் தவிர, ஏனைய ஆயுர்வேதப் பட்டதாரி வைத்தியர்கள் பொதுவாக இந்தப் பாதுகாப்புச் சபைகளில் கலந்துகொள்வதில்லை.

(iii) இந்தப் பாதுகாப்புச் சபைகளில் பாரம்பரிய வைத்தியர்கள் மாத்திரமே கலந்துகொள்வதுடன், அழைப்பாளராகச் சமூக சுகாதார வைத்திய அதிகாரி (CMO) மட்டுமே கலந்துகொள்கின்றார்.

(ஆ) (i) பாரம்பரிய மருத்துவ மாணவர்களின் பதிவுக்கான பரிந்துரைகளை வழங்குவது 2019ஆம் ஆண்டு வரை பாதுகாப்புச் சபையின் பரிந்துரைகள் மற்றும் கிராம உத்தியோகத்தரின் பரிந்துரைகளின் பேரில் பிரதேச செயலாளரின் அனுமதியுடன் ஆயுர்வேத மருத்துவ சபைக்கு விண்ணப்பம் ஒன்றைச் சமர்ப்பிப்பதன்மூலம் இடம்பெற்றது. எனினும், 2019ஆம் ஆண்டு முதல் ஆயுர்வேத மருத்துவ சபையானது மருத்துவ மாணவர்களின் பதிவு தொடர்பான பரிந்துரைகளைப் பிரதேச செயலாளர், கிராம உத்தியோகத்தர் மற்றும் பாதுகாப்புச் சபைகளிட மிருந்து பெற்றுக்கொள்ளாமல், ஆயுர்வேதச் சமூக சுகாதார வைத்திய அதிகாரியிடமிருந்து (CMO) பெற்றுக்கொள்வதற்கு நடவடிக்கை எடுத்தது. அதற்கமைய, பாதுகாப்புச் சபைகள் ஊடாகப் பாரம்பரிய மருத்துவ மாணவர்களின் பதிவுக்கான பரிந்துரைகள் வழங்கப் படுவதில்லை. இதனால் பாரம்பரிய மருத்துவ மாணவர்கள் பாதுகாப்புச் சபைகளின் உறுப்புரிமையைப் பெற்றுக்கொள்வது குறைந்த மட்டத்தில் காணப்படுகின்றது.

(ii) ***இணைப்பு** மூலம் காட்டப்பட்டுள்ளது. (சிங்கள மொழியிலுள்ள இணைப்பைப் பார்க்கவும்.)

(iii) ஆம்.

பாதுகாப்புச் சபைகளை வலுப்படுத்துவதற்காகப் பயிற்சி நிகழ்ச்சிகள், சுதேச மருத்துவ முறை களைப் பிரபல்யப்படுத்துவதற்கான செயற் பாடுகளை மேற்கொள்ளல், பாரம்பரிய ஆயுர்வேத மருத்துவ கிளினிக்குகளை நடாத்துதல் மற்றும் வழங்கப்பட்ட சிறிய மருந்து உற்பத்தி இயந்திரங்களைப் புனரமைக்கும் பணிகளை மேற்கொள்ளுதல் ஆகியவற்றுக்காக ஆண்டுதோறும் குறிப்பிட்டளவு ஒதுக்கீடு செய்யப்படுகின்றது.

(iv) ஆம்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(v) மரபுவழி வைத்தியர்களாகப் பதிவுசெய்வதற்கான பரீட்சைகள் நடாத்தப்படாமையும் பாதுகாப்புச் சபைகளிடமிருந்து பரிந்துரைகள் பெற்றுக் கொள்ளப்படாமையும் காரணமாக மாணவர்கள் உறுப்புரிமையைப் பெற்றுக்கொள்வது தவிர்க் கப்பட்டுள்ளது.

மரபுவழி வைத்தியராக தற்காலத்தில் பதிவு செய்யப்படாமை காரணமாக, தற்போது பாதுகாப்புச் சபைகளின் உறுப்புரிமையை வகிக்கும் பெரும்பாலான வைத்தியர்கள் 60 வயதைத் தாண்டியுள்ளமையால் கூட்டங்களில் கலந்துகொள்வதில் சிரமங்களை எதிர்கொள்கின்றனர்.

பாதுகாப்புச் சபைகளுக்குப் போதுமான நிதி ஒதுக்கீடுகள், தொழில்நுட்ப வசதிகள், நிலை யான கட்டடங்கள் மற்றும் ஏனைய பௌதிக வளங்கள் இன்மையால் அவற்றின் பணிகளைத் திறம்பட நிறைவேற்றுவது சவாலாக மாறியுள்ளது.

புதிய வைத்தியர்களுக்குப் பதிவு வழங்கப் படாமையும் குரு சான்றிதழைப் பெற்றுக்கொள்ள முடியாமையும் ஒரு தடையாகும். ஐந்து வருடங்களுக்கு ஒரு முறை புதுப்பிக்கும்போது அறவிடப்படும் கட்டணம் நியாயமானதல்ல என்பதுடன், தொழிற்சாலைப் பதிவுக் கட்டணங் களைச் செலுத்துவதற்குப் பலருக்குப் பொருளாதாரப் பலம் இல்லை.

போலி வைத்தியர்கள் நடாத்தும் நிலையங்களால் பொதுமக்களுக்கு ஏற்படும் பாதிப்புகளைத் தடுப்பதற்கான சரியான முறைமையொன்று இல்லாமை. அத்துடன், மூலிகைத் தாவரச் செய்கைக்கான நிறுவன ரீதியான ஆதரவு இல்லாமை, மூலப்பொருட்களின் விலை உயர்வு மற்றும் சில மருந்துப் பொருட்களைப் பெற்றுக்கொள்வதிலுள்ள கட்டுப்பாடுகள் காரணமாக மருந்து உற்பத்தி கடினமாகியுள்ளது.

பரம்பரை பரம்பரையாக இரகசியமாகப் பேணப்பட்டு வந்த சுதேச முறைகளும் மருந்துச் சூத்திரங்களும் ஆவணப்படுத்தப்படாமையால் அவை அழிந்துபோகும் அச்சுறுத்தல் காணப் படுகின்றது. இந்தச் சுதேச மருத்துவத்துறை தொடர்பில் புதிய தலைமுறையின் ஆர்வம் குறைவடைந்துள்ளது.

மருந்துகளின் தரத்தைப் பரிசோதிப்பதற்குப் பொருத்தமான முறைமையொன்று இன்மை யானது தரக் கட்டுப்பாட்டுக்குப் பாதகமாக உள்ளது. சந்தையிலுள்ள மருந்துகளின் தரத்தைப் பரிசோதிப்பதற்கும் நியமங்களைப் பேணிச் செல்வதற்கும் முறையான முறைமையொன்று இன்மையானது தரக் கட்டுப்பாட்டுக்குப் பாதகமாக உள்ளது.

(இ) (i)

| | |
|---|---|
| 1. அத்தனகல்ல 01 | 22. மாவனல்ல |
| 2. அத்தனகல்ல 02 | 23. மெதவச்சிய |
| 3. அம்பாறை | 24. மிஹிந்தலை |
| 4. அரநாயக்க | 25. மீரிகம |
| 5. எம்பிலிப்பிட்டிய 01 | 26. மொரவெவ |
| 6. எம்பிலிப்பிட்டிய 02 | 27. இராஜாங்கனை |
| 7. எல்ல | 28. ரத்கம |
| 8. எஹேட்டுவேவ | 29. லங்காபுர |
| 9. எஹலியகொட | 30. லாகுகல |
| 10.கந்தளாய் | 31. வவுனியா 01 |
| 11.கெபித்திகொல்லாவ | 32. வவுனியா 02 |
| 12.களனி | 33. வாகரை |
| 13.செவனகல | 34. வெலிகந்த |
| 14.கலென்பிந்துனுவேவ | 35. வெலிப்பிட்டிய |
| 15.கல்னேவ | 36. சியம்பலாண்டுவ |
| 16.திககொட | 37. ஹங்குரன்கெத்த |
| 17.திம்புலாகலை | 38. ஹிங்குரக்கொட |
| 18.பலுகஸ்வேவ | 39. ஹொரவப்பொத்தானை |
| 19.பள்ளேபொல | 40. தனமல்வில |
| 20.மகாஓயா | 41. நிகவெரட்டிய |
| 21.மஹியங்கனை | |

(ii) அந்த "ஹெல வெத கெதர" (திட்டத்தை மேற்கொள்வதற்காக கடந்த 05 ஆண்டுகளில் (2020-2025) நிதி ஒதுக்கீடுகள் செய்யப் படவில்லை.

(ஈ) பொருந்தவில்லை.

(a) (i) Conservation Councils operate at the level of each Divisional Secretary's Division under the supervision of Divisional Secretaries and Grama Niladharis as the system for regulating Deshiya Chikitsa (the traditional system of medicine), which has existed since ancient times. No legal provisions have been made for this purpose under the Ayurveda Act, and a set of guidelines on how each Council should function has been issued by the Ministry in charge of Indigenous Medicine.

(ii) These Conservation Councils have been established on the basis of each Divisional Secretary's Division. Although traditional medical practitioners residing within those divisions are represented on these Councils, their participation is not compulsory. Similarly, the Ayurveda Community Health Medical Officer, who holds an Ayurveda Degree, participates in the meeting as the convener. Apart from this officer, other Ayurveda Medical Officers who hold Degrees in Ayurveda do not usually participate in these Conservation Councils.

(iii) Only traditional medical practitioners participate in these Conservation Councils, and only the Community Health Medical Officer - CMO - participates as the convener.

(b) (i) Until 2019, applications for the registration of traditional medical students were forwarded to the Ayurveda Medical Council with the approval of the Divisional Secretary, based on the recommendations of the Conservation Council and the Grama Niladhari. However, from 2019 onwards, the Ayurveda Medical Council arranged to obtain recommendations relating to the registration of medical students from the Ayurveda Community Health Medical Officer - CMO - instead of obtaining them from the Divisional Secretary, Grama Niladhari and Conservation Councils. Accordingly, recommendations for the registration of traditional medical students are no longer provided through the Conservation Councils. Therefore, the number of obtaining membership of the Conservation Councils by traditional medical students remains low.

(ii) Indicated in the Annex*. (Please refer to the Annex in Sinhala.)

(iii) Yes. An annual allocation of funds is made for conducting training programmes to empower the Conservation Councils, carrying out activities to promote indigenous medical methods, conducting traditional Ayurveda medical clinics and repairing the small-scale medicine manufacturing machines provided.

(iv) Yes.

(v) Prevention of students from obtaining membership due to the failure to conduct examinations for the registration of traditional medical practitioners and to obtain recommendations from Conservation Councils.

As a consequence of not carrying out registration as traditional medical practitioners currently, the medical practitioners who had been registered are above 60 years and they find it difficult to participate in meetings.

Further, it has become a challenge to function Conservation Councils efficiently due to the shortage of adequate financial provisions, technology, permanent buildings and other physical resources.

Not granting registration for new doctors and inability to obtain the teaching certificate are obstacles. Similarly, the fee charged to update once in five years is not reasonable and many are not financially strong enough to pay the registration fee for manufacturing plants.

Furthermore, there is no proper mechanism to prevent harm caused to the general public from medical centres operated by quack doctors.

In addition, manufacturing medicine has become a hardship on the grounds of lack of institutional support for herbal plant cultivation, increase of the price of raw materials and restrictions related to obtaining certain medicines.

Traditional indigenous medical practices and formulations that have been passed down secretly from generation to generation are at risk of being lost due to the lack of proper documentation. Furthermore, interest in the field of indigenous medicine among the younger generation has declined.

The absence of an appropriate mechanism for testing the quality of medicines available on the market and ensuring compliance with established standards poses a significant challenge to quality control.

(c) (i)

| | |
|---|---|
| 1. Attanagalla - 01 | 22.Mawanella |
| 2. Attanagalla - 02 | 23.Medawachchiya |
| 3. Ampara | 24.Mihintale |
| 4. Aranayaka | 25.Mirigama |
| 5. Embilipitiya - 01 | 26.Morawewa |
| 6. Embilipitiya - 02 | 27.Rajanganaya |
| 7. Ella | 28.Rathgama |
| 8. Ehetuwewa | 29.Lankapura |
| 9. Eheliyagoda | 30.Lahugala |
| 10. Kantale | 31.Vavuniya - 01 |
| 11. Kebithigollewa | 32.Vavuniya - 02 |
| 12. Kelaniya | 33.Vakarai |
| 13. Sevenagala | 34.Welikanda |
| 14. Galenbindunuwewa | 35.Welipitiya |
| 15. Galnewa | 36.Siyambalanduwa |
| 16. Thihagoda | 37.Hanguranketha |
| 17. Dimbulagala | 38.Hingurakgoda |
| 18. Palugaswewa | 39.Horowpathana |
| 19. Pallepola | 40.Thanamalwila |
| 20. Mahaoya | 41.Nikaweratiya |
| 21. Mahiyanganaya | |

(ii) Provisions have not been allocated within the past five years for the "Hela Gedara" Project.

(d) Does not arise.

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.